# ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද?

## ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා




සංස්කරණය

ප්‍රදීප් පීරිස්

# ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද?

# ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා

සංස්කරණය

ප්‍රදීප් පීරිස්

ප්‍රකාශක: සෝෂල් ඉන්ඩිකේටර්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කොළඹ, ශ්‍රී ලංකාව

සංස්කාරක: ප්‍රදීප් පීරිස්

ISBN 978-624-5914-13-5

Bar Code: 9 786245 914135

පිටකවර ඡායාරූපය: නස්ලි අහමඩ්

© 2021 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ලේඛකයන්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දෘඩ විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවති රික්තයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටලු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

පරිවර්තනය: හසිනි ලේකම්වසම්

# පටුන


| | | |
|---|---|---|
| ලේඛකයන් | | 5 |
| පෙරවදන | | 7 |
| පූර්විකාව සහ ස්තුතිය | | 9 |
| 1 වන පරිච්ඡේදය | හැඳින්වීම: ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා<br>*ප්‍රදීප් පීරිස්* | 11 |
| 2 වන පරිච්ඡේදය | වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ සීඝ්‍ර පරිහානිය<br>*භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ* | 29 |
| 3 වන පරිච්ඡේදය | යටත්වැසියන් නිර්මාණය කිරීමෙන් ජනගහණය සුව කිරීම: ලංකාවේ වසංගත ආණ්ඩුකරණ මාදිලිය<br>*ප්‍රදීප් පීරිස්* | 59 |
| 4 වන පරිච්ඡේදය | ජීවිතද ජීවනෝපායන්ද? ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ සුබසාධනයේ පරිහානිය<br>*නිපුනිකා ඕ. ලේකම්වසම්* | 85 |
| 5 වන පරිච්ඡේදය | වර්ගවාදී වසංගත ආණ්ඩුකරණය: ශ්‍රී ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය තුළ මුස්ලිම් ප්‍රජාව<br>*සකිනා මොයිනුඩීන්* | 107 |
| 6 වන පරිච්ඡේදය | නිදහස්-නොවන-අධ්‍යාපනය: වසංගත සන්දර්භයෙහි ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය-පුරවැසි සම්බන්ධතා<br>*හසිනි ලේකම්වසම්* | 123 |
| 7 වන පරිච්ඡේදය | කබලෙන් ලිපට වැටීම: කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ සංක්‍රමණික ඇඟළුම් කම්හල් සේවකයින්ගේ ජීවිතය<br>*කෞෂිණී දම්මලගේ* | 143 |
| 8 වන පරිච්ඡේදය | දුෂ්කර සමයක සමාජ සම්බන්ධතා: කොවිඩ්-19 වසංගත තත්වය තුළ රාජ්‍ය සේවා ලබාගැනීමේදී සමාජ සම්බන්ධතා ජාල වල භූමිකාව පිළිබඳ අධ්‍යයනයක්<br>*ශෂික් සිල්වා* | 163 |
| ඇමුණුම 1 | | 181 |
| ඇමුණුම 2 | | 183 |
| ඇමුණුම 3 | | 197 |

# දායක වූ ලේඛකයන්

**භවානි ෆොන්සේකා** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකවරියක් සහ නීතිඥවරියක් වන අතර, පර්යේෂණ, ජාතික සහ ජාත්‍යන්තර උපදේශනය සහ මහජන නඩුකර පැවරීම ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඇය අවධානය යොමු කරනු ලබයි. ඇය දැනට *සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර සඟරාවේ* කර්තෘ මණ්ඩලයේ සමාජිකාවක් වශයෙන් මෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරියක ලෙස ද කටයුතු කරයි. ඇය වර්ෂ 2016 දී ශ්‍රී ලංකා රජය විසින් පත් කරන ලද උපදේශන කාර්ය සාධක බලකායේ උපදේශකවරියක් වූ අතර වර්ෂ 2017-2021 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවෙහි ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කෙටුම්පත් කමිටුවේ සාමාජිකාවක් වූවාය.

**කෞෂිණී දම්මලගේ** සමාජ විද්‍යාඥයින්ගේ සංගමයෙහි සාමාජිකාවක් වේ. ඇයගේ මූලික පර්යේෂණ ලැදියාවන් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනය, ප්‍රජාතන්ත්‍රවාදය, මැතිවරණ දේශපාලනය සහ ශ්‍රී ලංකාවේ වාම දේශපාලනයේ ඉතිහාසයයි. ඇය වතුකරයේ ශ්‍රම සචලීයකරණයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ක්‍රියාවලීන් පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වමේ පක්ෂයන්හි සංවිධාන උපාය මාර්ග පිළිබඳව ද පර්යේෂණ කටයුතු සිදු කර ඇත.

**හසිනි ලේකම්වසම්** පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අංශයේ දේශපාලන විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරියක් සහ සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ ඉංග්‍රීසි භාෂා සඟරාව වන *Polity* හි සම කර්තෘවරියකි. ඇයගේ පර්යේෂණ ලැදියාවන් අතර අනන්‍යතා ගොඩනැගීමේ දේශපාලන සමාජ විද්‍යාව, අධ්‍යාපනය ප්‍රජාතන්ත්‍රීකරණය සහ අවකාශීය දේශපාලනය සුවිශේෂී වේ.

**නිපුනිකා ඕ. ලේකම්වසම්** භූතානයේ රාජකීය තිම්පු විද්‍යාලයෙහි හි දේශපාලන විද්‍යාව සහ සමාජ විද්‍යා වැඩසටහනට අනුබද්ධ දේශපාලන විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරියකි. ඇයගේ පර්යේෂණ ලැදියාවන්ගේ පරාසය මානව විද්‍යාව සංවර්ධනය, තාරුණ්‍යය, සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදී පර්යේෂණ ආදී ක්ෂේත්‍ර ආවරණය වන පිරිදි විහිදේ.

**සකිනා මොයිනුඩීන්** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් හි පර්යේෂකවරියක් වන අතර ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ක්‍රම දෙකෙහිම පුළුල් පළපුරුද්දක් ඇත. ප්‍රජාතන්ත්‍රවාදය සහ පාලනය, සාක්ෂරතාවය සහ සංවර්ධනයේ පෝෂණ අංශ, පශ්චාත් යුධ සහ ගැටුම් බලපෑ සමාජවලට විශේෂයෙන් අදාළ වන යුද්ධය සහ සාමය පිළිබඳ මහජන අදහස් සහ අපේක්ෂාවන් සමඟ කටයුතු කිරීමට ඇයගේ පර්යේෂණ අත්දැකීම් ඇයට හේතු වී තිබේ.

**ප්‍රදීප් පීරිස්** කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අංශයහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් හි නිර්මාතෘවරයා ද වේ. ඔහු ශ්‍රී ලංකාවේ ෆෙඩරල් විවාදයේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය දක්වා වූ විෂය පරාසයක් පිළිබඳව ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇත. ඔහු රුචිකත්වයක් දක්වන පර්යේෂණ විෂය ක්ෂේත්‍රයන් අතර ගැටුම් නිරාකරණය, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, දේශපාලන පක්ෂ, පළාත් පාලනය සහ දකුණු ආසියාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ තත්ත්වය ආදිය සුවිශේෂී වේ.

**කුෂ්මිලා රණසිංහ** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂකවරියකි. ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයෙන් නීතිවේදී උපාධියක් ලබා ඇති අතර ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ද ලබා ඇත.

**ශෂික් සිල්වා** සමීක්ෂණ පර්යේෂකයෙකු, ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂකයෙකු සහ ගුණාත්මක පර්යේෂකයෙකු ලෙස වසර 15 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. ඔහු මීට පෙර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් හි සහ ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙහි ව්‍යවහාරික පර්යේෂණ ඒකකය සමඟ වැඩ කටයුතු සිදු කර ඇත. ඔහු දැනට ශ්‍රී ලංකා සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ පර්යේෂකයෙකු සහ පරිපාලන කළමනාකරුවෙකු වශයෙන් කටයුතු කරනු ලබයි. ඔහුගේ ප්‍රධාන පර්යේෂණ ලැදියාවන් වන්නේ ශ්‍රී ලංකාවේ සංහිඳියාව පිළිබඳ බහුවිධ ආඛ්‍යාන අර්ථනිරූපණය කිරීම, යුක්තිය සඳහා පුරවැසියන්ගේ අභිලාෂයන් අවබෝධ කර ගැනීම සහ පළාත් පාලනයට අදාල අන්තර්කරණය සහ බැහැර කිරීම පිළිබඳ ගැටළු ආදී විෂය ක්ෂේත්‍රයන් ය. ඔහු මහජන මත විමසුම් පර්යේෂණ සඳහා වන ලෝක සංගමයේ [World Association for Public Opinion Research (WAPOR)] සාමාජිකයෙකු වන අතර, වර්ෂ 2019 සිට එමඟින් සංවිධානය කරනු ලබන වාර්ෂික සම්මන්ත්‍රණවලදී ඔහුගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර ඇත.

# පෙරවදන

ශ්‍රී ලාංකික සන්දර්භය තුළ කොවිඩ්-19 වසංගතයේ දිගු කාලීන ප්‍රතිවිපාක සුවිශේෂයෙන් ගැටළු සහගතය. රජය කෙරෙහි ඇති මොනයම් හෝ මහජන ප්‍රසාදයක් වේ නම් එය පදනම් වී ඇත්තේ සාපේක්ෂව අඩු මරණ සහ ආසාදිත සංඛ්‍යාව මතය. එහෙත් සෞඛ්‍ය අර්බුදයෙන් ඔබ්බට, එනම් ආණ්ඩුකරණයට අදාළ තත්වය සළකා බැලීමට ජනතාව උනන්දු වී නැති බව පෙනේ. වඩාත්ම සැළකිල්ලට භාජනය විය යුත්තේ එයයි.

විධායක බලයේ අත්‍යන්ත වර්ධනයටත්, මිලිටරීකරණයටත් අවශ්‍ය ඉතා හොඳ හේතුවක් කොවිඩ්-19 වසංගතය මඟින් සපයා ඇත. මාස 3 ක් පමණ කාලයක් දක්වා පාර්ලිමේන්තුව නොකැඳවූ අතර, එම නිසා මහජන මූල්‍ය පරිපාලනය පිළිබඳ කිසිදු ව්‍යවස්ථාදායක අධීක්ෂණයක් නොවීය. වසංගතය ප්‍රධාන වශයෙන්ම කළමණාකරණය කෙරෙන්නේ හමුදාපති ශවේන්ද්‍ර සිල්වාගේ නායකත්වයෙන් ඒ සඳහාම පත්කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකායකින් වන අතර, විනයගරුක සමාජයක් ස්ථාපනය කිරීමටත් නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා උරුමයන් පිළිබඳ සොයා බැලීමටත් පත්කරන ලද, සේවයේ නියුතු සහ විශ්‍රාමික හමුදා නිලධාරීන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් තවත් එවැනි කාර්ය සාධක බලකා බොහෝ ප්‍රමාණයක්ද ඊට සමාන්තරව පවතී. විශේෂයෙන්ම නැගෙනහිර පළාත පිළිබඳ සොයාබැලීමට පත්කළ කාර්ය සාධක බලකාය තුළ අදාළ පළාතෙහි බහු වාර්ගිකත්වය නියෝජනය නොවීම සැළකිය යුතු කරුණකි. සමාජ පර්යාය රෙගුලාසි ඔස්සේ පවත්වාගෙන යන අතර, තමන්ගේ වචනය රජයේ ප්‍රතිපත්තිය බවට පත්වන බව ජනාධිපතිවරයා පැහැදිලිව ප්‍රකාශ කර ඇත. එසේම කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත වැනි නීති සම්මත කරගැනීමට දැඩි කලබලයක් තිබූ නමුත්, දේශපාලන පක්ෂ හා සිවිල් සමාජ සංවිධාන විසින් එහි වලංගුභාවය ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක්කළ බවද සිහිපත් කළ යුතුය. අධිකරණයේ තීන්දුවට අනුව පනත සම්මත කිරීමට පෙර සංශෝධනය කරන්නට යෙදුණි.

දේශපාලන විධායකය කෙරෙහි තිබූ සංවරණ හා තුලන බොහොමයක් ඉවත් කළ 20 වැනි සංශෝධනය හරහා වේගවත් වූ විධායක අත්තනෝමතිකත්වය, මිලිටරීකරණයෙහි උදව්වෙන් තවදුරටත් වර්ධනය වී ඇත. ඉහත සඳහන් කළ කාර්ය සාධක බලකා වලට අමතරව දිස්ත්‍රික්ක 25

තුළම නිරෝධායන කටයුතු වල ප්‍රධාන සම්බන්ධීකාරකවරුන් ලෙස හමුදා නිලධාරීන් පත්කොට ඇත්තේ ඉතා විශාල බලතල ප්‍රමාණයක් සමගිනි. නිරෝධායන නීති උල්ලංඝණය කරන්නන් සිර භාරයට ගැනීම සඳහා ගුවන් හමුදා ඩ්‍රෝන සහ හමුදා කඩිනම් ප්‍රතිචාර ආරෝහක කණ්ඩායම් භාවිතයට ගැනේ. ඒත් සමගම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිවිල් සමාජ අවකාශය සංකෝචනය කිරීමත්, විශේෂයෙන්ම උතුරු නැගෙනහිර සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට හිරිහැර සහ තර්ජනය කිරීමත් දිගින් දිගටම සිදුවේ. හදිසි නීතිය සම්බන්ධ පූර්ව අත්දැකීම් වලින් අප උගෙන ඇති පරිදි මෙහි සැබෑම අනතුර වන්නේ තත්වය කළමණාකරණය කරගැනීමට යැයි කියමින් හඳුන්වා දෙන භාවිතයන් සහ ක්‍රියාවලීන් සාමාන්‍ය ලෙස සැළකීමට සමාජය හුරු වීමේ ප්‍රවණතාවයයි.

මෙම කෘතිය තුළින් මේ කරුණු වලට අදාළ ප්‍රශ්න නඟනු ලැබේ. එහිදී ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, ආණ්ඩුකරණය, වසංගතයේ සුබසාධන බලපෑම, වාර්ගික සම්බන්ධතා, නිදහස් අධ්‍යාපනය, සංක්‍රමණික ශ්‍රමිකයින් සහ දේශපාලන අනුග්‍රාහකත්වය යන කරුණු සාකච්ඡා කෙරේ. මෙහි අන්තර්ගතය තුළින් අදාළ කරුණු අරබයා සංවාද හා විවාද සිදුවනු ඇති බව මගේ විශ්වාසය වන අතර, එම නිසා වඩා යහපත් ආණ්ඩුවක් සහ ආණ්ඩුකරණයක් ශ්‍රී ලංකාවේ ඇති කිරීමට මෙම කෘතිය දායක වනු ඇති බවද මම විශ්වාස කරමි.

**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# පූර්විකාව සහ ස්තුතිය

වසංගත තත්වයක් යනු සෞඛ්‍ය අර්බුදයක් පමණක් නොවේ. ඒවා මගින් තත්කාලීන සමාජයටද නොමැකෙන සළකුණක් එකතු කරයි. වසංගත තුළින් සමාජ අත්දැකීමෙහි ඇති කරන්නා වූ පෘශ්‍ය සහ අස්පෘශ්‍ය පරිවර්තනයන් ඉතා දැඩිව විමසුමට ලක් කළ යුතුය. මානව මතකයේ නෛසර්ගික දුර්වලතා නිසා මෙවැනි අත්දැකීම් සහ ඒවා පිළිබඳ විවේචනාත්මක විග්‍රහයන් ලේඛනගත කර තැබිය යුතුය. අප වර්තමානයේ අත්විඳිනා අන්දමේ ප්‍රශ්නකාරී අත්දැකීම් වලට නැවත මුහුණ නොදීමට වගබලා ගැනීම සඳහාද එය වැදගත් වේ.

*ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා කිහිපයක්* යන නමින් දොරට වඩින මෙම කෘතිය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (Social Indicator) හි මූලිකත්වයෙන් එළි දුටුවකි. වර්ෂ 2021 පෙබරවාරි-මාර්තු දෙමස පුරා සෝෂල් ඉන්ඩිකේටර් මගින් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලද 'Socio-Economic Index in the Face of COVID-19' නමැති සමීක්ෂණයේ අරමුණ වූයේ කොවිඩ්-19 වසංගතයේ පළමු සහ දෙවන රැළි දෙක තුළ ශ්‍රී ලාංකිකයන්ගේ අත්දැකීම් සහ ආකල්ප පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමය. එහි සොයාගැනීම් වලින් වැටහී ගිය කරුණක් වූයේ එම තේමා පිළිබඳ වඩා ගැඹුරු අධ්‍යයනයක් අවශ්‍ය බවයි. ව්‍යාපෘති කණ්ඩායමේ සිත් වල කෘතියක් පිළිබඳ අදහසක් පළමු වරට ජනිත වන්නේ ඒ අනුවය.

එසේ ආරම්භ වූ මෙම කෘතියෙන් අධ්‍යයනයට ලක් කරනු ලබන්නේ කොවිඩ්-19 වසංගතයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික සහ සමාජ ජීවිතයට එල්ල කරන ලද බලපෑමත්, එමගින් අප සමාජයේ දේශපාලන සංස්කෘතියෙහි ඇති කරන ලද පරිවර්තනයනුත් ය. වසංගතය හා සටන් කිරීම සඳහා රජයෙන් ගන්නා ලද ප්‍රතිපත්ති තීරණ හා මූලෝපායික ක්‍රියාමාර්ගයන් සමාජය කෙරෙහි එල්ල කර ඇති බලපෑම කෙබඳුද? එම ප්‍රතිපත්ති තීරණ හා මූලෝපායික ක්‍රියාමාර්ගයන් ආණ්ඩුකරණය, සෞඛ්‍යය අධ්‍යාපනය වැනි දේ සමාජයේ සැම අතර සාධාරණව බෙදා හැරීමට කුමනාකාරයේ බලපෑමක්

එල්ල කර ඇතිද? කෘතියේ විවිධ පරිච්ඡේද තුළින් මෙම ගැටළු වලට පිළිතුරු සෙවීමත්, එහිදී සමාජයේ එක් එක් කණ්ඩායම් වල අත්දැකීම සහ ඔවුන්ගේ අනාගතයට එහි බලපෑමත් තේරුම් ගැනීම අරමුණු කරයි.

පෙර දැක්වූ සමීක්ෂණය සහ මෙම කෘතිය යන ද්විත්වයම Global Initiative for Justice, Truth and Reconciliation (GIJTR) ආයතනයේ ව්‍යාපෘතියක් තුළින් සාක්ෂාත්කරණය වූ ඒවාය. සෝෂල් ඉන්ඩිකේටර් වෙනුවෙන් එම ආයතනයට මගේ හෘදයාංගම ස්තුතිය මෙම අවස්ථාවේ ප්‍රකාශ කරමි. සෝෂල් ඉන්ඩිකේටර් කණ්ඩායම් සාමාජිකයන් වන එම්. ක්‍රිෂ්ණමූර්ති, හසන්තා ගමගේ සහ සකිනා මොයිනුඩීන් ගේ නොමඳ සහය ලැබීමටද වාසනාවන්ත වීමි. එසේම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂක භවානි ෆොන්සේකාගේ දායකත්වය මෙහිදී සඳහන් නොකළහොත් එය බරපතල මඟ හැරීමක් වනු ඇත.

මෙම කෘතියේ පරිච්ඡේද වලට දායක වී ඇති සියළු ලේඛකයන් අතර නිරන්තරයෙන් සිදුවූ සංවාද වලින් ඔවුන්ගේ පරිච්ඡේද පෝෂණය වී ඇති බව කිව යුතුය. ඔවුන්ගේ කණ්ඩායම් මානසිකත්වය හා ශාස්ත්‍රීය දැනුම් සම්පාදනයට ඇති කැපවීම මෙම අර්බුදකාරී අවස්ථාවේ මෙවැනි අර්ථාන්විත මැදිහත්වීමක් කිරීමට සැපයූ දායකත්වය වචනයෙන් කිව නොහේ. කෘතියේ සම්බන්ධීකරණ වගකීම ඉටුකළ හසිනි ලේකම්වසම්ගේ භූමිකාවද මෙහිදී අමතක කළ නොහැක්කකි. පර්යේෂණ සහාය ලබාදුන් අමාරා නිලාෆ්දීන්ටද මෙම අවස්ථාවේ මගේ කෘතඥතාවය පුද කරනු කැමැත්තෙමි.

පිටු සැකසුම් සංස්කරණ ශිල්පී ඉෂාන් අමරවීරගේ වෘත්තීය සහාය සහ විශේෂඥ දැනුම මෙම කෘතිය සම්පූර්ණ කිරීමෙහි ලා මහඟු පිටිවහලක් විය. මෙම කෘතියෙහි ඉංග්‍රීසි පිටපත මුද්‍රණ කටයුතු කරන ලද මුද්‍රණායතනය වන කරුණාරත්න සහ පුත්‍රයෝ හි සියල්ලන්ගේ කැපවීම සහ උත්සහයද මෙහිදී සිහි කැඳවිය යුතුය. මෙම දෙපාර්ශ්වයටම මගේ හද පිරි කෘතඥතාවය පුද කරනු ලබන්නේ ඔවුන්ගේ සහයෝගය වෙනුවෙන් මෙන්ම, ඉතා කෙටි කාලයක් තුළදී අපගේ මුද්‍රණ අවශ්‍යතා ඉටුකර දීමද වෙනුවෙනි.

කෘතියේ අන්තර්ගතය තුළින් මහජනතාවගේ අවධානය උනන්දු කරන්නේ නම් සහ ඒ හරහා මෙම තේමා පිළිබඳ වැඩිදුර ගවේෂණය සහ විවාදයට මංපෙත් විවර වන්නේ නම් මගේ වෑයම සාර්ථක බව සිතමි.

# 1

# හැඳින්වීම

# ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා

***ප්‍රදීප් පීරිස්***

ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද? විවිධ රාජ්‍යයන් වල කොවිඩ් මර්දන වැඩපිළිවෙලවල් හරහා සිදුවිය හැකි හානිය තක්සේරු කිරීමේදී ලෝක ආණ්ඩුකරණ ධුරාවලියේ ඉහළම සිටින්නන්ගේ ප්‍රතිචාරය තුළ පවා මේ ප්‍රශ්නය අරබයා හටගත් සන්ත්‍රාසයක් ගැබ්ව ඇත. නිදසුනක් ලෙස එක්සත් ජාතීන්ගේ මහ ලේකම් අන්තෝනියෝ ගුටේරස් (Antonio Gueterres) විසින් වර්ෂ 2020 අප්‍රේල් මාසයේදී අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ කොවිඩ් වසංගත අර්බුදය ඉතා සීඝ්‍රයෙන් මානව හිමිකම් අර්බුදයක් බවට පත්වෙමින් පවතින බවයි. වසංගතය මැඬ පැවැත්වීමට යැයි කියමින් වසංගත තත්වයට කිසිදු සම්බන්ධයක් නොමැති හේතූන් මත ඉතා මර්දනකාරී ක්‍රියාමාර්ග ගැනීමට එමගින් ඉඩ සැලසීමේ අවදානමක් පවතින බව ඔහු වැඩිදුරටත් දක්වා ඇත (Choukroune, 2020). ජාත්‍යන්තර සිවිල් සමාජය විසින්ද මෙම අදහස දක්වා තිබේ. 2020 වර්ෂය සඳහා වූ විශේෂ වාර්තාවක් තුළින් Freedom House ආයතනය පෙන්වා දෙන්නේ අධි වසංගතයේ පැතිරී යෑමත් සමඟ ලොව රටවල් 80 ක ප්‍රජාතන්ත්‍රවාදයේ සහ මානව හිමිකම් වල තත්වය වඩාත් නරක අතට හැරී ඇති බවයි (*Democracy under Lockdown,* 2020). මෙම කෘතිය තුළින්ද මූලිකව අවධානයට ලක් කරන්නේ වසංගතයට දක්වන ලද ප්‍රතිචාරයේ ඍණාත්මක බලපෑම් පිළිබඳවය. එහි පරිච්ඡේද 07 හරහා ශ්‍රී ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය තුළ සමාජ-දේශපාලන වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී පදනම හායනයට ලක්කර ඇත්තේ කෙසේදැයි යන්න විවිධ දෘෂ්ඨිකෝණයන් ඔස්සේ සාකච්ඡාවට ලක්කරනු ලබයි.

කොවිඩ් වසංගතය හමුවේ සමස්ත ලෝකයම දණ ගැස්වී ඇත. එය පසුගිය සියවස තුළ ලෝකය මුහුණ දුන් බැරෑරුම්ම සෞඛ්‍ය අර්බුදය පමණක් නොව, එවැනි ගැටළුවකට රජයන් විසින් දක්වන ලද වඩාත් අදහාගත නොහැකි හා පෙර නොවූ විරූ ආකාරයේ ප්‍රතිචාර සහිත අර්බුදයද වේ (චීබබ් සහ වෙනත්, 2020). දියුණු වූ සහ වෙමින් පවතින සියළු රටවල් මෙම සෞඛ්‍ය අර්බුදය කළමණාකරණය කරගැනීම සඳහා දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරන අතර, ඒවා සමහර අවස්ථා වල අර්බුදයට සාපේක්ෂව සාධාරණීකරණය කළ නොහැකි මට්ටමේ ඒවාය. මෙම වසංගතයේ බැරෑරුම් බව මේ වනවිට පැහැදිලිව පෙනෙන්නට තිබුණද, ලොව පුරා ආණ්ඩු විසින් ඊට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් ඇති කරන ලද බලපෑම තේරුම් ගැනීමට තවත් කාලයක් ගතවනු ඇත. මෙහි විවිධ පැති මානයන් පිළිබඳ දැනටමත් ශාස්ත්‍රීය ලිපි ලේඛන බොහෝමයක් රචනා වෙමින් පවතී. එකී පැතිකඩ අතර වසංගතයෙන් සිවිල් නිදහසට එල්ල කරන බලපෑම (Coppedge et al, 2011), ලොව පුරා කොවිඩ් ප්‍රතිචාරයන් තුළ බලතල බේදීම සහ නීතියේ ආධිපත්‍යය වැනි පිළිගත් මූලධර්ම උල්ලංඝණයට ලක්ව ඇති ආකාරය මෙන්ම, එමගින් රාජ්‍යයේ බලය හා ක්‍රියාවන් සංවරණය කිරීමට ඇති හැකියාව අවම වීම (Zwitter, 2012) වැනි කරුණු දක්නට ඇත.

වසංගතය මගින් ජනිත කර ඇති භීතිය නිසා, සෞඛ්‍ය අර්බුදය කළමණාකරණය කිරීමේ නාමයෙන් සිය අයිතිවාසිකම් හා නිදහස කප්පාදුව සම්බන්ධයෙන් ජනතාව තුළ යම් ආකාර අනුමතියක් ඇතිව තිබේ. රටවල් 14 කින් ලබාගන්නා ලද දත්ත මත පදනම්ව (Chen et al, 2021) පෙන්වා දෙනු ලබන්නේ රටක කොවිඩ් ප්‍රතිචාරය සම්බන්ධයෙන් ඇති මහජන ප්‍රසාදයේ තරම තීරණය වන්නේ ආසාදිතයින් සහ මරණ සංඛ්‍යාව මත පදනම්ව මිස ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් මත පදනම්ව නොවන බවයි. එම නිසා වසංගතය පිළිබඳ ඇති භීතියෙන් පෙළෙන ජනතාවගේ අවධානයට, වසංගත ප්‍රතිපත්ති හරහා සිය රටේ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයෙහි අඩු වීමේ යථාර්ථය බඳුන් නොවේ. ලෙවිට්ස්කි සහ සිබ්ලත් (Levitsky and Ziblatt 2018) සිය කීර්තිමත් *How Democracies Die* කෘතිය හරහා පෙන්වා දෙන පරිදි, 1970 දශකයේ සිට ලෝක ඉතිහාසය සැළකූ විට ප්‍රජාතන්ත්‍රවාදය සන්නද්ධ කුමන්ත්‍රණ හරහා නැතිවනු වෙනුවට සිදුව ඇත්තේ කෙමෙන් වියැකී යාම තුළින් මරණයට පත්වීමයි. වසංගතය විසින් හඳුන්වා දෙනු ලැබ ඇති හදිසි තත්වය හා එය දිගටම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳව ඇති එකඟතාවය නිසා, මෙසේ ප්‍රජාතන්ත්‍රවාදය කෙමෙන් මරණයට පත්වීමට අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ වෙමින් පවතින බව පෙනෙන්නට තිබේ. ශ්‍රී ලංකාවේ ජනතාව සිය ආණ්ඩුවේ කොවිඩ් ප්‍රතිපත්ති වලට දක්වනු ලබන ප්‍රතිචාරය හා රෝග යට ‘ප්‍රතිකර්මයක්’ වශයෙන් හඳුන්වා දෙනු ලැබ ඇති ක්‍රියාමාර්ග හරහා රටේ ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරන බලපෑම පිළිබඳ මෙම කෘතියෙන් අවධානය යොමු කරන්නේ මෙවැනි පසුබිමකය.

ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණ ප්‍රතිචාරයෙහි ක්‍රියා පටිපාටි, නීති-රීති සහ තර්කනයන් තුළ කැටිව ඇති භයානක දේශපාලන ගම්‍යයන් තේරුම් ගැනීම සඳහා මෙම කෘතිය යම් සංකල්පීමය රාමුවක් තුළ ස්ථානගත වේ. පහතින් දක්වා ඇත්තේ එහි මූලිකාංග ය.

## වසංගත ආණ්ඩුකරණ මානසිකත්වය

ප්‍රංශ දාර්ශනිකයකු වූ මිෂෙල් ෆූකෝ විසින් ‘ආණ්ඩුකරණ මානසිකත්වය’ (governmentality) යන පදය හඳුන්වා දෙන ලද්දේ මිනිසුන්ගේ හැසිරීම හැඩ ගැස්වීම සහ නියාමනය කිරීම සඳහා භාවිතා කරන රීති පද්ධතියක් අරුත් ගැන්වීමටය (Li,2007). ෆූකෝට (Foucault) අනුව ආණ්ඩුකරණ මානසිකත්වය යනු:

> ඉතාම නිශ්චිත සහ සංකීර්ණ ආකාරයේ බලයක් හැසිරවීම සඳහා අවශ්‍ය කරන්නා වූ ආයතන, ක්‍රියා පටිපාටි, විශ්ලේෂණ සහ ආවර්ජනා සමුදාය වේ. එහි මූලිකම අරමුණ ජනගහණය පාලනය කිරීමයි; එහි දැනුමේ මූලිකම ප්‍රභවය දේශපාලන ආර්ථිකය වේ; එමෙන්ම එහි ප්‍රායෝගික තාක්ෂණය ක්‍රියාත්මක වන්නේ රාජ්‍යයේ ආරක්ෂක පද්ධති තුළිනි. (බර්ෂෙල් සහ වෙනත්, 1991, පිටු අංක 102 හි උපුටා දක්වා ඇති පරිදි)

ෆූකෝගේ දැක්ම තුළ ආණ්ඩුව යනු දේශපාලන පද්ධතීන් සහ රාජ්‍යයන්ගේ කළමණාකරණයට එහා ගිය දෙයකි. එමඟින් පුද්ගලයින් සහ කණ්ඩායම් වල හැසිරීම හසුරුවන බව ඔහු විශ්වාස කළේය. ඒ අනුව ඔහුගේ තර්කය වූයේ “ආණ්ඩුකරණ මානසිකත්වය යනු අනෙක් අයගේ ක්‍රියා වල භව්‍ය ක්ෂේත්‍රය පාලනය කිරීමයි” (Foucault, 2002, p. 336). ආණ්ඩුවේ කාර්යභාරය බවට ඒ අනුව පත් වන්නේ “ජනගහණයේ සුබසාධනය සැලසීමත්, ඔවුන් ජීවත් වන කොන්දේසි වල තත්වය ඉහළ දැමීමත්, ඔවුන්ගේ ධනය, ආයු කාලය, සෞඛ්‍යය වැනි කරුණු වල වැඩි වර්ධනයත්ය” (Burchell et al, 1991, p. 100). කෙසේ වුවත් සෑම පුද්ගලයකුටම බල කිරීමට ධාරිතාවක් ආණ්ඩුවට නොමැති නිසා ආණ්ඩුව කරන්නේ “ස්වාර්ථය සලසා ගනු රිසි පුද්ගලයින් මෙම නීති රීති වලට අවනත විය යුතු තැනට වැඩ සැලසීමයි” (Scott, 1995, p. 202). නූතන ආණ්ඩුකරණ ක්‍රියාවලිය පටිපාටි, නීති-රීති සහ තර්කනයන් සමූහයක සංකීර්ණ ජාලාවක් වශයෙන් ක්‍රියාත්මක වන්නේ ඒ අනුවය. ලි (2007, පිටුව 275) දක්වන ආකාරයට “බලය දුර සිට ක්‍රියාත්මක වන විට එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය අපෙන් ගිලිහේ. එවැනි අවස්ථා වල අපේ කැමැත්ත ඇතිව පාලනය කිරීම පිළිබඳ ප්‍රශ්නය අදාළ නැත.”

වසංගත තත්වය තුළ ජනිත කර ඇති අර්බුදයේ උත්සන්න භාවය පිළිබඳ මානසිකත්වය තුළින් මෙම ක්‍රියාවලිය තවදුරටත් මුල්බැස ගෙන තිබේ. එහිදී තමාගේ සෞඛ්‍යය රැකගැනීම තුළ ස්වාර්ථය සැලසෙන නිසා නියම

කර ඇති පරිදි සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමට සෑම පුද්ගලයෙකුටම පෞද්ගලික අවශ්‍යතාවයක් ඇතිවේ. එම නිසා මෙම තත්වය පවත්වා ගැනීමට යැයි කියමින් ආණ්ඩු විසින් පුරවැසි ජීවිතය වැඩි වැඩියෙන් පාලනයට හා අධීක්ෂණයට යටත් කිරීම පිළිබඳ පුරවැසියන් එතරම් තැකීමක් නොකරනවාක් මෙන්ම, ඒ පිළිබඳ සමහර අවස්ථා වල ඇත්තෙන්ම ප්‍රසාදයෙන් යුතුව දැකීමට පෙළඹී ඇත. එමගින් මෙම තත්වය තවදුරටත් සාමාන්‍යකරණය වන අයුරු ඊළඟ කොටසේ සාකච්ඡා කෙරේ.

## ව්‍යතිරේඛ තත්වය, වසංගතය සහ ආඥාදායක පාලනය

ලොව පුරා රටවල් කොවිඩ් වසංගතයට දක්වන ලද ප්‍රතිචාර අතර දේශසීමා වසා දැමීම්, නිරෝධායන ඇඳිරි නීතිය, පෙර නොවූ විරූ ආකාරයේ ආර්ථික උද්දීපන පැකේජ, ආසාදිතයන් අධීක්ෂණය හා ආසාදිත ප්‍රතිශතය ගණනය කිරීම සඳහා ඩිජිටල් ක්‍රම භාවිතය වැනි බොහෝ ක්‍රියාමාර්ග විය. සමහර නායකයන් විසින් මෙය හදිසි තත්වයක් වශයෙන් හඳුන්වා දෙමින් එය ජනතාවගේම යහපත සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයක් වශයෙන් පෙන්වා දීමේ ප්‍රවණතාවක්ද තිබේ. ඉතාලි ජාතික චින්තකයකු වන ජෝජියෝ අගම්බෙන්ට අනුව මෙසේ හදිසි තත්වය සාමාන්‍යකරණය කිරීම ඔස්සේ ආණ්ඩුවක් අර්බුද අවස්ථාවකදී සිය බලය වැඩිකර ගැනීම තුළ 'ව්‍යතිරේක තත්වයක්' (state of exception) නිර්මාණය වන බව දක්වා තිබේ (Agamben, 2005). ඔහු පෙන්වා දෙන්නේ මෙවැනි අසාමාන්‍ය ආකාරයේ බලය ව්‍යාප්ත කිරීම් නිසා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් අධි ආඥාදායක ආකාරයේ පාලන ක්‍රමයන් (totalitarian regimes) බවට පත්වීමේ අනතුරක් පවතින බවයි. ඉතාලි ආණ්ඩුවේ කොවිඩ් ප්‍රතිචාරය පිළිබඳ අදහස් දක්වන ඔහු පවසන්නේ එතුළ වියරු, අතාර්කික සහ කිසිසේත් සාධාරණීකරණය කළ නොහැකි ආකාරයේ හදිසි ක්‍රියාමාර්ග රාශියක් තිබූ බවයි (Agamben, 2020). ඔහුගේ විශ්ලේෂණයට අනුව මෙවැනි ක්‍රියාමාර්ග ඔස්සේ ආණ්ඩු උත්සහ කරන්නේ මතු දක්වන ලද ව්‍යතිරේක තත්වය සාමාන්‍ය ආණ්ඩු කිරීමේ මාදිලියක් බවට පත්කොට ඒ ඔස්සේ සාමාන්‍යකරණය වන විධායක ආඥා හරහා මිලිටරීකරණය හඳුන්වා දීමටය. ඇමෙරිකාවේ හිටපු ජනපති ඩොනල්ඩ් ට්‍රම්ප්ද ඇතුළුව බොහෝ නායකයන් විසින් වසංගතය යුධ තත්වයකට සමාන කිරීම හරහාය ඊට දක්වන ලද ප්‍රතිචාරයට මහජන සහයෝගය ලබාගත්තේ. එහිදී දැඩි ආරක්ෂක විධිවිධාන හඳුන්වා දීමට ප්‍රතිරෝධයක් එල්ල නොවුනේ ඒ අනුව බව ඔහුගේ දැක්මයි. ඩයස් සහ ඩෙලචි (Dias and Deluchey 2020) ට අනුව වසංගතය යුද්ධයකට සමාන කිරීම හරහා සිදුවන්නේ ආණ්ඩුකරණය තුළ ආරක්ෂක ව්‍යුහයන් හා ව්‍යතිරේක තත්වය සාමාන්‍යකරණය වීම පමණක් නොව,

නව ලිබරල් ආණ්ඩු වලට හඳුන්වා දීමට අවශ්‍යතාවය ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණද වඩාත් ගැඹුරින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකසා දීමයි (පිටුව 3). ''කොවිඩ් නමැති අදෘෂ්‍යමාන සතුරා නිසා ජනතාවගෙන් නැවත වාරයක් බලාපොරොත්තු වන්නේ කීකරු භාවය හා ආණ්ඩුවේ බලයට කැමැත්තෙන් යටත් වීම වන අතර, ආණ්ඩුකරණ ක්‍රමෝපායන් වලින් අරමුණු කරන්නේ මෙම යුද්ධය ඇති කිරීම හා අදෘෂ්‍යමානව පවත්වාගෙන යෑමය'' (ඉහත එම).

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය වර්ගීකරණයේ කොතනක සිටියත්, එනම් පටිපාටිමය, හරයාත්මක, ශක්තිමත් හෝ දුර්වල යන කුමනාකාරයේ ප්‍රජාතන්ත්‍රවාදයක් වුවත්, කොවිඩ් වෛරසය නැවැත්වීම සඳහා ප්‍රශ්නයට සාපේක්ෂව සාධාරණීකරණය කළ නොහැකි ආකාරයේ ප්‍රතිචාර භාවිතා කරනු දක්නට ලැබේ. මෙම ප්‍රතිචාර සාමාන්‍යයෙන් වෛරසය නැවැත්වීමට සහය වුවත්, බොහෝ කොටම පුද්ගල නිදහස කප්පාදු කරන ආකාරයේ ඒවාය. ඒවා සාමාන්‍යයෙන් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් වල තහවුරු කොට තිබෙන, සහ ඉතාම නිශ්චිත තත්වයන් යටතේ මිස සීමා කළ නොහැකි ආකාරයේ අයිතීන් වේ (Coppedge et al, 2011). ඊට අමතරව සහ කලින්ද පැවසූ පරිදි ''ඉක්මණින් ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාව, රාජ්‍යයේ ක්‍රියාවන් සංවරණය කරන හා සිරස් වගවීම තහවුරු කරන බලතල පංගු කිරීමේ න්‍යාය සහ නීතියේ ආධිපත්‍යය පිළිබඳ මූලධර්ම හා ගැටේ'' (Zwitter, 2012, p. 100). එම නිසා වසංගත තත්වය තුළ දැකිය හැකි වන්නේ දේශපාලන විධායකය ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය අතික්‍රමණය කර ඇති බවයි (Engler et al, 2021). හින්රිච්සන් (Hinrichesen) අනතුරු හඟවන පරිදි වසංගත තත්වය ජාතිවාදී තර්කනයන් ප්‍රතිසංවිධානය කිරීමට සහ නැවත පණ ගැන්වීමට, ආඥාදායක ආකාරයේ ආණ්ඩුක්‍රමයන් නැවත කරළියට ගෙන ඒමට, සහ ව්‍යතිරේඛ තත්වය සාමාන්‍ය ආණ්ඩුකරණ මාදිලියක් වශයෙන් පොදුජන විඥානය තුළ සාමාන්‍යකරණය කිරීමට භාවිතා කරන ආකාරය පිළිබඳ අප විමසිලිමත් විය යුතුය (2020).

## වසංගතය සහ නව ලිබරල්වාදය

ලිබරල්වාදයේ කුමන ප්‍රභේදයෙන් වුවත් අපේක්ෂා කරන්නේ පුරවැසි ජීවිතය තුළ අවම රාජ්‍ය මැදිහත්වීම වුවද, එහි නව ප්‍රවර්ගය (එනම් නව ලිබරල්වාදය) තුළින් ඊට අවශ්‍ය කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ බලෙන් හෝ හඳුන්වා දීම සඳහා අර්ධ-ආඥාදායක ස්වරූපයේ දේශපාලන නායකත්වයක් ඉල්ලා සිටීම රසවත් ප්‍රතිවිරුද්ධතාවකි. මෙය විශේෂයෙන්ම දියුණු වෙමින් පවතින රටවල දැකිය හැකි තත්වයක් වුවත් දියුණු රට වලද

නැත්තේ නොවේ. මෙසේ රාජ්‍යයේ ආයතන පද්ධතිය කොහොමටත් දුර්වල වෙමින් පැවති තත්වයක් යටතේ ඇති වූ වසංගත තත්වය එම දුර්වල රාජ්‍යයට පැමිණි කුණාටුවක් බඳු විය. ඇල්ෆ්‍රෙඩෝ සාඩ්-ෆිල්හෝ (Alfredo Saad-Filho) දක්වන පරිදි;

> වෙළඳපොළෙහි වඩා උසස් යැයි කියාගන්නා කාර්යක්ෂමතාවයෙහි නාමයෙන් දශක හතරක් මුළුල්ලේ රාජ්‍යයේ හැකියාව හායනයට ලක් කළ, ගෝලීයකරණය වන නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඉඩ සැදීමට පවතින කර්මාන්ත දුර්වල කළ, රාජ්‍යය ඇපයට තබා බිඳෙන සුළු මූල්‍ය පද්ධතීන් නිර්මාණය කළ, කෙටි කාලීන ලාභය වෙනුවෙන්ම කැප වූ නව ලිබරල්වාදී පසුබිමකටය කොවිඩ් වසංගතය පැමිණෙන්නේ (2020, පිටුව 478).

"නව ලිබරල්වාදයෙන් අපේ මහජන සේවා බාදනය වන්නට ඉඩ හැර, අධ්‍යාපනය සහ සෞඛ්‍යය ලාභ උපයන ව්‍යාපාර බවට පත්කොට, ඌන තක්සේරුවට ලක්ව අඩුවෙන් වැටුප් ලබන කම්කරුවන්ගේ සූරාකෑම මතින් ලාභ ලබා, මානව සුබසිද්ධියට ඉහළින් මිලිටරීකරණය වූ ලෝකයක උපයා ගතහැකි ලාභයට ප්‍රමුඛස්ථානය ලබාදී, මිනිසුන් සහ රටවල් අතර අසමානත්වය වඩාත් තීව්‍ර කොට තිබූ මොහොතක" (Isakovic, 2020) වසංගතය මගින් එම තත්වය උත්සන්න කොට සාමාන්‍යකරණය කරන ලද බව පැවසිය හැකිය. ඒ අතින් ගත් කළ වසංගතය ඔය කියන්නා වූ ආකාරයේ 'මහා සමපාතකයක්' (Bowleg, 2020; Marmot and Allen, 2020) නොවූ බව පැහැදිලිය. ඉසකොවිච් (Isakovic) (2020) ට අනුව නිරෝධායන නීති වලට අවනත වීමට සහ වසංගතයේ ආර්ථික හා මානසික බලපෑමෙන් යථා තත්වයට පත්වීමට කෙනෙකුට ඇති හැකියාව තීරණය වන්නේ වයස, ස්ත්‍රී-පුරුෂ භාවය, සමාජ පන්තිය හා භූගෝලීය සාධක වැනි සමාජ-ආර්ථික කරුණු මතය. මෙම කෘතිය තුළ නිතර මතු කරන මාතෘකාවක් වන සහ මෙම පරිච්ඡේදයේ ඊළඟ තේමාව වන 'ඉවත දැමිය හැකි ජීවිත' (disposable lives) සහ 'ඉවත දැමිය හැකි භාවය' (disposability) පිළිබඳ කරුණට වසංගතයේ මෙම විශේෂීකරණය වූ බලපෑම් සම්බන්ධ තර්කය ඍජුව අදාළ වේ. එහිදී කාගේ ජීවිත කාට වඩා වටින්නේද යන කරුණ වටා ඇති කතිකාව හඳුනා ගැනීම සඳහා 'මරණයේ දේශපාලනය' (necropolitics) යන රාමුව තුළ ඉවත දැමිය හැකි ජීවිත පිළිබඳ සාකච්ඡාව ස්ථානගත කරමි.

## මරණයේ දේශපාලනය සහ ඉවත දැමිය හැකි ජීවිත

නව ලිබරල් ආර්ථිකය තුළ එක් එක් ජීවිත වලට වෙනස් වටිනාකම් ලබාදීමේ කෲරත්වය වසංගතය තුළින් වඩාත් පැහැදිලිව හුවා දක්වා ඇත. මෙසේ වෙනස් වටිනාකම් අනුයුක්ත කිරීමේ අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ

සමහර ජීවිත ඉවත දැමිය හැකි ඒවා වශයෙන් වර්ගීකරණය වීම සහ එම මානසිකත්වයේ සාමාන්‍යකරණයයි. මෙම යථාර්ථය තේරුම් ගැනීම සඳහා 'මරණයේ දේශපාලනය' යන එම්බෙම්බෙ (Achille Mbembe) (2003) ගේ සංකල්පය ප්‍රයෝජනවත්ය. එම්බෙම්බෙ (Mbembe) දක්වන පරිදි යමෙකුගේ ජීවිතයේ වටිනාකම තීරණය වන්නේ ඔවුන් දේශපාලන බලයට කොතරම් සමීපද යන කාරණය මතය (Vagehese, 2021). මෙම අවස්ථාවේ ආගමික සහ වාර්ගික සුළුතර කණ්ඩායම් හා ආර්ථික වශයෙන් ආන්තීකරණය වූ කණ්ඩායම් පත්ව ඇති අනතුරේ තරම තේරුම් ගැනීම සඳහා මෙමගින් අපට තවත් එක් න්‍යායාත්මක මෙවලමක් ලබා දේ. ශ්‍රී ලංකාවේ වසංගත ආණ්ඩුකරණ මානසිකත්වය පිටුපස ඇති තර්කනය හඳුනා ගැනීම සඳහාද එය මහත් රුකුලකි.

රැකියා පරිසරය, ජීවන තත්වය, සමාජමය අවකාශය, වාර්ගික අසමානතා නිධන්ගත රෝග වැනි බොහෝ කාරණා මත වසංගතයේ බලපෑම වෙනස් වේ (සැන්ඩ්සෙට්, 2020). එක්සත් රාජධානියෙහි පිහිටි සේවාදායක අයිතීන් පිළිබඳ ආයතනයට අනුව අප්‍රිකානු, ආසියානු සහ මැද පෙරදිග කාන්තාවන් අඩු වැටුප් සහිත රැකියා කිරීමේ ප්‍රවණතාව අන් කාන්තාවන්ට වඩා දෙගුණයක් වන අතර, එම නිසා ඔවුන්ට වසංගතය වැළඳීමේ සුවිශේෂී අවදානමක් පවතී (*BAME women 'at twice the risk' of both Covid-19 and low pay, research shows,* 2020). ඒ අනුව පැහැදිලි වන්නේ යම් යම් කණ්ඩායම් වාර්ගික සහ ආර්ථික වශයෙන් මුහුණ දෙන ආන්තීකරණයන් නිසා වසංගතය වැළඳීමට ඔවුන්ට ඇති ප්‍රවණතාවය වඩා ඉහළ බවයි (Sandset, 2020). මේ සම්බන්ධයෙන් ජුඩිත් බට්ලර්ගේ අදහස් වැදගත් වේ. අනතුරට ලක්විය හැකි බව (vulnerability) ව්‍යාප්ත කර හැරීමේ, සම්පත් බෙදී යාමට අදාළ, විවිධ ක්‍රම පවතී. ඒවා නිසා යම් කණ්ඩායම් අනෙක් ඒවාට වඩා අත්තනෝමතික ප්‍රචණ්ඩත්වයට වැඩිපුර ගොදුරු වීම සිදුවේ (Butler, 2006, p. xii). සැන්ඩ්සෙට් (2020) ට අනුව වසංගතය සහ ඔඩුදුවා ගොස් ඇති සෞඛ්‍ය හා ආර්ථික විෂමතා අතර ඇති සම්බන්ධය තුළින් පෙන්වා දෙන්නේ කොවිඩ් තත්වය තුළ දක්නට ලැබෙන මරණයේ දේශපාලනය ව්‍යතිරේඛ තත්වයක ප්‍රතිඵලයක් පමණක් නොව, පවතින අසමානතා මිනිසුන් විසින් නිහඬව පිළිගැනීමේ ප්‍රතිඵලයක්ද වන බවයි. මෙහිදී ඉතාම තත් ආකාරයෙන් පවතින ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයේ බලපෑම පුද්ගලයන් විසින් නොසළකා හරිනු ලබන අතර, සමහර ජීවිත අනෙක් ඒවාට වඩා වසංගතයට ගොදුරු වීමේ වැඩි අවදානමක් පැවතීම ස්වභාවික කාරණයක් ලෙස දැකීමට එම නිසා ඔවුන් පෙළඹේ (Sandset, 2020).

වෛරසය පාලනය කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී වන හා නොවන කුමනාකාරයේ වුවද රටවල් වලට අනුගමනය කරන්නට සිදු වූ ක්‍රියාමාර්ග හේතුවෙන් ව්‍යතිරේඛ තත්වය සාමාන්‍යකරණය වී ඇති අතර, එය භාවිතයෙන් පාලකයන් සිය වගවීමේ වගකීම් වලින් මිදෙන බවක් පෙනෙන්නට තිබේ. වසංගතය හැඳින්වීම සඳහා යොදාගෙන ඇති යුධ උපමාව හා එමඟින් සමාජගත කොට තිබෙන මානසිකත්වය නිසා ලොව පුරා රටවල ආණ්ඩුකරණ ක්‍රියාවලිය මිලිටරීකරණයේ ග්‍රහණයට නතුව ඇති අතර, පුරවැසි ජීවිත ආණ්ඩුව මඟින් අධීක්ෂණය කිරීමද සාමාන්‍ය කරුණක් බවට පත්ව ඇත. මෙම ප්‍රවණතාවයන් තුළින්, සීඝ්‍රගාමී ලෙස හඳුන්වා දෙන්නට උත්සහ කෙරෙන නව ලිබරල් ප්‍රතිසංස්කරණ වලට එල්ල වන විරෝධතා මර්දනය කිරීම සඳහා අවශ්‍ය පසුබිමද සකසා දී තිබේ. අවසාන වශයෙන්, මේ ඇතිව තිබෙන ව්‍යතිරේඛ තත්වය තුළින් වසංගත මාදිලියේ ආණ්ඩුකරණ මානසිකත්වය සුජාතකරණය කර තිබෙන නිසා එවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී භාවිතයන් වසංගත තත්වයෙන් මතුවටත් පැවතීමේ හැකියාවක් තිබේ. මෙම කෘතිය ලියවෙන්නට අවශ්‍ය කරුණු කාරණා යෙදෙන්නේ මෙවැනි බැරෑරුම් තත්වයක් තුළය. එම රාමුව තුළ සිට ශ්‍රී ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය මඟින් ඇති කරන ලද සමාජ-දේශපාලන බලපෑම් අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ.

## ශ්‍රී ලංකාවේ පූර්ව-වසංගත ආණ්ඩුකරණ මානසිකත්වයේ ඉතිහාසයෙන් බිඳක්

නිදහස ලැබූ වකවානුවේ ශ්‍රී ලංකාවේ තත්වය ඉතා යහපත් විය. අධ්‍යාපනය හා සෞඛ්‍යය යන අංශ වලට ශක්තිමත් සුබසාධන පදනමක් තිබුණු අතර (Jayasuriya, 2004), පාර්ලිමේන්තු සම්ප්‍රදායද ඉතා ශක්තිමත් විය (ඩි වෝටා, 2010). එතෙකුදු වුවත් නිදහසින් අවුරුදු 70 ක් ගතවන තැන රාජපක්ෂ පාලනය යටතේ ලංකාව ඉතා සීඝ්‍රයෙන් ආඥාදායක ස්වරූපයේ වාර්ගික රාජ්‍යයක් බවට පත්වෙමින් තිබේ (DeVotta, 2010).

2009 එල්ටීටීඊ සංවිධානයට එරෙහිව ලත් යුධ ජයග්‍රහණයෙන් පසු රාජපක්ෂවරු ලංකා දේශපාලනය තුළ සිය බලය තහවුරු කරගන්නට පටන් ගත්හ. එහිදී සිංහල-බෞද්ධයන්ගේ සහ ජාතියේ ආරක්ෂකයන් ලෙස ඔවුන් ලද ජන වරම පෙර නොවූ විරූ අන්දමේ එකකි. 2015 දී පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයක් හමුවේ පරාජයට පත් වුවද, 2019 දී වඩා ශක්තිමත්ව ඔවුන් නැවත බලයට පැමිණෙන්නේ හරියටම වසංගතයට පෙරාතුවය. එහිදී යහපාලන ආණ්ඩුවේ පොරොන්දු කඩ කිරීම්, දූෂණ හා වංචා, අභ්‍යන්තර අර්බුද සහ අවසාන වශයෙන් පාස්කු ප්‍රහාරය වැළැක්වීමට නොහැකි වීම යන හේතු මෙම ජයග්‍රහණයට මූලික වූ බවද පැවසිය යුතුය. උයන්ගොඩ (2020) පවසන පරිදි:

"මෙම දුර්වලතා පොහොට්ටුව සඳහා නිර්මාණය කළ දේශපාලන සටන් පාඨය දේශපාලනික වශයෙන් ඉතා දීර්ඝ කාලීන හා ඵලදායී විය: එනම් ශක්තිමත් නායකයෙක්, ශක්තිමත් ආණ්ඩුවක්, මිලිටරි සහභාගීත්වය සහිත ශක්තිමත් රාජ්‍ය පරිපාලනයක් සහ සංවරණ සහ තුලන වලින් තොර වූ එක් ශක්තිමත් බල මධ්‍යස්ථානයක් යන රැඩිකල් නව දේශපාලනික විකල්පයයි."

මේ හරහා නිර්මාණය කරගන්නා ලද සිය දේශපාලනික ප්‍රතිරූපය තුළින් ගෝඨාභය රාජපක්ෂ යනු දක්ෂකමට, විශේෂඥ දැනුමට හා කාර්යක්ෂමතාවයට මුල්තැන දෙන, ජාතික ආරක්ෂාව අවධාරණය කරන්නෙක් බව සන්නිවේදනය කරන ලදී. ඩි වෝටා (DeVotta) දක්වන පරිදි "දේශපාලනය තුළ ඔහුගේ නැඟ ඒමත් සමඟ සිංහල-බෞද්ධ වාර්ගික රාජ්‍යය වඩා ශක්තිමත්ව ස්ථාපනය වීමත්, රටේ ඉතිරිව පවතින බහුත්වවේදය සහ ලිබරල්වාදය පිළිබඳ යම් හෝ නිධියක් වේ නම් එහි ක්‍රමික හායනයත් දක්නට ලැබේ." (2021, පිටුව 96)

රාජපක්ෂ නායකත්වය (ගෝඨාභය සහ මහින්ද යන දෙදෙනාම) යටතේ රාජ්‍ය කටයුතු වල මිලිටරි භූමිකාව එන්න එන්නටම වැඩි වී තිබේ. අභිලන් කදිර්ගාමර්ට අනුව පශ්චාත් යුධ ලංකාවේ මිලිටරිය බොහෝ කොටම යොදාගෙන ඇත්තේ සංවර්ධන කටයුතු සඳහාය (Kadirgarmar, 2013). එහෙත් පත්වූ දිනයේ පටන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවේ විවිධ තනතුරු වලට විශ්‍රාම ලත් සහ දැනට සේවයේ සිටින මිලිටරි නිලධාරීන් බොහෝමයක් පත්කොට තිබේ (Fonseka and Dissanayake, 2021). ආරම්භයේ පටන්ම ඉතා පැහැදිලි කරුණක් වූයේ ජනාධිපතිවරයා ආඥාදායක ආකාරයේ ආණ්ඩුක්‍රමයක් ප්‍රිය කරන, සිය බලය සම්බන්ධයෙන් කිසිදු සංවරණයක් හෝ තුලනයක් අපේක්ෂා නොකරන, එමෙන්ම විවේචනය නොඉවසන ආකාරයේ අයෙක් බවයි. සාම්ප්‍රදායික පක්ෂ දේශපාලනය තුළින් පැමිණි ප්‍රභූන්ට වඩා (තමාගේ මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් වැඩ කළ අයද ඇතුළුව) තමා හමුදා නිලධාරීන් සහ වෘත්තීයවේදීන් මත විශ්වාසය තබන බව පෙන්වන්නට ඔහු කිසිදු අවස්ථාවක මැලි නොවීය.

අත්‍යන්ත ජාතිවාදයට අමතරව රාජපක්ෂ ආණ්ඩුවේ තවත් ප්‍රවණතාවයක් වන්නේ නව ලිබරල් ආර්ථික පර්යාය තව තවත් ව්‍යාප්ත කිරීමයි. සිය මැතිවරණ ව්‍යාපාරයට සහය දුන් ව්‍යාපාරික පැළැන්තිය නිසාම පමණක් නොව, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට නව ලිබරල් දෘෂ්ටිවාදය පිළිබඳ නෛසර්ගික පැහැදීමක් ඇති බව පෙනෙන්නට තිබේ. බලයට ආ දින පටන් ඔහුගේ ප්‍රතිපත්ති රාමුව දෙස බැලූ විට - කොළඹ නගරය නූතනත්වයෙන් පිරි ගෝලීය නගරයක් කිරීම, වෙළඳපොළට අවශ්‍ය ආකාරයට අධ්‍යාපනය අනුවර්තනය කිරීම සහ රාජ්‍ය දේපළ කළමණාකරණය කිරීම සඳහා ගෝලීය ප්‍රාග්ධනය සමඟ අත්වැල් බැඳ ගැනීම වැනි නිදසුන් තුළින් - පැහැදිලි වන්නේ මෙයයි.

පශ්චාත් යටත්විජිත ලංකාවේ ඉතිහාසය තුළ අප ජීවත්ව ඇත්තේ සාමකාමී කාල වලට වඩා ‘ව්‍යතිරේඛ තත්වයන්’ (Georgio Agamben, 2005) තුළය. මෙරට හඳුන්වා දී ඇති ත්‍රස්ත-විරෝධී නීති සමුදාය සහ අද වනවිට ඉතා හුරු පුරුදු සහසක් හදිසි තත්වයන් තුළින් පැහැදිලි වන්නේ මෙයයි. 1953 සිට 2006 දක්වා කාලය තුළ වාර 20 කදී රට තුළ හදිසි තත්වයන් ප්‍රකාශයට පත්කොට ඇත (Manoharan, 2006, p. 24). 2006 දී ප්‍රකාශයට පත් කළ හදිසි තත්වය 2009 යුද්ධයේ අවසානය තෙක්ම පැවතුණි. මේවා හඳුන්වා දෙන ලද්දේ අධි ආරක්ෂක කලාපල සිවිල් වැසියන්ට පිවිසීම තහනම් කර තිබූ යුධ කලාප, මුර පොළවල් වැනි වෙනත් භෞතික ක්‍රියාමාර්ග වලට අමතරවය. නමුත් විශේෂිතම කරුණ වන්නේ මෙවැනි ආරක්ෂක විධිවිධාන හඳුන්වා දීමට හේතු වූ දුක් ගැනවිලි සහ අසහනයන් නීතිය, පර්යාය හා ආරක්ෂාව සම්බන්ධ කටයුතු වශයෙන් මිස, කිසිදු අවස්ථාවක ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඔස්සේ විසඳිය යුතු ඒවා වශයෙන් කිසිවකු විසින් වටහා නොගැනීමයි (Uyangoda, 2000). ඒ අනුව 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) නීතිය (Manoharan, 2006), 1978 ඊළාම් විමුක්ති කොටි සංවිධානය සහ වෙනත් එවැනි සංවිධාන තහනම් කිරීමේ පනත සහ 1978 අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනත වැනි ඒවා හඳුන්වා දෙන්නේ සන්නද්ධ අසහනය මර්දනය කිරීමටය. ඒ අතර සුවිශේෂයෙන් මර්දනකාරී නීතියක් වශයෙන් 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත දැක්විය හැකිය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළින් මූලික විමර්ෂණයකින් තොරව පුද්ගලයකු සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම, රැඳවුම් භාරයේ තබා ගැනීම සහ වෙනත් එවැනි ක්‍රියා සිදු කිරීමටද (4-6 වගන්ති), නීතිය ක්‍රියාත්මක කරවන නිලධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමෙන් වැළැක්වීමටද (26 වගන්තිය), පවතින වෙනත් නීති සමඟ ගැටෙන අවස්ථා වල ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට මූලිකත්වය ලැබීමටද (28 වගන්තිය) අවශ්‍ය ප්‍රතිපාදන සපයා ඇත. ආගමික අන්තවාදය වැළැක්වීමට යැයි කියමින් මෙම පනතට 2021 මාර්තු මාසයේ සංශෝධනයක් ඉදිරිපත් කරන ලද පසුබිමක් තුළ - 2021 අංක 01 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ දැඩි අන්තවාදී ආගමික මතවාද දැරීමෙන් මුදවා ගැනීමේ නියෝග - ඊට විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ (*Concerns Relating to the Recent Regulations Issued Under the Prevention of Terrorism Act,* 2021). මෙම පනත තුළින් සැබවින්ම කෙරෙන්නේ ආණ්ඩු විරෝධීන්ට එරෙහිව පියවර ගැනීමත්, වාර්ගික ආගමික සුළුතරයේ අයිතීන් කප්පාදු කිරීමත් බව ඉතා පැහැදිලිය (එම; *Sri Lanka's draft Counter Terrorim Act: a license for continued state oppression, intimidation and torture,* 2017).

ලංකාවේ වසංගත ආණ්ඩුකරණ මානසිකත්වයෙන් එසේ නම් සිදුකොට ඇත්තේ අළුතින් ව්‍යතිරේඛ තත්වයක් හඳුන්වා දීම නොව, පසුගිය දශක ගණනාව මුළුල්ලේ පැවති ව්‍යතිරේඛ තත්වය දීර්ඝ කොට පවත්වාගෙන යාමයි. මෙම ඓතිහාසක පසුබිම තුළ වසංගත ආණ්ඩුකරණ මානසිකත්වය හා ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය අතර සම්බන්ධය පිළිබඳ නවමු අදහස් කිහිපයක් සැපයීමටය මෙම කෘතියෙහි පරිච්ඡේද 07 ඔස්සේ අපේක්ෂා කරන්නේ.

## මෙම අධ්‍යනය

මෙම කෘතිය එළි දකින්නේ වඩා පුළුල් පර්යේෂණ ව්‍යාපෘතියක කොටසක් ලෙසය. කොවිඩ් වසංගතය ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්කළ දින පටන් වැඩිමනත් අවධානය යොමු වූයේ එහි සෞඛ්‍යමය පැතිකඩට මිස එමඟින් ඇති කරන ලද සමාජ-ආර්ථික බලපෑමට නොවන අතර, මාධ්‍ය වාර්තා හැරුණු විට ඒ පිළිබඳ විධිමත් විමසුමක් මේ දක්වාත් සිදුකෙරී නොමැත. මෙම පසුබිම තුළය ආණ්ඩුවේ කොවිඩ් ප්‍රතිචාරය සම්බන්ධයෙන් මහජන මත සමීක්ෂණයක් සිදු කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන Social Indicator ආයතනය යොමු වන්නේ. සමීක්ෂණ වල ස්වභාවයෙන්ම අවධානය යොමු වන්නේ සමස්තයට පමණක් නිසා, අධ්‍යයනය අතරවාරයේ කරුණු වඩාත් ගැඹුරින් තේරුම් ගැනීම සඳහා සිද්ධි අධ්‍යයන කිහිපයක් කිරීමට පියවර ගැනුණි. ඒ යටතේ ජීවනෝපායන්, අධ්‍යාපනය, සුළු ජන කණ්ඩායම් වල තත්වය හා සමාජ සම්බන්ධතා ජාලා වල බලපෑම යන මාතෘකා ගැඹුරින් හැදෑරීමට තීරණය විය. මෙසේ රැස්කළ කරුණු මත පදනම්ව කණ්ඩායමේ සාමාජිකයන් විසින් රචනා කිහිපයක් සම්පිණ්ඩනය කළ අතර, පසුව මෙම කෘතියේ සමහර පරිච්ඡේද දක්වා විකාශනය වූයේ එම රචනාය. මේ කෘතිය තුළින් ලංකාවේ වසංගත ආණ්ඩුකරණ මානසිකත්වය පිළිබඳ පරිපූර්ණ අදහසක් ලබා නොදෙන මුත්, රටේ සුබසාධන පද්ධතියෙහි ක්‍රමික හායනය පිළිබඳ ඉතා වැදගත් අදහස් කිහිපයක් එහි අන්තර්ගත වේ.

## පරිච්ඡේද සැකැස්ම

වසංගත ආණ්ඩුකරණයේ ආයතනික පැතිකඩ විග්‍රහ කරමින් භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ ඊට අදාළව හඳුන්වා දුන් නීති-රීති සහ කාර්ය සාධන බලකා පිළිබඳව වැදගත් කරුණු ඉදිරිපත් කරයි. වසංගත කලබලය මධ්‍යයේ හදිසියේ සම්මත තරගන්නා ලද ඉතා ප්‍රශ්නකාරී 20 වන සංශෝධනය සහ වරාය නගර පනත් කෙටුම්පත ඔවුන්ගේ විශේෂ

අවධානයට බඳුන් වේ. එහිදී හරයාත්මක ප්‍රජාතන්ත්‍රවාදයට ඒවායේ ඇති බලපෑම පොදුවේත්, මානව හිමිකම්, වගවීම සහ සමාජ අසමානත්වයට ඉන් ඇති කරන බලපෑම වඩා නිශ්චිතවත් ඔවුහු ප්‍රශ්න කරති.

මගේ පරිච්ඡේදය තුළ මූලිකවම අවධානයට බඳුන් වන්නේ 'වසංගත ආණ්ඩුකරණ මානසිකත්වය' යන සංකල්පයයි. ඒ යටතේ මෙම කාලය තුළ රට පාලනය කිරීමට යොදාගත් ක්‍රියා පටිපාටි, තාක්ෂණයන් හා තර්කනයන් සාකච්ඡාවට බඳුන් වන අතර එකී පටිපාටි, තාක්ෂණයන් හා තර්කනයන් ඔස්සේ පිළිබිඹු වන්නේ දැනට සිටින පාලකයන් කුමනාකාරයේ පාලනයකට පක්ෂද යන කරුණ බව පෙන්වා දෙන්නෙමි. එමඟින් ජනාධිපතිවරයාගේ දේශපාලන දැක්ම වන මිලිටරි සහභාගීත්වය සහිත ආණ්ඩුක්‍රමයක්, කීකරු සහ විනයගරුක සමාජයක් මෙන්ම තාක්ෂණවේදයට ප්‍රමුඛස්ථානය ලැබෙන පද්ධතියක් සාක්ෂාත්කරණය කරගැනීමට ප්‍රයත්න දරන බව මගේ මතයයි. ඒ හරහා සමාජයේ පවතින අසමානතාවයන් වැඩි වර්ධනය කිරීම හා විනයගරුක සමාජයක් කරා යන ගමනේදී දැඩි ලෙස අධීක්ෂණයට බඳුන් වීම සාමාන්‍යකරණය වීම යන කරුණු තුළින් හරයාත්මක ප්‍රජාතන්ත්‍රවාදය දරුණු ලෙස උල්ලංඝණය වන බව දක්වා ඇත්තෙමි.

වසංගත ප්‍රතිපත්ති සම්පාදනයෙහි ආර්ථික බලපෑම අධ්‍යයනය කරමින් නිපුණිකා ලේකම්වසම් උත්සහ කරන්නේ ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතියට හා සුබසාධන ප්‍රතිපත්ති වලට කුමක් සිදුවූයේද යන්න තේරුම් ගැනීමටය. ඇයගේ තර්කය වන්නේ ශක්තිමත් සුබසාධන පද්ධතියක් පවතී නම් ජීවිත රැකගැනීම සහ ආර්ථිකය අතර තේරීමක් කිරීමට සිදුනොවනු ඇති බවත්, ශ්‍රී ලංකාවේ සුබසාධන පද්ධතියෙහි ක්‍රමික හායනය, දූෂණය සහ දුර්වල කළමණාකරණය නිසා වසංගත තත්වය තුළ රාජ්‍යය 'බොල් රාජ්‍යයක්' (hollow state) බවට පත්ව ඇති බවත්ය. එම තත්වය තුළ වසංගතයක් වැනි බාහිර කම්පනයක් ඇති වූ විට තමාගේ සුබසාධනය තමාම සලසා ගතයුතු තැනට පුරවැසියා පත්ව ඇති බව ඇය පෙන්වා දේ.

සිය පරිච්ඡේදය තුළින් සකිනා මොයිනුඩීන් ශ්‍රී ලංකාවේ වසංගත ප්‍රතිචාරය පිටුපස ඇති වර්ගවාදී චින්තනයට අවධානය යොමු කරමින් පෙන්වා දෙන්නේ මෙම ප්‍රතිපත්ති නිසා පවතින වර්ගවාදය වඩාත් උත්සන්නව ඇති බවයි. විශේෂයෙන්ම වසංගතය තුළ මුස්ලිම් ප්‍රජාවට අදාළව හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති තුළින් ආණ්ඩුවට සිය ප්‍රජාතන්ත්‍ර විරෝධී පද්ධතිය කිසිදු වගවීමකින් තොරව පවත්වාගෙන යාමට හැකියාව ලබාදී තිබේ. මෙමඟින් හරයාත්මක ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරන බලපෑම පිළිබඳව විමසමින් මොයිනුඩීන් පවසන්නේ නීතිය අත්තනෝමතික හා එක් එක් කණ්ඩායම් වලට විශේෂීකරණය වූ පරිදි ක්‍රියාත්මක කරවීම හා විධායකයේ බලය අත්‍යන්තව වැඩි කිරීම තුළ ලංකා ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම ඛාදනයට ලක්වන බවයි.

කොවිඩ් වසංගත තත්වය තුළ ලක් රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය හරහා රටේ නිදහස් අධ්‍යාපනයට එල්ල කර ඇති බලපෑම අධ්‍යයනය කරමින් හසිනි ලේකම්වසම් තර්ක කරන්නේ මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය පුද්ගලයාගේ ක්‍රය ශක්තිය මඟින් මිස ආයතනික වශයෙන් සම්බන්ධීකරණය නොකරන තත්වයක් තුළ නිදහස් අධ්‍යාපනය තවදුරටත් නිදහස් අධ්‍යාපනය වශයෙන් පවතීද යන්න සැක සහිත බවයි. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රාජ්‍යය සිය සුබසාධන වගකීම් වලින් පසුබැස යෑමේ තත්වයක පැතිර යන නව ලිබරල් මානසිකත්වයේ එක් ප්‍රතිඵලයක් බවට පත්ව ඇත්තේ ස්වාධීනත්වය සහ ස්වයංපෝෂිත භාවයේ නාමයෙන් කලින් ආයතනික වගකීම් ව තිබූ දේ වත්මනේ පුද්ගලයාට තනිව අනුයුක්ත කොට තිබීම බව ඇය පෙන්වා දේ.

රජයේ කොරෝනා ප්‍රතිපත්ති වල අසංවේදී දරුණු භාවය හේතුවෙන් නිදහස් වෙළඳ කලාප තුළ සිරවූ සංක්‍රමණික ශ්‍රමිකයන්ට අත්වූ තත්වය පිළිබඳව සාකච්ඡා කරමින් කෞෂිනී දම්මලගේ ප්‍රාග්ධනය සහ ශ්‍රමය අතර සම්බන්ධතාවය රාජ්‍යය මඟින් සම්බන්ධීකරණය කරන්නේ කෙසේද යන්න පෙන්වා දෙයි. ඇය තර්ක කරන්නේ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයන් සූරා කෑම ප්‍රාග්ධන හිමිකරුවන්ට මෙන්ම රාජ්‍යයටද වාසිදායක බවත්, එය සිදුවන්නේ සූරාකෑම තුළින් ප්‍රාග්ධන හිමිකරුවන්ට හිමිවන ලාභයේ පංගුව වැඩිවීමෙන් සහ ඔවුන් රජයට ගෙවන්නා වූ බදු මුදල් වල ප්‍රතිශතය වැඩි වීමෙන් බවත්ය. ඇයට අනුව වසංගත තත්වය තුළ මෙම සූරාකෑම තවත් දැඩි කිරීමට මෙම දෙපාර්ශවයටම හැකිවිය.

සිය පරිච්ඡේදය තුළ ශෂික් සිල්වාගේ අවධානය යොමු වන්නේ කොවිඩ් වසංගතයට අදාළ සේවා ලබාගැනීමේදී සමාජ සම්බන්ධතා ජාල වල භූමිකාවටය. මෙම සේවා ලබාදීම සඳහා නිල ආයතනික පද්ධතියක් පැවතුණද, එම සමස්ත ක්‍රියාවලිය සැබවින්ම සංවිධානය වී තිබෙන්නේ දේශපාලනඥයින් වටා බවත්, නිල ආයතනික පද්ධතියට වඩා කාර්යක්ෂම සේවාවක් ඔවුන් නොනිල මාර්ග වලින් බොහෝ විට ලබාදීමට සමත් වන බවත් සිල්වා පෙන්වා දේ. මෙම ජාලය තුළ නව පුරුක් වශයෙන් කරළියට පැමිණ ඇති සෞඛ්‍ය අංශයේ නිලධාරීන්ද අවසානයේ දේශපාලනඥයින් මත යැපෙන බව ඔහුගේ අදහසයි. මෙම නොනිල සම්බන්ධතා ජාල තුළින් සමාජයේ ආන්තිකරණය වූවන්ට නිල ආයතන පද්ධතිය තුළින් සාමාන්‍යයෙන් නොලැබෙන ආකාරයේ සේවාවන් වලට ප්‍රවේශය හිමිවීම සත්‍යයක් වුවත්, එමඟින් අළුත් අසමානතා ඇති කිරීමත්, පවතින ඒවා තවදුරටත් ඉදිරියට ගෙන යාමත් සිදුවන බවද සිල්වා දක්වයි.

## ආශ්‍රිත ග්‍රන්ථ

Agamben, G. (2005) *State of exception*. Illinois: University of Chicago Press.

Agamben, G. (2020) *'The state of exception provoked by an unmotivated emergency' praxis.* Available at: https://positionspolitics. org/giorgio-agamben-the-state-of-exception-provoked-by-anunmotivated-emergency/ (Accessed: 07 July 2021).

*BAME women 'at twice the risk' of both Covid-19 and low pay, research shows (2020) Institute of Employment Rights.* Available at: https://www.ier. org.uk/news/bame-women-at-twicethe-risk-of-both-covid-19-and-low-pay-research-shows/ (Accessed: 17 June 2021).

Bowleg, L. (2020) 'We're not all in this together: On COVID-19, intersectionality, and structural inequality', American Journal of Public Health, 110(7), p. 917.

Burchell, G. Gordon, C. and Miller, P. (1991) 'Governmentality' in Burchell, G. Gordon, C. and Miller, P. (Eds.) The Foucault effect: Studies in governmentality. Illinois: University of Chicago Press, pp. 87-104.

Butler, J. (2006) Precarious life: The powers of mourning and violence. London: Verso Books.

Cheibub, J.A., Ji Y.J., Hong, and Adam Przeworski (2020) 'Rights and Deaths: Government Reactions to the Pandemic', SSRN Working Paper.

Chen et al. (2021) 'What factors drive the satisfaction of citizens with governments' responses to COVID-19?', International Journal of Infectious Diseases, 102, pp. 327-331.

Choukroune, L. (2020) 'When the state of exception becomes the norm, democracy is on a tightrope', The Conversation, 27 April. Available at: https://theconversation.com/whenthe-state-of-exception-becomes-the-norm-democracy-is-on-atightrope-135369 (Accessed: 02 July 2020).

*Concerns Relating to the Recent Regulations Issued Under the Prevention of Terrorism Act (2021) Centre for Policy Alternatives*. Available at: https://www.

cpalanka.org/concerns-relatingto-the-recent-regulations-issued-under-the-prevention-ofterrorism-act/ (Accessed: 03 July 2021).

Coppedge, M., et al. (2011) 'Conceptualizing and Measuring Democracy: A New Approach', Perspectives on Politics, 9(2), pp. 247–67.

*Democracy under Lockdown* (2020) *Freedom House*. Available at: https://freedomhouse.org/report/special-report/2020/ democracy-under-lockdown (Accessed: 15 June 2020).

DeVotta, N. (2010) Politics and governance in post-independence Sri Lanka. London and elsewhere: Routledge.

DeVotta, N. (2021) 'Sri Lanka: Returning to Ethnocracy', Journal of Democracy, 32(1), pp. 96-110.

Dias, B. and Deluchey, J. (2020) 'The "Total Continuous War" and the COVID-19 Pandemic: Neoliberal Governmentality, Disposable Bodies and Protected Lives', Law, Culture and the Humanities, pp. 1 -18.

Engler, S. Brunner, P. Loviat, R. Abou-Chadi, T. Leemann, L. Glaser, A. and Kübler, D. (2021) 'Democracy in times of the pandemic: explaining the variation of COVID-19 policies across European democracies', West European Politics, 44(5- 6), pp. 1077-1102.

Fonseka, B. and Dissanayake, U. (2021) 'Sri Lanka's Vistas of Prosperity and Splendour: A Critique of Promises Made and Present Trends', Centre for Policy Alternatives. Available at: https://www.cpalanka.org/wp-content/uploads/2021/07/ Sri-Lankas-Vistas-of-Prosperity-and-Splendour-A-Critiqueof-Promises-Made-and-Present-Trends.pdf (Accessed: 22 July 2021).

Foucault, M. (2002) 'The Subject and Power' in M Foucault, Power: Volume 3: Essential Works of Foucault 1954-1984 (J Faubion, ed; R Hurley, trs). London: Penguin, pp. 326-341.

Hinrichesen, J. (2020) 'Conditions of Life: A Comment on Giorgio Agamben's Reading of the Corona Pandemic' The Hedgehog Review, 20 April 2020. Available at: https://hedgehogreview.com/web-features/thr/posts/conditions-of-life (Accessed: 16 June 2021).

Isakovic, N. (2020) 'What has COVID-19 Taught Us About

Neoliberalism?' WILPF Newsbrief. Available at: http:// wilpf.nl/ wp-content/uploads/2020/06/WILPF-nieuwsbrieflente-2020. pdf (Accessed: 13 July 2021).

Jayasuriya, L. (2004) 'The Colonial Lineages of the Welfare State', in Kelegama, S. (ed.) Economic Policy in Sri Lanka: Issues and Debates. First edition. Thousand Oaks, California: SAGE Publications Pvt. Ltd, pp. 403–425.

Kadirgamar, A. (2013).'The Question of Militarisation in Post-war Sri Lanka', Economic and Political Weekly, 48(7), pp. 42-46.

Levitsky, S. and Daniel, Z. (2018) How Democracies Die. New York: Crown.

Li, T.M. ,s (2007) 'Governmentality', Anthropologica, 49(2), pp. 275–281.

Manoharan, N. (2006) Counterterrorism Legislation in Sri Lanka: Evaluating Efficacy. Washington: East-West Center.

Marmot, M., & Allen, J. (2020) 'COVID-19: Exposing and amplifying inequalities', Journal of Epidemiology and Community Health, 74(9), pp. 681–682.

Mbembe, A. (2003) 'Necropolitics', Public Culture, 15(1), pp.11-40.

Saad-Filho, A. (2020) Critical Sociology, 46(4-5), pp. 477-485.

Sandset, T. (2020) 'The necropolitics of COVID-19: Race, class and slow death in an ongoing pandemic', Global Public Health. DOI: 10.1080/17441692.2021.1906927.

Scott, D. (1995) 'Colonial Governmentality', Social Text, 43, pp. 191- 220.

Solty, I. (2020) 'The bio-economic pandemic and the western working classes', *SP: The Bullet*, March 24. Available at: https:// socialistproject.ca/2020/03/bioeconomic-pandemicand-western-working-classes/ (Accessed: 05 July 2021).

'Socio-Economic Index in the face of COVID-19' (2021) *Centre for Policy Alternatives*, 30 June. Available at: https://www.cpalanka.org/ socio-economic-index-in-the-face-of-covid-19/

(Accessed: 30 June 2021).

*Sri Lanka's draft Counter Terrorism Act: a license for continued state oppression, intimidation and torture* (2017) *Sri Lanka Campaign for Peace and Justice*. Available at: https://www. srilankacampaign.org/sri-lankas-draft-counter-terrorismact-license-continued-state-oppression-intimidation-torture/ (Accessed: 05 July 2021).

Uyangoda, J. (2020) 'A Major Shift in Sri Lanka's Politics', Ground Views, 08 August. Available at: https://groundviews. org/2020/08/08/a-major-shift-in-sri-lankas-politics/ (Accessed 20 July 2021).

Uyangoda, Jayadeva. (2000) 'A State of Desire? Some Reflections on the Unreformability of Sri Lanka's Post-colonial Polity', in S.T. Hettige & Markus Mayer (Eds.) Sri Lanka at Crossroads – Dilemmas and Prospects after 50 Years of Independence. Delhi: McMillan India.

Vagehese, N. (2021) 'What is Necropolitics? The Political Calculation of Life and Death' Teen Vogue, 10 March 2021. Available at: https://www.teenvogue.com/story/what-is-necropolitics (Accessed: 17 July 2021).

Zwitter, A. (2012). 'The Rule of Law in Times of Crisis', *Archiv f€ur* Rechtsund Sozialphilosophie, 98(1), pp. 95–111.

2

# වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ සීඝ්‍ර පරිහානිය

*භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ*

## හැඳින්වීම

2020 වර්ෂයේ පටන් ශ්‍රී ලංකාව වෙලාගෙන තිබෙන කොවිඩ්-19 වසංගත තත්වය සහ එමඟින් ඇතිකරන ලද සෞඛ්‍යමය සංකූලතා වලට අමතරව මානව හිමිකම්, ආණ්ඩුකරණය සහ සංහිඳියාව පිළිබඳ ගැටළු රාශියක්ද මෙම අර්බුදය මඟින් මතුකොට තිබේ (Fonseka, Ganeshathasan, and Welikala, 2021). මෙම අභියෝග වඩාත් හොඳින් තේරුම් ගැනීම සඳහා 2019 දී ජනතාවට ලබාදුන් පොරොන්දු පිළිබඳ සන්දර්භයද සිහි කැඳවා ගත යුතුය. යහපාලන ආණ්ඩුවේ පිළිවෙලක් නොමැති ආණ්ඩුකරණ මාදිලිය සහ එහි ප්‍රතිඵලයක් සේ සළකන ලද පාස්කු ප්‍රහාරය නිසා ශක්තිමත් නායකයකුගේ අවශ්‍යතාවය පිළිබඳ වඩාත් තදින් දැනෙන්නට පටන් ගැනුණි. ඒ අනුව වර්ෂ 2019 නොවැම්බර් මාසයේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති බවට පත්වන්නේ තාක්ෂණතන්ත්‍ර ආණ්ඩුකරණය, ආරක්ෂාව, ස්ථායීතාව සහ විනය සමාජයට ළඟාකර දෙන බවට වූ පොරොන්දුව මතය. ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශය වූ සෞභාග්‍යයේ දැක්ම තුළින්ද ලංකාවේ වත්මන් අභියෝග ජයග්‍රහණය කිරීම සඳහා ප්‍රතිසංස්කරණ ගණනාවක් යෝජනා කොට තිබුණි. කෙසේ වුවත් අද වනවිට සෞභාග්‍යය වෙනුවට පෙර නොවූ විරූ අන්දමේ සෞඛ්‍ය සහ ආර්ථික අභියෝග ගණනාවක්ද, අධිකතර මිලිටරීකරණය, ඔඩුදුවා යන අසමානත්වය හා මානව හිමිකම් උල්ලංඝණය වීම්, ප්‍රතිපත්ති නොගැළපීම් සහ නීතියේ ආධිපත්‍යය එළිපිටම නොසළකා හැරීම වැනි අර්බුද ගණනාවක් උද්ගතව තිබේ (Fonseka and Dissanayake, 2020).

එම පසුබිම තුළ මෙම පරිච්ඡේදයෙන් උත්සහ ගනු ලබන්නේ කොවිඩ්-19 වසංගත තත්වය කළමණාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හඳුන්වා දෙන ලද යාන්ත්‍රණයන් වල නීත්‍යානුකූල භාවය සහ ව්‍යවස්ථානුකූල භාවය විමසා බැලීමයි. සෞඛ්‍ය අර්බුදය කළමණාකරණය කරගැනීම වෙනුවෙන් යැයි හඳුන්වා දෙන ලද ව්‍යුහයන් මෙන්ම, වසංගත ප්‍රතිචාරය තුළ පනවන ලද විවිධ සීමාවන්ට අදාළ නෛතික රාමුව පිළිබඳවද ඒ යටතේ විමසා බැලේ. එමෙන්ම වසංගත කලබලයට මුවා වී හදිසියේ සම්මත කරගන්නා ලද පනත් කෙටුම්පත් හා ඒ තුළින් විද්‍යාමාන වන ආඥාදායක සහ මිලිටරීකරණය වූ පාලන ක්‍රමයක් පිළිබඳ ඉතා ප්‍රශ්නකාරී ප්‍රවණතාද මෙම පරිච්ඡේදයේ අවධානයට යොමු වේ. එහිදී මූලිකවම අරමුණු කරන්නේ මෙම යාන්ත්‍රණ හා ප්‍රතිපත්ති ඇඳා ගැනීම මගින් ආණ්ඩුකරණය තුළ වගවීම සහ විනිවිදභාවය ක්‍රමයෙන් අඩු කරන අන්දම මෙන්ම ඒ හරහා ලංකාවේ ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරන බලපෑම හඳුනා ගැනීමයි.

## ව්‍යුහයන්

වර්ෂ 2020 මාර්තු මස කොවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත්කළ දිනයේ පටන් ඒ හා සම්බන්ධ විවිධ ගැටළු පිළිබඳ විමසා බැලීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකා සමූහයක් පිහිටුවන ලදී ('Structures to Deal with COVID-19 in Sri Lanka: A Brief Comment on the Presidential Task Force', 2020; also see 'Q and A on Regulations Issued under the Quarantine and Prevention of Diseases Ordinance & how this impacts the COVID-19 response in Sri Lanka', 2020). මෙම කාර්ය සාධක බලකාය ස්ථාපනය කරන ලද්දේ ජනාධිපතිගේ බලතල හා කාර්යයන් දක්වා ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයාට හිමිවන බලතල යටතේය. අදාළ ගැසට් නිවේදන වල 33 වැනි වගන්තිය පමණක් දක්වා තිබුණද, එහි 33(2)(උ)[1] ප්‍රතිපාදනය මෙම කාර්ය සාධක බලකා ස්ථාපනය කිරීම සඳහා භාවිතා කළ බව සිතිය හැකිය.

මෙම කාර්ය සාධක බලකා වල කාර්යයන්, අධිකාරියෙහි වපසරිය මෙන්ම පවතින ව්‍යුහයන් හා ඇති සම්බන්ධයද නොපැහැදිලිය ('Pandemic Crisis and Democratic Governance in Sri Lanka', 2021). තවත් විවාදාපන්න කරුණක් බවට පත්ව ඇත්තේ මෙම කාර්ය සාධක බලකා වලට ආරක්ෂක අංශ වල සහ නීති ක්ෂේත්‍රයේ බොහෝ පිරිස් පත්කොට තිබීමයි. මෙම

---

1 ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ 33(2)(උ) වගන්තිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන වලට පටහැනි නොවන්නා වූද, ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ජනාධිපතිවරයාට බලය ලැබී ඇත්තා වූ හෝ නියමිතව ඇත්තා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේය.

පත්කිරීම් මඟින් ඉඟි කරනු ලබන්නේ සිවිල් ජීවිතය හා සම්බන්ධ කරුණු මිලිටරීකරණය වීම පිළිබඳ වඩා පුළුල් ප්‍රවණතාවය වේ. වෘත්තීයවේදීත්වය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ පොරොන්දු ලබා දී තිබුණද ('Structures to Deal with COVID-19 in Sri Lanka: A Brief Comment on the Presidential Task Force', 2020), කොවිඩ් ආසාදිතයින් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වීම තුළින් පෙනී යන්නේ වෛරසයේ පැතිරීම පාලනය කිරීමට හදිසියේ පත්කරන ලද මෙම මිලිටරීකරණය වූ ව්‍යුහ වලට නොහැකිව ඇති බවය ('An Update on the Legal Framework to Address the COVID-19 Pandemic in Sri Lanka', 2021). පහතින් දැක්වෙන්නේ වර්ෂ 2020 මාර්තු මස සිට මෙයාකාරයෙන් ස්ථාපනය කරන ලද ව්‍යුහයන් පිළිබඳ කෙටි විස්තරයකි.

අර්බුදයට කඩිනම් ප්‍රතිචාරයක් වශයෙන් හමුදාපති ශවේන්ද්‍ර සිල්වා යටතේ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය පිහිටුවන ලද්දේ ජනපති විසිනි ('No decision taken to declare a complete lockdown', 2021). එහි අරමුණ ලෙස "සෞඛ්‍ය සහ අනෙකුත් සේවාවන් මහජනතාවට සේවය කිරීමට හැකිවන පරිදි නිවාරණාත්මක හා කළමණාකරණ පියවරයන් සම්බන්ධීකරණය කිරීම" දක්වා ඇත (President's Media Division, 2020).

2020 මාර්තු 20 දින, එනම් කොවිඩ් ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය පිහිටුවා සතියක් ගතවූ තැන, අති විශේෂ ගැසට් නිවේදන අංක 2168/8 තුළින් තවත් ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටවනු ලැබුණි. එමඟින් අරමුණු කරන ලද්දේ "කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවධානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කවලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශවලට ග්‍රාමීය ප්‍රදේශ හා නිෂ්පාදකයින් විසින් සපයනු ලබන අහාර සැපයුම් සෘජුවම පාරිභෝගිකයන්ට ලබා දීම ඇතුළු සමස්ථ ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බනධීකරණය හා පසු විපරම" සහ ඒ හා බැඳුනු තවත් කාර්යයන් 12ක් සම්පූර්ණ කිරීමය. මෙම නොපැහැදිලි සහ ඉතා පුළුල් වපසරිය පිළිබඳ ගැටළුව තවත් වර්ධනය වී ඇත්තේ එම කාර්ය සාධක බලකා වල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කිසිදු අධීක්ෂණයක්, විනිවිදභාවයක් හෝ වගවීමක් සඳහා ප්‍රතිපාදන නොමැති හෙයිනි. එහිදී කිසිදු පිළිගත් ආකාරයක වගවීමේ යාන්ත්‍රණයක් නොමැති වීමත්, එම කාර්ය සාධක බලකායන් ජනාධිපතිට පමණක් වගකීමට බැඳී සිටීමත් කැපී පෙනේ.

මෙම පුළුල් වපසරිය නිසා වසංගත ප්‍රතිචාරය තුළ සිවිල් සේවයේ ස්වාධීනත්වයද යම් ආකාරකින් හැල්ලුවට ලක්ව ඇත. මෙම කාර්ය සාධක බලකාය ඉල්ලා සිටිනු ලබන තොරතුරු හා සේවා සැපයීමටත්, එහි උපදෙස් අනුගමනය කිරීමටත් සියළු රාජ්‍ය නිලධාරීන් බැඳී සිටී. එසේම

රාජ්‍ය නිලධාරීන් අතින් සිය රාජකාරී ඉටු කිරීමේදී සිදුවන ප්‍රමාද වීම් හෝ අතපසුවීම් ජනාධිපතිට වාර්තා කිරීමට මෙම කාර්ය සාධක බලකාය බැඳී සිටී ('Structures to Deal with COVID-19 in Sri Lanka: A Brief Comment on the Presidential Task Force', 2020).

2020 අප්‍රේල් 27 වන දින අති විශේෂ ගැසට් නිවේදන අංක 2173/4 ප්‍රකාරව පිහිටුවන ලද තවත් ජනාධිපති කාර්ය සාධක බලකායක වගකීම වූයේ "ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වලක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියාමාර්ග අධ්‍යනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීම" ය. පසුව එම කාර්ය සාධක බලකායේ වපසරිය පුළුල් කොට මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී පුනරුත්ථාපනය වන පුද්ගලයන් සහ බන්ධනාගාර රැඳවියන්ද ඇතුළත් වන පරිදි සංශෝධනය කරන ලදී[2].

වඩාත් මෑත කාලීනව, එනම් 2020 දෙසැම්බර් 31 දින, අති විශේෂ ගැසට් නිවේදන අංක 2208/33 මඟින් කොවිඩ්-19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවන ලදී. එහි මූලිකම කාර්යභාරය වූයේ පුහුණු විශේෂඥයින්ගේ උපදෙස් හා පවතින සාක්ෂි මත ලංකාවට සුදුසු කොවිඩ්-19 එන්නතක් හඳුනා ගැනීමත්, එය කඩිනම්ව ලබාගැනීම සඳහා අවශ්‍ය හදිසි නියාමන හා පරිපාලන රෙගුලාසි ස්ථාපනය කිරීම මඟින් ප්‍රමාදයකින් තොරව එන්නත් ලබාගැනීමට කටයුතු කිරීමත්ය.

වසංගත සමය තුළ පිහිටවූ කාර්ය සාධක බලකා අතරින් තවත් එකක් වූයේ සෞභාග්‍යයේ දැක්මෙහි ඇති ප්‍රතිපත්ති ක්‍රියාත්මකකරණය සඳහා වූ කාර්ය සාධක බලකායයි. ඊට අමතරව ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකාය 2020 අප්‍රේල් 22 දින අති විශේෂ ගැසට් නිවේදන අංක 2172/9 යටතේ පිහිටුවන ලදී. ඉන්පසුව 2020 ජූනි 02 දින අති විශේෂ ගැසට් නිවේදන අංක 2178/18 හරහා සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායද, අති විශේෂ ගැසට් නිවේදන අංක 2178/17 හරහා නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමණාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායද පිහිටුවන ලදී ( 'The Appointment of the Two Presidential Task Forces', 2020). මෙම කාර්ය සාධක බලකා පිහිටුවන ලද්දේ පාර්ලිමේන්තුව අත්හිටුවා තිබූ, එනම් සංවරණ හා තුලන විධායකයේ වාසියට සැකසී තිබූ අවස්ථාවක බව සිහිතබා ගත යුතුය.

---

2 Gazette (Extraordinary) No. 2185/41 of 21 July 2020. Available at: http://www.documents.gov.lk/files/egz/2020/7/2185-41_E.pdf (Accessed: 14 June 2021).

මෙහිදී කැපී පෙනෙන කරුණක් වන්නේ පවතින නෛතික හා ආයතනික රාමුව තුළ, එනම් 2005 අංක 13 දරණ ව්‍යසන කළමණාකරණ පනත වැනි ප්‍රතිපාදන තුළින් මෙම අර්බුදයට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දී තිබීමයි. ඒ අනුව මෙවැනි ක්ෂණික විධිවිධාන ඔස්සේ ස්ථාපනය කරන ලද කාර්ය සාධක බලකා වල අවශ්‍යතාව පිළිබඳ සත්‍ය වශයෙන්ම ගැටළුවක් පැන නඟී.

නිදසුනක් ලෙස, ශ්‍රී ලංකා ව්‍යසන කළමණාකරණ පනත යටතේ පිහිටුවා ඇති ව්‍යසන කළමණාකරණය සඳහා වූ ජාතික සභාවෙහිවගකීම වන්නේ ව්‍යසන අවස්ථාවන් වලදී ජාතික ව්‍යසන කළමණාකරණ සැලසුමක් ඔස්සේ හදිසි ප්‍රතිචාර දැක්වීම, සහන බෙදාහැරීම සහ අරමුදල් බෙදාහරින ආකාරය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි කටයුතු සිදු කිරීමයි[3]. මේ යටතේ ව්‍යසන කළමණාකරණය සඳහා වූ ජාතික සභාව මඟින් පිහිටුවනු ලබන ව්‍යසන කළමණාකරණ මධ්‍යස්ථානයක් ඔස්සේ නියමිත සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ව්‍යසන කළමණාකරණයේදී ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අදාළ උපදෙස් නිකුත් කිරීමත්, එම සංවිධාන සමඟ සම්බන්ධීකරණය කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදුකිරීම අපේක්ෂා කෙරේ[4]. පළමු ව්‍යසන කළමණාකරණය සඳහා වූ ජාතික සභාව පිහිටුවනු ලබන්නේ 2005 මැයි මස වන අතර, පසුව ව්‍යසන කළමණාකරණ මධ්‍යස්ථානය පිහිටුවා දිවයිනේ සියළු දිස්ත්‍රික්ක වලට එහි නිලධාරීන් අනුයුක්ත කිරීම ආරම්භ කෙරේ. ඔවුන්ගේ වගකීම් වූයේ ප්‍රජාවන් විපත සඳහා සූදානම් කිරීම, පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතීන් ස්ථාපනය කිරීම සහ සුනාමි ව්‍යසනයට මුහුණ දීමට අවශ්‍ය සහනාධාර එකතු කිරීම වැනි දේය ('Sri Lanka, the tsunami and the evolution of disaster response', 2014).

යම් ව්‍යසනයක බැරෑරුම් බව නිසා ඊට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සිවිල් සේවයේ පවතින සම්පත් හා ක්‍රියාමාර්ග වලින් කළමණාකරණය කළහැකි මට්ටමින් පරිබාහිරව පවතී නම්, ව්‍යසන තත්වයක් ප්‍රකාශයට පත්කිරීමේ බලය ජනාධිපතිවරයාට පනත මඟින් ලබා දී තිබේ. එය තමාගේ තනි තීරණයෙන් හෝ ව්‍යසන කළමණාකරණය සඳහා වූ ජාතික සභාවෙහි උපදෙස් මත කළ හැකිය[5]. වසංගත තත්වයන් මෙම පනතෙහි ආවරණය කර ඇති ව්‍යසන ගණයෙහිලා ගැණෙන බැවින්[6], වත්මන් අර්බුදය වැනි

3 Section 4 of the Disaster Management Act No. 13 of 2005.

4 Section 8(2)(e) of the Disaster Management Act No. 13 of 2005.

5 Section 11 of the Disaster Management Act No. 13 of 2005.

6 Section 25k of the Disaster Management Act No. 13 of 2005.

තත්වයකදී වුවත් කඩිනමින් හා වගවීමෙන් යුතුව ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පවතින නීතිය තුළම ඇති බව නිගමනය කළහැකි වේ ('Structures to Deal with COVID-19 in Sri Lanka: A Brief Comment on the Presidential Task Force', 2020). එසේ වුවත්, මෙකී පනත ප්‍රකාරව කටයුතු කරනු වෙනුවට ආණ්ඩුව තීරණය කොට තිබෙන්නේ කාර්ය සාධක බලකා සහ වෙනත් එවැනි ව්‍යුහයන් මඟින් පාලනය ගෙන යෑමටය.

මෙම කාර්ය සාධක බලකා සමූහයට අමතරව වසංගතයට අදාළව නිර්දේශ සහ උපදෙස් නිකුත් කිරීමට විශේෂඥ කමිටු ගණනාවක්ද පත් කරන ලදී. මේ අතර 2020 දෙසැම්බර් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කරන ලද බෙහෙවින් විවාදාපන්න අනිවාර්ය ආදාහන රෙගුලාසි පිළිබඳ විශේෂඥ කමිටුව වැදගත්ය ('Cremation Vs. Burial: Expert Panel Revises Recommendation To Include Both Cremation And Burial Of COVID-19 Dead Bodies', 2021). මුස්ලිම් ප්‍රජාවට සිය භූමදානය සම්බන්ධ සිය ආගමික අයිතීන් භුක්ති විඳීමේ අවස්ථාව පවා මඟ හැරුණු (*Report of the United Nations High Commissioner for Human Rights,* 2021), කිසිදු විද්‍යාත්මක සාක්ෂියක් මත පදනම් නොවූ මෙවැනි අත්තනෝමතික සහ විශේෂීකරණය කරනු ලබන ආකාරයේ නීති ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් වලටද පටහැනිය (Saroor and de Soysa, 2020). මේ සම්බන්ධ සිය නිර්දේශ ඉදිරිපත් කරමින් යට කී විශේෂඥ කමිටුව සඳහන් කළේ "කොවිඩ් මළ සිරුරු බැහැර කිරීම පිළිබඳ පෙර නිර්දේශය වෙනස් කරන බවත්, අදාළ ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග හා රෙගුලාසි වලට යටත්ව මළ සිරුරු ආදාහනය හා භූමදානය යන ආකාර දෙකටම බැහැර කළහැකි බවත්" ය ('Cremation Vs. Burial...', 2021). 2021 පෙබරවාරි මාසයේ මෙම සංශෝධනය සිදුකරන ලද්දේ ජාතික සුළුතර කණ්ඩායම් වලින් හා ජාතිකව හා ජාත්‍යන්තරව මානව හිමිකම් කණ්ඩායම් වලින් එල්ල වූ පීඩනය නිසාය ('An Update on the Legal Framework to Address the COVID-19 Pandemic in Sri Lanka', 2021).

වඩාත් මෑත කාලීනව, කොවිඩ්-19 ප්‍රතිකාර හා ඖෂධ සම්බන්ධයෙන් ජාත්‍යන්තරව අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහාද සෞඛ්‍ය අමාත්‍යවරිය විසින් විශේෂඥ කමිටුවක් පත් කළාය ('Expert Committee to keep tab on new COVID therapies, vaccines', 2021). එන්නත්කරණය පිළිබඳ සොයා බැලීමටද මේ හා සමාන කමිටු පත්කළ බවට වාර්තා පවතින අතර, සයිනොෆාම් එන්නත කුමන වයස් කාණ්ඩ වලට ලබාදිය යුතුදැයි තීරණය කිරීමට පත්කළ කමිටුව ඊට එක් උදාහරණයකි (Jayasinghe, 2021). 2020 සහ 2021 වසර දෙක ඇතුළත මෙවැනි කුමනාකාර ව්‍යුහයන් හඳුන්වා දුන්නද, ඒවායෙහි කාර්යභාරය පිළිබඳ අද වනතුරුත් කිසිදු තොරතුරක් පොදු මහජනතාවට ලබාගැනීමට හැකිව නැත.

## නෛතික රාමුව

2020 වසරේ පටන් වරින් වර හඳුන්වා දෙනු ලැබූ නිරෝධායන නීති, ඇඳිරි නීතිය, පොලිස් ඇඳිරි නීතිය මෙන්ම සංචරණ සීමාද නිසා බොහෝ ව්‍යාකූලත්වයක් ජනනය වී ඇත්තේ ඒවායෙහි නෛතික පදනම පිළිබඳ කිසිදු තොරතුරක් පොදු පරිමණ්ඩලය තුළ හමු නොවන හෙයිනි. මෙම සීමා බොහෝ විට හඳුන්වා දුන්නේ මාධ්‍ය රැස්වීම් තුළින් වන අතර, මෙසේ සිවිල් නිදහස සීමා කිරීමට පදනම් වන නෛතික රාමුව කිසිදු අවස්ථාවක පැහැදිලි කළේ නැත. එසේද වුවත් එම සීමා උල්ලංඝණය කිරීමේ පදනම මත අත්අඩංගුවට ගැනීම් ගණනාවක් සිදුව තිබේ (Ranasinghe, 2021). වෛරසයේ පැතිරීම පාලනය කිරීම සඳහා මෙසේ සීමා පැනවීම අත්‍යාවශ්‍ය බවට විවාදයක් නොමැති වුවත්, එම සීමා වලට අදාළ නෛතික රාමුව පැහැදිලි නොකිරීම තුළින් අත්තනෝමතික ලෙස එකී තීරණ බලාත්මක කිරීමේ හැකියාව ලැබෙන බවත්, එම නිසා ආණ්ඩුව කෙරෙහි ජනතාවගේ පැහැදීම අඩුවීම තුළින් සෞඛ්‍ය අර්බුදය කළමණාකරණය කරගැනීමට අවශ්‍ය මහජන සහයෝගය නොලැබී යන බවත් පිළිගත යුතුය.

### *නිරෝධායනය*

1897 පෙබරවාරි 9 වැනි දින බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දෙනු ලදුව, අවසන් වරට 1952 දී සංශෝධනයට ලක්වූ යල්පැන ගිය නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥා පනත (Gunasekara, 2020) යටතේ වත්මන් නිරෝධායන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සැළකිල්ලට භාජනය වී ඇත. එසේම එම ආඥා පනතින් ඇඳිරි නීතිය පැනවීම සඳහා අවශ්‍ය නෛතික පදනම ලබාදෙන්නේ නැත (*HRCSL Recommendations on Regularizing the Imposition of Curfew,* 2020). ආඥා පනතේ 2 වැනි වගන්තියට අනුව "ලංකාවට රෝගයක් පැමිණීම වැළැක්වීමේ අරමුණින් සහ ලංකාව තුළට හෝ ඉන් පිටතට රෝගයක් පැතිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය ඕනෑම රෙගුලාසියක් බලාත්මක කිරීමේ, ආපසු හැරවීමේ හෝ වෙනස් කිරීමේ බලය අමාත්‍යවරයා සතුව පවතින" අතර[7], එසේ රෙගුලාසි බලාත්මක කළ හැක්කේ කුමන කරුණු අරබයාද යන්න එහි 3 වැනි වගන්තියේ දක්වා ඇත. එහෙත් එම වගන්තිය තුළ ඇඳිරි නීතියක් පැනවීම සම්බන්ධයෙන් විධිවිධාන අඩංගු නොවීම සැළකිය යුත්තකි.

---

7 Section 2 of Quarantine and Prevention of Diseases Ordinance No. 3 of 1897.

මීට අමතරව මෙම ආඥා පනත යටතේ පසුගිය මාස කිහිපය තුළ හඳුන්වා දුන් තවද රෙගුලාසි තිබේ:

1. 2020 මාර්තු 20 සිකුරාදා අති විශේෂ ගැසට් නිවේදන අංක 2167/18 මඟින් කොවිඩ්-19, නිරෝධායන නීති අදාළ වන රෝග යක් බවට ප්‍රකාශයට පත් කිරීම. මෙය 1925 සහ 1960 වර්ෂ වල මේ සම්බන්ධයෙන් පැනවූ නිරෝධායන නීති වත්මන් වසංගත තත්වයට අදාළ කළහැකි වීම සඳහා හඳුන්වා දුන් ගැසට් නිවේදනයකි.
2. 2020 මාර්තු 25 බදාදා අති විශේෂ ගැසට් නිවේදන අංක 2168/6 තුළින් 'ආසාදිත ප්‍රදේශයක්' සහ 'නිසි අධිකාරය' යන පද නිර්වචනය කිරීම.
3. 2020 අප්‍රේල් 11 සෙනසුරාදා අති විශේෂ ගැසට් නිවේදන අංක 2170/8 ඔස්සේ කොවිඩ්-19 ආසාදනය වී මිය යන්නන්ගේ සිරුරු සඳහා ආදාහනය අනිවාර්ය කිරීම.
4. 2020 ඔක්තෝබර් 15 බ්‍රහස්පතින්දා අති විශේෂ ගැසට් නිවේදන අංක 2197/25 යටතේ පොදු ස්ථාන වල සංචරණ සීමා පැනවීම.
5. 2021 පෙබරවාරි 25 බ්‍රහස්පතින්දා අති විශේෂ ගැසට් නිවේදන අංක 2116/38 හරහා කොවිඩ්-19 ආසාදනය වී මිය යන්නන්ගේ සිරුරු සඳහා ආදාහනය සහ භූමදානය යන විකල්ප දෙකම විවෘත කිරීම.

නිරෝධායන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ආයතන පද්ධතිය සහ නිලධාරීන් පිළිබඳවද ගැටළු පැන නැඟී ඇත. නිදසුනක් ලෙස වර්ෂ 2020 ඔක්තෝබර් මාසයේ හඳුන්වා දුන් පොදු ස්ථාන වල සංචරණ සීමා පැනවීම යටතේ, කොවිඩ් ආසාදනය වී ඇති බව ඔප්පු වූ හෝ එසේ වී ඇති බවට සැක කරන ඕනෑම පුද්ගලයකු අදාළ ස්ථානයෙන් ඉවත් කොට රෝහලකට, නිරෝධායන මධ්‍යස්ථානයකට හෝ ස්වයං නිරෝධායනයට යොමු කිරීමේ හැකියාව නිසි බලධාරීන්ට පවතී. එහෙත් මෙම රෙගුලාසි මඟින් පොලිසිය හෝ ආරක්ෂක අංශ 'නිසි බලධාරීත්වය' යටතේ හඳුනාගෙන නැත. එම නිසා ඔවුන් මෙම ක්‍රියාවලියට සම්බන්ධ වීම ඇත්තෙන්ම එම රෙගුලාසි උල්ලංඝණය කිරීමකි ('Q and A on Regulations Issued under the Quarantine and Prevention of Diseases Ordinance & how this impacts the COVID-19 response in Sri Lanka', 2020). එබැවින් නිරෝධායන නීති උල්ලංඝණය කරන ලදැයි හුවා දක්වමින් ආරක්ෂක අංශ මඟින් සිදුකරන්නා වූ අත්අඩංගුවට ගැනීම් වල නීතිමය පදනම පැහැදිලි නැති බව කිව හැකිය. වර්ෂ 2021 මැයි මාසයේ පොලිස්පතිවරයාට යොමු කරන ලද ලිපියක් තුළින්

මානව හිමිකම් කොමිසමද පෙන්වා දෙනු ලබන්නේ මෙම අත්අඩංගුවට ගැනීම් වලදී නෛතික භාවය සහ සමානව සැළකීම යන මූලධර්ම පිළිබඳ සැළකිළිමත් වියයුතු බවයි (*IGP responds to HRCSL in respect to the arrest of persons violating quarantine rules,* 2021).

නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥා පනතෙහි 4(1)[8] සහ 5(1)[9] වගන්ති වල සඳහන්ව ඇති සමහර ප්‍රතිපාදන තුළ මෙවැනි අත්අඩංගුවට ගැනීම් සඳහා යම් පදනමක් සපයා ඇත. එසේම දණ්ඩ නීති සංග්‍රහයේ 262[10] සහ 264[11] වගන්ති තුළද මෙවැනිම යම් පදනමක් සපයා ඇති බවත් පෙනේ (‘An Update on the Legal Framework to Address the COVID-19 Pandemic in Sri Lanka’, 2021).

### *ඇඳිරි නීතිය*

වරින් වර බලාත්මක කරන ලද ඇඳිරි නීතිය සම්බන්ධ රෙගුලාසි හඳුන්වා දීමේදී ඒවාට අදාළ නෛතික ප්‍රතිපාදන මොනවාදැයි පැහැදිලි කිරීමට ආණ්ඩුව දිගින් දිගටම අසමත් වුනි (‘Curfew in response to COVID-19: Legal Framework and Relevant Questions in Sri Lanka’, 2020). 2020 ජූනි මාසයේදී මානව හිමිකම් කොමිසම කියා සිටියේ ඇඳිරි නීතිය පැනවීම පවතින ව්‍යවස්ථාවට සහ රාජ්‍යයේ ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම් වලට අනුකූලව කළයුතු බවයි (*HRCSL Recommendations on Regularizing the Imposition of Curfew,* 2020). මෙසේ ඇඳිරි නීතිය

---

8 Section 4(1) of the Quarantine and Prevention of Diseases Ordinance No. 3 of 1897. මෙම වගන්තියට අනුව මෙම ආඥාවේ ඇති කිසියම් නියමයක් උල්ලංඝණය කරන්නෙකු ආඥාවට එරෙහිව වරදක් කළ අයකු සේ සැළකේ.

9 Section 5(1) of the Quarantine and Prevention of Diseases Ordinance No. 3 of 1897. මෙම වගන්තියට අනුව මෙම ආඥාවට එරෙහිව වරදක් කළා යැයි ඔප්පු වූ තැනැත්තෙකුට හය මාසයකට නොවැඩි සිර දඬුවමක් හෝ රුපියල් දෙදහසට නොඅඩු සහ රුපියල් දස දහසට නොවැඩි දඩයක් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය.

10 Section 262 of the Penal Code of Sri Lanka. “ජීවිතයට අන්තරාදායක වූ යම් රෝගයක් පැතිරවිය හැකි වූද, එලෙස පැතිරවිය හැකි බව තමා දන්නා වූ හෝ එලෙස විශ්වාස කිරීමට කරුණු තිබෙන්නා වූද යම් ක්‍රියාවක් නීති විරෝධීව හෝ නොසැළකිළිමත්ව කරන තැනැත්තෙකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය.”

11 Section 264 of the Penal Code of Sri Lanka. “යම් යාත්‍රාවක් නිරෝධායන තත්වයක තැබීම සඳහා හෝ නිරෝධායන තත්වයක තිබියදී යාත්‍රාවල වෙරළ සමඟ හෝ වෙනත් යාත්‍රා සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධත්වය ක්‍රමවත් කිරීම සඳහා හෝ බෝවෙන රෝගයක් ඇති ස්ථානයක් වෙනත් ස්ථාන සමඟ ඇති අන්‍යෝන්‍ය සම්බන්ධත්වය පාලනය කිරීම සඳහා ආණ්ඩුව විසින් පනවා ප්‍රසිද්ධ කරනු ලැබූ යම් ව්‍යවස්ථාවකට දැනුවත්ව අකීකරු වන තැනැත්තකුට මාස හය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය.”

හඳුන්වා දීමේදී යම් යම් කොන්දේසි සම්පූර්ණ කළයුතු බව අදාළ නෛතික ප්‍රතිපාදන වල දක්වා තිබුණත්, ඒවා එසේ සම්පූර්ණ කළාද යන්න සැක සහිතය.

ව්‍යවස්ථාව සහ මහජන ආරක්ෂණ ආඥා පනත මඟින් ඇඳිරි නීතිය බලාත්මක කිරීමේ අධිකාරය ජනාධිපති වෙත ලබාදී තිබුණද, නිරෝධායන ඇඳිරි නීතිය ප්‍රකාශයට පත්කළ කිසිදු අවස්ථාවක ආඥා පනත පිළිබඳ කිසිදු සඳහනක් නොවුණි. එසේම 'නිරෝධායන ඇඳිරි නීතිය' යන පදය දැනට පවතින කිසිදු නීතියක භාවිතා වන පදයක් නොවීමද වැදගත්ය. මෙවැනි නෛතික පදනමක් රහිත පද ගණනාවක් ආණ්ඩුව විසින් මෑත කාලයේදී භාවිතා කොට ඇති බව පෙනේ.

මහජන ආරක්ෂණ ආඥා පනතේ 16 වැනි වගන්තියට අනුව ජනාධිපතිට ගැසට් නිවේදනයක් මඟින් යම් ප්‍රදේශයක වෙසෙන්නන්ගේ පොදු ස්ථාන වල සංචරණය දෙන ලද කාල සීමාවකට සීමා කළ හැකිය. කෙසේ වුවත් එම ආඥාව වලංගු වීමට නම් කොන්දේසි දෙකක් සම්පූර්ණ විය යුතුය: පළමුවැන්න එකී ආඥාව ගැසට් නිවේදනයක් හරහා ප්‍රකාශයට පත් කිරීමයි; දෙවැන්න එම ආඥාව පාර්ලිමේන්තුවට සන්නිවේදනය කිරීමයි. එහිදී සාමාන්‍යයෙන් හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කිරීමේදී අනුගමනය කරන ක්‍රියාවලිය අනුගමනය කිරීම අපේක්ෂා කෙරේ (*HRCSL Recommendations on Regularizing the Imposition of Curfew,* 2020).

හදිසි තත්වයකදී මහජන ආරක්ෂාව සඳහා අවශ්‍ය යැයි ජනාධිපති තීරණය කරන ඕනෑම රෙගුලාසියක් හඳුන්වා දීමේ බලය ව්‍යවස්ථාව සහ මහජන ආරක්ෂණ ආඥා පනත යන ද්විත්වයෙන්ම ජනාධිපතිට ලබාදී ඇත[12]. එසේම මෙම රෙගුලාසි අනෙක් නීතීන් අභිබවා බලපවත්වන බවත්[13], එම අනෙකුත් නීතීන් සංශෝධනය හෝ තාවකාලික අත්හිටුවීමට ලක්කිරීමේ බලය ඒවාට පවතින බවත් එහි සඳහන් වේ. එසේ වුවද ව්‍යවස්ථාමය ප්‍රතිපාදන මෙසේ සංශෝධනයට හෝ තාවකාලික අත්හිටුවීමට ලක්කිරීමේ බලයක් හදිසි රෙගුලාසි වලට නොමැත[14]. එවැනි රෙගුලාසි ප්‍රශ්න කිරීමේ හැකියාව කිසිදු අධිකරණයකට නැත[15]. එසේ වුවත් එබඳු රෙගුලාසි බලාත්මක වීමට නම් පාර්ලිමේන්තුවේ අනුමැතිය සහිත හදිසි තත්වයක් ප්‍රකාශයට පත්විය යුතුය[16].

---

12 Section 5 of the Public Security Ordinance No. 25 of 1947.

13 Section 7 of the Public Security Ordinance No. 25 of 1947.

14 Article 155(2) of the Constitution.

15 Section 8 of the Public Security Ordinance No. 25 of 1947.

16 Article 155(3) of the Constitution.

***පොලිස් ඇඳිරි නීතිය***

කිහිප අවස්ථාවකදීම පොලිස් බල ප්‍රදේශ කිහිපයක ප්‍රකාශයට පත්කරන ලද 'පොලිස් ඇඳිරි නීතිය' (Foreign Ministry, Sri Lanka, 2020) සඳහා පදනම් වූ නෛතික රාමුව කුමක්දැයි යන්න කිසිදු අවස්ථාවකදී පැහැදිලි නොකෙරුණි. 'මහජන පීඩාව' සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ ඇති ප්‍රතිපාදන, පොලිස් ආඥා පනත හා එකට ගෙන සැළකූ විට මහජන ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන්ගේ භූමිකාව පිළිබඳ යම් තොරතුරක් ලැබුණත්, පොලිස් ඇඳිරි නීතිය යැයි හඳුන්වා ගන්නා තත්වය බලාත්මක කිරීමට එතුළ කිසිදු ප්‍රතිපාදනයක් සපයා නැත.

දණ්ඩ නීති සංග්‍රහයේ 261[17] සහ 262[18] වගන්ති වල මහජන පීඩාව සම්බන්ධයෙන් තොරතුරු දක්වා ඇති අතර, එහිදී මහජනතාවට ආරක්ෂාවට ඇති අයිතිය පිළිගෙන ඇත. ඊට අමතරව පොලිස් ආඥා පනතේ 56 වැනි වගන්තිය යටතේ මහජන පීඩාව වැළැක්වීමට සිය රාජකාරී මට්ටමින් හැකි උපරිමයෙන් කටයුතු කිරීමට පොලිස් නිලධාරීන්ට වගකීමක් ඇති බව පෙන්වා දේ. එසේ වුවත් මෙම ආඥා පනතෙහිද කිසිදු තැනක ඇඳිරි නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පොලිස් නිලධාරීන්ට බලය ලබා දී නොමැති වීම කැපී පෙනේ ( 'Curfew in response to COVID-19: Legal Framework and Relevant Questions in Sri Lanka', 2020).

## වසංගතය තුළ හදිසියේ සම්මත කරගන්නා ලද නීති

වේගයෙන් විකාශනය වන සෞඛ්‍ය අර්බුදයට ප්‍රතිචාර දැක්වීම සඳහා හදිසි නීති සෑදීම අත්‍යාවශ්‍ය වුවත්, ආණ්ඩුවේ ප්‍රමුඛතාව වූයේ විධායකයේ බලය තවදුරටත් වර්ධනය කරන සහ පාර්ලිමේන්තුව දුර්වල කරන ආකාරයේ

---

17 Section 261 of the Penal Code of Sri Lanka. "මහජනයාට හෝ සාමාන්‍යයෙන් අසල පදිංචිව සිටින හෝ දේපල භුක්ති විඳින ජනයාට පොදු පාඩුවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇති කරන, නැතහොත් යම් පොදු අයිතිවාසිකමක් භුක්ති විඳීමේ අවස්ථාවකින් ප්‍රයෝජනයක් ගැනීමට සිදුවිය හැකි ජනයාට අවශ්‍යයෙන්ම පාඩුවක්, බාධාවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇතිවන යම් ක්‍රියාවකට හෝ එබඳු නීති විරෝධී නොකර හැරීමකට වරදකරු වන තැනැත්තෙක් මහජන කරදරය කිරීම් වරදට වැරදිකාරයෙක් වේග යම් පහසුවක් හෝ ලාභයක් සැලසීමේ කරුණ උඩ මහජන කරදරයකට සමාව නොලැබේ."

18 Section 262 of the Penal Code of Sri Lanka. "ජීවිතයට අන්තරාදායක වූ යම් රෝගයක් පැතිරවිය හැකි වූද, එලෙස පැතිරවිය හැකි බව තමා දන්නා වූ හෝ එලෙස විශ්වාස කිරීමට කරුණු තිබෙන්නා වූද යම් ක්‍රියාවක් නීති විරෝධීව හෝ නොසැළකිළිමත්ව කරන තැනැත්තෙකුට හය මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය."

නීතීන් සම්මත කරගැනීමයි. 20 වන සංශෝධනය සහ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත මේ සම්බන්ධයෙන් වඩාත් හොඳ නිදර්ශනයන් ද්විත්වයක් වශයෙන් පෙන්වා දිය හැකිය. එහෙත් සෞඛ්‍ය අර්බුදය කළමණාකරණය කිරීමට අදාළ නීති හඳුන්වා දීම සඳහා ආණ්ඩුව මේ වන තුරුත් අවංක උත්සහයක් දරා නැත. 2020 ඔක්තෝබර් 19 වන දින සුමන්දිරන් මන්ත්‍රීවරයා විසින් ඉදිරිපත් කරන ලද පෞද්ගලික යෝජනාවක් මගින් හදිසි සෞඛ්‍ය තත්වයක් ප්‍රකාශයට පත්කිරීමට පාර්ලිමේන්තුවට අවශ්‍ය නෛතික පදනම ලබාදීමත්, ඒ මත පදනම්ව මහජන ආරක්ෂාව වෙනුවෙන් අවශ්‍ය කරන්නා වූ විශේෂ පියවර ගැනීමත් පිළිබඳ යෝජනාවක් සිදුකර තිබූ පසුබිමක මෙම මගහැරීම සිදුවීම වැදගත්ය (Indrajith, 2020).

### *20 වන සංශෝධනය*

2020 ඔක්තෝබර් 22 වැනිදා 20 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත වූයේ හුදු දින දෙකක විවාදයකින් පසුවය (*Sri Lanka: newly adopted 20th Amendment to the Constitution is blow to the rule of law,* 2020). මෙම සංශෝධනයෙන් සිදුකරන ලද මූලිකම වෙනස නම් විධායක ජනාධිපති ධූරය අරබයා තිබූ සංවරණ සහ තුලන සැළකිය යුතු ප්‍රමාණයක් ඉවත් කිරීමයි. කලින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ස්වාධීන ආයතන ගණනාවකට ජනාධිපති විසින් සිදුකළ යුතුව තිබූ පත් කිරීම් වලට අනුමැතිය, නව සංශෝධනයේදී ලැබෙන්නේ පාර්ලිමේන්තු සභාවක් තුළිනි. එයට ඇත්තෙන්ම කිසිදු ආකාර බලයක් නැත. ඉන් පැහැදිලි වන්නේ මෙම ස්වාධීන ආයතන වල පත් කිරීම් සම්බන්ධ සම්පූර්ණ බලතල ජනාධිපති යටතට ගෙන ඇති බවත්, එමගින් ඒවායෙහි ස්වාධීනත්වය දැඩි සේ සීමා කොට ඇති බවත්ය ('Statement on the Twentieth Amendment', 2020).

මෙම සංශෝධනය සම්බන්ධ ඉතාම ගැටළුකාරී තත්වයක් වූයේ පාර්ලිමේන්තුවට හඳුන්වා දෙන ලද අවස්ථාවේ නොතිබූ නව ප්‍රතිපාදන ගණනාවක් කමිටු අවස්ථාවේදී හඳුන්වා දීමයි. උපරිමාධිකරණ දෙක තුළ සේවය කරන විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම වැනි වැදගත් ප්‍රතිපාදනද ඊට අයත් විය. මෙසේ නීතියක් සම්මත කිරීමේ අවසාන අදියර තුළදී වෙනස්කම් හඳුන්වා දීම මගින් අධිකරණ විවරණය සහ මහජන මතය විමසීම යන ක්‍රියාදාමයන් සම්පූර්ණයෙන්ම මගහැර යාමක් සිදුවන අතර, එය ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම වලට අතිශයින් අහිතකර වේ (*Sri Lanka: newly adopted 20th Amendment to the Constitution is blow to the rule of law,* 2020).

*කොළඹ වරාය නගරය*

කොළඹ වරාය නගර පනතේ විවිධ වගන්ති වල නෛතික භාවය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් 19 ක් ගොනු වූ අතර, ඒ අතර විපක්ෂයේ සහ සිවිල් සමාජ ක්‍රියාධරයින්ගේ පෙත්සම්ද විය[19]. රටේ ස්වෛරීභාවයට, භෞමික අඛණ්ඩතාවයට හා නීතියේ ආධිපත්‍යයට එමගින් ඇතිකළ හැකි බලපෑම ඒවායින් මතුකරන ලද මූලික කරුණු අතර විය. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අදාළ පනතට සංශෝධන 25 ක් යෝජනා කළ අතර, ආණ්ඩුව ඒවා ඉක්මණින්ම පිළිගත්තේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතරයක් අවශ්‍ය වීම වැළැක්වීමටය (Srinivasan, 2021).

මෙම පනත සම්බන්ධයෙන් එල්ල වූ වෙනත් විවේචන අතර එය සම්මත කරගැනීමේ ක්‍රියාවලිය තුළ මහජන අදහස් ප්‍රකාශ කිරීමට ලබාදී තිබූ අවම ඉඩ පිළිබඳ කරුණද විය. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාශයට පත්වීමෙන් දින දෙකක් වැනි කෙටි කාලයක් ඇතුළත පාර්ලිමේන්තු විවාදයද අවසන් කොට පනත සම්මත කරගන්නා ලදී ('Transparency International Sri Lanka continues to have serious concerns about new Colombo Port City Law', 2021).

වසංගත තත්වයක් පවතින අවස්ථාවකදී ඉතා හදිසි කරමින් මෙවැනි නීති සම්මත කරගැනීම සැළකීමට බඳුන් වියයුතු කරුණක් වන්නේ, එමගින් නීතියේ ආධිපත්‍යය, ස්වෛරීභාවය සහ මූලික අයිතිවාසිකම් වලට දිගු කාලීන බලපෑම් එල්ල කිරීම හේතුවෙනි.

## ආණ්ඩුකරණය සහ අයිතිවාසිකම් පිළිබඳ ගැටළු

*දේශපාලනීකරණය සහ මිලිටරීකරණය වූ ප්‍රතිචාරය*

වසංගතයේ මුල පටන්ම ඉතා පැහැදිලි කරුණක් වූයේ අර්බුදය කළමණාකරණය කරගැනීම සඳහා අවශ්‍ය නිපුණත්වය සහ විශේෂඥ දැනුම රටේ සිවිල් පරිපාලනයට පැවති බවයි ('Structures to Deal with COVID-19 in Sri Lanka: A Brief Comment on the Presidential Task Force', 2020). එසේ වුවත් වසංගත ප්‍රතිචාරය තුළ ආරක්ෂක අංශ වලට සහ ජනපතිට මිතුරු විශේෂඥයින්ට මුල්තැන ලබාදුන්නේ සෞඛ්‍ය හා සිවිල් සේවයේ වෙනත් අදාළ අංශ වසංගත ප්‍රතිචාරයෙන් විතැන් කරමිනි.

19 'The Centre for Policy Alternatives (Guarantee) Limited and Dr. Paikiasothy Saravanamuttu vs. The Attorney General (SC SD 4/ 2021) (in re the Colombo Port City Economic Commission Bill)', 2021.

මිලිටරීකරණය පිළිබඳ මහජනතාවට ඇති සැකසංකා දුරලීම සඳහා විනය හා කාර්යක්ෂමභාවය පිළිබඳ ආඛ්‍යාන නිතර භාවිතයට ගනු ලැබේ. ඊට මුවා වී සිදුකරන ලද පත්කිරීම් වලට නිදසුනක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ විපත් කළමණාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ යන තනතුරු වලට හමුදා නිලධාරීන් පත්කිරීම සහ, ඉහත සඳහන් කරන ලද කාර්ය සාධක බලකා සමූහයේ සැළකිය යුතු තරම් සාමාජිකයින් පිරිසක් හමුදා පසුබිමක් සහිත අයවළුන් වීම දැක්විය හැකි වේ ('Technocratic Populism and the Pandemic State', 2020). 2021 ජනවාරි මාසයේදී දිස්ත්‍රික් මට්ටමින් කොවිඩ් වැළැක්වීම සහ නිරෝධායන වැඩපිළිවෙලවල් සම්බන්ධීකරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් අනුයුක්ත කෙරුණු අතර, එම පත්වීම් නිර්දේශ කළේ හමුදාපති ශවේන්ද්‍ර සිල්වාය ('Army officers to coordinate COVID-19 prevention measures', 2021). ජාතික කොවිඩ් මර්දන මධ්‍යස්ථානයේ සභාපති ලෙස කොවිඩ් ප්‍රතිචාරයේ මුහුණ බවට පත්ව ඇත්තේ ඔහු වන අතර, එම නිසා සෞඛ්‍ය අර්බුදය සම්බන්ධ තීරණ සහ නිවේදන දිගින් දිගටම ඔහු හරහා සන්නිවේදනය වේ (Fonseka, 2020).

ප්‍රාදේශීය මට්ටමේදී මෙම තදින් මිලිටරීකරණය වූ ස්වභාවය ප්‍රකාශයට පත්වූයේ ආශ්‍රිතයන් සෙවීම, මුරපොලවල් පවත්වාගෙන යෑම (*Sri Lanka: Increasing Suppression of Dissent,* 2020) එන්නත්කරණය (Jayawardana, 2021), නිරෝධායන මධ්‍යස්ථාන වෙත කැමැත්තෙන් හෝ අකමැත්තෙන් පිරිස් රැගෙන යාම (*Sri Reflections on COVID Governance in Sri Lanka 43 Lanka: vulnerable groups pay the price for militarization of COVID-19 response,* 2020), හා හුදෙකලා කරන ලද ප්‍රදේශ වල කටයුතු අධීක්ෂණය සඳහා ඩ්‍රෝන භාවිතය (Charindra, 2020) වැනි අවස්ථා තුළිනි.

එසේම ආරක්ෂාව පිළිබඳ භාෂාව යොදා ගනිමින් වසංගත තත්වය පිළිබඳ කතා කිරීමද මෙම මිලිටරීකරණයේම දිගුවකි. එහිදී 'සෞඛ්‍ය අර්බුදයක්' යන යෙදුමට වඩා බොහෝ කොටම භාවිතා කළේ 'වසංගතයට එරෙහි යුද්ධය', 'ජාතික ආරක්ෂාවට තර්ජනයක්' වැනි යෙදුම්ය (Fonseka, 2020). රටේ මිලිටරි ව්‍යුහය තවදුරටත් විස්තීර්ණ කිරීමටත්, යම් යම් ප්‍රශ්නකාරී භාවිතයන් සාමාන්‍යකරණය කිරීමටත් මෙම වසංගත තත්වය උපකාරී වී ඇති බව පෙනේ. හදිසි අවස්ථාවකදී ආරක්ෂක අංශ වල සේවය ලබාග ැනීම සාමාන්‍ය දෙයක් වුවත්, වර්තමානයේ මෙන් සිවිල් ජීවිතය තුළ අතිශය වැදගත් භූමිකාවක් ඒවා මගින් ඉටු කිරීමට පටන් ගැනීම තුළ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදයට දිගු කාලීනව ගැටළු ඇතිවිය හැක.

මීට අමතරව වසංගත ප්‍රතිචාරයේ කොටසක් ලෙස පිහිටුවන ලද බොහෝ ව්‍යුහයන් වලට සිදුකරන ලද පත්කිරීම් තුළින් විද්‍යාමාන වන තවත් ප්‍රවණතාවයක් වන්නේ දේශපාලනීකරණයයි. මෙවැනි පත්කිරීම්

අතර වැදගත් එකකි අත්‍යාවශ්‍ය සේවා සම්බන්ධීකරණය හා අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති වශයෙන් බැසිල් රාජපක්ෂ පත්කිරීම. මෙම පත්කිරීම නිසා සහනාධාර බෙදා හැරීමේදී ආණ්ඩුවට සහය දක්වන්නන්ට වැඩි වාසි ලැබෙන බවට චෝදනාවක් එල්ල විය. එසේම රුපියල් 5000 දීමනාව බෙදාහැරීමත් අවම අධීක්ෂණය යටතේ පලාත් පාලන ආයතන වලට පවරා තිබූ බැවින් ඒ සම්බන්ධවද බොහෝ චෝදනා එල්ල වන ලදී (Colombage, 2020a). පෙර දක්වන ලද මිලිටරීකරණයද දේශපාලන නායකත්වය යටතේ සිදුවන බැවින් මිලිටරීකරණයේ දේශපාලනීකරණයද අප හඳුනාගත යුතුය.

***මර්දනය***

සෞඛ්‍ය අර්බුදයට මුවා වී ආණ්ඩුවට විරුද්ධ හඬවල් නිහඬ කිරීමේ වෑයමක්ද ඇති බව පෙනේ. 2020 අප්‍රේල් මාසයේදී ජ්‍යෙෂ්ඨ නීතිඥයකු වන හේජස් හිස්බුල්ලා අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගත්තේ නිවසේ රැඳී සිටීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඔහුට ලබාදුන් පණිවුඩයකට අනුව ලද උපදෙස් පරිදි නිවසේ රැඳී සිටියදීය (Ruwanpathirana, 2020). වසංගත සමය තුළ ලංකාවේ ප්‍රකාශනයේ නිදහස උල්ලංඝණය වී ඇති පරිමාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් මිෂෙල් බැචලේ පවා සිය සැළකිළිමත්භාවය ප්‍රකාශ කළාය (*Asia: Bachelet alarmed by clampdown on freedom of expression during COVID-19,* 2020).

වැඩ බලන පොලිස්පතිවරයා එක් අවස්ථාවක අනතුරු හැඟවූයේ රජයේ නිලධාරීන්ගේ සුළු වැරදි විවේචනය කරමින් සමාජ මාධ්‍ය වල මත පල කරන්නන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්නා බවයි ('Strict action against those criticise state officials on social media', 2020). ඊට එරෙහිව ලිපියක් නිකුත් කරමින් මානව හිමිකම් කොමිසම මගින් වැඩ බලන පොලිස්පතිවරයා වෙත දන්වා සිටියේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති හෝ නිලධාරීන් විවේචනය කිරීම නිසා පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවක් බවය (*Limiting Freedom of Expression in a Democracy: The Need to Strike a Lawful Balance,* 2020). එසේම මෑතදී පත් කරන ලද අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ විශේෂ කණ්ඩායමක් විසින් සමාජ මාධ්‍ය වල වැරදි තොරතුරු පතුරුවන්නන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා බව ආණ්ඩුව දන්වා සිටියේ, ඒවා නිසා විශේෂයෙන්ම මහජන ව්‍යාපාර, කොවිඩ් මර්දන වැඩසටහන සහ ඩෙංගු මර්දන වැඩසටහන යන කරුණු පිළිබඳ වැරදි මතයන් සමාජගත කරන බව පෙන්වාදෙමිනි (Nathaniel, 2021).

ඒ අනුව පැහැදිලි වන්නේ වසංගතය කළමණාකරණය කිරීමට යැයි කියමින් හඳුන්වා දෙනු ලැබ ඇති නීති නිසා භාෂණයට, සමාගමයට සහ පුද්ගලික නිදහසට ඇති ව්‍යවස්ථාපිත අයිතීන් උල්ලංඝණය වීමේ ප්‍රවණතාවයක් හටගෙන ඇති බවයි. මිලිටරීකරණය තුළින් මෙම තත්වය තවත් දරුණු වියහැකි බවද, එනිසා දිගු කාලීනව රටේ ප්‍රජාතන්ත්‍රවාදී ජීව ගුණයට හානි වියහැකි බවද පෙනෙන්නට තිබේ. මර්දනය පිළිබඳ ඇති බිය හේතුවෙන් අන්තර්ජාලයේ හා සැබෑ ලෝකය තුළ සිය මතය ප්‍රකාශ කරන්නට පුරවැසියන් මැලි වීමත්, එම නිසා සිවිල් සමාජ ක්‍රියාකාරීත්වයට ඇති අවකාශය එන්න එන්නටම අඩු වීමත් දැනටමත් දැකිය හැකිය.

### *ආන්තික කණ්ඩායම් කෙරෙහි ඇති බලපෑම*

කොවිඩ්-19 අර්බුදයෙහි බලපෑම වැඩිපුරම දැනෙන්නේ සමාජයේ දැනටමත් ආන්තීකරණයට ලක්ව සිටින දෛනික වේතන ලබන්නන්, නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්, සංක්‍රමණික ශ්‍රමිකයින් සහ වතු ප්‍රජාව වැනි කණ්ඩායම් වලටය (‘Socio-Economic Index in the face of COVID-19’, 2021). එමඟින් ඇත්තෙන්ම සමාජයේ පවතින බෙදුම් රේඛාවන් මොනවාද යන්නත්, ඒවා තුළින් ඇති කරන අසමානත්වයන් කොතරම් දරුණුද යන්නත් මොනවට පැහැදිලි කරයි. වෛරසයේ පැතිරීම පාලනය කිරීම සඳහා බලාත්මක කරන ලද ඇඳිරි නීතිය සහ රට අගුළු දැමීම් වැනි දේ නිසා මිලියන ගණනක් දෛනික වේතන ලබන්නන්ගේ ජීවිත බලපෑමට ලක්විය (‘Partial shutdown sinks small businesses, daily wage earners’, 2020). එසේම කිසිදු ආකාර හව් හරණක් නොමැතිව සහ නැවත ලංකාව බලා ඒමට ගුවන් ටිකට්පතක් ලබාගැනීම සඳහා අවශ්‍ය ප්‍රවේශය නොමැතිව ගල්ෆ් කලාපයේ සිරවූ සේවක සේවිකාවන්ගේ සංඛ්‍යාවද අති මහත්ය (Hamza, 2021).

එන්නත්කරණ වැඩසටහන තුළ මෑතදී ප්‍රමුඛතාව ලබාදුන් නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් අතර සීඝ්‍රයෙන් වෛරසය පැතිර යාමේ ප්‍රවණතාවද මෙහිදී අවධානයට ලක්විය යුතුය (Gunawardana and Padmasiri, 2021). එසේම බන්ධනාගාර වල රැඳවියන් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් වසංගත තත්වයට ගොදුරු වීමේ වැඩි අවදානමක් පැවතීමත්, එම කාරණය අරබයා මහර බන්ධනාගාරයේ සිදුවූ කෝලාහලය නිසා රැඳවියන් 11 දෙනෙකු මරණයට පත්වීමත් තුළ එහි තත්වය කොතරම් බැරෑරුම්ද යන වග පැහැදිලි වේ (Srinivasan, 2020). පවතින නෛතික රාමුව හා අළුතින් ඇති කරන ලද ව්‍යුහයන් මඟින් මෙම ගැටළු වලට විසඳුම් සෙවිය හැකි වුවත්, මෙවැනි සිදුවීම් උද්ගත වීම තුළ ක්‍රියාත්මකකරණයේ යම් යම් අඩුපාඩු පවතින බව පැහැදිලිව පෙනී යයි.

රට අගුළු දැමූ කාල සීමාව තුළගෘහස්ථ ප්‍රචණ්ඩත්වයද සීඝ්‍රයෙන් ඉහළ ගියේය. සංචරණ සීමා තුළින් එල්ල කරන ලද ආර්ථික හා සමාජමය පීඩනයන් (UNICEF, 2020) නිසා මෙම ගැටළු ඉහළ ගිය අතර, නීතිය බලාත්මක කරන නිලධාරීන්ට සහ වෙනත් නෑ හිතමිතුරන්ට තිබූ ප්‍රවේශය විශාල වශයෙන් ඇහිරීමද තත්වය තවත් දරුණු අතට හැරවීමෙහිලා හේතු විය (Fonseka, 2021). මේ හා සම්බන්ධ නෛතික අඩු ලුහුඬුකම් උපරිණපූරණය කිරීම හා ඒ තුළින් ක්‍රියාත්මකකරණයේ දෝෂ මඟ හරවා ගැනීම එම නිසා ඉතා වැදගත් වේ.

කොවිඩ්-19 ට දැක්වූ ප්‍රතිචාරය තුළ මුස්ලිම් ප්‍රජාව පිළිබඳ ගත් තීරණ ඉතා දැඩි වශයෙන් විවේචනයට භාජනය විය. ඔවුන් කලින් සිටම ලක්වූ වෙනස් කොට සැළකීම් සහ නින්දාවන් වසංගත තත්වය තුළදී ඉතා අධික මට්ටමකට ගිය බව සිහිපත් කළ යුතුය (Fonseka and Dissanayake, 2021). එහිදී කොවිඩ්-19 ආසාදනය වී මියයන්නන් අනිවාර්යයෙන් ආදාහනය කළයුතු බවට නියෝග කරමින් 2020 අප්‍රේල් 11 වන දින නිකුත් කරන ලද අංක 2170/8 දරණ ගැසට් නිවේදනය වැදගත් වේ (‘Q and A on Regulations Issued under the Quarantine and Prevention of Diseases Ordinance & how this impacts the COVID-19 response in Sri Lanka’, 2020). එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් විශේෂඥයින්ට අනුව මෙම තහනම මානව හිමිකම් උල්ලංඝණයකි. මන්ද කොවිඩ්-19 ආසාදනය වී මියයන්නන් භූමදානය කිරීම මඟින් කිසිදු ආකාර සෞඛ්‍ය අනතුරක් සිදුවන බවට විද්‍යාත්මක සාක්ෂි ලංකාවේ හෝ ලොව කිසිදු තැනක හමුව නොමැති බැවිනි (*Sri Lanka: Compulsory cremation of COVID-19 bodies cannot continue, say UN experts,* 2021). ඉතා දරුණු ලෙස විවේචනයට භාජනය වීම නිසා පසුව මෙම තීරණය භූමදානයද ඇතුළත් වන පරිදි වෙනස් කිරීමට ලක්විය (‘An Update on the Legal Framework to Address the COVID-19 Pandemic in Sri Lanka’, 2021).

මුස්ලිම් ප්‍රජාව සදාචාර විරෝධී වාර්තාකරණයේද ගොදුරක් බවට පත්විය. එහිදී කොවිඩ්-19 ආසාදිතයින් අතර සිටි මුස්ලිම් ජාතිකයින්ගේ වාර්ගිකත්වය ඉස්මතු කිරීම තුළින් උත්සහ කළේ ඔවුන් වෛරසය පැතිරවීමේ සුවිශේෂී කාරකයන් වන බව ව්‍යංගයෙන් ප්‍රකාශ කිරීමයි (Ganeshathasan, 2021). මේ අරබයා ජාතිකව සහ ජාත්‍යන්තරව මතු කරන ලද කරුණු සැහෙන දුරට නොසළකා හැරි බව කිව යුතුය.

### *එන්නත්කරණ අක්‍රමිකතා*

ශ්‍රී ලංකාවේ එන්නත්කරණ වැඩසටහන ආරම්භ වූයේ 2021 ජනවාරි 29 වැනි දිනදීය. සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ බොහෝ පිරිසකට එන්නතෙහි පළමු මාත්‍රාව ලබාදී තිබූ අවස්ථාවක සමස්ත ලංකා හෙද සංගමයේ සභාපති පැවසූයේ හෙද හෙදියන්ට ඒ වන විටත් එන්නත ලබාදී නොතිබුණු බවයි ('Nurses yet to receive COVID-19 vaccines; union claims', 2021). එහිදී ප්‍රමුඛතාකරණය පිළිබඳ බොහෝ ගැටළු මතුවිය. වර්තමානය වනවිටත් එන්නත්කරණය සම්බන්ධ වැඩිම අවධානය බස්නාහිර පළාතට ලබාදී තිබෙන බැවින් සමස්ත දිවයිනේ එන්නත්කරණය පිළිබඳ ඇති දත්ත අවම හා අවිශ්වසනීය වේ ('An Update on the Legal Framework to Address the COVID-19 Pandemic in Sri Lanka', 2021). ඊට අමතරව එන්නත්කරණ වැඩසටහනට අසාධාරණ ලෙස අත පොවන බවට දේශපානඥයින් කිහිප දෙනෙකුටම චෝදනා එල්ල විය (Sangakkara, 2021). ඔවුන්ට එල්ල වූ තවත් චෝදනාවක් වූයේ එන්නත්කරණ මධ්‍යස්ථාන වල සේවය කළ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට ලබාදී තිබූ ප්‍රමුඛතා ලැයිස්තු සහ ලියාපදිංචි වීම් නොසළකා හැර කටයුතු කරන ලෙසට බලපෑම් කළ බවයි (Dewasiri, 2021).

ප්‍රමාණවත් පරිදි සැලසුම්කරණය, ප්‍රමුඛතාකරණය සහ අවදානම් සන්නිවේදනය එන්නත්කරණ වැඩසටහන තුළ නොකළ බැවින් ('Sri Lanka's vaccination drive in disarray - College of Community Physicians highlights six key issues', 2021) ඒ පිළිබඳ ජනතාව තුළ ව්‍යාකූලත්වයක් සහ බියක් ජනිත වූ බව සිතිය හැකිය. එහි බලපෑම මඟහරවා ගැනීම සඳහා නියමිත තොරතුරු ඉතා සක්‍රීයව ජනතාව වෙත ළඟා කිරීමේ ව්‍යාපාරයක් අවශ්‍ය වේ. එහිදී එන්නත්කරණ වැඩසටහනේ නායකත්වය, සංවිධාන ව්‍යූහය සහ තීරණ සම්බන්ධයෙන් වගවීමේ ක්‍රමවේදය යනාදිය පැහැදිලි කළ යුතුය ('Let's talk about the vaccine: the need for strategy, clarity and equality', 2021).

## විනිවිදභාවය සහ වගවීමට එල්ල වූ බලපෑම

### *පාර්ලිමේන්තුව විසුරුවා හැරීම*

වසංගතයේ මුල් සමය තුළ පාර්ලිමේන්තුවක් නොතිබීම වසංගත ප්‍රතිචාරයට දැඩි බලපෑමක් එල්ල කළා පමණක් නොව, විධායක බලයේ අත්‍යන්ත වර්ධනයටද හේතු විය. 2020 මාර්තු 02 වන දින, එනම් වසංගතයට හරියටම පෙරාතුව ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරින

ලදී[20]. මාර්තු 19 වනදා නාම යෝජනා භාර දීම අවසන් වීමත් සමඟ මැතිවරණය කල් දැමීමට මැතිවරණ කොමිසම තීරණය කළේ සෞඛ්‍ය අර්බුදය උග්‍ර වීම හේතුවෙනි. මෙවැනි හදිසි අවස්ථාවකදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ ගැටළු මතු වූ අතර, එහි මූලිකම තර්කය වූයේ මෙම අවස්ථාවේ ගතයුතු තීරණ රාශියක් ගැනීමට එම නිසා නොහැකි වන බවයි. එසේම එම තත්වය යටතේ මහජන අරමුදල් සම්බන්ධයෙන් අවම අධීක්ෂණය යටතේ උපරිම බලයක් ජනපතිට හිමිවීමද විශාල ගැටළුවක් විය. එසේ වුවත් ජනාධිපති විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් නිවේදනය නිෂ්ප්‍රභා නොකිරීම සැළකිය යුතුය. එසේ විසුරුවා හැර තිබූ කාල සීමාව තුළදී බලය විධායකයට වාසි වන පරිදි හරවා ගැනීමටත්, නව ආයතන සහ රෙගුලාසි මාර්ගයෙන් කොවිඩ්-19 අර්බුදයට ප්‍රතිචාර දැක්වීමටත් ජනපති පියවර ගත්තේය.

### *මහජන මුදල් සහ ඉටුකම අරමුදල*

ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය තුළ ආර්ථික වගවීමද සැළකිය යුතු කරුණකි. 2021 අයවැයෙන් ජනතාව මූලිකවම බලාපොරොත්තු වූයේ වසංගතය නිසා දුර්වල වූ ආර්ථිකය නැවත පණ ගැන්වීම සඳහා සැලසුමක් ඉදිරිපත් කිරීම හා ප්‍රතිපාදන සලසා දීමයි. එහෙත් 2021 දෙසැම්බර් 10 සම්මත වූ අයවැය තුළ සෞඛ්‍ය අංශය සඳහා ආණ්ඩුව වෙන්කර තිබූ මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 235 ක් වූ අතර (එනම් ආණ්ඩුවේ මුළු පිරිවැයෙන් 6.43% ක්), ආරක්ෂක අංශය සඳහා රුපියල් බිලියන 348 ක් (එනම් ආණ්ඩුවේ මුළු පිරිවැයෙන් 9.55% ක්) වෙන්කොට තිබීම කැපී පෙනුනි ('Public Report on the 2021 budget: assessment on whether the expenditure allocations and taxation policies are in line with the government's policy', 2020). ඒ අතරම නගර නිර්මාණය, මං මාවත් තැනීම සහ ඇවිදින මං තීරු සකස් කිරීම වැනි කාර්යයන් සඳහාද මුදල් වෙන්කොට තිබීම බොහෝ විවේචනයට තුඩුදුන් කරුණකි (Colombage, 2020b). 2021 අප්‍රේල් මාසයේදී අගමැති මහින්ද රාජපක්ෂ තවත් රුපියල් බිලියන 18 ක් සෞඛ්‍ය වියදම් වෙනුවෙන් වෙන් කළේය (Ghosh, 2021).

වර්ෂ 2020 මාර්තු මාසයේදී ඉටුකම අරමුදල පිහිටුවන්නේ මෙවැනි පසුබිමකය. එමඟින් අරමුණු කරන ලද්දේ කොවිඩ්-19 අර්බුදයේ ඍජු පිරිවැය සහ ඊට අදාළ සුබසාධන වැඩසටහන් සඳහා මහජන මූල්‍ය උපකාරය ලබාග ැනීමයි. ඊට රුපියල් බිලියන 1.7 ක් එකතු වී ඇති බව වාර්තා වුවත්, එම මුදල

20 Gazette (Extraordinary) No. 2165/8 of 2 March 2020.

වියදම් කළ ආකාරය පිළිබඳ කිසිදු වගවීමක් නොමැති වීම බොහෝ සෙයින් විවාදයට තුඩු දී තිබේ. 2021 මැයි 10 වනදා ජනාධිපති මාධ්‍ය අංශය මඟින් නිකුත් කළ ප්‍රකාශයක ඉටුකමේ අයවැය පිළිබඳ විස්තරයක් සඳහන් විය. ඊට අනුව ලද ආධාර මුදල් වලින් අද දක්වා වියදම් කොට තිබෙන්නේ 23% ක ප්‍රමාණයකි. ඉතිරිය එන්නත්කරණය සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බව පවසා තිබේ (‘Remaining ‘ITUKAMA’ COVID–19 Fund for …’, 2021).

මැයි 12 වන දින විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ජනාධිපති කාර්යාලයේ ඉල්ලීම මත ඉටුකම අරමුදල විගණනය කිරීම ආරම්භ කළ බව ප්‍රකාශයට පත්විය (Thomas, 2021). එසේ වුවත් උප විගණකාධිපති පී. එල්. කේ. පෙරේරාට අනුව එම අරමුදල සෘජුව විගණනය කිරීමේ බලය ජාතික විගණන කාර්යාලය සතුව නොමැත. මන්ද ඉටුකම අරමුදල විශේෂ පාර්ලිමේන්තු පනතක් මඟින් සම්මත වූවක් නොවන බැවිනි. එම නිසා එය විගණනය කිරීම වාර්ෂික ජනාධිපති කාර්යාල විගණනය යටතේ සිදුකළ යුතුය. උප විගණකාධිපතිවරයාට අනුව ජාතික විගණන කාර්යාලය විසින් එම විගණන වාර්තාව ඉදිරි වසරේ අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පියවර ගනු ඇත (Mudugamuwa, 2021).

මෙම ආයතනික අර්බුද හටගන්නේ වඩා විශාල සමාජ අර්බුදයක් තුළ බවත්, එම නිසා ඒවායේ දිගු කාලීන සමාජ-ආර්ථික ප්‍රතිවිපාක පවතින බවත් සිහිතබා ගත යුතුය. එක් අතකින් ආයතනික විනිවිදභාවයේ සහ වගවීමේ අඩු වීමත් විධායක බලයේ වැඩිවීමත් නිසා කොවිඩ්-19 පාලනය කිරීම හා ඉන් ඇතිකරන ලද ආර්ථික පසුබෑස්ම කළමණාකරණය කරගැනීම අපහසු වනු ඇත. ඒ තුළින් සිදුවන්නේ පවතින සමාජ-ආර්ථික බෙදීම් තවදුරටත් තීව්‍ර වීමයි (Fonseka, Ganeshathasan, and Welikala, 2020). අනෙක් අතට වැඩිවන අසමානතා, ආන්තීකරණයන් සහ ආයතනික මට්ටමෙහි විද්‍යාමාන වන නීතිය සැමට එක හා සමාන නොවීමේ ප්‍රවණතාව වැනි දේ නිසා ආයතනික ක්‍රියාවලි පිළිබඳ මහජන විශ්වාසය පළුදු විය හැකිය.

## නිගමනය

ශ්‍රී ලංකාවේ වසංගත ප්‍රතිචාරය තුළ අපැහැදිලි සහ මිලිටරීකරණය වූ ව්‍යුහයන්, අසමානව බලාත්මක කරනු ලබන නීතිය සහ පවතින ආයතනික ව්‍යුහය, යාන්ත්‍රණ සහ විශේෂඥයින් පැහැදිලිව නොසළකා හැරීම වැනි ලක්ෂණ දැකගත හැකිය. වසංගතයේ පළමු රැල්ල පාලනය කිරීම සම්බන්ධයෙන් ලද සාර්ථකත්වය අගය කළයුතු වුවත්, වැඩිවන ආසාදිතයින් ප්‍රමාණයෙන් හඟවන අර්බුදයේ බැරෑරුම් බව, වැරදි කළමණාකරණය සහ ප්‍රශ්නකාරී

සන්නිවේදනය නිසා ආණ්ඩුවට දරාගත හැකි සීමාවෙන් එපිටට යාමේ අවදානමක් පවතී. එමෙන්ම දේශපාලනීකරණය, මිලිටරීකරණය, විධායක බලය අත්‍යන්තයෙන් වැඩිවීම සහ ආන්තීකරණය වූ කණ්ඩායම් තවදුරටත් අනතුරේ හෙළීම වැනි ප්‍රවණතා නිසා දිගු කාලීනව නීතියේ ආධිපත්‍යය, බලතල බෙදීම සහ පුරවැසි අයිතීන් වැනි කරුණු කෙරෙහි බලපෑමක් ඇතිවිය හැක. ඒ තුළින් දැනටමත් සිදුවෙමින් පවතින ප්‍රජාතන්ත්‍රවාදය ආපසු හැරීමේ ක්‍රියාවලිය තවදුරටත් වේගවත් වීමේ ප්‍රවණතාවක් පවතී.

වසංගතය නිසා දැනටමත් භාෂණයට, සමාගමයට හා නිදහසට ඇති අයිතීන් සැළකිය යුතු දුරකට කප්පාදු වී ඇත. එසේම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන් අවතක්සේරුවට ලක්වී, ඒ වෙනුවට ජනප්‍රිය ආඥාදායකත්වය ප්‍රචලිත වෙමින් පවතී. දැනටමත් පවතින බිය හා සැකය මුල්කරගත් පරිසරය ඊට හොඳ තෝතැන්නක් වී ඇත. එම නිසා වසංගත ප්‍රතිචාරය තුළ විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීම තුළින් ප්‍රජාතන්ත්‍රවාදයේ මෙම සීඝ්‍ර පරිහානිය තරමක් දුරට හෝ අඩුකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ


'An Update on the Legal Framework to Address the COVID-19 Pandemic in Sri Lanka' (2021) *Centre for Policy Alternatives*, 12 May. Available at: https://www.cpalanka.org/an-updateon-the-legal-framework-to-address-the-covid-19-pandemic-insri-lanka/ (Accessed: 15 June 2021).

*Appropriation Bill 2021*. Available at: https://www.parliament.lk/ uploads/ bills/gbills/gazette/english/6202.pdf (Accessed: 24 July 2021).

'Army officers to coordinate COVID-19 prevention measures' (2021) *News First*, 1 January. Available at: https://www. newsfirst. lk/2021/01/01/army-officers-to-coordinate-covid19-prevention-measures/ (Accessed: 15 June 2021).

*Asia: Bachelet alarmed by clampdown on freedom of expression during COVID-19* (2020) *United Nations Office of the High Commissioner (OHCHR)*. Available at: https:// www.ohchr.org/EN/NewsEvents/Pages/ DisplayNews. aspx?NewsID=25920&LangID=E (Accessed: 15 June 2021).

Centre for Policy Alternatives (2021) 'Pandemic Crisis and Democratic Governance in Sri Lanka' [ADRN Working Paper], *East Asia*

*Institute*, 03 May. Available at: http://www.eai. or.kr/new/en/pub/view.asp?intSeq=20498&board=eng_ workingpaper (Accessed: 15 June 2021).

Charindra, (2020) 'Covid-19 ; Drones to monitor isolated areas', *The Morning*, 13 November. Available at: https://www. themorning. lk/covid-19-drones-to-monitor-isolated-areas/ (Accessed: 15 June 2021).

Colombage, D. (2020) 'Politicisation of COVID-19', *DailyFT*, 9 December. Available at: https://www.ft.lk/columns/ Politicisation-of-COVID-19/4-709928 (Accessed: 6 July 2021).

Colombage, S. (2020) 'Budget 2021 in the context of the COVID-19 pandemic', *DailyFT*, 24 November. Available at: https:// www. ft.lk/columns/Budget-2021-in-the-context-of-theCOVID-19-pandemic/4-709287 (Accessed: 15 June 2021).

'Cremation Vs. Burial: Expert Panel Revises Recommendation To Include Both Cremation And Burial Of COVID-19 Dead Bodies' (2021) *Colombo Telegraph*, 2 January. Available at: https://www. colombotelegraph.com/index.php/ cremation-vs-burial-expert-panel-revises-recommendation-toinclude-both-cremation-and-burial-of-covid-19-dead-bodies/ (Accessed: 15 June 2021).

'Curfew in response to COVID-19: Legal Framework and Relevant Questions in Sri Lanka' (2020) *Centre for Policy Alternatives*, 21 April. Available at: https://www.cpalanka.org/curfewin-response-to-covid-19-legal-framework-and-relevantquestions-in-sri-lanka/ (Accessed: 15 June 2021).

Dewasiri, H. (2021) 'Rosy Madam's list' under fire', *The Morning*, 23 February. Available at: https://www.themorning.lk/rosymadams-list-under-fire/ (Accessed: 15 June 2021).

*Disaster Management Act No. 13 of 2005*. Available at: https:// www. parliament.lk/uploads/acts/gbills/english/5640.pdf. (Accessed: 15 June 2021)

'Expert Committee to keep tab on new COVID therapies, vaccines' (2021) *Daily News*, 21 May. Available at: http://www. dailynews. lk/2021/05/21/local/249855/expert-committeekeep-tab-new-

covid-therapiesvaccines (Accessed: 15 June 2021).

Fonseka, B. (2020) 'Uncomfortable Truths with the Pandemic Response in Sri Lanka', *Groundviews*, 11 May. Available at: https://groundviews.org/2020/11/05/uncomfortabletruths-with-the-pandemic-response-in-sri-lanka/ (Accessed: 15 June 2021).

Fonseka, B. and Dissanayake, U. (2021) 'Sri Lanka's Vistas of Prosperity & Splendour: A Critique of Promises Made & Present Trends', *Centre for Policy Alternatives*, Available at: https://www.cpalanka.org/wp-content/uploads/2021/07/ Sri-Lankas-Vistas-of-Prosperity-and-Splendour-A-Critiqueof-Promises-Made-and-Present-Trends.pdf (Accessed: 14 July 2021).

Fonseka, B., Ganeshathasan, L. and Welikala, A. (2021) 'Sri Lanka: Pandemic-Catalyzed Democratic Backsliding', in Ramraj, V. V. (ed.) *Covid-19 in Asia: Law and Policy Contexts*. Oxford, Oxford University Press, pp. 349 – 364.

Fonseka, P. (2021) 'Pandemic-related Domestic Violence: Victims don't often get the desired help', *Daily Mirror*, 11 June. Available at: https://www.dailymirror.lk/insight/ Pandemic-related-Domestic-Violence-Victims-dont-oftenget-the-desired-help/374-213849 (Accessed: 15 June 2021).

Foreign Ministry, Sri Lanka (MFA) (2020) *Declaration of Police Curfew Island Wide*. Available at: https://mfa.gov.lk/ declaration-of-police-curfew-island-wide/ (Accessed: 15 June 2021).

Ganeshathasan, L. (2021) 'Sri Lanka's Legal Response to COVID-19: Past Trends and Future Prospects.' *VerfBlog*. Available at: https://verfassungsblog.de/sri-lankas-legal-response-tocovid-19-past-trends-and-future-prospects/ (Accessed: 15 June 2021).

*Gazette (Extraordinary) No. 2165/8 of 2 March 2020*. Available at: www.presidentsoffice.gov.lk/wpcontent/uploads/2020/02/ 2165-08_E.pdf (Accessed: 14 June 2021).

*Gazette (Extraordinary) No. 2168/8 of 26 March 2020*. Available at: http://documents.gov.lk/files/egz/2020/3/2168-08_E.pdf (Accessed: 14 June 2021).

*Gazette (Extraordinary) No. 2172/9 of 22 April 2020*. Available at: http://

www.documents.gov.lk/files/egz/2020/4/2172- 09_E.pdf (Accessed: 14 June 2021).

*Gazette (Extraordinary) No. 2173/4 of 27 April 2020*. Available at: http://www.documents.gov.lk/files/egz/2020/4/2173- 04_E.pdf (Accessed: 14 June 2021).

*Gazette (Extraordinary) No. 2185/41 of 21 July 2020*. Available at: http://www.documents.gov.lk/files/egz/2020/7/2185- 41_E.pdf (Accessed: 14 June 2021).

*Gazette (Extraordinary) No. 2208/33 of 31 December 2020*. Available at: http://documents.gov.lk/files/egz/2020/12/2208-33_E. pdf (Accessed 14 June 2021).

Ghosh, P. (2021) 'Budget 2021: Rs 18Bn to be allocated for Maintaining Health Services', *Social Health Protection Network*, 13 April. Available at: https://p4h.world/en/news/budget-2021-rs18bn-be-allocated-maintaining-health-services (Accessed: 15 June 2021).

Gunasekara, T. (2020) '20th in the time of COVID: A grim tale', *DailyFT*, 9 October. Available at: https://www.ft.lk/ columns/20th-in-the-time-of-COVID-A-grim-tale/4-707213 Accessed: 15 June 2021).

Gunawardana, S. and Padmasiri, B. (2021) 'Avoiding Necrocapitalism in Sri Lanka's Free Trade Zones', *Groundviews*, 13 June. Available at: https://groundviews.org/2021/06/13/ avoiding-necrocapitalism-in-sri-lankas-free-trade-zones/ (Accessed: 15 June 2021).

Hamza, M. (2021) 'Thousands of Migrant workers stranded in the Gulf States', *EconomyNext*, 15 March. Available at: https://economynext.com/thousands-of-migrant-workers-strandedin-the-gulf-states-79779/ (Accessed: 15 June 2021).

*HRCSL Recommendations on Regularizing the Imposition of Curfew* (2020) *Human Rights Commission of Sri Lanka (HRCSL)*. Available at: https://www.hrcsl.lk/wp-content/ uploads/2020/02/curfew. HRCSL-recommendation-final.pdf (Accessed: 29 June 2021).

*IGP responds to HRCSL in respect to the arrest of persons violating quarantine rules* (2021) *Human Rights Commission of Sri Lanka (HRCSL)*. Available

at: https://www.hrcsl.lk/ igp-responds-to-hrcsl-in-respect-to-the-arrest-of-personsviolating-quarantine-rules/ (Accessed: 29 June 2021).

Indrajith, S. (2020) 'Sumanthiran moves private member's Bill to tackle health emergency', *The Island*, 21 October. Available at: https://island.lk/sumanthiran-moves-private-membersbill-to-tackle-health-emergency/ (Accessed: 15 June 2021).

Jayasinghe, C. (2021) 'Expert committee to decide who in Sri Lanka should receive Sinopharm jab', *EconomyNext*, 2 April. Available at: https://economynext.com/expert-committeeto-decide-who-in-sri-lanka-should-receive-sinopharmjab-80359/ (Accessed: 15 June 2021).

Jayawardana, A. (2021) 'In Pictures: Army joins COVID vaccination drive', *Times Online*, 11 May. Available at: https://www. timesonline.lk/news-online/In-Pictures-Army-joinsCOVID-vaccination-drive/2-1133268 (Accessed: 15 June 2021).

*Let's talk about the vaccine: the need for strategy, clarity and equality* (2021) *Law & Society Trust (LST)*. Available at: https:// lstlanka.org/images/pdf/2021/Lets_talk_about_the_ vaccine_English.pdf (Accessed: 15 June 2021).

*Limiting Freedom of Expression in a Democracy: The Need to Strike a Lawful Balance* (2020) *Human Rights Commission of Sri Lanka (HRCSL)*. Available at: https://www.hrcsl.lk/wp-content/ uploads/2020/02/Letter-to-IGP-Freedom-of-Expression.pdf (Accessed: 15 June 2021).

Marasinghe, S. and Nathaniel, C. (2021) 'Port City Bill passed', *Daily News*, 21 May. Available at: http://www.dailynews. lk/2021/05/21/local/249850/port-city-bill-passed (Accessed: 15 June 2021).

Mudugamuwa, M. (2021) 'Itukama Covid-19 Fund: Cannot be directly audited: Auditor General's Department', *The Morning*, 23 May. Available at: https://www.themorning.lk/itukama-covid-19-fund-cannot-be-directly-audited-auditorgeneral-department/ (Accessed: 15 June 2021).

Nathaniel, C. (2021) 'Sri Lanka to curb fake news on social media', *Daily News*, 7 June. Available at: http://www.dailynews. lk/2021/06/07/

local/251037/sri-lanka-curb-fake-newssocial-media (Accessed: 15 June 2021).

'No decision taken to declare a complete lockdown' (2021) *Daily News*, 10 May. Available at: http://www.dailynews. lk/2021/05/10/ local/248889/no-decision-taken-declarecomplete-lockdown (Accessed: 15 June 2021).

'Nurses yet to receive COVID-19 vaccines; union claims' (2021) *News First*, 3 May. Available at: https://www.newsfirst. lk/2021/05/03/ nurses-yet-to-receive-covid-19-vaccinesunion-claims/ (Accessed: 15 June 2021).

'Partial shutdown sinks small businesses, daily wage earners' (2020) *DailyFT*, 19 March. Available at: https://www.ft.lk/FrontPage/Partial-shutdown-sinks-small-businesses-daily-wageearners/44-697783 (Accessed: 15 June 2021).

*Penal Code of Sri Lanka*. Available at: https://www.lawnet.gov.lk/ penal-code-consolidated-2/ (Accessed: 15 June 2021).

President's Media Division (2020) *Army Commander Shavendra Silva heads National Operation Center for Prevention of COVID- 19 Outbreak*. Available at: http://www.pmdnews.lk/armycommander-shavendra-silva-heads-national-operation-centerforprevention-of-covid-19-outbreak/ (Accessed: 15 June 2021).

'Public Report on the 2021 budget: assessment on whether the expenditure allocations and taxation policies are in line with the government's policy' (2020) *Verite Research*. Available at: https:// www.veriteresearch.org/wpcontent/uploads/2021/05/VR_ ENG_Research_Report_May2021_ Public_Report_on_2021_ Budget.pdf (Accessed: 15 June 2021).

*Public Security Ordinance No. 25 of 1947*. Available at: https://www. lawnet. gov.lk/public-security-4/ (Accessed: 15 June 2021).

'Q and A on Regulations Issued under the Quarantine and Prevention of Diseases Ordinance & how this impacts the COVID-19 response in Sri Lanka' (2020) *Centre for Policy Alternatives*, 6 November. Available at: https://www.cpalanka.org/qand-a-on-regulations-issued-under-the-quarantine-andprevention-of-diseases-

ordinance-how-this-impacts-thecovid-19-response-in-sri-lanka/ (Accessed: 15 June 2021).

*Quarantine and Prevention of Diseases Ordinance No. 3 of 1897*. Available at: http://www.quarantine.health.gov.lk/images/pdf/act/quarantine_and_prevention_of_disease_act553.pdf (Accessed: 15 June 2021).

Ranasinghe, I. (2021) 'Sri Lanka police arrest record numbers for COVID-19 quarantine violations', *EconomyNext*, 28 May. Available at: https://economynext.com/sri-lankapolice-arrest-record-numbers-for-covid-19-quarantineviolations-82520/ (Accessed: 15 June 2021).

'Remaining 'ITUKAMA' COVID–19 Fund for' (2021) *Ceylon Today*, 11 May. Available at: https://ceylontoday.lk/news/ remaining-itukama-covid-19-fund-for (Accessed: 15 June 2021).

*Report of the United Nations High Commissioner for Human Rights* (2021) *Office of the High Commissioner for Human Rights (OHCHR)*. Available at: https://www.ohchr. org/EN/HRBodies/HRC/RegularSessions/Session46/ Documents/A_HRC_46_20_AEV.docx. (Accessed: 15 June 2021)

Ruwanpathirana, T. (2020) 'On Hejaaz Hizbullah: The latest victim of Sri Lanka's draconian Prevention of Terrorism Act', *Amnesty International*, 15 July 2020, Available at: https:// www.amnesty.org/en/latest/news/2020/07/sri-lankaon-hejaaz-hizbullah-and-the-prevention-of-terrorism-act/ (Accessed: 7 July 2021).

Sangakkara, A. (2021) 'Vaccine Thieves of Sri Lanka', *Colombo Telegraph*, 20 May. Available at: https://www. colombotelegraph.com/index.php/vaccine-thieves-of-srilanka/ (Accessed: 15 June 2021).

Saroor, S. and de Soysa, M. (2020) 'Death in the Time of Corona: A Risky Business for Muslims', *Groundviews*, 11 December. Available at: https://groundviews.org/2020/11/12/death-inthe-time-of-corona-a-risky-business-for-muslims/ (Accessed: 29 June 2021).

'Socio-Economic Index in the face of COVID-19' (2021) *Centre for Policy Alternatives*. Available at: https://www.cpalanka. org/wp-content/uploads/2021/06/SOCIO-ECONOMICINDEX-for-

Web-F-I-N-A-L.pdf (Accessed: 29 June 2021).

*Sri Lanka: Compulsory cremation of COVID-19 bodies cannot continue, say UN experts* (2021) *United Nations Office of the High Commissioner (OHCHR).* Available at: https:// www.ohchr.org/EN/NewsEvents/Pages/ DisplayNews. aspx?NewsID=26686&LangID=E (Accessed: 15 June 2021).

*Sri Lanka: Increasing Suppression of Dissent* (2020) *Human Rights Watch (HRW).* Available at: https://www.hrw.org/ news/2020/08/08/ sri-lanka-increasing-suppression-dissent (Accessed: 15 June 2021).

*Sri Lanka: newly adopted 20th Amendment to the Constitution is blow to the rule of law* (2020) *International Commission of Jurists (ICJ).* Available at: https://www.icj.org/sri-lanka-newlyadopted-20th-amendment-to-the-constitution-is-blow-to-therule-of-law/ (Accessed: 15 June 2021).

'Sri Lanka, the tsunami and the evolution of disaster response' (2014) *ReliefWeb*, 24 December. Available at: https://reliefweb.int/ report/sri-lanka/sri-lanka-tsunami-and-evolution-disasterresponse (Accessed: 14 June 2021).

'Sri Lanka's vaccination drive in disarray - College of Community Physicians highlights six key issues' (2021) *Lanka Leader*, 23 May. Available at: https://english.theleader.lk/news/1420-sri-lanka-s-vaccination-drive-in-disarray-collegeof-community-physicians-highlights-six-key-issues (Accessed: 15 June 2021).

*Sri Lanka: vulnerable groups pay the price for militarization of COVID-19 response* (2020) *International Commission of Jurists (ICJ).* Available at: https:// www.icj.org/sri-lanka-vulnerablegroups-pay-the-price-for-militarization-of-covid-19-response/ (Accessed: 15 June 2021).

Srinivasan, M. (2020) 'Following deadly riot, spotlight on Sri Lanka's prison conditions', *The Hindu*, 10 December. Available at: https:// www.thehindu.com/news/international/followingdeadly-riot-spotlight-on-sri-lankas-prison-conditions/ article33302053.ece (Accessed: 15 June 2021).

Srinivasan, M. (2021) 'Sri Lankan parliament passes controversial Bill

on China-backed Port City', *The Hindu*, 20 May. Available at: https://www.thehindu.com/news/international/srilankan-parliament-passes-controversial-bill-on-china-backedport-city/article34608185.ece (Accessed: 15 June 2021)

'Statement on the Twentieth Amendment' (2020) *Centre for Policy Alternatives*, 4 September. Available at: https://www. cpalanka.org/statement-on-the-twentieth-amendment-2/ (Accessed: 15 June 2021).

'Strict action against those criticise state officials on social media' (2020) *Daily Mirror*, 1 April. Available at: https://www. dailymirror.lk/breaking_news/Strict-action-against-thosecriticise-state-officials-on-social-media/108-186028 (Accessed: 15 June 2021).

'Structures to Deal with COVID-19 in Sri Lanka: A Brief Comment on the Presidential Task Force' (2020) *Centre for Policy Alternatives*, 8 April. Available at: https://www.cpalanka. org/structures-to-deal-with-covid-19-in-sri-lanka-a-briefcomment-on-the-presidential-task-force/ (Accessed: 15 June 2021).

'Technocratic Populism and the Pandemic State' (2020) *Centre for Policy Alternatives*, 10 November. Available at: https://www. cpalanka.org/technocratic-populism-and-the-pandemicstate/ (Accessed: 29 June 2021).

'The Appointment of the Two Presidential Task Forces' (2020) *Centre for Policy Alternatives*, 8 June. Available at: https://www. cpalanka.org/the-appointment-of-the-two-presidential-taskforces/ (Accessed: 14 June 2021).

'The Centre for Policy Alternatives (Guarantee) Limited and Dr. Paikiasothy Saravanamuttu vs. The Attorney General (SC SD 4/ 2021) (in re the Colombo Port City Economic Commission Bill)' (2021) *Centre for Policy Alternatives*, 17 April. Available at: https://www.cpalanka.org/the-centrefor-policy-alternatives-guarantee-limited-and-dr-paikiasothysaravanamuttu-vs-the-attorney-general-sc-sd-4-2021-in-re-thecolombo-port-city-economic-commission-bill/ (Accessed: 15 June 2021).

*The Constitution of Sri Lanka*. Available at: https://www.parliament. lk/files/pdf/constitution.pdf (Accessed: 15 June 2021).

Thomas, K. (2021) 'What Happened To The Itukama Fund?', *Roar Media*, 13 May. Available at: https://roar.media/english/ life/current-affairs/what-happened-to-the-itukama-fund (Accessed: 15 June 2021).

'Transparency International Sri Lanka continues to have serious concerns about new Colombo Port City Law' (2021) *Colombo Page*, 26 May. Available at: http://www.colombopage.com/ archive_21A/ May26_1622045066CH.php (Accessed: 15 June 2021].

*UNICEF and NCPA gravely concerned by increase in proportion of child cruelty cases reported to NCPA hotline since the start of the COVID-19 curfew* (2020) *UNICEF*. Available at: https:// www.unicef.org/srilanka/ press-releases/unicef-and-ncpagravely-concerned-increase-proportion-child-cruelty-casesreported (Accessed: 15 June 2021).

# 3

# යටත්වැසියන් නිර්මාණය කිරීමෙන් ජනගහණය සුව කිරීම: ලංකාවේ වසංගත ආණ්ඩුකරණ මාදිලිය

*ප්‍රදීප් පීරිස්*

## හැඳින්වීම

> වසංගත මගින් මානව ඉතිහාසය හැඩගස්වා තිබේ. අස්ථිර අධිරාජ්‍යයන් බිඳ වට්ටමින්, යටත්විජිතකරණ රටාවන් වෙනස් කරමින්, ජනගහණයන් වෙත තරඟකාරී ලාභයන් ළඟා කරදෙමින් වසංගත විසින් එම කාර්යය සිදුකර ඇත. තත්වය මත පදනම්ව ශ්‍රම වෙළඳපොළ ප්‍රතිව්‍යුහගත කිරීමටත්, එමගින් අසමානත්වයට හා සමාජය සංවිධානය කර ඇති ආකාරයට දිගු කාලීන වෙනස්කම් හඳුන්වා දීමටත් වසංගත වලට හැකියාව පවතී. (Gingerich and Vogler, 2021, p. 393)

ලොව වසංගත ඉතිහාසය මගින් එක් දෙයක් නිසැකවම උගන්වා ඇත. එනම් ඒවා අනිවාර්යයෙන්ම වියැකී යන බව හා එසේ වුවත් ඒවායේ සමාජ සහ දේශපාලන බලපෑම පරම්පරා ගණනාවකට දැනෙනු ඇති බවය. පසුගිය සහශ්‍රයේ ඇතිවූ දරුණුතම ගෝලීය අධි වසංගතය වූ 'කළු මරණය' (Black Death) අධ්‍යයනය කළ ජින්ජරිච් සහ වොග්ලර් (2021), යුරෝපයේ සමාජ-දේශපාලන තත්වයට එමගින් ඇති කළ බලපෑම පිළිබඳව අදහස් දක්වා ඇත. ජීව අවියක් වශයෙන් නිෂ්පාදනය කළහොත් මිස, වසංගතයක් යනු මානව තේරීමෙන් තොරව සිදුවන දෙයකි; නමුත් ඊට දක්වන ප්‍රතිචාරය අනිවාර්යයෙන්ම මානව තේරීමෙහි ප්‍රතිඵලයක් වේ. මෙම කෘතියෙහි හැඳින්වීම තුළ දක්වා ඇති පරිදි සෞඛ්‍ය අර්බුදය කළමණාකරණය කිරීමට යැයි කියමින් ලොව බොහෝ ආණ්ඩු විසින් ගැටළුවට සමානුපාතික නොවන ආකාරයේ ව්‍යතිරේඛ තත්වයන් සහ දැඩි රෙගුලාසි හඳුන්වා දී ඇත (Cheibub

et al, 2020). වසංගතය කළමණාකරණය කිරීමට මුවා වෙමින් පාලකයින් සිය බලය තවදුරටත් වර්ධනය කරගැනීම තුළින් ප්‍රජාතන්ත්‍රවාදයට අත්‍යාවශ්‍ය වන්නා වූ සංවරණ හා තුලන ක්‍රම හැල්ලුවට ලක්ව තිබේ. වසංගත ආණ්ඩුකරණ මාදිලියෙහි - එනම් වසංගතය කළමණාකරණයෙහි ලා හඳුන්වා දී ඇති ක්‍රියාවලීන්, තාක්ෂණයන් සහ තර්කනයන් තුළ - ඇති ප්‍රජාපීඩක භාවය පැහැදිලි වුවත්, ඒවා විඳදරා ගැනීමට මෙන්ම සමහර අවස්ථා වල වර්ණනා කිරීමටද පුරවැසියන් යොමුවන්නේ වෛරසය පිළිබඳ ඇති බිය නිසාය. Freedom House ආයතනයේ සභාපති මයිකල් ඒබ්‍රමොවිට්ස්ට අනුව "සෞඛ්‍ය අර්බුදයක් ලෙස ආරම්භ වූ ගැටළුව අද වනවිට ප්‍රජාතන්ත්‍රවාදී අර්බුදයක් බවට පත්ව තිබේ." (*Democracy under Lockdown,* 2020)

මෙම පරිච්ඡේදය තුළ මාගේ මූලික අරමුණ වන්නේ ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණ මාදිලිය රටේ බලය දරන්නන්ගේ බල අභිලාෂයන් නිරූපණය කරන්නේ කෙසේදැයි යන්න අධ්‍යයනය කිරීමයි. මෙහි ද්විතියික අරමුණු දෙකක් තිබේ: 1) ආණ්ඩුවේ වසංගත ප්‍රතිචාරය සහ එහි ක්‍රියාවලිය පිළිබඳ කෙටි විස්තරකථනයක් කිරීම හා 2) එම ප්‍රතිචාරයෙහි ප්‍රධාන දේශපාලන ප්‍රතිවිපාක හඳුනාගැනීම. මෙම විශ්ලේෂණය මූලිකවම පදනම්ව ඇත්තේ ගුණාත්මක සම්මුඛ සාකච්ඡා සහ ද්වීතීයික දත්ත මතය. වසංගත ප්‍රතිචාරය තුළ ආණ්ඩුකරණ තර්කනය තේරුම් ගැනීම සඳහා ඉහළ පරිපාලන සහ මිලිටරි නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා කිහිපයක්ද සිදුකරන ලදී. ඊට අමතරව මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය වල පල වූ විවිධ ප්‍රවෘත්ති සහ මතවාදයන්ද යොදා ගැණුනි.

මෙම පරිච්ඡේදයේ සාකච්ඡාව ආරම්භ වනුයේ වසංගතයේ මුල් කාලය තුළ එම ආණ්ඩුකරණය පිළිබඳ මහජන මතය විමසා බැලීමෙනි. එහිදී Social Indicator ආයතනය මඟින් සිදුකරන ලද 'Socio-Economic Index in the Face of COVID-19' සමීක්ෂණයේ දත්ත භාවිතා කරන ලදී. ඉන් අනතුරුව ආණ්ඩුවේ වසංගත ප්‍රතිචාරය ප්‍රධාන තේමා 4 ක් යටතේ විග්‍රහ කර ඇත: 1) වසංගත ප්‍රතිචාරයෙහි මිලිටරීකරණය 2) වසංගත ප්‍රතිචාරය තුළ කැටිව තිබූ ප්‍රතිවිරුද්ධතා සහ අසංවේදීභාවයන් 3) වසංගත ප්‍රතිචාරය තුළ ධූරාවලීන් ප්‍රතිනිෂ්පාදනය වීම සහ 4) වසංගත ප්‍රතිචාරයෙහි දේශපාලනය. ලංකාවේ වසංගත ප්‍රතිචාරය පිළිබඳ පරිපූර්ණ විග්‍රහයක් සිදුකිරීම මගේ අරමුණ නොවුණත්, එම සන්දර්භය තුළ විද්‍යාමාන වන වඩා පුළුල් රටාවන් සහ රටේ ප්‍රජාතන්ත්‍රවාදී දිවියට ඒවායින් එල්ල කෙරෙන බලපෑම හඳුනාග ැනීමට මෙමඟින් අපේක්ෂා කරමි.

### *වසංගත ප්‍රතිචාරය පිළිබඳ මුල් සමය තුළ මහජන ආකල්ප*

ඉහත සඳහන් කළ සමීක්ෂණ දත්ත වලට අනුව වසංගතයේ පළමු සහ දෙවන රැළි ආණ්ඩුව විසින් කළමණාකරණය කළ ආකාරය පිළිබඳව ජනතාව තුළ පොදුවේ ගත්කළ පැවතියේ ප්‍රසාදයකි. වර්ෂ 2020 පෙබරවාරි වනතෙක් කාලය තුළ මේ සම්බන්ධ සෑහීමට පත්වූ පිරිස නියැදියෙන් 67% ක් විය (කරුණාකර ඇමුණුම් අංක 3 හි වගු අංක 41 බලන්න). වෛරසය පැතිර යෑමේ සාපේක්ෂව වැඩි අවදානමක් සහිත නගර සහා බල ප්‍රදේශ වල වාසය කරන ප්‍රතිචාරකයින් අතර පමණක් සෑම 10 දෙනෙකුගෙන් 4 දෙනෙකුම මේ සම්බන්ධව සිය නොසෑහීම ප්‍රකාශ කළහ. වසංගතයේ මෙම අවස්ථාව වනවිට ශ්‍රී ලංකාව ඇත්තෙන්ම දියුණු රටවලට සාපේක්ෂව වුවද ඉතා සාධනීය මට්ටමක සිටි බවත්, දියුණු රටවල දෛනික මරණ ප්‍රමාණය 2000 ක් වැනි අගයක් ගෙන තිබූ මෙම අවස්ථාවේ ලංකාවේ එම ප්‍රමාණය 2021 ජනවාරි 31 වන විටත් තිබුණේ 316 සීමාවේ බව හා ආසාදිතයන් සංඛ්‍යාව 6682 ක් වූ බවත් සිහිතබා ගත යුතුය (*Sri Lanka Coronavirus – Worldometer,* 2021). රජය කෙරෙහි මෙම මුල්කාලීන පැහැදීම ගෝලීය ප්‍රවණතාවයකි. රටවල් 14 ක සංඛ්‍යා දත්ත විශ්ලේෂණය කරමින් චෙන් සහ කණ්ඩායම පෙන්වා දී ඇත්තේ සිය රජයෙහි වසංගත ප්‍රතිචාරය තක්සේරු කිරීමෙහිලා පුරවැසියන් මූලික කොට ගන්නේ ආසාදිතයින් සංඛ්‍යාව සහ ජනගහණයට අනුපාතිකව මරණ සංඛ්‍යාව මිස, රජයේ ප්‍රතිපත්තිමය තීරණ නොවන බවයි (Chen et al, 2021).

විධායකයේ විවිධ ශාඛා මඟින් රඟ දක්වන භූමිකාව පිළිබඳව නියැදියේ බහුතරයක් ප්‍රසාදය පල කර තිබුණි. මෙම කරුණේදී ජනාධිපතිවරයාගේ භූමිකාව සම්බන්ධයෙන්ද ප්‍රසාදයක් තිබූ නමුත්, මහජන සෞඛ්‍ය නිලධාරී, ග්‍රාම නිලධාරී, පොලීසිය සහ හමුදාව වැනි අයගේ භූමිකාව හා සසඳන විට එම අගය තරමක පහත එකක් විය. රසවත් සොයාග ැනීමක් වන්නේ මන්ත්‍රීවරුන්ගේ භූමිකාව පිළිබඳව තමා සෑහීමට පත්වන බව ප්‍රකාශ කර තිබුණේ නියැදියෙන් තුනෙන් එකක ප්‍රමාණයක් පමණක් වීමයි (කරුණාකර ඇමුණුම් අංක 3 හි වගු අංක 5-10 බලන්න). වසංගත ප්‍රතිචාරය තුළ මන්ත්‍රීවරුන්ට තිබූ අවම භූමිකාව මෙමඟින් පැහැදිලි වන අතර, පරිච්ඡේදයේ ඊළඟ කොටස් වලදී මිලිටරීකරණය සහ විශේෂඥ පාලනයට ජනාධිපතිවරයාගේ ඇති කැමැත්ත පිළිබඳ සාකච්ඡා කිරීමේදී මෙම කරුණ වැඩිදුරටත් විග්‍රහ කිරීමට බලාපොරොත්තු වෙමි.

## කොවිඩ් ප්‍රතිචාරයේ මිලිටරීකරණය

ආඥාදායක පද්ධති වල පටන් ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයන් දක්වා සියළු ආකාරයේ පාලන ක්‍රම වසංගතය කළමණාකරණය කරගැනීම සඳහා ආරක්ෂක අංශ වල සහය පැතීය. ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන ආඥා ධූරාවලියක පැවැත්ම සහ, කෙටි දැනුම් දීමකින් සේවය ලබාගත හැකි ශික්ෂිත මානව සම්පතක් තිබීම යන හේතු නිසා හදිසි තත්වයන් වලදී ආරක්ෂක අංශ මහගු සම්පතක් වී ඇත. එම නිසාය බොහෝ රටවල් වසංගතය පාලනය කිරීම සඳහා එම අංශයන්හි සේවාව ලබාගත්තේ (Graham, 2020). ප්‍රවාහන පහසුකම් සැපයීම, රෝහල් සහ වෙනත් අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම, පරිපාලන හා දේශසීමා නියාමනය කිරීම, නිරෝධායන නීති රෙගුලාසි බලාත්මක කිරීම, අවශ්‍ය සෞඛ්‍ය සේවා සහයෝගය ලබාදීම, එනන්ත්කරණය වැනි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ මෙම සහයෝගය ලබාදෙන ලදී. කෙසේ වුවත් වසංගතය පාලනය කිරීම සඳහා වන සිවිල් යාන්ත්‍රණයට සහය වීම වෙනුවට, සමහර රටවල වසංගත ප්‍රතිචාරය තනිකරම ආරක්ෂක අංශ වල පාලනයට නතු කර තිබේ. Shangri-la Dialogue හි ආසියා-පැසිපික් කලාපයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයකු වන යුවාන් ග්‍රැහැම්ට අනුව:

> අග්නිදිග ආසියාවේ මෑත කාලීනව දේශපාලනය තුළ මිලිටරි මැදිහත්වීම් සිදුවූ මියන්මාරය සහ ඉන්දුනීසියාව වැනි රටවල ආරක්ෂක අංශ වසංගතයට ප්‍රතිචාර දැක්වීම තුළ කැපී පෙනෙන ආකාරයේ උපදේශාත්මක සහ තීරණ ගැනීමේ භූමිකා රඟ දක්වති. හමුදාවේ බලපෑමට සැළකිය යුතු දුරකට නතුව සිටින තායිලන්තයේ ආණ්ඩුවද වසංගතයට ප්‍රතිචාර දැක්වීම සඳහා පත්කර ගන්නා ලද මණ්ඩලයේ සිවිල් දායකත්වය අවම කොට ඇති බවට වාර්තා වී ඇත (Graham, 2020).

ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදයක් වන එක්සත් රාජධානිය විසින්ද කොවිඩ් වසංගතය පාලනය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය හවුල් කරගෙන තිබේ. එහෙත් එම භූමිකාව සිවිල් පරිපාලනයට අවශ්‍ය සහයෝගය දීමට සීමා කර ඇත (Graham, 2020). එතරම් නිදහස් රටක් නොවන සිංගප්පූරුවේ වුවත් වසංගත ප්‍රතිචාරය තුළ ආරක්ෂක අංශ වලට මූලික භූමිකාවක් අනුයුක්ත කර නොමැති අතර, මුල් සමය තුළ සෑම කුටුම්බයක් සඳහාම මුඛ ආවරණ ඇසුරුම් කිරීම වැනි කාර්යයන් වල ඔවුහු නිරත වී ඇත (ඉහත එම).

නමුත් ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය මිලිටරීකරණය වී ඇති තරම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් අතර අසමසම මට්ටමක තිබෙන බව සිතේ. සහය භූමිකාවක් නොව, ආණ්ඩුවේ කොවිඩ් ප්‍රතිචාරයේ ඉදිරි ගමන් මඟ නිර්ණය කිරීමේ මූලෝපායික තීරණ ගැනීමද සිදුකරන්නේ මෙරට ආරක්ෂක අංශ

විසිනි. හමුදා නිලධාරියෙක් ලෙස හා ඉන් අනතුරුව ආරක්ෂක ලේකම් ලෙස සේවය කර ඇති ජනාධිපතිවරයා වසංගත ප්‍රතිචාරය පිළිබඳ තනිව තීරණ ගැනීමක් දක්නට ලැබුණු අතර, එහිදී ආරක්ෂක අංශ වල නිලධාරීන් ප්‍රධාන තනතුරු බොහෝ ප්‍රමාණයකට පත් කරනු ලැබිණි. කොවිඩ්-19 වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලදුව, එහි සේවය කිරීම සඳහා සෞඛ්‍ය හෝ පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරීන් අනුයුක්ත කරනු වෙනුවට, යුධ හමුදාපති ශවේන්ද්‍ර සිල්වා පත්කරන ලදී. ඒ අනුව පෙනී යන්නේ ජනාධිපතිවරයාගේ මනස තුළ කොවිඩ්-19 ට එරෙහි සටන සෞඛ්‍ය අර්බුදයකට වඩා ආරක්ෂක අර්බුදයක් ලෙසත්, එම නිසා එහිදී සෞඛ්‍ය අංශ ඇත්තෙන්ම ආරක්ෂක අංශ වලට සහයෝගය දැක්විය යුතු බවටත් වැටහීමක් ඇති බවයි. ජනාධිපතිවරයා සියළු ගැටළු වලට පිළිතුරක් ලෙස ආරක්ෂක අංශ වල මැදිහත්වීම සළකන පසුබිමක් තුළ මෙහි පුදුමයකුත් නැත. නිදසුනක් ලෙස වසංගතය සම්බන්ධ පරිපාලන ව්‍යුහය තුළ ප්‍රධාන තනතුරු කිහිපයකටම වත්මන් සහ විශ්‍රාමලත් ආරක්ෂක අංශ නිලධාරීන් පත්කිරීම දැක්විය හැකිය. එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ධූරය, ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය සහ ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය යන ඒවා කැපී පෙනේ (Perera, 2020). එමෙන්ම කොවිඩ්-19 සහන අරමුදල භාරව සිටින්නේත්, වසංගතයෙහි ආර්ථික බලපෑම අවම කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකායේ සෑම තනතුරු පහෙන් එකක්ම හොබවන්නේත් ආරක්ෂක අංශ නිලධාරීන් බව සිහිතබා ගත යුතුය (*Militarisation of COVID response, the looming refugee crisis, and Nepal's PM under pressure,* 2020).

වසංගතයක් වැනි හදිසි තත්වයකට ප්‍රතිචාර දැක්වීමේදී අනිවාර්යයෙන්ම ඉක්මන් තීරණ ගැනීමට හැකියාව සහ ඒ සඳහා අවශ්‍ය වන සම්පත් හා ධාරිතාවන් ඇති බව තහවුරු කරගත යුතුය. ඒ පිළිබඳ විවාදයක් නැත. නමුත් ලංකාවේ සෞඛ්‍ය යාන්ත්‍රණයෙහි ඉතිහාසය සැළකූ කළ ඊට එම හැකියාව පවතින බව හොඳින් පෙනී යයි. නිදසුනක් ලෙස "2016 දී ලංකාව මැලේරියාවෙන් තොර කලාපයක් බව ප්‍රකාශයට පත්කරන ලදී. එහිදී රෝග නිවාරණ ප්‍රජා සෞඛ්‍ය පද්ධතියේ ශක්තිය ඉතා වැදගත් වුණි." (Srinivasan, 2020a) එහෙත් එවන් වූ සෞඛ්‍ය සේවයේ ධාරිතාව වර්ධනය කිරීම වෙනුවට ඊට සමගාමීව යන්නා වූ මිලිටරි පද්ධතියක් නිර්මාණය කිරීම ප්‍රහේලිකාවකි.

වැඩිවන ආසාදිතයින් සංඛ්‍යාවට අනුකූල වන පරිදි අවශ්‍ය භෞතික යටිතල පහසුකම් තැනීමෙහිලා ආරක්ෂක අංශ වල ඉංජිනේරු සේවාවන් විසින් ඉටුකළ සේවය විශිෂ්ඨ බව පිළිගත යුතුය. පෞද්ගලික අංශයද එම ප්‍රයත්නය හා අත්වැල් බැඳගත් බව අපි දනිමු. නිදසුනක් ලෙස රටේ ප්‍රධාන පෙළේ ඇඟළුම් නිෂ්පාදන ආයතනයක් හමුදාව සමඟ එක්ව ඇඳන් 1200

ක් සහිත දියුණු මට්ටමේ රෝහලක් තැනීම සඳහා සිය කර්මාන්ත ශාලාවක් පරිත්‍යාග කිරීම දැක්විය හැකිය (*Sri Lanka Army constructs 1200-bed hospital in Seeduwa for COVID-19 patients,* 2021). එසේ වුවත් වසංගතයට ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින සිවිල් යාන්ත්‍රණයට සහය වනු වෙනුවට, නිරෝධායන නීති බලාත්මක කිරීම වැනි කරුණු වලට සම්බන්ධ වීම මගින් මිලිටරිය ඍජුව සිවිල් කටයුතු සම්බන්ධයෙන් තීරණ ගන්නා තැනකට පත්කොට ඇත. මෙවැනි ප්‍රවණතා සම්බන්ධව අදහස් දක්වමින් යුවාන් ග්‍රැහැම් පහත කරුණු කියා සිටී:

> දක්ෂතා අතින් ගත්කළ යම් පොදු සාධක තිබිය හැකි වුවත්, විශේෂීකරණය වූ මිලිටරි කුසලතා කට්ටලය තුළ සිවිල් හදිසි තත්වයන්ට මුහුණ දියහැකි අන්දමේ හැකියාවන් ස්වභාවිකව අඩංගු වන්නේ නැත. එමෙන්ම කොවිඩ්-19 වසංගතය වැනි බැරෑරුම් තත්වයක් තුළ රෝගය ආසාදනය වී සේනාංක වල මානව ශක්තිය පහත යෑම සම්බන්ධයෙන්ද ආරක්ෂක අංශ වලට ගැටළු තිබීමේ ඉඩක් පවතී. (Graham, 2020)

වසංගතය පාලනය කිරීමෙහි ලා නිරෝධායනය වැදගත් හා අත්‍යාවශ්‍ය භූමිකාවක් ඉටු කරයි. ඒ සඳහා අවශ්‍ය වන්නා වූ මානව සහ භෞතික සම්පත් ඔවුන් සතුව පවතින බැවින්ද, නිරෝධායනයට අදාළ නීති රෙගුලාසි තදින් බලාත්මක කිරීමේ අවශ්‍යතාවය නිසාද එම ක්‍රියාවලිය මිලිටරියට පැවරුණු බව තර්ක කළ හැකිය. කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ සිය භූමිකාව විස්තර කරමින් ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරියකු පැවසුවේ ශ්‍රී ලංකා හමුදාව යටතේ නිරෝධායන මධ්‍යස්ථාන 54 ක්, ඒවා තුළ ඇඳන් 10,430 ක් සහ, කොවිඩ් රෝගීන්ගේ ආශ්‍රිතයන් සඳහා අන්තර් මධ්‍යස්ථාන 92 ක් සහ ඒවා තුළ ඇඳන් 22,240 ක් පවත්වාගෙන යන බවය.[1] මෙම මධ්‍යස්ථාන තුළ කටයුතු බාධාවකින් තොරව කරගෙන යෑමටත්, ඒවා පවත්වාගෙන යාමට අවශ්‍ය මානව සම්පත බාධාවකින් තොරව ලබාගැනීමටත් මිලිටරි ආකාරයේ කළමණාකරණ රටාව ඉතා ප්‍රයෝජනවත් බව ඔහු පැවසීය.

ත්‍රස්තවාදී ප්‍රහාරයක්, පාරිසරික විපතක් හෝ සෞඛ්‍ය අර්බුදයක් වැනි අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීමේදී පුරවැසි අයිතීන් සහ නිදහස යම්තාක් දුරකට කප්පාදු කිරීමට සිදුවන බව සැබෑවකි. නමුත් සිවිල් කටයුතු සම්බන්ධව කිසිදු පුහුණුවක් නොලැබූ ආරක්ෂක අංශ ඒ සඳහා යෙදවීම මගින් මානව හිමිකම් දරුණු ලෙස උල්ලංඝණය වීමේ හැකියාවක් පවතී. මෙම කෘතියේම වෙනත් පරිච්ඡේදයක දැක්වෙන නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයන් පිළිබඳ පහත උදාහරණය මගින් මේ බව වඩාත් හොඳින් පැහැදිලි වේ:

1 නිරෝධායන මධ්‍යස්ථානයක් භාරව සිටින ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරියකු සමඟ සාකච්ඡාවල 2021 ජූලි 17.

තමුන්ගේ කළමණා එකතු කරගැනීම සඳහා ඔවුන්ට ලබාදුන්නේ මිනිත්තු 5-10 වගේ කාලයක්. ඉන්පසුව සෙනග තෙරපෙමින් තිබූ බස් රථ වලට ඔවුන් පටවාගෙන නිරෝධායන මධ්‍යස්ථාන වලට රැගෙන ගියා. ඒවායේත් තත්වය ඉතා ප්‍රශ්නකාරීයි. තමුන්ව ගෙන යන්නේ කොහේටද කියා ඔවුන්ට කීවේ නෑ වගේම, PCR පරීක්ෂණ සිදුකළේත් නෑ. මුඛ ආවරණද දී නොතිබුණු නිසා මෙතැනින් කොවිඩ් ආසාදනය වූ අය සිටියා වෙන්න පුළුවන්. (Fonseka and Dissanayake, 2021, p. 23)

වසංගතය පාලනය කිරීමට යැයි කියමින් බුද්ධි අංශ භාවිතා කොට ජනතාවගේ පෞද්ගලික තොරතුරු එකතු කිරීමේ ප්‍රවණතාවක්ද තිබේ. පෞද්ගලික අංශයේ දුරකථන පහසුකම් සපයන ආයතන පවා සිය සේවාලාභීන්ගේ තොරතුරු මෙසේ ආරක්ෂක අංශ වල ඉල්ලීම මත ලබාදී තිබුණි (*Intelligence units to trace contacts of COVID – 19 patients,* 2020). පෙරේරා (2020) පෙන්වා දෙන්නේ එකී තොරතුරු කොතරම් කාලයක් බුද්ධි අංශ සතුව පවතින්නේද යන වග, ඒවා ආශ්‍රිතයන් හඳුනාගැනීම සඳහා භාවිතා කරන්නේද නැතිද යන වග මෙන්ම, රජයේ කුමන ආයතන මගින් එම තොරතුරු පරිහරණය කරන්නේද යන වග නොපැහැදිලි වීම තුළින් මෙම තොරතුරු එකතු කිරීමේ මෙහෙයුම් වල ඇති විනිවිද භාවයේ මඳකම පෙන්නුම් කෙරෙන බවයි. “ගඩොලින් ගඩොල, සෞඛ්‍ය අර්බුදයට ප්‍රතිචාර දක්වන රජයන් සහ පෞද්ගලික ආයතන අනාගත නිරීක්ෂණ රාජ්‍යය සඳහා පදනම තනමින් සිටී.” (Shahbaz and Funk, 2020)

ලංකාව තුළ මිලිටරීකරණය ඇරඹෙන්නේ වසංගතයට බොහෝ පෙර සිටය. වසංගතය මගින් සිදුකර ඇත්තේ එම තත්වය සාමාන්‍යකරණය කිරීම පමණක් නොව, අවශ්‍යතාවයක් බවට පත්කිරීමයි. නිදසුනක් ලෙස, කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් ගුරුවරියක් එන්නත්කරණ මධ්‍යස්ථානයක් තුළ තමා ලද අත්දැකීම පිළිබඳව ප්‍රසාදයෙන් කතා කරමින් පැවසූයේ එම මධ්‍යස්ථානය කාර්යක්ෂමව හා අනවශ්‍ය පරිපාලන ක්‍රියාවලි වලින් තොරව පවත්වාගෙන යාමට හේතුව ආරක්ෂක අංශ විසින් එය භාරව සිටීම බවයි[2]. මෙම අදහසෙන් පෙනී යන්නේ පරිපාලනයට වඩා මිලිටරිය කෙරෙහි මහජන ප්‍රසාදය වර්ධනය වෙමින් පවතින බවය. නමුත් ඉතා විශිෂ්ඨ අන්දමේ සේවාවක් ලබාදුන්නත් ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ සිවිල් කටයුතු සඳහා මිලිටරිය හවුල් කරගැනීමට එය හේතුවක් නොවිය යුතු බව අප සිහිතබා ගත යුතුය.

2 පාසල් ගුරුවරියක් සමඟ සාකච්ඡාවල 2021 ජූලි 11.

## වසංගත ප්‍රතිචාරයේ ප්‍රතිවිරුද්ධතා සහ අසංවේදීත්වයන්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රතිරූපය ප්‍රධාන වශයෙන්ම ගොඩනැගුනේ විනයගරුක භාවය හා පොරොන්දු ඉටු කිරීම යන ගුණාංග මත පදනම්වය. ශක්තිමත් පෞරුෂයක් ඇති බවට දෙන හැඟීම සහ සාම්ප්‍රදායික දේශපාලනයෙන් දිගින් දිගටම දුරස්ව සිටීම යන කරුණු නිසා මෙතෙක් සිටි දේශපාලනඥයින්ට වඩා ඔහු වෙනස් බව ඡන්දදායකයෝද සිතූහ. වසංගත ප්‍රතිචාරය තුළ ආරක්ෂක අංශ වලට මුල්තැනක් දීමට ගත් තීරණය නිසා ඇත්තෙන්ම මෙම ප්‍රතිරූපය වර්ධනය වූ බව පැවසිය හැකිය. එහෙත් වසංගතය හේතුවෙන් කරළියට ආ ආණ්ඩුකරණය පිළිබඳ යම් යම් යථාර්ථයන් නිසා මෙම අපේක්ෂාවන් පදනම් විරහිත බව බොහෝ දෙනාට වැටහී ගොස් හමාරය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ වසංගත ප්‍රතිචාරය තුළ බොහෝ ප්‍රතිවිරුද්ධතා පවතින්නාක් මෙන්ම, අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේදී විවිධ කණ්ඩායම් වල තත්වය සම්බන්ධයෙන් ප්‍රකට කරන ලද අසංවේදීත්වය ඊට නොමැකිය හැකි කැළලක් එකතු කොට ඇත. ඊළඟ කොටස් වලදී මා බලාපොරොත්තු වන්නේ මුඛ ආවරණ පැළඳීම, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම, හුදෙකලා කිරීම්, රට වසාදැමීම් සහ නිරෝධායන නීති යන කරුණු වලට අදාළව මෙම විශේෂීකරණය වූ සැළකීම් කෙසේ දිග හැරුණේද යන්න අධ්‍යයනය කිරීමටය.

## මුඛ ආවරණ පැළඳීම සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කළ මාර්ගෝපදේශ වල සඳහන් වූ අන්දමට පහත ක්‍රියාමාර්ග පිළිපැදීම මඟින් වෛරසයේ පැතිරීම පාලනය කරගත හැකිය: නිවසින් බැහැරට යනවිට මුඛ ආවරණයක් පැළඳීම, නිතර දෑත් සේදීම, කසින හෝ කිවිසුම් යවන විට ටිෂූ කඩදාසියක් භාවිතා කිරීම සහ එය නියමාකාරයෙන් ඉවත දැමීම, අතට අත දීමෙන් හා/හෝ වැළඳ ගැනීමෙන් වැළකීම, සෙනඟ ගැවසෙන ස්ථානවලට නොයෑම සහ පොදු ස්ථාන වලදී අනෙක් අය සමඟ අවම මීටරයකවත් පරතරයක් පවත්වා ගැනීම. මීට අමතරව සමාජ ක්‍රියාකාරකම්, එනම් ආගමික උත්සව, මංගල උත්සව, ප්‍රිය සම්භාෂණ සහ ක්‍රීඩා කටයුතු වැනි ඒවා සීමා කිරීමට හා පසුව තහනම් කිරීමට රෙගුලාසිද හඳුන්වා දෙන ලදී. එසේම කලක් යනවිට ආණ්ඩුව මඟින් නිකුත් කරන ලද ගැසට් නිවේදන හරහා පොදු ස්ථාන වල මුඛ ආවරණ පැළඳීමත්, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමත් අනිවාර්ය කෙරුණි (*Health guidelines made compulsory,* 2020). මෙම රෙගුලාසි උල්ලංඝණය කරන්නන්ට මාස හයක සිර දඬුවමක් සහ රුපියල් 10,000 ක දඩයක් නියම විය (*Sri Lanka makes masks mandatory under new quarantine laws;*

*to impose fine if rule violated,* 2020). එම ගැසට් නිවේදනය මඟින් සුපිරි වෙළඳසැල්, කඩ සාප්පු, පොදු ප්‍රවාහනය සහ වෙනත් එවැනි පිරිස එක්රැස් වන ස්ථාන වලට නියම කළේ සිය සේවා පරිභෝජනය කරන්නන්ගේ විස්තර ලේඛනයක් පවත්වා ගන්නා ලෙසයි. ඊට අමතරව වරකට යම් දෙන ලද ස්ථානයක ගැවසිය හැකි පිරිස සම්බන්ධයෙන් උපරිම සීමා පැනවුනු අතර, අදාළ ස්ථානයට පිවිසෙන්නන්ගේ ශරීර උෂ්ණත්වය මැන බැලීමේ ක්‍රම ස්ථාපනය කරන ලෙසද නියෝග කෙරුණි. එහෙත් නිතර වාර්තා කෙරුණු අන්දමට මෙම රෙගුලාසි බලාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ දූෂණය, දෝෂ සහගත කළමණාකරණය සහ වාර්ගිකත්වය, ආගම, ආර්ථික තත්වය වැනි කරුණු මත පදනම් වූ වෙනස් කොට සැළකීම නොමඳව දක්නට තිබුණි. එසේම නිරෝධායන රෙගුලාසි බලාත්මක කිරීමේ අධිකාරය ආරක්ෂක අංශ වලට ලබාදීම නිසා සමාජයේ ඉතාම ආන්තීකරණය වූ කොටස් තවදුරටත් මර්දනය කරන්නට යෙදුණි.

නිදසුනක් ලෙස පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා 2021 මැයි 7 පැවති මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කළේ නිරෝධායන නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් 5000 ට අධික පිරිසක් අත්අඩංගුවට ගෙන ඇති බවත්, මුඛ ආවරණ පැළඳීම පමණක් නොව ඒවා නියමිත සෞඛ්‍ය නිර්දේශ වලට අනුකූලව නොපළඳින්නේ නම් ඊට අදාළ නීතිද බලාත්මක කිරීමට සිදුවන බවත්ය (*Police arrest 238 for not masking,* 2021). කෙසේ වුවත් ක්‍රියාත්මකකරණයේදී පැහැදිලි වූයේ මෙයාකාර දැඩි නීති භාවිතා වූයේ දුගී සහ සුළුතර කණ්ඩායම් අරබයා පමණක් බවත්, අනෙකුත් අය සඳහා ලිහිල් ආකාරයෙන් ඒවා ක්‍රියාත්මක කළ බවත්ය. ශ්‍රී ලංකා පොලීසිය විසින් මුඛ ආවරණ නොපළඳින්නන් ඔසවාගෙන යන අයුරු ජාත්‍යන්තර ප්‍රවෘත්ති නාලිකාවක් විසින් පවා වාර්තා කර තිබුණි (*Mask Police 'lift' people in Sri Lanka,* 2021). ප්‍රවෘත්ති වාර්තාකරණයට වඩා ප්‍රේක්ෂක සංඛ්‍යාව වැඩිකර ගැනීමට තතනන මාධ්‍ය අංශයද මෙවැනි අවස්ථා රස කරමින් වාර්තා කරන ලද අතර, එහිදී සමාජගත කෙරුණේ දුගී සහ වෙනත් ආකාර වලින් ආන්තීකරණය වූ කණ්ඩායම් නීති කඩන්නන් සහ අපරාධකරුවන් බවයි. එහෙත් එම ක්‍රියාම සිදුකළ ධනවතුන් සහ බලවතුන් සම්බන්ධයෙන් එවැනි ආඛ්‍යානයක් නොවීය. නිදසුනක් ලෙස උත්සවයකට මුඛ ආවරණ පැළඳීමෙන් තොරව සහභාගී වීම සම්බන්ධව මහත් විවේචන එල්ලව තිබියදී වුවද ආචාර්ය සරත් වීරසේකර ඒ පිළිබඳව සමාව අයැදියේ නැත (*Min. of Public Security goes 'without' facemask during official function,* 2021).

වෛරසයේ පැතිරීම පාලනය කිරීම සඳහා හඳුන්වා දුන් තවත් භාවිතයක් වූයේ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමයි. එහෙත් එයද ක්‍රියාත්මක වූයේ විශේෂීකරණය වූ අන්දමිනි. නිදසුනක් ලෙස පොදු

ප්‍රවාහනය භාවිතා කිරීමේදී සියළු මගීන් අතර මීටරයක පරතරයක් පවත්වන ලෙසත්, ආසන ධාරිතාවෙන් 50% ක් නොඉක්මවන ලෙස මගීන් ප්‍රවාහනය කරන ලෙසත් උපදෙස් ලැබුණි. ටැක්සි රථ , මෝටර් රථ සහ ත්‍රී රෝද රථ සඳහා ලැබුණු උපදෙස වූයේ උපරිම මගීන් දෙදෙනෙකු ප්‍රවාහනය කරන ලෙසයි (*COVID-19 BEST PRACTICE RESPONSE: PASSENGER TRANSPORT GUIDANCE IN SRI LANKA,* 2020&. නමුත් යථා තත්වය සැළකූ විට මෙම උපදෙස් ප්‍රායෝගික නැත. මේ සම්බන්ධව සිය උදහස ප්‍රකාශ කරමින් පෞද්ගලික බස් රථ හිමියකු පහත අදහස් දැක්වීය:

> මෙහෙම මෝඩ උපදෙස් කාටවත් බැහැ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න. කොවිඩ් පටන් ගන්න පෙරත් අපි අමාරුවෙන් ගැටගහ ගත්තේ. වාහනෙන් බාගයක් පුරවන්න අපි වාහනේ පාරට දාලා වැඩක් නෑ. එක්කෙනෙක් බහිනකල් ඉන්න පුළුවන්ද තව කෙනෙක් නග්ග ගන්න? පෞද්ගලික බස් එහෙම දුවන්න බෑ. බස් එකේ වියදමවත් හොයාගන්න බෑ මෙහෙම දිව්වොත්. ඊට වඩා හොඳයි බස් ටික ගෙදර තියන් ඉන්නවා![3]

මෙහි ඇති අප්‍රායෝගිකත්වය වටහාගත් ආණ්ඩුව ඉන්පසු කළේ එම උපදෙස් වෙනස් නොකොට, ක්‍රියාත්මකකරණය පමණක් ලිහිල් කිරීමයි. වසංගතයේ උපරිම අවස්ථාවේදී වුවත් පොදු ප්‍රවාහනය තුළ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම කළ නොහැකි වූයේ එය අභව්‍ය නිසාය. මෙම තත්වය නිසා රැකියා ස්ථාන තුළ හා අධ්‍යාපන ආයතන වල සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමෙහි තේරුමක් නොමැති විය. මන්ද, සෙනඟ පිරුණු රථයක ගමන් කළ අයකුට රැකියා ස්ථානය තුළ දුරස්ථභාවය පිළිබඳ ගැටළුව අදාළ නොවන හෙයිනි. මින් කියන්නට උත්සහ ගන්නේ මෙම සියළු ගැටළු පිළිබඳව කල්පනා කොට රජය විසින් පරිපූර්ණ ප්‍රතිපත්තිමය විසඳුම් සැපයිය යුතුව තිබුණු බව නොවේග මෙයින් මතු කරන්නට උත්සහ ගන්නේ කොවිඩ් රෙගුලාසි හඳුන්වා දීමේ ක්‍රියාවලිය තුළ තිබූ හදිසි සහ පිළිවෙලක් නොමැති ස්වභාවයයි.

මෙම රෙගුලාසි ක්‍රියාත්මකකරණය තුළද රසවත් ක්‍රමෝපායන් දක්නට ලැබුණි. හඳුන්වා දෙන ලද යම් රෙගුලාසියක ප්‍රායෝගිකත්වය පිළිබඳ ගැටළු පවතී නම් එය ක්‍රියාත්මකකරණය ආණ්ඩුව විසින් ලිහිල් කරන නමුත්, ආණ්ඩුවට හිතැති මාධ්‍ය භාවිතා කොට එය බලාත්මක වන බවට හැඟීමක් සමාජගත කරයි. නිදසුනක් ලෙස නිරෝධායන රෙගුලාසි කඩ කරන පෞද්ගලික බස් රථ පොලීසිය සහ ආරක්ෂක අංශ විසින් වටලන ආකාරය මාධ්‍ය විසින් එක් පසෙකින් වාර්තා කරද්දී, අනෙක් පසින්

3 මාතර බස් හිමියකු සමඟ සාකච්ඡාවල 2020 නොවැම්බර් 10.

සමස්ත පොදු ප්‍රවාහන පද්ධතියම ඇත්තෙන්ම මෙම රෙගුලාසි ලිහිල්ව ක්‍රියාත්මක කරන තත්වයක් පැවතුණි. එම නිසා රජයේ කොවිඩ් රෙගුලාසි ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූවාට වඩා, මාධ්‍ය වල සහය ඇතිව දෘෂ්ටිවාදීමය තලයක ක්‍රියාත්මක වූ බව පැවසිය හැකිය.

ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ ආර්ථික බර අඩු කරන බවටද රජය පොරොන්දුවක් දුනි. ඒ අනුව 2020 පාර්ලිමේන්තු මැතිවරණයට හරියටම පෙරාතුව සියළු රියදුරන් සහ කොන්දොස්තරවරුන් සඳහා රුපියල් 5000 බැගින් ලබාදීමට කටයුතු කරන ලදී (*Rs. 5,000 allowance for private bus drivers & conductors,* 2020). මහ බැංකුව විසින්ද ණය දෙන ආයතන වෙත උපදෙස් නිකුත් කරමින් කියා සිටියේ බස් හිමියන්ට සිය ණය පියවීම සඳහා සහන කාලයක් ලබාදෙන ලෙසයි. එහෙත් එම උපදෙස සියළුම අවස්ථා වල එකම ආකාරයෙන් ක්‍රියාත්මක වූවාද යන්න සැක සහිතය. ඉහත සඳහන් බස් රථ හිමියාට අනුවද මෙම සහනය ලැබී තිබුණේ සමහරුන්ට පමණි. එහෙත් ඔවුන්ටද ලද සහන කාලය සඳහා ගෙවීමට අමතර මුදලක් අදාළ ආයතන විසින් එකතු කර තිබූ බව ඔහු පැවසීය. රජයෙන් යම් යම් සහනයන් සහ දීමනා ලැබුණත්, ප්‍රවාහන ක්ෂේත්‍රයේ කටයුතු දිගටම පවත්වාගෙන යෑම සඳහා ඒවා කිසිසේත් ප්‍රමාණවත් නොවූ බව පැහැදිලිය. අදාළ රෙගුලාසි ලිහිල්ව බලාත්මක කිරීමට කොවිඩ් කාර්ය සාධක බලකාය ගත් තීරණය පිටුපස තිබුණේ මෙම යථාර්ථයයි.

එසේම සාමාන්‍ය පුරවැසියාට සංස්කෘතිකමය වශයෙන් වැදගත් අවමංගල්‍ය උත්සව, මංගල උත්සව සහ විවිධ ආගමික උත්සව වැනි දේ නිරෝධායන නීති නිසා නැවැත්වීමට සිදුවුවත්, එම නීති දේශපාලනඥයින් සහ ඔවුන්ගේ හිතවතුන්ට බලනොපෑ බව පෙනෙන්නට තිබුණි. වතු ශ්‍රමිකයින් දහස් ගණනකගේ සහභාගීත්වයෙන් තලවාකැලේ පවත්වන ලද ආරුමුගම් තොණ්ඩමන්ගේ අවමංගල්‍ය උත්සවය මීට කදිම නිදසුනකි (රූප සහටන් අංක 1 බලන්න). එසේම සිය බලය තවදුරටත් තහවුරු කරගැනීම සඳහා 2020 අගෝස්තුවේ පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන විටත් ජනාධිපතිවරයාට මෙම නිරෝධායන නීති බාධාවක් වූ බව නොපෙණුනි. ‘ගම සමඟ පිළිසඳරක්’ වැඩසටහන වෙනුවෙන් සිය ගණනක් ගම්වාසීන් සහ සිය ආරක්ෂක කාර්ය මණ්ඩලය එක තැනකට කැඳවන විටද ජනාධිපතිවරයා සිදුකළේ තමා විසින් හඳුන්වා දුන් නිරෝධායන රෙගුලාසි තමා විසින්ම උල්ලංඝණය කිරීමය (රූප සහටන් අංක 2 බලන්න).



*රූපසටහන 1: ජනාධිපතිවරයා විසින් හල්දුම්මුල්ල ප්‍රදේශයේ ගම්මාන වෙත සංචාරය කිරීම (2020 සැප්තැම්බර් 25)*

*මූලාශ්‍රය: මිනිසුන් ජීවත් කරවීම යුද්ධයකි..., 2020*




*රූපසටහන 2: ඒ. තොණ්ඩමන් ගේ අවමඟුල් පෙරහැර (2020 මැයි 29)*

*මූලාශ්‍රය: තොණ්ඩමන් ගේ අවමඟුල් පෙරහැර නගරයට සේන්දු වීමත් සමඟ නුවරඑළියට ඇඳිරි නීතිය පැනවීම, 2020*

පෙරද දැක්වූ පරිදි කොවිඩ් රෙගුලාසි ලිහිල් කෙරුණේ දේශපාලනඥයින්ට පමණක් නොව ඔවුන්ගේ නෑ හිතමිතුරන්ටත්ය. මෙම කණ්ඩායම විසින් තරු පහේ හෝටල් වල පවත්වනු ලැබූ මංගල උත්සව සහ උපන්දින සාද පිළිබඳවත්, ඒවාට කොවිඩ් යාන්ත්‍රණයේ ඉහළින්ම සිටින නිලධාරීන්ගේ ආශිර්වාදය තිබූ බවත් බොහෝ අවස්ථා ගණනකදී වාර්තා විය. එවැනි එක්තරා උදාහරණයක් නම් වර්ෂ 2021 ජූනි 30 වන දින පවත්වනු ලැබූ මංගලෝත්සවයකි. පොලිස් මාධ්‍ය ප්‍රකාශකට අනුව මෙම මංගලෝත්සවය පිළිබඳ ලද තොරතුරක් මත වැටලීමක් සිදුකොට අදාළ පිරිස නිරෝධායනයට යොමුකළ බව කියවුණද, පසුව වාර්තා වූයේ එහි සිටි අමුත්තන්ගෙන් 20 දෙනෙකු එකම නිවසේ නිරෝධායනයට යොමුකළ බවයි (*The wedding that violated quarantine regulations*, 2021). නිරෝධායන රෙගුලාසි ඉතා විශේෂීකරණය වූ අන්දමින් බලාත්මක වූ බව ඒ අනුව පැහැදිලි වේ.

## *සංචරණ සීමා, රට වසා දැමීම් සහ නිරෝධායනය*

වෛරසයේ සීඝ්‍ර පැතිරීම පාලනය කිරීම සඳහා වරින් වර සංචරණ සීමා, රට වසා දැමීම් සහ ආසාදිතයින්ට නිරාවරණය වූවන් නිරෝධායනය කිරීම වැනි පියවර ගැනීමට ආණ්ඩුව ක්‍රියාකරන ලදී. වසංගතයේ මුල් අවධිය තුළ සංචරණ සීමා පනවන ලද්දේ පළාත් අතර සංචරණය, විශේෂයෙන්ම වෛරසයේ පැතිරීම සුවිශේෂයෙන් දැඩිව තිබූ බස්නාහිර පළාතට පිරිස් පැමිණීමෙන් සහ ඉන් පිටතට යාමෙන් වැළැක්වීම සඳහාය. මෙවැනි ක්‍රියාමාර්ග වල අවශ්‍යතාවය සහ ඒ පිටුපස තිබූ වෛද්‍ය විද්‍යාත්මක පදනම පිළිබඳ ගැටළුවක් නොමැති නමුදු, ඒවා බලාත්මක කළ ආකාරය නිසා සමාජයේ විවිධ කොටස් වලට සිදුවූ බලපෑමත්, පවතින අසාධාරණකම් සහ අසමානතා ඒ ඔස්සේ වැඩි වර්ධනය වූ අයුරුත් සැළකිය යුතුය.

මෙම කෘතියේ පරිච්ඡේද දෙකක් මඟින් නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් සහ මුස්ලිම් ප්‍රජාව යන දෙපිරිසට වසංගත ආණ්ඩුකරණයෙන් සිදුවූ බලපෑම විග්‍රහ කරන ලදී. මා මෙහිදී උත්සාහ කරන්නේ ආන්තීකරණය වූ කණ්ඩායම් වල මෙම අත්දැකීම් තුළින් කුමනාකාරයේ රටා මතුවේද යන්න හඳුනා ගැනීමටයි. ආදායම් උත්පාදනය සඳහා විවිධ සමාජ කණ්ඩායම් විවිධ මට්ටම් වලින් සමාජ අන්තර් ක්‍රියා මත යැපෙන බව අපි දනිමු. එම නිසා සංචරණ සීමා හා හුදෙකලා කිරීම් විවිධ කණ්ඩායම් වලට බලපාන්නේ විවිධාකාරයට බවද පැහැදිලිය. සුදු කරපටි රැකියා කරන්නන් බොහෝ දෙනෙකුට සිය රැකියා කටයුතු දුරස්ථ ක්‍රම මඟින් කරගෙන යෑමේ ගැටළුවක් නොවීය. එසේම විධිමත් අංශයේ බොහෝ රැකියා මේ සමය තුළ සුරක්ෂිතව පැවතුණු අතර, නිවසේ සිටියත් සම්පූර්ණ ආදායම ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට ලැබුණි. එහෙත් අවිධිමත් අංශයේ සහ විශේෂයෙන්ම නගර වල වාසය කරන්නන්ගේ අත්දැකීම මීට වෙනස් එකකි[4]. ඔවුන් මුහුණ දුන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ආණ්ඩුව ලබාදුන් සහය නොගිණිය හැකි තරම් කුඩාය (*Protest in Wanathamulla demanding more relief amidst COVID-19,* 2020). මෝදර ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී මහල් නිවාස සංකීර්ණයක වාසය කරන පුද්ගලයකුගේ ඒ සම්බන්ධ අත්දැකීම මෙසේ විය:

> හැමෝටම ගෑස් බෙදා දීමේ ක්‍රමයක් නැහැ. ආණ්ඩුවෙන් අපිට ක්‍රමයක් හදා දුන්නා රජයේ නිලධාරීන් හරහා C බ්ලොක් එකේ කඩෙන් බඩු ගන්න හැකි වෙන්න. නමුත් ඊට අවශ්‍ය මුදල් අපි ළඟ තවදුරටත් නැහැ. එළවළු, මස්-මාළු, බේත් හේත් වගේම කාන්තා අයට අවශ්‍ය කරන සනීපාරක්ෂක දේවල් මුකුත්ම අපේම කඩ වලින්වත් ගන්න ක්‍රමයක් නැතිව ඉන්නේ. (Gunasekera, 2020 හි දැක්වෙන පරිදි)

ඒ අනුව බොහෝ දුගී වැසියන් ආණ්ඩුවට එරෙහිව විරෝධතාවය ප්‍රකාශ කිරීම සඳහා වීදි බටහ. එහිදී සිය ජීවනෝපායන් නැති වීමෙන් ඇති වූ ආර්ථික ගැටළුවට පිළියම් නොයෙදීම සම්බන්ධයෙන්ද, එමෙන්ම මූල්‍යමය හා ද්‍රව්‍යාත්මක සහනාධාර බෙදා හැරීමේදී රජයේ නිලධාරීන්ට විශේෂ සැලකිළි ලබාදීම පිළිබඳවද රජය විවේචනයට ලක්වුණි (*Protest in Wanathamulla demanding more relief amidst COVID-19 (2020) News First*, 2020).

අධික ජනගහණයක් සහිත ප්‍රදේශ වල ජීවත් වන්නන්ද හුදෙකලා කිරීම් සහ රට වසා දැමීම් වලින් සුවිශේෂීව පීඩා වින්දහ. තවත් අඩු ආදායම්ලාභී මහල් නිවාස සංකීර්ණයක වාසය කරන පුද්ගලයකු ඒ පිළිබඳ මෙසේ පැවසීය:

---

4 ග්‍රාමීය ප්‍රදේශ වල වාසය කරන සහ කෘෂිකර්මාන්තයෙන් යැපෙන අයවළුන් නාගරික ප්‍රදේශ වල ජීවත් වූවන් තරම් හුදෙකලා කිරීම් වලින් බලපෑමට ලක් නොවුනි.

> අපේ ගෙවල් වර්ග අඩි 450 ට වැඩිය ලොකු නැහැ, ගෙදරකට වර්ග අඩි 550 ගාණේ තියෙනව කිව්වට. ඒ ගාණ හැදෙන්න නම් කොරිඩෝ කොටසත් එක්ක ගණන් හදන්න වෙනවා. මෙතන ගෙවල් 927 ක් තියෙනවා. ඒ අතරින් 870-880 වගේ ප්‍රමාණයක සෙනග පදිංචි වෙලා ඉන්නේ. සමහර ගෙවල් වල හත් අට දෙනා ඉන්නවා. තව සමරහක් වල ඊටත් වැඩියි. අනික් අයව කොරෝනා වලින් ආරක්ෂා කරන්න කියලා අපිව හිර කරලා තියෙනවා; හැබැයි අන්තිමේ දරුණු මානසික පීඩා සහිත පිරිසක් මේකෙන් බිහිවෙන එකයි වෙන්නේ (Gunasekera, 2020).

පෙරද දැක්වූ පරිදි මාධ්‍ය මඟින් කොවිඩ් ආසාදිතයින් අපරාධකරුවන් ලෙස හුවා දැක්වීම නිසා ඔවුන් සමාජයට තර්ජනයක් ලෙස පෙනෙන්නට පටන් ගැණුනු අතර, එබැවින් ඔවුන්ගේ ආන්තීකරණය වැඩි වර්ධනය විය. මෙම මානසිකත්වය තවත් වැඩි වී ඇත්තේ එම ප්‍රදේශ අධීක්ෂණය සඳහා ඩ්‍රෝන යොදාගැනීමත් සමඟය. පොලිස් මාධ්‍ය ප්‍රකාශක අජිත් රෝහණට අනුව ඩ්‍රෝන භාවිතය මඟින් හුදෙකලා කරන ලද ප්‍රදේශ වල වාසය කරන්නන් නිරෝධායන නීති අනුගමනය කරන්නේද යන්න නිරීක්ෂණය කිරීම සිදුවේ (*15 arrested from lock-down areas following drone monitoring op,* 2020).

මෙසේ ඩ්‍රෝන භාවිතා කිරීම ලංකාවට සුවිශේෂී තත්වයක් නොවන නමුදු, ඒවා ආන්තීකරණය වූ කණ්ඩායම් වලට එරෙහිව පමණක් යෙදවීම තුළින් ඔවුන් සමාජයට කරදරයක් හෝ සෞඛ්‍ය ගැටළුවක් ලෙසත්, වඩාත් බැරෑරුම්ව ගත්විට අපරාධකරුවන් ලෙසත් හුවා දැක්වීම සිදුවන බව සිහිතබා ගත යුතුය. අවංකා ප්‍රනාන්දුට අනුව "සමහර කණ්ඩායම් දඩමීමා කරගැනීම තුළින් ඔවුන්ගේ ආන්තික තත්වය තවත් දරුණු අතට හැරේ" (Gunasekera, 2020 හි දක්වා ඇති පරිදි). ඊට අමතරව නිරෝධායන නීති බලාත්මක කරන නිලධාරීන් විසින් නීතිය තමන් අතට ගැනීම නිසා දුගී, දුර්වල සහ ආන්තීකරණය වූ ප්‍රජාවන්ට දරුණු සංකීර්ණතා අත්විඳින්නට සිදුවිය. එසේම වසංගතය පිළිබඳ කතා කිරීමේදී යුධ ආඛ්‍යානයක් භාවිතා කිරීම හේතුවෙන්, වසංගතය කළමණාකරණය කිරීමේ උත්සහයේ යෙදුනු පිරිස විසින් ප්‍රජාවන් තර්ජනයක් ලෙස මිස අයිතීන් දරන පුරවැසියන් ලෙස සළකන්නට නොයෙදුණි. පහත රූප වලින් දැක්වෙන්නේ මීට උදාහරණ දෙකකි.



රූපසටහන 3: ඇඳිරි නීතිය අතරතුර මාර්ග යට පිවිසි අයවලුන් මහා මාර්ගයේ දණ ගැස්සවීම.

මූලාශ්‍රය: ශ්‍රීනිවාසන්, 2021.




රූපසටහන 4: ඇඳිරි නීතිය අතරතුර කැරම් ක්‍රීඩාවේ නිරතවූ පිරිස් පළවා හැරීම.

මූලාශ්‍රය: හිරු ප්‍රවෘත්ති (තිර රූපසටහනක්)

ඉහත රූප සටහන් අංක 4 රූපසටහනෙන් දැක්වෙන්නේ තරුණ ත්‍රීරෝද රථ රියදුරකුට සිය කැරම් ක්‍රීඩා කට්ටලය හිස තබාගෙන දුවන්නට නියම කළ අයුරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට හිතවත් මාධ්‍ය ආයතනයක් විසින් වාර්තා කළ අන්දමය. රූප සටහන් අංක 3 හි දැක්වෙන්නේ සංචරණ සීමා මධ්‍යයේ එළිබට පිරිසකට මහමඟ දණ ගසාගෙන සිටීමට නියෝග කළ අයුරු වේ ('The marvelous punishments meted out to those who violated COVID regulations'). ඒවා ඉතා රසවත් අන්දමින් වාර්තා කිරීම තුළින් පෙනී යන්නේ එම ආයතනය එකී දඬුවම් අනුමත කරන බවයි. මෙයාකාරයෙන් ඉතා පක්ෂපාතී ලෙස වාර්තාකරණය සිදුකිරීමේදී බලවතුන් විසින් සිදුකරන ලද නිරෝධායන නීති උල්ලංඝණය කිරීම් පිළිබඳ කිසිත් නොකීම කැපී පෙනුණි.

## සමාජ ධූරාවලීන් ප්‍රතිනිෂ්පාදනය කිරීම

වසංගතය සමාජය පුරා වෙනසකින් තොරව පැතිරුණද, එහි බලපෑම විවිධ කණ්ඩායම් වලට විවිධ වශයෙන් දැනුණි. නිදසුනක් ලෙස ඉහත දැක්වූ අත්දැකීම් තුළින් පැහැදිලි වන එක් කරුණක් වන්නේ පැල්පත්වාසී ජනතාවට වෛරසය වැළඳීමේ ප්‍රවණතාව, ඊට ඉහළ මට්ටමේ නිවාස ක්‍රම වල ජීවත් වන්නන්ට වඩා වැඩි බවයි. මෙම පරිච්ඡේදයෙන් දැනටමත් දක්වා ඇති පරිදි වෛරසයටත් වඩා ඇත්තෙන්ම ඊට දක්වන ලද ප්‍රතිචාරය තුළිනි පවතින සමාජ අසමානාතා තවදුරටත් වැඩි වර්ධනය කරන්නට යෙදුනේ.

වෙනත් රටවල මෙන් ලංකාවේද වෛරසයේ පැතිරීම පාලනය කිරීම සඳහා ගන්නා ලද මූලික පියවරක් ලෙස පිටරැටියන් රටට ඇතුළු වීම වැළැක්වීම සිදුවිය. මුල් කාලයේදී සම්පූර්ණ තහනම වෙනුවට සිදුකළේ ගුවන් තොටුපොලින් ඇතුළු වන්නන් පරීක්ෂාවට ලක් කිරීමයි. නමුත් තත්වය බැරෑරුම් වනවිට රෙගුලාසි දැඩි කළ අතර, ඒ අනුව දෙන ලද හෝටලයක හෝ ආණ්ඩුවෙන් පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථානයක යම් කාල සීමාවක් සඳහා නිරෝධායනය වීම අනිවාර්ය කෙරුණි. එහෙත් විශේෂ සංචාරකයන් සහ වෙනත් එවැනි පුද්ගලයන් සඳහා 'සංචාරක බුබුළු' නිර්මාණය කෙරුණු අතර, ඒ තුල මෙම කිසිවක් අදාළ නොවීය.

සාමාන්‍යයෙන් මෙවැනි සීමා පනවන ලද අවස්ථාවක සාමාන්‍ය සංචාරකයන්ට යම් යම් අපහසුතා ඇතිවීම නොවැළැක්විය හැකි වුවත්, ඒවා බලාත්මක කළ ආකාරය තුළින් විශේෂිත ආකාරයේ අපහසුතාද නිර්මාණය වූ බව පෙනේ. නිදසුනක් ලෙස වසංගතයේ මුල් සමය තුළ තමා නිරෝධායනය වන ස්ථානය තීරණය කිරීමේ හැකියාව බොහෝ දෙනෙකුට නොවීය. ඒ අනුව සමහර පිරිස් වලට මඩකලපුව සහ වවුනියාව වැනි දුර බැහැර ස්ථාන වලට යෑමට සිදුවන ලදී. ලංකාවට පැමිණීම සඳහාම දිගු කාලයක් වැය කළ මෙම පිරිසට ඉන්පසුව සම්පූර්ණ කරන්නට සිදුවූ මෙම අමතර ගමන ඉතා අපහසුදායක වූවාට සැක නැත. පසුව පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් ගාස්තු ගෙවන නිරෝධායන මධ්‍යස්ථාන ස්ථාපිත කළද, ඒවායින් ප්‍රයෝජන ගත හැකි වූයේ සමහරුන්ට පමණක් බව නොකිවමනාය. මුල් කාලයේදී පෞද්ගලික නිරෝධායනය තෝරා ගත්තවුන්ගේ එම වියදම ගුවන් ටිකට්පතට එකතු කෙරුණි. දැඩි ආර්ථික ගැටළු වලින් පීඩා විඳි විදෙස් ශ්‍රමිකයින් වැනි පිරිස් වලට නැවත සිය ගම් රටවල් බලා ඒම එම නිසා අතිශය අපහසු කරුණක් බවට පත්විය. සංචරණ සීමා වලට අමතරව පෞද්ගලික නිරෝධායනය ආශ්‍රිතව දැරීමට සිදුවූ මෙම අමතර බරපැන හේතුවෙන් එවැනි බොහෝ ශ්‍රමිකයින් මැද පෙරදිග රටවල සිරවී සිටි බව වාර්තා වේ. ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයේ නිලධාරියකු ඔහුගේ අත්දැකීම පහත පරිදි විස්තර කළේය:

> නව රෙගුලාසි වලින් පසුව ගුවන් ටිකට්පත් වල මිල වැඩි වුනේ නිරෝධායනයට අදාළ පිරිවැයද ඊට එකතු කළ නිසයි. බොහෝ ශ්‍රමිකයින්ට ඒ වනවිටත් රැකියා අහිමි වෙලා තිබුණේ. කන්න බොන්න ඉන්න හිටින්න තැනක්වත් බොහෝ දෙනෙකුට තිබුණේ නැහැ මේ වෙනකොට. එම නිසා ආණ්ඩුව ගුවන් තොටුපොල විවෘත කළ පමණින් ගෙදර එන්න හැකියාවක් ඔවුන්ට තිබුණේ නෑ. බොහෝ දෙනා මට කතා කළා අපේ සමාගමෙන් යම් උපකාරයක් ගන්න හැකි වෙයිද බලන්න. මොකද තානාපති කාර්යාලයෙන් එවැනි උදව්වක් ලබාගත නොහැකි වූ නිසා.[5]

5 මැද පෙරදිග නේවාසිකව සේවය කරන ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයේ නිලධාරියෙක් සමඟ සාකච්ඡාව, 2021 පෙබරවාරි 10.

රටේ විදේශ විනිමය සපයන ප්‍රධාන මූලාශ්‍රයක් වන මිලියන 1.2 ක් වූ මුහුදෙන් එතෙර සේවය කරන ශ්‍රී ලාංකික ජනගහණයෙන් බහුතර පිරිසට ආණ්ඩුවේ අවධානය නොලැබී යාම නිසා මෙසේ දුක් විඳින්නට සිදුවිය. මෙම ශ්‍රමිකයන් ප්‍රමාණයෙන් ඉතා අධික නිසා ආර්ථික වශයෙන් දුර්වල අඩියක සිටින ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවට ඔවුන් සියල්ලන්ම නැවත ගෙන්වා ගැනීමෙහි බරපැන දැරිය නොහැකි බව සැබෑවකි. එහෙත් වසංගතය කළමණාකරණය කරගැනීම සඳහාම ජාත්‍යන්තරව ආධාර ලැබුණු සහ, ඒවායින් වියදම් කොට ඇත්තේ අඩකට අඩු ප්‍රමාණයක් බව රජයේම වාර්තා වල සඳහන් වූ කාලයක සහ පසුබිමක (මේ පිළිබඳ වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා කරුණාකර මෙම කෘතියෙහි සුබසාධන ප්‍රතිපාදන පිළිබඳව ලියවී ඇති පරිච්ඡේදය බලන්න) මෙම කණ්ඩායම පිළිබඳව කුමන හෝ යාන්ත්‍රණයක් හඳුන්වා නොදීම පිළිගත නොහැකි මට්ටමේ අත්හැරීමකි.

රාජ්‍ය සේවයේ සහ විධිමත් අංශයේ නියුතු අයවළුන් මෙම තත්වය නිසා බලපෑමට ලක්වූයේ සාපේක්ෂව අඩුවෙනි. බොහෝ රටවල සහනාධාර ක්‍රම වලින් මූලිකවම ඉලක්ක කළේ අඩු ආදායම්ලාභීන්, අවිධිමත් අංශයේ පිරිස් සහ රැකියා අහිමි වූවන්ය. එසේ කළේ ඔවුන්ට පැවැත්ම සඳහා වෙනයම් මාර්ග නොමැති වීම හෝ අඩු වීම නිසාය (*Coronavirus bailouts: Which country has the most generous deal,* 2020). නිදසුනක් ලෙස කැනඩාවේ වසංගතය නිසා රැකියා අහිමි වූ පිරිස් වෙනුවෙන් මසකට කැනේඩියානු ඩොලර් 2000 බැගින් මාස 4 ක කාලයක් දක්වා පිරිනැමූ අතර, කොස්ටා රීකා වල එම අගය මසකට ඇමෙරිකානු ඩොලර් 220 විය. නමුත් ලංකාවේ ජාතික මට්ටමින් සිදුකෙරෙන එවැනි වැඩපිළිවෙලක් දක්නට නොවීය. එම නිසා වසංගතයේ ආර්ථික බලපෑම ආදායම් කාණ්ඩය අනුව වෙනස් වූ අතර, එම පීඩනය දරාගැනීම සඳහා රාජ්‍ය මැදිහත්වීමක් නොවූ පසුබිමක කුටුම්බ විසින් පෞද්ගලිකව ඒ සඳහා ක්‍රම සෙවීමෙහි නිරත වන ලදී.

එමෙන්ම ආණ්ඩුව විසින් සමහර වෘත්තීන්ට ඉතා විශාල ගෞරවයක් ලබා දෙමින් ඔවුන් උලුප්පා දැක්වීමට කටයුතු කළේ වසංගතය හා සටන් වදිමින් සමාජය බේරා ගැනීමට තැත් කිරීමේ ඔවුන්ගේ භූමිකාව නිසාය. ඒ අනුව සෞඛ්‍ය සේවය, ආරක්ෂක අංශ සහ පොලීසිය මෙන්ම තෘණ මූල මට්ටමේ රාජ්‍ය නිලධාරීන් යන සියල්ලන් සමරමින් දැවැන්ත පුවරු ඉදිවිය. එහෙත් හුදෙකලා කිරීම් සහ රට වසා දැමීම් වල බලපෑම සාමාන්‍ය ජන ජීවිතයට දැනීම අවම කළ භාණ්ඩ නිවසටම ගෙන්වා දීමේ සේවා, සුපිරි වෙළඳසැල් සහ ටැක්සි රථ රියදුරන් වැනි අයගේ භූමිකාව එසේ සැමරුමට ලක් නොවුණි. ඔවුන්ගේ දායකත්වය ඉන් ව්‍යංගයෙන් අවතක්සේරු වූ අතර, සිය රාජකාරි ඉටු කිරීමේදී ඔවුන් නිරාවරණය වූ අනතුරෙහි බැරෑරුම්කමද එම නිසා අවධානයෙන් බැහැර විය. වෛද්‍යවරුන් සහ ඔවුන්ගේ පවුල් වල

සාමාජිකයන් එන්නත්කරණය කිරීමට තිබූ හදිසිය එදිනෙදා සමාජය පවත්වා ගැනීමෙහි ලා දිවා රෑ නොබලා වෙහෙස වූ නිල් කරපටි රැකියා කරන පිරිස හෙවත් පහල මට්ටමේ ගෙවීම් ලබන කම්කරුවන් එන්නත්කරණය කිරීමට නොතිබුණි. ඇත්තෙන්ම ඉගැන්වීම් කටයුතු තනිකරම මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවූ වකවානුවක වුවත් විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය එන්නත්කරණය කළද, ටැක්සි රථ රියදුරන් සහ සුපිරි වෙළඳසැල් කාර්ය මණ්ඩල වැනි පිරිස් වලට එම සේවා එතරම් කාර්යක්ෂමව ලැබුණේ නැත. එම්බෙම්බෙ (2003) ට අනුව මෙය තේරුම් ගතහොත් පැවසිය හැක්කේ ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය තුළින් ගොඩනඟා ඇති සමාජ ක්‍රමයෙහි, බේරා ගැනීමට තරම් වටින්නේ කාගේ ජීවිතද සහ එසේ නොවටින්නේ කාගේ ජීවිතද යන්න පිළිබඳව ව්‍යංගයෙන් යමක් සන්නිවේදනය කරන බවය.

## කොවිඩ් ප්‍රතිචාරයෙහි දේශපාලනීකරණය

ජනාධිපතිවරයාගේ කොවිඩ් ප්‍රතිචාරය තුළින් ඉතා පැහැදිලි වූ එක් කරුණක් නම් ඔහු සිය දේශපාලන අරමුණු සඳහා එය යොදාගත් බවයි. බලය තහවුරු කරගැනීම, රාජ්‍ය සේවය සහ සිවිල් කටයුතු මිලිටරීකරණය කිරීම සහ සිය දේශපාලන හා ආර්ථික දැක්ම සාක්ෂාත්කරණය කරගැනීම සඳහා මඟ පැහැදිලි කරගැනීම වැනි අරමුණු එතුළ ගැබ්ව තිබුණි. නිදසුනක් ලෙස සෞඛ්‍ය අර්බුදය දරුණු වෙන්නට හොඳින්ම ප්‍රවණතාවය තිබූ අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණය කැඳවීම දැක්විය හැකිය. ඇලන් කීනන්ට අනුව:

> ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසයේ ප්‍රථම වරට පාර්ලිමේන්තු අධීක්ෂණයෙන් තොරව වැඩ කටයුතු කරගෙන යාමට ආණ්ඩුව තීරණය කර ඇත. මෙමඟින් දරුණු ව්‍යවස්ථා අර්බුදයක් ඇතිවීමේ ප්‍රවණතාවයක් පවතී. නොවැම්බරයේ බලයට පැමිණි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ පාර්ලිමේන්තුව තුළ බහුතරයක් නොමැති වීමේ අඩුපාඩුව මඟ හරවා ගැනීම සඳහා ලද පළමු අවස්ථාවේම, එනම් මාර්තු 2 වැනි දින පාර්ලිමේන්තුව විසුරුවා හැර, අප්‍රේල් 25 නව මැතිවරණයක් කැඳෙව්වේය. රට තුළ කොවිඩ් අර්බුදය උග්‍ර වෙත්ම මැතිවරණ කොමිසම විසින් දින නියමයකින් තොරව මැතිවරණය කල් දමන ලදී. ව්‍යවස්ථාවට අනුව මාස 3 කට වැඩි කාලයක් පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබිය නොහැකි තත්වයක් තුළ, ජූනි 2 වැනි දායින් කාලය ඉකුත් වීමට ප්‍රථම ජනාධිපති හෝ අධිකරණය විසින් යම් තීරණයක් නොගත හොත් ලංකාව එළඹෙන්නේ පෙර නොවූ විරූ ආකාරයේ පරිච්ඡේදයකටය. (Keenan, 2020)

පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට අදාළ නීතිමය තත්වය සහ වසංගතය පාලනය කිරීමට හඳුන්වා දුන් රෙගුලාසි වල නීතිමය තත්වය දිගින් දිගටම නොසළකා හරිමිනි ජනාධිපතිවරයා කටයුතු කළේ (Sumanthiran, 2021). පාර්ලිමේන්තුව පමණක් නොව ඔහුගේ ප්‍රගමනයට උපකාර කළ මන්ත්‍රීවරුන්ද ඔහුගේ පාලනය තුළ කොන් වී සිටිති. මේ පිළිබඳව විවේචනය කරමින් පාර්ලිමේන්තුව තුළ කතාවක් කළ සුමන්දිරන් මන්ත්‍රීවරයා පැවසුවේ සිය පක්ෂය තුළම සිටින වෛරස පිළිබඳ විශේෂඥ මහාචාර්ය විතාන සහ ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය ප්‍රනානදුපුල්ලේ වැනි අයගේ සේවයවත් ජනාධිපතිවරයා ලබා නොගන්නා බව හා, ඒ වෙනුවට රටේ වසංගත ප්‍රතිචාරයට මූලිකත්වය දීම සඳහා හමුදාපතිවරයා පත්කර ඇති බවය (*MP Sumanthiran speech on the Parliament,* 2021). ඒත් සමඟම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වැනි ජනාධිපතිගේ බලතල අතිශයින් වර්ධනය කරන හා එම ධූරයේ වගවීම අත්‍යන්තයෙන් අඩු කරන ප්‍රශ්නකාරී නීති කෙටුම්පත් (Srinivasan, 2020b) වසංගතයට මුවා වී සම්මත කරගැනීමද අමතක කළ නොහැක.

වසංගතයේ පළමු හා දෙවන රැළි පාලනය කරගැනීමෙහි ලා ලද සාර්ථකත්වය ජනාධිපතිවරයා විසින් ස්වකීය පාලනය සුජාතකරණය සඳහා යොදා ගන්නා ලදී. මේ පිළිබඳව ආණ්ඩුවට හිතැති මුද්‍රිත මාධ්‍ය මඟින් ඉතා උත්කර්ෂවත් අන්දමින් වාර්තා කර තිබුණේ මෙපරිදිය: "ගෝලීය බෝවන රෝග ප්‍රතිචාර දර්ශකය තුළ 9 වන තැන ශ්‍රී ලංකාව සහ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට" (*SL ranked 9th in Global Response to Infectious Diseases (GRID) index,* 2020). කෙසේ නමුත් තත්වය එන්න එන්නටම බරපතල වෙද්දී මෙම ජයග්‍රාහී ආඛ්‍යානය තවදුරටත් පවත්වා ගත නොහැකි විය. ඒ හා සමඟම ආර්ථිකයද දරුණු වෙද්දී ජනාධිපතිවරයා සහ ඔහුගේ ප්‍රතිපත්ති වඩාත් සියුම්ව මහජන නිරීක්ෂණයට ලක්වන ලද අතර, විවේචන උග්‍ර වන්නට විය. පොහොර ඉල්ලමින් ගොවියෝ වීදි බටහ; රජයේ අනුග්‍රහයෙන් සිදුවන කැලෑ කැපීම් සහ මෙරට සම්පත් විදෙස් රට වලට විකිණීම් සම්බන්ධයෙන් විරෝධය පාමින් සිවිල් සමාජ සංවිධාන වීදි බටහ; ගුරුවරු, සිසුන් සහ වෙනත් මහජන ආයතන අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමට සහ මිලිටරීකරණය කිරීමට විරෝධය පාමින් වීදි බටහ; ඒත් සමඟම ගුරුවරු දීප ව්‍යාප්ත වැඩ වර්ජනයකට එළඹුනේ වැටුප් විෂමතා ඉවත් කරගැනීමටය.

නිරෝධාන නීති වලට මුවා වෙමින් වීදි බට අසහනය මර්දනය කිරීම සඳහා ආණ්ඩුව විසින් පොලිස් බලය දියත් කරන්නට යෙදුණි. ඒ වනවිටත් වෛරසයේ පැතිරීම පාලනය වී ඇති බව කියමින් සංචරණ සීමා ලිහිල් වෙමින් තිබූ අවස්ථාවක වුවද, උද්ඝෝෂණකරුවන්ට එරෙහිව නිරෝධායන නීතිය තදින්ම ක්‍රියාත්මක විය. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය අසේල

ගුණවර්ධන නැවත දැනුම් දෙනතුරු විරෝධතා සහ මහජන රැස්වීම් තහනම් කරන ලෙස පොලීසියට උපදෙස් දුන්නේ වෛරසය පාලනය කිරීමට බව කියමිනි. එහෙත් උද්ඝෝෂණකරුවන් ඉන් පසුබට වූයේ නැත. බොහෝ අය අත්අඩංගුවට, පහර දීම් වලට සහ ඇප ලැබී තිබියදීත් බලහත්කාර නිරෝධායනයට ලක්විය. ගුරු සංගම් වල සාමාජිකයන්, ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින්ද ඇතුළුව, නිරෝධායන නීති උල්ලංඝණය කිරීමේ පදනම මත අත්අඩංගුවට ගනු ලදුව, නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කෙරුණි. එහෙත් මෙවැනි රෙගුලාසි මහින්දානන්ද අළුත්ගමගේ වැනි අමාත්‍යවරුන් වර්ෂ 2021 ජූලි 15 නාවලපිටියේ පා ගමන් යද්දී අදාළ වූයේ නැත. එම නිසා ආණ්ඩුවේ කොවිඩ් ප්‍රතිචාරයේ අරමුණ වසංගතය පාලනය කිරීමට වඩා ජනාධිපතිවරයාගේ දේශපාලන න්‍යාය පත්‍රය සාක්ෂාත්කරණය කිරීමට බව පැහැදිලිය.

## නිගමනය

මෙම පරිච්ඡේදය තුළින් ශ්‍රී ලංකාවේ වසංගත ආණ්ඩුකරණ මානසිකත්වය හා පුරවැසියාගේ ප්‍රජාතන්ත්‍රවාදී දිවියට එමඟින් එල්ල වන බලපෑම අධ්‍යයනය කෙරුණි. ආණ්ඩුවේ කොවිඩ් ප්‍රතිචාරය මූලිකවම පදනම්ව ඇත්තේ ජනාධිපතිගේ ආණ්ඩුකරණ තර්කනය මත මිස වසංගත හා වෛරස ක්‍රියාකාරීත්වය පිළිබඳ විශේෂඥයින්ගේ උපදෙස් මත නොවේ. වසංගතය යටතේ එන්න එන්නටම සාමාන්‍යකරණය වන ව්‍යතිරේඛ තත්වය ගෝඨාභය රාජපක්ෂ මාදිලියේ පාලනය සඳහා කිහිප අයුරකින් මහත් රුකුලක් වී ඇත: 1) ආණ්ඩුවේ සියළු ආයතන වල බලතල විධායක ජනාධිපති ධූරය වෙත සංකේන්ද්‍රණය කිරීම 2) විධායකය සියළු ආකාර සංවරණ හා තුලන වලින් නිදහස් කිරීම හරහා තම පාලනයට ඇති සීමා ඉවත් කරගැනීම 3) විවේචනය සහ විසම්මුතිය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් වෙනුවට විනය සහ කීකරු බව මත පදනම් වූ සමාජයක් බිහි කිරීම සහ 4) සාර්ව තලයේ ප්‍රතිඵල පිළිබඳ මිස මානව අවශ්‍යතා සහ අභිලාෂ පිළිබඳව උනන්දු නොවන ක්‍රමයක් ඇති කිරීම. එම නිසා ලංකාවේ වසංගතයට එරෙහි ප්‍රයත්නය ජනාධිපතිගේ දේශපාලන දැක්ම *මත හා ඒ වෙනුවෙන්* දියත් වන්නක් බව පැහැදිලිය.

කොවිඩ් ප්‍රතිචාරය තුළින් සිවිල් කටයුතු වලට මැදිහත් වීමට ආරක්ෂක අංශ වලට හොඳ හේතුවක් සපයා ඇත. මෙම 'නව සාමාන්‍ය' තත්වය වසංගතයෙන් ඔබ්බටද පවතින බව පෙනේ. සිවිල් සේවයේ පවතින දූෂණය, දෝෂ සහගත කළමණාකරණය සහ අලස බව වැනි සෑම ගැටළුවකටම පිළිතුරක් ලෙස ආරක්ෂක අංශ සැළකීමට පටන් ගැනීමත් සමඟ, මිලිටරීකරණය පිළිබඳ මහජනතාවට ඇති සැකය කෙමෙන් නැතිව යා හැකිය.

ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය තුළ මූලිකවම පිළිබිඹු වන්නේ ජනපති විසින් තෝරාගෙන ඇති දේශපාලන සන්ධානය කුමක්ද යන්නයි. ඔහුට පෙර සිටි නායකයින්ට සහ රටේ මෙතෙක් පැවති දේශපාලන සම්ප්‍රදායට වෙනස්ව යමින් ජනාධිපතිවරයා ඔහුට උපකාර කළ අයද ඇතුළුව සියළු දේශපාලන ප්‍රභූන් වසංගත ප්‍රතිචාරය තුළ මඟහැර තිබේ. මෙය මූලෝපායික තීරණයක්ද නැතිනම් පහසුව තකා ගන්නා ලද තීරණයක්ද යන්න කෙසේ වෙතත්, මෙමඟින් සාම්ප්‍රදායික පද්ධතිය පැහැදිලි වෙනසකට ලක් කොට ඇති බවත්, එහි බලපෑම අනිවාර්යයෙන්ම වසංගතයෙන් එහාට දැනෙනු ඇති බවත් පැහැදිලිය.

වෙනත් බොහෝ රටවල මෙන් ලංකාවේද කොවිඩ් ප්‍රතිචාරය තුළ මූලික අවධානය යොමු වූයේ ජනගහණයේ සෞඛ්‍යය කළමණාකරණය කිරීමටය. එබැවින් වින්දිතයන් සහ ආන්තීකරණයන්ට ලැබෙනවාට වැඩි තැනක් ආසාදිතයින් හා මරණ සංඛ්‍යාව, ආර්ථික දර්ශක සහ පාලනයේ ජනප්‍රියභාවය වැනි ඒවාට ලැබී තිබේ. මෙම පසුබිම තුළ රජය වසංගතයට එරෙහිව දියත් කරන්නේ යුද්ධයක් බවත්, එහිදී තමන්ගේම ජනතාව තර්ජනයක් ලෙස සළකන බවත් පෙනෙන්නට තිබෙන්නේ වැටලීම් සහ බලහත්කාරයෙන් නිරෝධායන මධ්‍යස්ථාන වෙත පටවා යැවීම් වැනි ක්‍රියා තුළිනි. විශේෂයෙන්ම ආන්තීකරණය වූ කණ්ඩායම් වලට එරෙහිව මෙවැනි ක්‍රියා සිදුකිරීමේ දී ඔවුන්ගේ ආන්තිකභාවයත්, පවතින ධූරාවලියත් යන දෙකම ප්‍රතිනිෂ්පාදනය වේ. එම නිසා වසංගත ප්‍රතිචාරය තුළින් අපේ සමාජය වෙනස් කරන්නේ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී හා ගෞරවාන්විත එකක් බවට නොව, අන් මත හා විවේචනය නොඉවසන, ඉතා මෙවලම්වාදී සහ පුරවැසියා යටත් වැසියකු බවට පත්කරන ආකාරයේ පද්ධතියකට බව සිහිතබා ගැනීම වටී.

## ආශ්‍රිත ග්‍රන්ථ


*15 arrested from lock-down areas following drone monitoring op* (2020) *News First*. Available at: https://www.newsfirst. lk/2020/11/12/15-arrested-from-lock-down-areas-followingdrone-monitoring-op/ (Accessed: 02 July 2021).

Cheibub, J.A., Ji Y.J., Hong, and Adam Przeworski (2020) 'Rights and Deaths: Government Reactions to the Pandemic', *SSRN* Working Paper.

Chen et al. (2021) 'What factors drive the satisfaction of citizens with governments' responses to COVID-19?', *International Journal of*

*Infectious Diseases*, 102, pp. 327-331.

*Coronavirus bailouts: Which country has the most generous deal?* (2020) *BBC News*. Available at: https://www.bbc.com/news/ business-52450958 (Accessed: 15 June 2021).

*COVID-19 BEST PRACTICE RESPONSE: PASSENGER TRANSPORT GUIDANCE IN SRI LANKA* (2020) *The Chartered Institute of Logistics and Transport*. Available at: https:// www.ciltinternational.org/news/covid-19-best-practice-response-passenger-transport-guidance-in-sri-lanka/ (Accessed: 05 July 2021).

*Curfew declared in Nuwara Eliya as Thondaman's funeral cavalcade enters town* (2020) *Economy Next*. Available at: https:// economynext.com/curfew-declared-in-nuwara-eliyaas-thondamans-funeral-cavalcade-enters-town-70497/ (Accessed: 30 July 2021).

*Democracy under Lockdown* (2020) *Freedom House*. Available at: https://freedomhouse.org/report/special-report/2020/ democracy-under-lockdown (Accessed: 15 June 2020).

Gingerich, D. and Vogler, J. (2021) 'Pandemics and Political Development: The Electoral Legacy of the Black Death in Germany', *World Politics*, 73(3), pp. 393-440.

Fonseka, B. and Dissanayake, U. (2021) 'Sri Lanka's Vistas of Prosperity and Splendour: A Critique of Promises Made and Present Trends' *Centre for Policy Alternatives*. Available at: https://www.cpalanka.org/wp-content/uploads/2021/07/ Sri-Lankas-Vistas-of-Prosperity-and-Splendour-A-Critiqueof-Promises-Made-and-Present-Trends.pdf (Accessed: 20 July 2021).

Graham, E. (2020) 'The armed forces and COVID-19', *IISS*, 08 April. Available at: https://www.iiss.org/blogs/analysis/2020/04/ easia-armed-forces-and-covid-19 (Accessed: 23 June 2021).

Gunasekera, D. (2020) 'Life in high-rise buildings amidst isolation', *The Morning*, 06 December. Available at: https://www. themorning.lk/life-in-high-rise-buildings-amidst-isolation/?

fbclid=IwAR2OmpzKYpYKbcii794d8n5iK5K8mKttKet9nYT3cRdI-fNQkN2KXtrinnY (Accessed: 27 June 2021).

*Health guidelines made compulsory* (2020) *Daily News*. Available at: https://www.dailynews.lk/2020/10/12/local/231231/ health-guidelines-made-compulsory (Accessed: 15 July 2021).

*Intelligence units to trace contacts of COVID – 19 patients* (2020) *News First*. Available at: https://www.newsfirst.lk/2020/04/18/intelligence-units-to-trace-contacts-of-covid-19-patients/ (Accessed: 28 June 2021).

Keenan, A. (2020) 'Sri Lanka's Other COVID-19 Crisis: Is Parliamentary Democracy at Risk?', *Crisis Group*, 29 May. Available at: https://www.crisisgroup.org/asia/south-asia/ sri-lanka/sri-lankas-other-covid-19-crisis-parliamentarydemocracy-risk (Accessed: 17 June 2021).

*Make people living is a battle, I undertake the responsibility of winning it-President says at inaugural "Discussion with Villagers" in Haldummulla* (2020) *Presidential Secretariat*. Available at: https://www.presidentsoffice.gov.lk/index. php/2020/09/25/make-people-living-is-a-battle-i-undertakethe-responsibility-of-winning-it-president-says-at-inauguraldiscussion-with-villagers-in-haldummulla/?lang=ti (Accessed: 30 July 2021).

*Mask Police 'lift' people in Sri Lanka* (2021) *Gravitas*. Available at: https://www.youtube.com/watch?v=cwfvJ6NBb1I (Accessed: 30 June 2021).

*Militarisation of COVID response, the looming refugee crisis, and Nepal's PM under pressure* (2020) *Himal Southasian*. Available at: https://www.himalmag.com/southasiasphere-issue-4/ (Accessed: 05 July 2021).

*Min. of Public Security goes 'without' facemask during official function* (2021) *Newshub.lk*. Available at: https://newshub. lk/en/2021/05/10/min-of-public-security-goes-withoutfacemask-during-official-function/ (Accessed: 25 June 2021).

*MP Sumanthiran speech on the Parliament* (2021) *JK Lanka Tamil*. Available at: https://www.youtube.com/watch?v=3AVqj2qctw

(Accessed: 24 June 2021).

Perera, S. (2020) 'When the Pandemic is a Portal to Militarization', *Groundviews*, 30 May. Available at: https://groundviews.org/2020/05/30/when-the-pandemic-is-a-portal-tomilitarization/ (Accessed: 17 July 2021).

*Police arrest 238 for not masking* (2021) *Daily News*. Available at: http://www.dailynews.lk/2021/05/07/law-order/248647/police-arrest-238-not-masking (Accessed: 05 July 2021).

*Protest in Wanathamulla demanding more relief amidst COVID-19* (2020) *News First*. Available at: https://www.newsfirst.lk/2020/11/26/protest-in-wanathamulla-demanding-morerelief-amidst-covid-19/ (Accessed: 15 July 2021).

*Rs. 5,000 allowance for private bus drivers & conductors* (2020) *Ceylon Today*. Available at: https://archive.ceylontoday.lk/newsmore/13721 (Accessed: 13 July 2021).

*SL ranked 9th in Global Response to Infectious Diseases (GRID) index* (2020) *The Morning*. Available at: https://www.themorning. lk/sl-ranked-9th-in-global-response-to-infectious-diseasesgrid-index/ (Accessed: 20 July 2021).

*Sri Lanka Army constructs 1200-bed hospital in Seeduwa for COVID-19 patients* (2021) *Colombo Page*. Available at: http://www.colombopage.com/archive_21A/May08_1620487579CH. php (Accessed: 17 June 2021).

*Sri Lanka Coronavirus – Worldometer* (2021) *Worldometers*. Available at: https://www.worldometers.info/coronavirus/country/ sri-lanka/ (Accessed: 15 June 2021).

*Sri Lanka makes masks mandatory under new quarantine laws; to impose fine if rule violated* (2020) *The New Indian Express*. Available at: https://www.newindianexpress.com/world/2020/oct/16/ sri-lanka-makes-masks-mandatory-under-new-quarantinelaws-to-impose-fine-if-rule-violated-2211071.html (Accessed: 22 June 2021).

Srinivasan, M. (2020a) 'COVID-19 Sri Lankan military is helping the country fight the pandemic', *The Hindu*, 15 April. Available

at: https://www.thehindu.com/news/international/covid19-sri-lankan-military-is-helping-the-country-fight-thepandemic/article31350778.ece (Accessed: 27 June 2021).

Srinivasan, M. (2020b) 'Sri Lanka: Controversial 20th Amendment passed', *The Hindu*, 22 October. Available at: https://www.thehindu.com/news/international/sri-lanka-controversial20th-amendment-passed/article32921800.ece (Accessed: 04 July 2021).

Srinivasan, M. (2021) 'Sri Lanka to probe 'army attack and humiliation' of Muslims', *The Hindu*, 20 June. Available at: https://www.thehindu.com/news/international/srilanka-to-probe-army-attack-and-humiliation-of-muslims/ article34871262.ece (Accessed: 30 July 2020).

Sumanthiran, M.A. (2021) 'Covid-19, Old Laws & The Government's Mismanagement', *Colombo Telegraph*, 06 May. Available at: https://www.colombotelegraph.com/index.php/covid-19- old-laws-the-governments-mismanagement/ (Accessed: 03 July 2021).

*The wedding that violated quarantine regulation* (2021) *Ada Derana*. Available at: http://www.adaderana.lk/news/75029/ wedding-party-violating-health-protocols-raided-20- attendees-quarantined (Accessed: 10 July 2021).

# 4

# ජීවිතද ජීවනෝපායන්ද?

# ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ සුබසාධනයේ පරිහානිය

*නිපුනිකා ඕ. ලේකම්වසම්*

## හැඳින්වීම

දෙවන ලෝක යුද්ධයට පසුව ලෝකය මුහුණ දෙන බැරෑරුම්ම අභියෝගය ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා ඇති කොවිඩ්-19 ගෝලීය අධි වසංගතය ආරම්භ වූයේ වර්ෂ 2019 අග භාගයේ චීනයේ වූහාන් ප්‍රාන්තයෙනි. එහි බලපෑම අද වන විට ලොව පුරා සියළු ක්ෂේත්‍ර ඔස්සේ පැතිර ගොස් තිබේ. වෛරසයේ පැතිරීම පාලනය කිරීමටත්, මරණ සංඛ්‍යාව අඩු කරගැනීමටත් ලොව පුරා රජයන් දැඩි සංචරණ සීමා සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ රෙගුලාසි හඳුන්වා දී ඇත. ජීවිත රැක ගැනීමෙහිලා මෙම ක්‍රියාමාර්ග බොහෝ සෙයින් උපකාරී වී ඇති නමුත්, ඒවා නිසා ඇතිව තිබෙන ආර්ථික බලපෑම හේතුවෙන් බොහෝ අවස්ථා වල තත්වය ජීවිත සහ ජීවනෝපායන් අතර තේරීමකට සිරවී ඇත. ආණ්ඩු වලට මෙහිදී ගැනීමට සිදුව ඇත්තේ ඉතා දුෂ්කර ප්‍රතිපත්තිමය තීරණයකි.

චීනයේ හඳුන්වා දුන් මාදිලියේ දැඩි සීමා නිසා ජීවිත රැකුණු ආකාරයත්, එවැනි සීමා නොවූ ඉන්දියාව සහ බ්‍රසීලය වැනි රටවල ඇති වූ ඛේදාන්තයනුත් අපි දනිමු. ලංකාවේ තත්වයද එතරම් වෙනස් නොවේ. වර්ෂ 2020 මාර්තු මස ඇරඹි පළමු රැල්ල පාලනය කිරීමෙහිලා රජය සාර්ථක වූයේ දැඩි සංචරණ සීමා, කිසිදු සමාජ හමුවකට අවසර නොදීම සහ ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සමීපව කටයුතු කිරීම වැනි තීරණ නිසාය (Ranaraja,

2020). එසේ වුවත් තවත් රැළි දෙකකට පසු වර්තමාන තත්වය තුළ මෙම මූලික අවස්ථාවේ ලද සාර්ථකත්වය කිසි ලෙසකින් පිළිබිඹු නොවේ. මරණ සංඛ්‍යාව එන්න එන්නටම වැඩි වෙමින් පවතින අතර, ආර්ථිකය තව තවත් දුර්වල වෙමින් තිබේ.

මෙම පරිච්ඡේදයේ අරමුණ වසංගත සමය තුළ රජයේ ආර්ථික සහන ලබාදීමේ වැඩපිළිවෙල සම්බන්ධයෙන් ජනතාවගේ ආකල්ප ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව හඳුනා ගැනීමයි. කොවිඩ් වසංගත තත්වය තුළ සාමාන්‍ය පිළිගැනීම වී ඇත්තේ ජීවිත හා ජීවනෝපායන් අතර ප්‍රතිලෝම සම්බන්ධයක්, එනම් ජීවිත බේරා ගන්නේ නම් ජීවනෝපායන් කැප කිරීමට සිදුවන ආකාරයේ තත්වයක් පවතින බවයි. මන්ද, ජීවිත බේරා ගැනීමට බලාත්මක කරන සංචරණ සීමා නිසා බොහෝ දෙනාගේ ජීවනෝපායන් අඩාල වන නිසාය. මෙම තර්කනයෙහි යම් සත්‍යතාවයක් තිබුණද, මෙම පරිච්ඡේදය තුළින් පෙන්වා දෙනු ලබන්නේ ශක්තිමත් සුබසාධන පද්ධතියක් පවතින්නේ නම් ජීවිත හා ජීවනෝපායන් යන ද්විත්වයම ආරක්ෂා කරගත හැකි බවයි. නිදහසටත් පෙර පටන්ම ලංකා රාජ්‍යය තුළ ආයතනගත වී ඇති සුබසාධන දෘෂ්ඨිවාදයක් (Jayasuriya, 2000; 2004) පවතින පසුබිමක් තුළ, මෙම පරිච්ඡේදයෙන් උත්සහ ගන්නේ වසංගත තත්වයෙහි රජයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් ආර්ථික අර්බුදයට නිසි අයුරින් ප්‍රතිචාර දැක්වීමට හැකිවුනි දැයි යන්න ජනතාවගේ අත්දැකීම් ආශ්‍රයෙන් විමසා බැලීමයි.

මූලිකවම ද්විතියික දත්ත මත පදනම්ව මෙහිදී පළමුව උත්සහ කරන්නේ වසංගතයෙන් ආර්ථිකයන්ට එල්ල කරන ලද බලපෑම ගෝලීයව හා ජාතිකව හඳුනා ගැනීමය. සාර්ව මට්ටමේ ජාතික දත්ත වලට එහිදී සාපේක්ෂව වැඩි වැදගත්කමක් දෙනු ලැබේ. ඉන්පසුව ජීවිත හා ජීවනෝපායන් අතර සම්බන්ධය පිළිබඳව සාකච්ඡා කෙරේ. එහිදී පුරවැසි අත්දැකීම් හඳුනාග ැනීම සඳහා 'Socio-Economic Index in the Face of COVID-19' සමීක්ෂණයේ සොයාගැනීම් භාවිතා කෙරෙන අතර, ඊට අමතරව ජාතික මට්ටමේ කතිකාවන් සහ විවාද යොදාගැනේ. රජයේ වසංගත ප්‍රතිචාරය මෙන්ම වසංගතය නිසා ඇතිවූ අසමානතාවයන්ටද එතුළ අවධානය යොමු කොට ඇත. ඒ සඳහා වසංගතයෙන් සිය ජීවනෝපායන්ට එල්ල කරන ලද බලපෑම් පිළිබඳව කුටුම්බ වල ආකල්ප, වසංගතය මගින් ජනනය කරන ලද විවිධ ආර්ථික යථාර්ථයන්, වසංගතයේ ආර්ථික බලපෑම කළමණාකරණය කරගැනීම සඳහා විවිධ කණ්ඩායම් විසින් යොදාගන්නා ලද ක්‍රමෝපායන් සහ, රජයේ සුබසාධන වැඩපිළිවෙළෙහි සාර්ථකත්වය පිළිබඳ ඉහත සඳහන් සමීක්ෂණයෙන් වාර්තා කළ අන්දමට ජනතාවගේ තක්සේරුව යන ඒවාට අවධානය යොමු කෙරේ.

## කොවිඩ්-19 හි ආර්ථික බලපෑම: ගෝලීය සහ ජාතික තත්වය පිළිබඳ මූලික හැඳින්වීමක්

### *ගෝලීය තත්වය*

කොවිඩ්-19 න් ලෝක ආර්ථිකයට ඇති කරන ලද බලපෑමෙහි ප්‍රතිවිපාක දිගුකාලීන වනු ඇතැයි බලාපොරොත්තු වන අතර, යථා තත්වයට පත්වීමේ ක්‍රියාවලිය ඉතා සෙමෙන් සහ කලාප අතර වෙනස්කම් සහිතව සිදුවනු ඇති බවට අනාවැකි පළ වී ඇත (See *The Global Economic Prospects*, 2021 ). වසංගතය මගින් ලොව පුරා රාජ්‍යයන්ගේ ධාරිතාව, ශ්‍රම වෙළඳපොළවල් සහ මූල්‍ය ප්‍රතිපත්ති යන ඒවා සම්බන්ධව ඇති අඩු ලුහුඬුකම් පෙන්වා දී තිබේ. වර්ෂ 2020 ජූනි මාසයේදී ලෝක බැංකුව විසින් කරන ලද පුරෝකථනයකට අනුව එම වසර තුළදී ගෝලීය දළ දේශීය නිෂ්පාදිතය 5.2% කින් පහළ යනු ඇති බව බලාපොරොත්තු වූ අතර (The Global Economic Outlook, 2020), ඒ අනුව මෙය දශක ගණනාවකින් ලෝකයේ සිදු වූ දරුණුතම ආර්ථික අවපාතය ලෙස හැඳින්විය හැක. ලොව සියළු කලාප වල ආර්ථික වර්ධනය සැළකිය යුතු තරම් පහත යනු ඇති බවද පුරෝකථනය වී තිබේ. මෙම බලපෑම් නිසා සංවර්ධනය වෙමින් පවතින සහ අවම සංවර්ධිත රටවල දරිද්‍රතාවයද තවත් දරුණු අඩියකට යනු ඇති අතර, ඔවුන්ගේ දශක ගණනාවක සංවර්ධන ප්‍රගතිය එම නිසා ආපසු හැරවෙනු ඇත. ලෝක බැංකුවට අනුව:

> කොවිඩ්-19 වසංගතයෙහි බලපෑමෙන් නැවත යථා තත්වයට පත්වීම සම්බන්ධයෙන් විවිධ කලාප වල අසමාන තත්වයන් පෙන්නුම් කරනු ලබයි. ඇමෙරිකාව වැනි ශක්තිමත් මූල්‍ය පද්ධතියක් ඇති රටවල පවා යථා තත්වයට පත්වීම වඩාත් තීව්‍ර මට්ටමේ ආපසු හැරවීම් පිළිබිඹු කර ඇත. එවැනි ආර්ථිකයන්හි පවා එන්නත්කරණයට ඇති ප්‍රවේශය අසමානය. වැඩි වන ආසාදිතයින් සංඛ්‍යාව, එන්නත්කරණ අපහසුතා සහ ආර්ථික අර්බුද මගින් දියුණු වෙමින් පවතින ආර්ථිකයන්හි බාහිර ඉල්ලුම සහ භාණ්ඩ මිල වැඩි වීමෙන් ලද වාසි ආපසු හරවා ඇත. වර්ෂ 2022 වන විට ගෝලීය නිෂ්පාදනය වසංගතයට පෙර තිබුණාට වඩා 2% කින් පමණ අඩු අගයක් ගනු ඇති බව අපේක්ෂා කෙරෙන අතර, දියුණු වෙමින් පවතින ආර්ථිකයන් 1/3 ක ප්‍රමාණයක ඒක පුද්ගල ආදායමෙහි සිදු වූ පහත බැස්ම යථා තත්වයට පත් නොවනු ඇත (*The Global Economic Prospects*, 2021, p. xvii).

Brookings Institute විසින් වර්ෂ 2021 ජූනි මාසයේදී සම්පාදනය කරන ලද වාර්තාවකට අනුව වසංගතය නිසා දුගී රටවල් අවසානයේ වැඩි පාඩුවක් ලබනු ඇත (Yeyati and Filippini, 2021, p. 5). එම වාර්තාවට අනුව

රජයක කොවිඩ් ප්‍රතිචාරයෙහි සාර්ථකත්වය කරුණු 3 ක් මත තීරණය වේ: ඒවා නම් පවතින සමාජ ආරක්ෂණ පද්ධතීන්, ඩිජිටල් පහසුකම් වල ශක්තිය සහ සජීවී අධීක්ෂණය[1] වේ (ඉහත එම/ibid, p. 14 ). වසංගත තත්වය තුළ කොතරම් සුබසාධන පහසුකම් ලබාදිය හැකිද යන්න මෙම පූර්ව කොන්දේසි මත තීරණය වන අතර, එම නිසා ලොව පුරා රජයන්ගේ වසංගත ප්‍රතිචාරයන් එකිනෙකින් වෙනස් වේ. එහිදී දියුණු වෙමින් පවතින රට වලට දැනෙන බලපෑම වඩා අධිකය (ඉහත එම/ibid). ඒ රටවල රැකියා වලින් විශාල ප්‍රමාණයක් සේවාදායකයන්ගේ භෞතික පැමිණීම අපේක්ෂා කරන ආකාරයේ ඒවා වන අතර, වසංගතය පාලනය කිරීමට හඳුන්වා දෙන ලද සංචරණ සීමා නිසා එවැනි රැකියා වලට සහ එම නිසා සමස්තයක් වශයෙන් ශ්‍රම වෙළඳපොළට එල්ල වන පීඩනය සාපේක්ෂව දියුණු වූ රටවලට වඩා අධිකය. එම නිසාම මෙවැනි ආර්ථිකයන් සඳහා සුබසාධන ප්‍රතිපාදන වැඩිපුර අවශ්‍ය වේ. Decerf et al. (2020, pp. 23-4) ට අනුව:

> දියුණු වූ රටවල ජනගහණයන් සමස්තයක් වශයෙන් සාපේක්ෂව මහළු නිසා වසංගතයේ මරණ අනුපාතය එම රටවල වැඩිය. නමුත් දියුණු වෙමින් පවතින රටවල ජනගහණයන්ගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවට ආසන්නයේ පිහිටි ආදායම් මත ජීවිතය ගැටගසා ගනිති. එහි ප්‍රතිඵලයක් වශයෙන් දරිද්‍රතාවය වෙනුවෙන් දියුණු වෙමින් පවතින රටවල රජයන්ට දැරීමට සිදුවන සුබසාධන පිරිවැය, මහළු බව නිසා දියුණු වූ රටවල රජයන්ට දැරීමට සිදුවන සුබසාධන පිරිවැයට වඩා බොහෝ අධික වේ. මෙම සුබසාධන පිරිවැය සාමාන්‍යයෙන් ඒක පුද්ගල ආදායමට ප්‍රතිලෝම සම්බන්ධයක් දක්වයි.

මෙම පරිච්ඡේදයේ ඊළඟ කොටස් වලින් උත්සාහ ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ මේ පිළිබඳ තත්වය වටහා ගැනීමයි.

1 Yeyati and Filippini (2021) ට අනුව පවතින සමාජ ආරක්ෂණ පද්ධතීන් වැදගත් වන්නේ ඒවා වසංගතයට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සඳහා වඩා සුදුසු වන හෙයිනි. ඩිජිටල් පහසුකම් ප්‍රමාණවත් පරිදි පවතින රටවල් වල රට වසාදමන තත්වයන් තුළදී සහන ප්‍රතිපාදන සහ අත්‍යාවශ්‍ය සේවා කුටුම්බ වෙත ළඟා කිරීමේ යාන්ත්‍රණයක් පවතින අතර, සජීවී අධීක්ෂණය භාවිතයෙන් වසංගතයේ නවතම තොරතුරු පිළිබඳ යාවත්කාලීන වීමටත්, ඒ අනුව ප්‍රතිචාර දැක්වීමටත් රජයන්ට හැකියාව ලැබේ. සජීවී අධීක්ෂණය විශේෂයෙන්ම වැදගත් වන තවත් හේතුවක් වන්නේ කුටුම්බ වල සමාජ-ආර්ථික තත්වය තේරුම් ගැනීම සඳහා එය භාවිතා කළහැකි බැවිනි (Yeyati and Filippini, 2021, p. 14).

### *කොවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුකළ බලපෑමෙහි ජාතික මට්ටමේ ප්‍රවණතා*

2021 වර්ෂය සඳහා නිකුත් කළ ලංකාවේ සංවර්ධන පුරෝකථනය තුළ ලෝක බැංකුව සඳහන් කොට තිබුණේ වර්ෂ 2020 වසරේදී ලංකා ආර්ථිකය 3.6% කින් පසුබෑමට ලක්ව ඇති බවයි (*Sri Lanka Development Update: Economic and Poverty Impact of COVID-19,* 2021). එම වාර්තාවට අනුව පෙර පටන් ආර්ථිකයේ තිබූ දුර්වලතා නිසා - නිදසුනක් ලෙස ආර්ථික වර්ධන වේගය 3.1% ක් තරම් අඩු අගයක පැවතීම, පෞද්ගලික අංශය ප්‍රමාණවත් පරිදි සහභාගී කර නොගැනීම හා අපනයන ආර්ථිකයක් මත පදනම් වීම වැනි කරුණු - තත්වය තවත් දරුණු වී ඇත. වැඩියෙන්ම බලපෑමට ලක්ව ඇත්තේ කර්මාන්ත අංශය වන අතර, එහි 6.9% ක සංකෝචනයක් සිදුව ඇත. සේවා හා කෘෂිකර්මාන්තය තුළ ඊට සාපේක්ෂව පිළිවෙළින් 1.5% ක සහ 2.4% ක සංකෝචනයන් සිදුව ඇත (ඉහත එම/ibid, p. 11). කර්මාන්ත අංශයේ රැකියා අහිමි වීම් බොහෝ කොටම සිදුවන්නේ ආදායම් ව්‍යාප්ති චක්‍රයේ පහළ මධ්‍යම කාණ්ඩයේ ස්ථානගතව සිටින්නන්ටය. එතුළද නාගරික පෞද්ගලික අංශයේ සහ ව්‍යවසායික ක්ෂේත්‍රයේ අය වඩාත්ම බලපෑමට ලක්ව ඇති බව වාර්තාව පෙන්වා දේ (ඉහත එම/ibid). දුරස්ථ ක්‍රම ඔස්සේ රැකියා කටයුතු කරගෙන යා හැකි පිරිස ලංකා ශ්‍රම බලකායෙන් 27% ක් තරම් සුළු ප්‍රමාණයක් බවද එමඟින් පෙන්වා දේ (ඉහත එම/ibid, p. 31). එම රැකියා අවස්ථා බොහෝ දුරට භුක්ති විඳිනු ලබන්නේ නාගරික ඉහළ ආදායම් කාණ්ඩ වල අයයි.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයනායතනයේ (IPS) විද්වත් මණ්ඩලයක් විසින් වාර්තාවක් (*Sri Lanka: State of the Economy 2020 | Institute of policy studies Sri Lanka,* 2020) මඟින් පෙන්වා දී ඇති පරිදි වැඩිවන ණය හා පිරිහෙන මූල්‍ය ශක්තිය හේතුවෙන් වසංගතයේ ආර්ථික බලපෑම අවම කිරීමට රාජ්‍යයට අවශ්‍ය කරන සාර්ව මට්ටමේ ආර්ථික ස්ථාවරත්වය නොමැති වී ඇති අතර, එනිසා සමාජයේ අසමානතාව ඔඩුදුවා යමින් පවතී. එවැනි තත්වයක් තුළ ශ්‍රම බලකායෙන් 68% ක් තරම් වූ අවිධිමත් අංශයේ රැකියා කරන්නන් පැවැත්ම සඳහා දරුණු අරගලයක යෙදෙන අතර, සිය ඉතිරි කිරීම් වල ඇති මුදල් ආපසු ගැනීමත්, අධ්‍යාපනය හා සෞඛ්‍යය වෙනුවෙන් සාමාන්‍යයෙන් කරන්නා වූ ආයෝජන නොකර සිටීමත් දැකිය හැකිය (Nisha Arunatilake as reported by Weerasekera, 2020). එම ආයතනයෙහිම තවත් අධ්‍යයනයකට අනුව අස්ථිර රැකියා කරන්නන් (වර්ෂ 2018 වනවිට මෙම ප්‍රමාණය මිලියන 2.8 ක් වූ පෞද්ගලික අංශ ශ්‍රම බලකායෙන් 60% ක් විය) රැකියා සුරක්ෂිත භාවය සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අතින් ඉතා අනතුරුසහගත තත්වයකට වැටී ඇත (Jayawardena, 2020). ලංකාව තුළ

රැකියා සුරක්ෂිතභාවය යම් යම් කණ්ඩායම් වලට තිබුණද, සමස්තයක් වශයෙන් ශ්‍රම වෙළඳපොළ සුරක්ෂිතභාවය නොපවතින බව පෙන්වා දෙන එම වාර්තාව, ඊට අමතරව රැකියා විරහිත අයවළුන් සඳහා රක්ෂණාවරණයක් නොතිබීම වැනි සාධක නිසා වසංගතයක් වැනි තත්වයක් තුළ මෙම ශ්‍රමික කණ්ඩායම ඉතාම අනතුරුදායක අඩියකට පත්වන අයුරු පෙන්වා දී තිබේ (එම; *Most Sri Lanka workers without formal protection amid Covid-19 shock: IPS study,* 2020 මූලාශ්‍රයද බලන්න).

වර්ෂ 2020 ඔක්තෝබර් මාසයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වාර්තාවකට අනුව 2020 වසර තුළදී සේවා නියුක්තික ජනගහණය 2.4% ක අඩුවක් පෙන්නුම් කොට ඇත. එතුළ පෞද්ගලික අංශය වැඩිපුර නියෝජනය වේ (*Recent Economic Developments: Highlights of 2020 and Prospects for 2021,* 2020). රාජ්‍ය සේවය තුළද යම් දුරකට රැකියා අහිමි වීම් පෙන්නුම් කළත්, රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීම වැනි වැඩපිළිවෙළවල් නිසා එම තත්වය සැළකිය යුතු තරමකින් කළමණාකරණය කරගැනීමේ හැකියාව ලැබී ඇත (ඉහත එම/ibid). කෙසේ වුවත් මෙවැනි වැඩසටහන් කොතරම් දුරට තිරසාරද යන්න ගැටළුවක් බව පිළිගත යුතුය. මීට අමතරව අවිධිමත් ශ්‍රම බලකායට සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් හඳුන්වා දීමේ අවශ්‍යතාවයද ඉහත වාර්තාව මඟින් පෙන්වා දී තිබේ.

පෙර දැක්වූ 2021 වර්ෂය සඳහා නිකුත් කළ ලංකාවේ සංවර්ධන ප්‍රක්ෂේපණය තුළ ලෝක බැංකුව විසින් ලංකාවේ සාර්ව මට්ටමේ රැකියා නියුක්ති අගයන් වලට බලපෑම් කරන්නා වූ සාධක තුනක් හඳුනාගෙන ඇත: අඩු ආදායම් මට්ටම, සමාජ ආරක්ෂණ රහිත අවිධිමත් ශ්‍රම බලකායක පැවැත්ම සහ වසංගත තත්වය යටතේ විශේෂිතව අනතුරට භාජනය වී ඇති ඇඟළුම් වැනි කර්මාන්ත වල විධිමත් සේවක කණ්ඩායමක පැවැත්ම යනු ඒවා වේ (*Sri Lanka Development Update: Economic and Poverty Impact of COVID-19,* 2021). මෙම බලපෑම අවම කිරීම සඳහා රජයෙන් ලද සහයෝගය වාර්තාවේ කරුණු 2 ක් ආශ්‍රයෙන් හඳුනාගෙන ඇත: එනම් සමෘද්ධිය වැනි පවතින සුබසාධන වැඩපිළිවෙළවල් සහ වසංගත තත්වය තුළ සුවිශේෂයෙන් හඳුන්වා දෙන ලද සහන දීමනා වේ (ඉහත එම/ibid). ඊළඟ කොටස තුළ සමීක්ෂණයේ දත්ත මත පදනම්ව මෙම වැඩපිළිවෙළවල් සම්බන්ධයෙන් මහජන ආකල්ප ඉදිරිපත් කර ඇත.

## ජීවිත සහ ජීවනෝපායන්: කොවිඩ්-19 න් ශ්‍රී ලංකාව තුළ ඇතිකරන ලද ආර්ථික භීතීන්

### *කොවිඩ්-19 වසංගතය තුළ රාජ්‍ය ධාරිතාව*

Yeyati and Filippini (2020) විසින් දක්වන ලද සාධක 3 ට අනුව ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය මැන බැලුවහොත්, ඩිජිටල් පහසුකම් සහ සජීවී අධීක්ෂණය යන කරුණු අරබයා ඇති අඩු ලුහුඬුකම් නිසා ජීවිත සහ ජීවනෝපායන් යන දෙකම තුළ වසංගතයේ බලපෑම අධික වී ඇති බව හඳුනාගත හැකිය. අන්තර්ජාල පහසුකම් අතින් ගත්විට ලංකාවේ නාගරික ප්‍රදේශ වල භාවිතය ග්‍රාමීය ප්‍රදේශ වලට සාපේක්ෂව දෙගුණයකි (*Sri Lanka Development Update: Economic and Poverty Impact of COVID-19, 2021,* p. 30). එම නිසා ඩිජිටල් පහසුකම් සැමට සමානව සලසා දීම තරමක් යථාර්ථයෙන් බැහැර වූ අරමුණකි. එමෙන්ම ආසාදිතයින් සංඛ්‍යාව හෝ නිවැරදි ආකාරයෙන් වාර්තා කිරීමට ආණ්ඩුවට නොහැකි වූ තත්වයක් තුළ සජීවී අධීක්ෂණයද එතරම් යථාර්ථවාදී නොවන බව පෙනී යයි. ඇත්තෙන්ම සිතාමතා පරීක්ෂණ කිරීම් අවම කිරීම සහ සංඛ්‍යා දත්ත අඩුවෙන් වාර්තා කිරීම සම්බන්ධව චෝදනා ද රජයට එල්ල වී තිබේ (Gunasekera, 2021; Jayasinghe, 2020). මෙවැනි අවභාවිතයන් මෙන්ම නිසි කළමණාකරණයකින් හෝ සැලසුම්කරණයකින් තොරව හඳුන්වා දෙන ලද සංචරණ සීමා නිසා සිදුව ඇත්තේ මරණ සංඛ්‍යාවේ අත්‍යන්ත වැඩිවීමක් සමගම ආර්ථිකයේද දරුණු කඩා වැටීමක් සිදුව තිබීමයි. ඒ අනුව ඉතිරිව ඇත්තේ පවතින සමාජ ආරක්ෂණ පද්ධති පිළිබඳ නිර්ණායකය පමණි.

පහත සාකච්ඡාවේ අවධානය මූලිකවම යොමුවන්නේ පවතින හා අළුතෙන් හඳුන්වා දුන් ක්‍රියාමාර්ග තුළින් වසංගතය නිසා ආර්ථිකමය වශයෙන් බලපෑමට ලක්වූ කණ්ඩායම් වලට ලබාදුන් සහන කොතරම් දුරට සාර්ථකද යන්නටය. ලංකාවේ සුබසාධන පද්ධතිය කොහොමටත් පැවතුණේ දුර්වල තත්වයකය. මෙය පැහැදිලිවම වසංගතයට පෙර කාරණයක් බවත්, වසංගතය මඟින් කළේ එය තීව්‍ර කිරීම පමණක් බවත් මතක තබාගත යුතුය. මෑත කාලීනව ලංකා රාජ්‍යය වැඩි වැඩියෙන් නව ලිබරල් ප්‍රතිපත්ති වැළඳ ගන්නා බව[2] හා එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ ආරක්ෂණ ජාලා වල ක්‍රමික සංකෝචනයක් දක්නට ලැබුණු බව පෙර සිටම පෙනෙන්නට තිබුණි. මෙම ප්‍රවණතා වලට අනුපූරකයක් ලෙස විධායක බලය අතිශයින් සංකේන්ද්‍රණය

2 නව ලිබරල්වාදය විවිධාකාරයෙන් අරුත් ගන්වා තිබේ. එහි පදනම් අර්ථය ලෙස ආඥාදායක ප්‍රාග්ධනයට අවශ්‍ය ආකාරයෙන් සහ සමාජ සුබසාධනයට හානිදායක අයුරින් ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීම් සිදුකිරීම දැක්විය හැකිය (Venugopal, 2015).

වීමත්, රාජ්‍යය ආරක්ෂකකරණය වීමත් යන ප්‍රවණතා වසංගත තත්වය තුළ ඉතා සාමාන්‍යකරණය වීම හඳුනාගත හැකිය. මෙම කෘතියේ වෙනත් පරිච්ඡේද දෙකක නව ලිබරල්වාදයේ පැතිරීම නිසා නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ට හා අධ්‍යාපනයට එල්ල වී ඇති බලපෑම සාකච්ඡා කොට තිබේ. මෙම පරිච්ඡේදයෙන් හඳුනා ගැනීමට උත්සහ කරන්නේ ජීවිත සහ ජීවනෝපායන් වලට එමඟින් එල්ල කරන බලපෑමයි.

### *වසංගත සමය තුළ රජයේ සහන වැඩසටහන් පිළිබඳ මහජන ආකල්ප*

ඉහත සඳහන් කළ සමීක්ෂණයට[3] අනුව වසංගත සමය තුළ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ රජයේ උත්සහය සම්බන්ධයෙන් ප්‍රතිචාරකයින්ගෙන් 52.7% ක් සෑහීමට පත් නොවේ. නාගරික ප්‍රදේශ වල ප්‍රතිචාරකයින්ගෙන් 59.8% ක් ඒ අතර විය. ග්‍රාමීය ප්‍රතිචාරකයින්ගෙන් 50.5% ක් ද මෙම කාණ්ඩයට අයත් වන අතර, ග්‍රාමීය කණ්ඩායමේ 41.4% ක් විසින් තමන් ඒ පිළිබඳ සෑහීමට පත්වන බව වාර්තා කරන ලදී. එසේම සමස්ත ප්‍රතිචාරකයින්ගෙන් 67.8% ක් වාර්තා කරන පරිදි ඔවුන්ගේ කුටුම්බ ආර්ථිකය වසංගතය නිසා වඩාත් නරක අතට හැරී තිබේ. එම සංඛ්‍යාව අතර ග්‍රාමීය ප්‍රතිචාරකයින් වැඩිය. සාර්ව මට්ටමේ සමීක්ෂණ දත්ත වල නාගරික කර්මාන්ත අංශය ග්‍රාමීය කෘෂිකර්මාන්තයට සාපේක්ෂව වැඩි කඩා වැටීමකට ලක්වූ බව කියන පසුබිමක් තුළ මෙම සොයාගැනීම වැදගත් වේ. මෙම කාලය තුළදී රජයේ සහනාධාර ලැබූ බව පැවසූයේ 9.7% ක් වැනි සුළු ප්‍රතිශතයකි (එතුළ 2.3% ක් නාගරික සහ 11.8% ක් ග්‍රාමීය විය). 28.5% කට අනුව ඉඳහිට රජයේ ආධාර ලැබී තිබේ (18.3% ක් නාගරික සහ 31.4% ක් ග්‍රාමීය). සමීක්ෂණයෙන් හෙළි වූ අන්දමට පැවැත්ම සඳහා කුටුම්බ තුළ වැඩියෙන්ම ගෙන තිබූ පියවර වූයේ එදිනෙදා වියදම් කපා හැරීමයි. පවතින ඉතිරි කිරීම් භාවිතා කිරීම දෙවැනියට වැඩියෙන්ම ගත් ක්‍රියාමාර්ගය බව පෙනෙන්නට තිබේ. ණයට භාණ්ඩ ලබාගැනීම (42.1%), භාණ්ඩ උකස් කිරීම/බැංකු ණය ලබාගැනීම (42.2%), පොළියට දෙන්නන්ගෙන් ණය ලබාගැනීම (29.5%) සහ පවුලේ නෑ හිතමිතුරන්ගේ උපකාර ලබාගැනීම (37.7%) වැනි ක්‍රමද අඩු වැඩි වශයෙන් භාවිතා කොට ඇත. මෙමඟින් නිරූපණය වන ආඛ්‍යානය රජයේ නිල යථාර්ථයෙන් තරමක් දුරට වෙනස් බව පෙනී යයි. එනම් වසංගත තත්වය තුළ පැවැත්ම සඳහා වන වගකීම ආණ්ඩුව විසින් බොහෝ කොටම පුරවැසියාට පෞද්ගලිකව අනුයුක්ත කර ඇති අතර, එමඟින් සිය සුබසාධන වගකීම් සැළකිය යුතු දුරකට පැහැර හැරීමක් සිදුකොට තිබෙන බවයි. මෙම

3 මෙහිදී භාවිතා කරන්නේ 'බොහෝ විට' සහ 'සමහර විට' යනුවෙන් ලබාදුන් පිළිතුරු පමණක් බව සළකන්න. 'එක් වරක්' වශයෙන් සඳහන් වූ පිළිතුරු භාවිතා නොකරන ලදී.

සොයාගැනීම් වඩාත් හොඳින් තේරුම් ගැනීම සඳහා රජයේ සාර්ව මට්ටමේ ක්‍රියාකලාපය දෙස බැලීම වැදගත් වේ. ඒ සඳහා ධීවර කර්මාන්තයට හා කෘෂිකර්මාන්තයට මේ කාලය තුළදී අත්වූ ඉරණම මුලින්ම සළකා බලමු.

### *ධීවර කර්මාන්තය හා කෘෂිකර්මාන්තයට ආණ්ඩුව ප්‍රමාණවත් පියවර ගෙන තිබේද?*

කොවිඩ්-19 පළමු රැල්ලෙන් රටේ කුඩා පරිමාණ ධීවර කර්මාන්තය දැඩිව බලපෑමට ලක්විය. ලෝක බැංකුව වාර්තා කළේ සංචරණ සීමා හා එනිසා සිදුවූ ඉල්ලුම හා සැපයුම යන දෙඅංශයේම පසුබැස්ම නිසා එම කාලය තුළ ධීවර නිෂ්පාදිතය 50-65% අතර ප්‍රමාණයකින් අඩුවූ බවයි (Jayamanne, 2020 වාර්තා කර ඇති අන්දමට). ජයමාන්න පවසන්නේ වර්ෂ 2020 අප්‍රේල් මාසය වන විට ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා මුළුමනින්ම පාහේ බිඳවැටී තිබූ හා විකල්ප ආදායම් මාර්ග නොමැති පසුබිමක වුවත්, 2020 ජූනි මාසය වන විට ධීවර කර්මාන්තය නැවත යථා තත්වයට පත්වෙමින් තිබූ බවයි. එහෙත් පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොළ පොකුර වාර්තා වීමෙන් ඇරඹි දෙවන රැල්ලත් සමඟ මත්ස්‍ය නිෂ්පාදන සම්බන්ධයෙන් පැතිර යන්නට වූ භීතිය නිසා මාස කිහිපයකින් ධීවර කර්මාන්තයට මරු පහරක් එල්ල වුණි. නිවැරදි තොරතුරු සමාජගත කිරීම මඟින් මෙම භීතිය පාලනය කිරීමට ආණ්ඩුවට නොහැකි විය (ඉහත එම/ibid). එසේම බලපෑමට ලක්වූ ධීවරයින්ට නියමිත පරිදි සහනාධාර ලබාදීමද නොකෙරුණි. සිදුවූ එකම සාධනීය දෙය වූයේ වර්ෂ 2020 ඔක්තෝබර් මාසයේ සමස්ත ධීවර අස්වැන්න ආණ්ඩුව විසින් මිලට ගැනීමත්, වියළි මත්ස්‍ය නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීමත්ය (*Sri Lanka: The government decides to buy all the fish harvest,* 2020).

මෙම සිදුවීම් වලින් නැවත යථා තත්වයට පත්වීමට ධීවර කර්මාන්තය උත්සහ ගනිමින් සිටි අවස්ථාවකය තුන්වැනි රැල්ල ආණ්ඩුව විසින් නිවැරදිව කළමණාකරණය නොකිරීම සහ, එනිසා නැවතත් හඳුන්වා දෙන්නට සිදුවූ සංචරණ සීමා වල ප්‍රතිවිපාකය ධීවරයින්ට තවදුරටත් ගැටළු ඇති කරන්නට වූයේ. ඒ අතර වර්ෂ 2021 මැයි මාසයේ X-Press Pearl නෞකාව කන්ටේනර් රථ 146 ක් සමඟ ලංකා මුහුදේ ගිනිබත් වී ගිලී යාම මෑත ඉතිහාසයේ ධීවර කර්මාන්තයට එල්ල වූ දරුණුතම පහර විය (Sirilal and Illmer, 2021; Perera, 2021). එහි බලපෑම ඉදිරි දශක ගණනාවක කාලය පුරා දැනෙනු ඇත. ගිලී ගිය නෞකාවේ සුන්බුන් ලංකා සාගර කලාපය සැළකිය යුතු තරමින් කෙලෙසූ අතර, එනිසා එම කොටසේ සාගර ජීවිතයේ පැවැත්මද ඉදිරි වසර ගණනාව පුරාවටම දැඩිව තර්ජනයට ලක් වී තිබේ. ධීවර කර්මාන්තයට මෙහි බලපෑම අමුතුවෙන් කිවයුතු නොවේ. මෙම කම්පන වලින් ඔවුන් ආරක්ෂා කිරීම සඳහා කිසිදු සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක නොවන

පසුබිමක, තමන්ගේ ජීවනෝපාය නැතිවී යාම සම්බන්ධව බටහිර වෙරළ තීරයේ ධීවරයෝ දැනටමත් හඬ නඟති (ඉහත එම/ibid). ධීවර කර්මාන්තය තුළ වසර 35 ක් වැනි දීර්ඝ කාලයක් මුළුල්ලේ සේවයේ නියැලෙන ටියුලින් ප්‍රනාන්දුට අනුව:

> සාමාන්‍යයෙන් මාළු පැටව් බෝ කරන්නේ කොරල් පර ආශ්‍රිතව. නමුත් අපිට කියා තිබෙනවා නැවෙන් නිකුත් වූ හානිදායක රසායනික ද්‍රව්‍ය නිසා කොරල් පර විනාශ වෙලා කියලා. දැන් ඉතින් වෙන කරන්න දෙයක් නැහැ, මුහුදට පැනල මැරෙන්න තමයි තියෙන්නේ. (Sirilal and Illmer, 2021 හි දක්වා ඇති පරිදි)

කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් ලෝක බැංකුවේ තක්සේරුව මීට වඩා තරමක් දීප්තිමත් වුවත් (එනම් 2.4% ක පසුබැස්මක්) (*Sri Lanka Development Update: Economic and Poverty Impact of COVID-19,* 2021), සමීක්ෂණ දත්ත වලට අනුව ග්‍රාමීය ප්‍රතිචාරකයින්ගෙන් 69.5% ක් (එනම් නාගරික ප්‍රතිචාරකයින්ට සාපේක්ෂව 7.6% ක වර්ධනයක්) පවසා තිබුණේ වසංගතයෙන් පසු සිය ආර්ථික තත්වය වඩාත් නරක අතට හැරී ඇති බවයි. ජාතික තලයේ සිදුවූ ප්‍රතිපත්තිමය දෝෂ තුළ මේ සම්බන්ධ පැහැදිලි කිරීමක් හමු වේ. වර්ෂ 2021 මැයි මාසයේ ආණ්ඩුව විසින් රසායනික පොහොර ආනයනය තහනම් කළේ එමඟින් වාර්ෂිකව ඩොලර් මිලියන 400 ක් ඉතිරි කරගත හැකි බව කියමිනි (*Sri Lanka farmers, local bodies to be taught produce organic fertilizer after import ban,* 2021). මෙම ප්‍රතිපත්ති තීරණය හදිසියේ හා ඉතා අහඹු ලෙස ගන්නා ලද එකක් පමණක් නොව කිසිදු විද්‍යාත්මක පදනමකින් තොර එකක්ද විය (Waliwitiya, 2021; 'Fertiliser ban could have disasterous outcome', 2021; Sri Lanka - Ban on agrochemicals, 2021 යන මූලාශ්‍ර බලන්න). එමෙන්ම මන්ත්‍රීවරුන් වෙනුවෙන් වාහන ආනයනය කිරීම සඳහා දැවැන්ත විදේශ විනිමය ප්‍රමාණයක් වෙන්කොට ඇති පසුබිමක වාර්ෂිකව ඉතිරි කරගත හැකි ඩොලර් ප්‍රමාණය පිළිබඳ ආඛ්‍යානයද වටහා ගැනීමට අසීරුය.

ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය මත යැපෙන ග්‍රාමීය ආර්ථිකයට මෙය මරු පහරකි. ජයසූරිය (2021) ට අනුව මෙවැනි ප්‍රවාදාත්මක ප්‍රතිපත්ති නිසා වී ඵලදාව 25% කින් හා තේ ඵලදාව 35% කින් අඩුවිය හැකිය. රසායනික පොහොර වල අඩුව පිරිමැසිය හැකි පරිමාණයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම් හැකියාවද ලංකාවට නැත (ඉහත එම/ ibid ). එනිසා පොහොර තහනම හේතුවෙන් ආහාර අර්බුදයක් මතුවීමේ හැකියාව පිළිබඳවද බියක් පවතී (*Fertilizer shortage could lead to food shortage in Sri Lanka, warn farmers,* 2021). මෙම අර්බුදයෙන් විද්‍යාමාන වන තවත් කරුණක් වන්නේ වගවීමෙන් තොර විධායකයකින් සිදුකළ

හැකි දරුණු හානියයි. ආණ්ඩුව තවදුරටත් මහජනතාවට වග නොකියන බවක් පෙනෙන්නට ඇතිවාක් මෙන්ම, එම අත්තනෝමතික පාලන ක්‍රමය සාමාන්‍යකරණය කරන බවක්ද පෙනේ. පරිච්ඡේදයේ අවධානය මීළඟට යොමු වන්නේ වසංගත තත්වය තුළ රජය විසින් ජනතාවට ලබාදුන් ආර්ථික සහනාධාර වෙතය.

## *කොවිඩ්-19 සහ ඊට අදාළව ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහන වැඩසටහන්: ආණ්ඩුව කුමක් කරන්නේ ද සහ අදාළ සහනාධාර අරමුදල් ගියේ කොයිබටද?*

වර්ෂ 2020 මාර්තු මාසයේදී වසංගතයෙන් බලපෑමට ලක්වූ ජනතාව සඳහා රජය විසින් සහනාධාර ක්‍රම කිහිපයක්ම ප්‍රකාශයට පත් කරන ලදී. මේ වෙනුවෙන් පත්කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් එවැනි සහනාධාර යාන්ත්‍රණ 10 ක් හඳුන්වා දෙනු ලැබූ අතර, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් 5000 ක දීමනාවක් ලබාදීම, ආබාධිතයින්, වකුගඩු රෝගයෙන් පෙළෙන්නන්, සමෘද්ධිලාභීන් සහ ගොවි රක්ෂණාවරණ ක්‍රමය යටතේ ආවරණය වන්නන් වැනි හඳුනාගත් කණ්ඩායම් වලට මූල්‍යාධාර ලබාදීම වැනි යෝජනාද එහි අඩංගු විය (*Sri Lanka: Sri Lanka government grants more concessions to public affected by COVID-19 pandemic,* 2020). මීට අමතරව අඩු ආදායම්ලාභී පවුල් වලට රුපියල් 5000 ක දීමනාවක් දීම ප්‍රසිද්ධියට පත්වූ කාරණයකි (ඉහත එම/ibid). මෙම යාන්ත්‍රණයක් වසංගත තත්වය අවසාන වනතුරු පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒවාට අවශ්‍ය මූල්‍යමය සහය ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් ලබාදුනි. ඒ අතර ලෝක බැංකුව විසින් වසංගතයේ ආර්ථික බලපෑම අවම කිරීම සඳහා 2020 සැප්තැම්බර් මාසයේදී ඩොලර් මිලියන 184.6 ක් ලබාදීම (*World Bank Supports Sri Lanka With $56 Million to Mitigate COVID-19 Impacts,* 2020) හා ආසියානු සංවර්ධන බැංකුව විසින් 2020 ජූනි මාසයේදී ලංකාවේ වසංගතයට එරෙහි සටන සඳහා ඩොලර් මිලියන 3 ක මුදලක් අනුමත කිරීම (*ADB Approves $3 Million Grant to Assist Sri Lanka's Response to COVID-19,* 2020) වැනි උදාහරණ කැපී පෙනේ. එසේම ජාතික මට්ටමින් ගත්කළ 2020 මාර්තු මාසයේ පිහිටුවන ලද 'ඉටුකම' අරමුදල වැදගත්ය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ මූලිකත්වයෙන් පිහිටවූ ඊට වර්ෂ 2021 අප්‍රේල් මස වනතෙක් මාසිකව සාමාන්‍ය වශයෙන් රුපියල් මිලියන 7 ක පමණ මුදලක් ලැබුණු බව සඳහන් වේ (*Sri Lanka : Remaining balance of 'ITUKAMA' COVID–19 Fund to be allocated for vaccination drive,* 2021). මෙම අරමුදලට දායකත්වය ස්වේච්ඡා පදනමක් මත වන අතර, මහජනතාවට අමතරව විදෙස්හි වාසය කරන ශ්‍රී ලාංකිකයන් සහ විවිධාකාරයේ සංවිධාන ඊට අනුග්‍රහ දක්වන ලදී (ඉහත එම/ibid).

මෙම සිදුවීම් මගින් ලංකා රාජ්‍යය පිළිබඳව වැදගත් කරුණු කිහිපයක් ප්‍රකට වේ. උද්ධමනය හා ඔඩුදුවන විරැකියාව පවතින පසුබිමක් තුළ රුපියල් 5000 ක් ප්‍රමාණවත් නොවන බව පැවසීමට සිදුවීමද විහිළුවකි. රටේ ආර්ථිකය මේ වනවිට මුහුණ දී ඇති තත්වය නිසා කුමක් හෝ ලැබීමත් යමකැයි කෙනෙකුට තර්ක කළ හැකිය. එහෙත් 2021 මැයි මාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීන් වෙනුවෙන් රුපියල් බිලියන 3.6 ක් යටකොට සුඛෝපභෝගී වාහන ගෙන්වීමේ සූදානම (*Preparations to import Luxury vehicles for MPs at a cost of over 3.6 billion rupees,* 2021) හා හදිසි තත්වයකදී අවශ්‍ය අවම පහසුකම් මන්ත්‍රීන්ට ලබාදීම සඳහා එය සිදුකළේ යැයි පැවසීම අමතක කළ නොහේ. පසුව ප්‍රකාශයක් නිකුත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව පැවසූයේ එම ගනුදෙනුව පිළිබඳ තමන් දැනුවත්ව නොසිටි බවයි (*Sri Lanka CB did not approve luxury SUV imports for MPs: Governor,* 2021). මෙයට එල්ල වූ දරුණු මහජන ප්‍රතිචාරය හමුවේ එම වාහන ආනයනය තාවකාලිකව නවතා දැමීමට ආණ්ඩුවට සිදුවිය. ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායකට අනුව මෙය ආණ්ඩුවේ වර්තමාන ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ විශ්වාසය දිනාගැනීම සඳහා භාවිතා කරන ලද ගුණ්ඩුවකි (*Sri Lanka says state luxury SUV imports for MPs halted following outcry,* 2021). රූපවාහිනී නාලිකාවකට සම්මුඛ සාකච්ඡාවක් ලබාදෙමින් ඔහු පහත අදහස් දැක්වීය:

> සමහරු තමන්ට වෙන් කරලා තියෙන මුළු මුදලම වියදම් වෙන ආකාරයේ වාහන ගන්නවා. නමුත් මමත් ජනතා විමුක්ති පෙරමුණේ තවත් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුත් මිළදී ගත් ඩබල් කැබ් වල මිල ඩොලර් 15,000 යි. මේ වගේ වෙලාවක වාහන ගැන කතා කරන්න පුළුවන්ද? අපි පිළිගන්නවා මන්ත්‍රීවරයකුට තමුන්ගේ ධූරයේ වගකීම් ඉටුකිරීම සඳහා ධූර කාලය තුළ වාහනයක් අවශ්‍ය බව. නමුත් PCR පරීක්ෂණ වලට මුදල් නැතිව, ICU වල ඇඳන් නැතිව, වෛරසය වැළඳේවි කියා බයෙන් මිනිස්සු ජීවත් වෙන, ඒ වගේම සැළකිය යුතු ප්‍රමාණයක් මියැදෙන මෙවැනි වෙලාවක මෙවැනි දෙයක් ගැන කතා කිරීමෙන් අමනුෂ්‍ය මානසිකත්වයක් පෙන්නුම් කරන්නේ. (ඉහත එම/ibid)

ඉටුකමෙහි භූමිකාවද විමසා බැලීම වටී. මෙවැනි අරමුදල් පිහිටුවීම තුළ විද්‍යාමාන වන්නේ රාජ්‍යයෙහි බොල් ස්වභාවයයි[4]. එනම් සහන දීමනා සැපයීම අරබයා ගත්කළ රාජ්‍යය කුමන භූමිකාවක් රඟ දක්වන්නේද යන්න ප්‍රශ්නකාරී වී ඇති බවයි. මෙම කෘතියෙහි දිගින් දිගටම දක්වා ඇති පරිදි ආණ්ඩුව එන්න එන්නටම වගවීමෙන් තොරව ක්‍රියාත්මක වන සන්දර්භයක් තුළ මෙවැනි සහනාධාර ක්‍රම වලටද මහජනතාවගේ මුදල් ලබාගැනීම ගැටළු සහගතය.

මෙම අවස්ථාවේ වැදගත්ම ප්‍රශ්නය වන්නේ ඉටුකම අරමුදලට ලැබුණු මුදල් කෙසේ භාවිතා වූයේද යන්නය. 2021 මාර්තු මාසයේදී Verite Rsearch ආයතනය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ පෙත්සමක් ගොනු කරමින් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මෙම තොරතුරු විමසා සිටින ලදී. එහිදී මුල් අවස්ථාවේ ජනාධිපති ලේකම් කාර්යාලයට වගවිය හැකි වූයේ මුළු මුදලෙන් 6% ක ප්‍රමාණයක් සඳහා පමණි (එනම් රුපියල් මිලියන 105 ක්). එයද වැයවී තිබුණේ හමුදාව මඟින් මෙහෙයවන ලද PCR පරීක්ෂණ සහ නිරෝධායන පහසුකම් සැපයීම වැනි කටයුතු වලටය (*The government spent only 6% of the Itukama COVID-19 fund balance,* දිනයක් නොමැත). ඉතිරිය එන්නත්කරණය සඳහා යොදවන බව පවසා තිබුණි (*Sri Lanka : Remaining balance of 'ITUKAMA' COVID–19 Fund to be allocated for vaccination drive,* 2021). වර්ෂ 2021 මැයි මාසයේ ජනාධිපති මාධ්‍ය අංශය මඟින් නිකුත් කළ නිවේදනයක් තුළද මුළු අරමුදලෙන් වගවී තිබුණේ 23% ක ප්‍රමාණයක් සඳහා පමණි. එහිදීද සමාජ සුබසාධනය වෙනුවෙන් වෙන් කිරීමක් නොවීය (Thomas, 2021).

මරණ සංඛ්‍යාව අඩු කිරීමෙහිලා පමණක් නොව ආර්ථිකය නැවත පණගැන්වීමෙහිලා ද එන්නත්කරණය වැදගත් වේ. එහෙත් එය නිවැරදිව කළමණාකරණය නොකිරීම[5] තුළින්ද ප්‍රකට වන්නේ ජීවිත හෝ ජීවනෝපායන් යන ද්විත්වයම රැකගැනීම පිණිස ආණ්ඩුව සිය වගකීම් ඉටු නොකරන

---

4 'බොල් රාජ්‍යය' යන්න භාවිතා කරනු ලබන්නේ "ආණ්ඩුවක් සහ එමඟින් මූල්‍යමය වශයෙන් නඩත්තු කළයුතු සේවා අතර ඇති පරතරය" හැඳින්වීමටය (Milward and Provan, 2000, p. 362). මෙය සාමාන්‍යයෙන් භාවිතා වන්නේ යම් යම් සේවාවන් සැපයීමේ වගකීම ආණ්ඩුව බාහිර ආයතන වලට පවරා තිබෙන සන්දර්භයන්හිය. වත්මන් ලංකාව තුළ තමා විසින් ඉටුකළ යුතු වගකීමක් ඉටුකිරීම සඳහා මහජන අරමුදලක් පිහිටුවීම තුළ රජය එම වගකීමද පිටට පවරා ඇති බව පෙනී යයි. එසේ නම් රාජ්‍යයේ භූමිකාව කුමක්ද යන්න වැදගත් ප්‍රශ්නයකි.

5 මෙහිදී ඇස්ට්‍රා-සෙනෙකා එන්නතේ දෙවන මාත්‍රාව ප්‍රමාණවත් පරිදි නොතිබීමේ පටන් සමස්ත ජනගහණය ආවරණය කිරීමට තරම් එන්නත් නොතිබීම, අනුමත කරන ලද සමහර එන්නත් වල ඵලදායීත්වය පිළිබඳ ගැටළු සහ විවිධ ආදායම් කාණ්ඩ අතර සමාන ලෙස එන්නත්කරණය ක්‍රියාත්මක නොකිරීම වැනි බොහෝ කරුණු පිළිබඳ ප්‍රශ්නකාරී තත්වයන් හටගන්නා ලදී.

බවය. එම නිසා දිගු කාලීනව විශේෂයෙන්ම ආර්ථිකයට බලපෑම් එල්ල වීමේ ප්‍රවණතාවක් පවතී. එන්නත්කරණයේදී ඇඟළුම් කම්හල් කාර්ය මණ්ඩලයට ප්‍රමුඛස්ථානය ලබාදෙන ලෙසට ඉල්ලීමක් ඉදිරිපත් වූයේ ඔවුන් සංචරණ සීමා මධ්‍යයේද දිගටම රාජකාරී කළයුතු බැවිනි. එහෙත් ආණ්ඩුව එය නෑසූ කන්ව සිටියේය (Gunasekera, 2021; Glover, 2021). එන්නත්කරණය තබා මෙම කණ්ඩායමට සේවා ස්ථානය තුළ වෛරසයෙන් ආරක්ෂා වීමේ මූලික පහසුකම්වත් සලසා නොතිබුණි. එම නිසා වසංගත තත්වය තුළ වැඩියෙන්ම බලපෑමට ලක්වූ කණ්ඩායමක් බවට ඔවුන් පත්විය (Glover, 2021). ඒ පිළිබඳව මෙම කෘතියේ වෙනම පරිච්ඡේදයක සාකච්ඡා වේ. ප්‍රනාන්දුට (2021) අනුව මෙවැනි තත්වයක් තුළදී ආණ්ඩුව කළ යුත්තේ 'අපි තමයි හොඳටම කළේ' වැනි වීර වාක්‍ය වලින් තොරව, 'එකතු වී වැඩ කරමු' වැනි මානසිකත්වයක් සමාජගත කිරීමයි.

වර්ෂ 2021 මැයි මාසයේ සිදුවූ තවත් සිදුවීමක් නිසා ආණ්ඩුවේ වගකීම් විරහිත ආකල්පය කැපී පෙනුණි. එය නම් රුපියල් මිලියන 625 ක් වැයකොට ශාරීරික පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමේ ප්‍රයත්නයයි (Husain, 2021; 'Cabinet approves Rs 625 million to establish 500 outdoor fitness centers using containers', 2021 යන මූලාශ්‍ර බලන්න). සමාජ මාධ්‍ය ජාලා සහ වෙනත් මාධ්‍ය ඔස්සේ මේ පිළිබඳව එල්ල වූ දැඩි විවේචන හමුවේ යෝජනාවෙහි නිර්මාතෘ නාමල් රාජපක්ෂ මුහුණුපොතෙහි සටහනක් යෙදුවේ ආණ්ඩුව අනිවාර්යයෙන්ම වසංගතය පිළිබඳ කටයුතු වලට මූලිකත්වය දෙන බවත්, ආරම්භ කොට ඇත්තේ යෝජිත ශාරීරික පුහුණු මධ්‍යස්ථාන වල මූලික කටයුතු පමණක් බවත් කියමිනි ('Cabinet approves Rs 625 million to establish 500 outdoor fitness centers using containers', 2021). තවදුරටත් අදහස් දක්වමින් ඔහු කියා සිටියේ මුදල් අමාත්‍යාංශය විසින් මෙම මුදල් වසංගතයට අදාළ කටයුතු සඳහා ඉල්ලා සිටින්නේ නම් මුදාහරින බවයි (Husain, 2021).

### *සුබසාධන අරමුදල් කළමණාකරණය හා පරිපාලනය කිරීම*

ආණ්ඩුව සුබසාධන අරමුදල් බෙදාහැරීමෙහිලා අලස භාවයක් පෙන්නුම් කරන තත්වයක් තුළ දැනටමත් වෙන්කර ඇති කොවිඩ්-19 ප්‍රතිපාදන සම්බන්ධයෙන් එහි ක්‍රියාකාරීත්වය විමසා බැලීම වටී. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර මෙම කෘතියේ වෙනත් පරිච්ඡේදයක දක්වා ඇත.

Transparency International ආයතනය වවුනියාවේ රුපියල් 5000 දීමනාව නොලද ග්‍රාමීය පුරවැසියන් 28 දෙනෙකුගේ අත්දැකීම ආශ්‍රයෙන් 2020 දෙසැම්බර් මාසයේ පෙන්වා දෙන ලද්දේ සහනාධාර බෙදා හැරීමේදී

ගැටළු මතුව තිබෙන බවය (*Ensuring COVID-19 relief reaches Sri Lanka's people,* 2020). දීමනාවට අයදුම් කිරීමට අවශ්‍ය අයදුම් පත්‍රය මෙම ගම් වැසියන්ට ලැබී නොතිබුණු අතර, ග්‍රාමීය මට්ටමේ පරිපාලනය විසින් ඊට හේතු දැක්වීමක් හෝ කර නොතිබුණි. මූල්‍ය සහනාධාර බෙදාහැරීම සම්බන්ධ අක්‍රමිකතා වලට මෙය එක් උදාහරණයක් පමණි. පරිපාලනමය අකාර්යක්ෂමභාවයෙහි පටන් දේශපාලන වාසි සඳහා පද්ධතිය අවශ්‍ය පරිදි වෙනස් කරගැනීමත්, සමහර අවස්ථා වල ඍජු මංකොල්ලයත් දක්වා චෝදනා ගණනාවක් මෙම යාන්ත්‍රණයට එල්ල වී තිබේ (ඉහත එම/ibid).

වර්ෂ 2020 මැයි මාසයේදී මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය විසින් සිය කොමිසම ලද ලිපියක් ඉදිරිපත් කරමින් කොවිඩ්-19 ට අදාළ සහන බෙදාහැරීමේ වැඩපිළිවෙළ සම්බන්ධව ඇති මහජන පැමිණිලි ඉස්මතු කළේය (*Remove politicians from Covid-19 relief programme,* 2020). එම ලිපියට අනුව ඡන්ද හිමි නාම ලේඛන දේශපාලන අනුග්‍රාහක කටයුතු සඳහා භාවිතා කිරීම, මැතිවරණයට පෙර කොවිඩ්-19 මර්දනය කිරීම වෙනුවෙන් වෙන්කර තිබූ සුබසාධන ප්‍රතිපාදන ප්‍රචාරණ කටයුතු සඳහා යෙදවීම මෙන්ම, දීමනා ලැබීමට සුදුසුකම් සහිත සමහර පිරිස් එම යාන්ත්‍රණ වලින් ඉවත් කිරීම වැනි අකටයුතුකම් ගණනාවක් සිදුව ඇති බව පැහැදිලි වේ (ඉහත එම/ibid). මෙම දීමනා බෙදාහැරීමේදී වූ අක්‍රමිකතා පිළිබඳ කරුණු දක්වමින් ෆොන්සේකා (2020) පහත අදහස් පල කර ඇත:

> එක්සත් ස්වයං රැකියා කරන්නන්ගේ සංගමයේ සභාපති චාල්ස් ප්‍රදීප්ට අනුව පිටකොටුවෙහි පමණක් ස්වයං රැකියාවන්හි යෙදෙන්නන් 50,000 කට ආසන්න ප්‍රමාණයක් ඇති අතර, ඒ කිසිවකුටත් රුපියල් 5000 දීමනාව ලැබී නැත. අප්‍රේල් මස දීමනාව මැයි මාසයේදී ලද ඉතාම ස්වල්පයක් දෙනෙකු දැන් ඔවුන්ගේ මැයි දීමනාව ලැබෙන තුරු බලා සිටිති. හැටන් සහ වටවල ප්‍රදේශ වල වතු ශ්‍රමිකයින් සිය රුපියල් 5000 මැයි මස දීමනාව ලබාග ැනීමට දැන් සති දෙකක් මුළුල්ලේ පලාත් පාලන ආයතන වලට යමින් සිටී. පළාත් පාලන ආයතන වලින් ඔවුන්ට පවසා ඇත්තේ බෙදාහැරීම සඳහා රජයෙන් මුදල් එවන තෙක් තමනුත් බලා සිටින බවයි.

එම ලිපියට අනුව මාතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර කිතලගම ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරියකු විසින් රුපියල් 5000 දීමනාව බෙදාහැරීම සඳහා රජය විසින් වෙන්කොට එවා තිබූ මුදල් වලින් රුපියල් ලක්ෂයක් මංකොල්ල කා තිබුණි (ඉහත එම/ ibid).

ඉහළ මධ්‍යම ආදායම් කාණ්ඩයේ කුටුම්බයක සාමාජිකයකු සමඟ යෙදුණු පිළිසඳරක දී මෙම පරිපාලනමය ගැටළු වල තවත් පැතිකඩක් හෙළි විය.[6] 2021 ජූනි මාසයේ ඇය සිය ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීතුමිය හමුවට ගොස් තිබුණේ විදෙස් රටක සිට නැවත පැමිණ සංචාරක හෝටලයක නිරෝධායනය අවසන් කළ සිය ස්වාමි පුරුෂයා නිවසට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය සංචරණ බලපත්‍රයක් ලබාගැනීමටය. එකී ලේඛන කටයුතු සම්පූර්ණ කළ පසු එම ග්‍රාම නිලධාරීතුමිය ඇගෙන් විමසා තිබුණේ රුපියල් 5000 දීමනාව ලබාගැනීමේ ලැයිස්තුවට ඇගේ නමත් ඇතුළත් කළ යුතුද යනුවෙනි. සහන දීමනා බෙදා හැරීමේ යාන්ත්‍රණය කිසිදු සම්බන්ධීකරණයකින් තොරව සහ වාචික දත්ත මත පදනම්ව සදුකෙරෙන බව මෙයින් පැහැදිලි වේ. දීමනාවේ අවශ්‍යතාවය තදින්ම දැනෙන වවුනියාවේ ගම්වාසීන් 28 කට නොලැබුණු රුපියල් 5000 දීමනාව, ඉතා පැහැදිලිවම එම අවශ්‍යතාවය නොමැති නුවර දිස්ත්‍රික්කයේ අයකුට අවශ්‍ය දැයි ඇසෙන්නේ ඒ අනුවය.

## නිගමනය

ඉහත සාකච්ඡාවට අනුව වසංගතයේ ආර්ථික බලපෑම සියළු දෙනාට සමානව නොදැනුණු බවත්, ඊට ලද රජයේ සුබසාධන ප්‍රතිචාරය පිළිබඳ ජනතාව පොදුවේ ගත්කළ අපැහැදීමෙන් සිටින බවත් පැහැදිලිය. රැකියා වලින් බහුතරයක් අවිධිමත් අංශයේ සංකේන්ද්‍රණය වී තිබෙන තත්වයක් තුළ ඩිජිටල් ක්‍රම ඔස්සේ රාජකාරී කටයුතු කරගෙන යාමට සිදුවීම නිසා පවතින අසමානතාවයන් වර්ධනය වී ඇති බව පෙනී යයි. රැකියා වෙළඳපොළෙහි සුරක්ෂිතභාවය හා විරැකියා රක්ෂණාවරණ වැනි යාන්ත්‍රණ නොමැති බැවින් වඩාත් අනතුරට ලක්විය හැකි කණ්ඩායම් වලට රාජ්‍යයේ රැකවරණය අන් කවරදාටත් වඩා අවශ්‍යව තිබේ. එසේ වුවත් මූල්‍යමය සහනාධාර ක්‍රම ආණ්ඩුව විසින් පෞද්ගලික වාසි උදෙසා භාවිතා කරන බව දැකිය හැකිය.

මෙම පසුබිම තුළ පරිච්ඡේදයෙන් තර්ක කළේ කොවිඩ්-19 වසංගතයෙහි ආර්ථික බලපෑම අවම කිරීමෙහිලා ආණ්ඩුව අසමත්ව ඇති බවය. ඊට අදාළ හේතු 4 ක් හඳුනාගෙන තිබේ: ඉන් පළමුවැන්න වන්නේ රාජ්‍යය බොල් රාජ්‍යයක් බවට පත්ව තිබීමයි. එනම් තමා විසින් පුරවැසියා කෙරෙහි ඉටුකළ යුතු වගකීම් ඉටු කිරීමේ භූමිකාව පෞද්ගලික හා ජාත්‍යන්තර ක්‍රියාධරයින්ට අනුයුක්ත කිරීමය. එමෙන්ම තත්වය කේවල වශයෙන් කළමණාකරණය කරගැනීමට පුරවැසියා වක්‍රාකාරයෙන් දිරිමත්

6 මහනුවර ප්‍රදේශයේ නීති ක්ෂේත්‍රයේ රැකියාවෙහි නියුතු අයෙක් සමඟ පිළිසඳර (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 11.

කිරීමක්ද එහිදී දක්නට ලැබෙන අතර, එතුළ ජනගහණය ආරක්ෂා කිරීමේ රාජ්‍යයේ වගකීම මඟහැර යාමක් දක්නට ලැබේ. ඒ අනුව සිදුව ඇත්තේ රාජ්‍යයේ සුබසාධන ක්‍රියාවලිය එන්න එන්නටම හැකිලී යාමත්, එම නිසා හදිසි තත්වයන්ට මුහුණ දීමේ වගකීම පුරවැසියාට තනිව දැරීමට සිදුවීමත්ය. දෙවැන්න, වසංගත තත්වය තුළ ගතයුතු ප්‍රතිපත්තිමය තීරණ වලට ප්‍රමුඛස්ථානය දෙනු වෙනුවට, ඊට කිසිදු සම්බන්ධයක් නොමැති සහ ආර්ථිකයට බරක් වන ආකාරයේ කටයුතු වලට මුල්තැනක් දීමය. තුන්වැන්න නම් සහනාධාර යාන්ත්‍රණය පරිපාලනය කිරීම හා අදාළ සහනාධාර බෙදාහැරීම නිවැරදිව කළමණාකරණය නොකිරීම මෙන්ම අවභාවිතා කර තිබීමය. එම නිසා ජනගහණයේ අවම ආරක්ෂිත තත්වයක සිටින්නා වූ කොටස් වසංගත තත්වය තුළ තවත් අනතුරුදායක අඩියකට ඇද දමා තිබේ. සිව්වැනි සහ අවසාන හේතුව වන්නේ අත්තනෝමතික හා පුරවැසියාට හානිදායක අන්දමට කඩිමුඩියේ තීරණ ගැනීමයි. අවසාන වශයෙන් කිවහැකි වන්නේ ලංකාවේ සුබසාධන පද්ධතියේ ශක්තිය මෙම වසංගතයෙන් පරීක්ෂා කර ඇති බවත්, එම පරීක්ෂණයෙන් ජාතියක් වශයෙන් අප ඉතා බේදජනක ලෙස අසමත්ව ඇති බවත්ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


*ADB Approves $3 Million Grant to Assist Sri Lanka's Response to COVID-19* (2020) *Asian Development Bank*. Available at: https://www.adb.org/news/adb-approves-3-million-grantassist-sri-lanka-s-response-covid-19 (Accessed: 30 June 2021).

*BBC News* (2020) 'Coronavirus: Greatest test since World War Two, says UN chief', 1 April. Available at: https://www.bbc.com/ news/ world-52114829 (Accessed: 27 June 2021).

'Cabinet approves Rs 625 million to establish 500 outdoor fitness centers using containers' (2021) *NewsWire*, 4 May. Available at: https://www.newswire.lk/2021/05/04/cabinet-approves-rs-625-million-to-establish-500-outdoor-fitness-centers-usingcontainers/ (Accessed: 1 July 2021).

Decerf, B., Ferreira, F.H.G., Mahler, D.G., Sterck, O. (2020) *Lives and Livelihoods: Estimates of the Global Mortality and Poverty Effects of the COVID-19 Pandemic.* 13549. Bonn: Institute of Labor Economics (IZA). Available at: https://www. econstor.eu/ bitstream/10419/223991/1/dp13549.pdf.

*Ensuring COVID-19 relief reaches Sri Lanka's people* (2020) *Transparency.org.* Available at: https://www.transparency. org/en/blog/ensuring-covid-19-relief-reaches-sri-lankaspeople (Accessed: 1 July 2021).

Fernando, L. (2021) 'Covid - Let's Migrate From "I did It Best" To "Let's Do It Together"', *Colombo Telegraph*, 7 May. Available at: https:// www.colombotelegraph.com/index.php/ covid-lets-migrate-from-i-did-it-best-to-lets-do-it-together/ (Accessed: 1 July 2021).

'Fertiliser ban could have disasterous outcome' (2021), 10 June. Available at: http://island.lk/fertiliser-ban-could-havedisasterous-outcome/ (Accessed: 25 July 2021).

*Fertilizer shortage could lead to food shortage in Sri Lanka, warn farmers* (2021) *Newsfirst Sri Lanka.* Available at: https:// www.youtube.com/ watch?v=GmjFkbQfFv8 (Accessed: 1 July 2021).

Fonseka, P. (2020) *Swindlers deal to deprive Rs. 5000 allowance, Daily Mirror.* Available at: https://www.dailymirror. lk/recomended-news/ Swindlers-deal-to-deprive-Rs-5000- allowance/277-190489 (Accessed: 1 July 2021).

Glover, S. (2021) *Sri Lankan garment workers 'hit by third wave', Ecotextile News.* Available at: https://www.ecotextile. com/2021062427983/ materials-production-news/sri-lankangarment-workers-hit-by-third-wave.html (Accessed: 1 July 2021).

Gunasekera, T. (2021) *Patriot, Bared, Colombo Telegraph.* Available at: https://www.colombotelegraph.com/index.php/patriotbared/ (Accessed: 30 June 2021).

Husain, J. (2021) *Namal Says Project To Establish 500 Outdoor Gyms Only After Covid-19 Third-Wave Ends, Daily Mirror.* Available at: https:// www.magzter.com/stories/Newspaper/DailyMirror-Sri-Lanka/ Namal-Says-Project-To-Establish-500- Outdoor-Gyms-Only-After-Covid-19-Third-Wave-Ends (Accessed: 1 July 2021).

Jayamanne, D. (2020) *Taking Stock of Growing 'Fish-phobia', CeylonToday.* Available at: https://ceylontoday.lk/news/ taking-stock-of-growing-fish-phobia (Accessed: 1 July 2021).

Jayasinghe, C. (2020) *Sri Lanka needs to ramp up daily PCR testing to 40-50,000 a day: Dr Rannan-Eliya, EconomyNext.* Available at: https://

economynext.com/sri-lanka-needs-to-ramp-updaily-pcr-testing-to-40-50000-a-day-dr-rannan-eliya-75755 (Accessed: 30 June 2021).

Jayasuriya, L. (2000) *Welfarism and Politics in Sri Lanka: Experience of a Third World Welfare State. The University of Western Australia.* Available at: https://research-repository.uwa. edu.au/en/publications/welfarism-and-politics-in-sri-lankaexperience-of-a-third-world-w (Accessed: 1 July 2021).

Jayasuriya, L. (2004) 'The Colonial Lineages of the Welfare State', in Kelegama, S. (ed.) *Economic Policy in Sri Lanka: Issues and Debates*. First edition. Thousand Oaks, California: SAGE Publications Pvt. Ltd, pp. 403–425.

Jayasuriya, R. (2021) 'The coming full-blown crisis in agricultural sector courtesy of a shortsighted fertilizer ban', *LankaWeb*, 16 June. Available at: https://www.lankaweb.com/ news/items/2021/06/16/the-coming-full-blown-crisis-inagricultural-sector-courtesy-of-a-shortsighted-fertilizer-ban/ (Accessed: 1 July 2021).

Jayawardena, P. (2020) 'talkingeconomics - COVID-19 and Sri Lanka's Labour Market Gaps: Permanent Protection for Temporary Employees', *Institute of Policy Studies*, 9 September. Available at: https://www.ips.lk/talkingeconomics/2020/09/09/ covid-19-and-sri-lankas-labour-market-gaps-permanentprotection-for-temporary-employees/ (Accessed: 29 June 2021).

Milward, H. B. and Provan, K. G. (2000) 'Governing the Hollow State', *Journal of Public Administration Research and Theory: J-PART*, 10(2), pp. 359–379.

*Most Sri Lanka workers without formal protection amid Covid-19 shock: IPS study* (2020) *EconomyNext*. Available at: https:// economynext.com/most-sri-lanka-workers-without-formalprotection-amid-covid-19-shock-ips-study-76369 (Accessed: 29 June 2021).

Perera, M. M. (2021) *Colombo, Express Pearl disaster worries Catholics and civil society, AsiaNews*. Available at: http://www. asianews.it/news-en/Colombo,-Express-Pearl-disasterworries-Catholics-and-civil-society-53291.html (Accessed: 1 July 2021).

*Preprations to import Luxury vehicles for MPs at a cost of over 3.6 billion rupees* (2021) *Sri Lanka News - Newsfirst*. Available at: https://www.newsfirst.lk/2021/05/24/preprations-toimport-luxury-vehicles-for-mps-at-a-cost-of-over-3-6-billionrupees/ (Accessed: 1 July 2021).

Ranaraja, M. (2020) 'Notes from Colombo: Sri Lanka Weathers the Covid-19 Storm', *The Asia Foundation*, 8 July. Available at: https://asiafoundation.org/2020/07/08/notes-fromcolombo-sri-lanka-weathers-the-covid-19-storm/ (Accessed: 27 June 2021).

*Recent Economic Developments: Highlights of 2020 and Prospects for 2021* (2020) Colombo: Central Bank of Sri Lanka. Available at: https://www.cbsl.gov.lk/en/publications/economicand-financial-reports/recent-economic-developments/recenteconomic-developments-2020 (Accessed: 29 June 2021).

*Remove politicians from Covid-19 relief programme* (2020) *Lanka Mirror*. Available at: https://srilankamirror.com/ news/18247-remove-politicians-from-covid-19-reliefprogramme (Accessed: 1 July 2021).

Sirilal, R. and Illmer, A. (2021) 'X-Press Pearl: The "toxic ship" that caused an environmental disaster', *BBC News*, 10 June. Available at: https://www.bbc.com/news/worldasia-57395693 (Accessed: 1 July 2021).

'Socio-Economic Index in the face of COVID-19' (2021) *Centre for Policy Alternatives*, 30 June. Available at: https://www. cpalanka.org/socio-economic-index-in-the-face-of-covid-19/ (Accessed: 30 June 2021).

*Sri Lanka - Ban on agrochemicals* (2021). Available at: https:// www.hortibiz.com/news/?tx_news_pi1%5Bnews%5D=1137&cHash=dd059427406ea8fe24400acd2ef06b52 (Accessed: 25 July 2021).

*Sri Lanka CB did not approve luxury SUV imports for MPs: Governor* (2021) *EconomyNext*. Available at: https://economynext. com/sri-lanka-cb-did-not-approve-luxury-suv-imports-formps-governor-82962 (Accessed: 1 July 2021).

*Sri Lanka Development Update: Economic and Poverty Impact of COVID-19* (2021) Washington, DC: The World Bank Group. Available at: https://thedocs.worldbank.org/en/doc/15b8de0edd4f39cc7a82b7aff8430576-0310062021/original/SriLanka-DevUpd-Apr9.pdf.

*Sri Lanka farmers, local bodies to be taught produce organic fertilizer after import ban* (2021) *EconomyNext*. Available at: https:// economynext.com/sri-lanka-farmers-local-bodies-to-betaught-produce-organic-fertilizer-after-import-ban-82690 (Accessed: 1 July 2021).

*Sri Lanka: Remaining balance of 'ITUKAMA' COVID–19 Fund to be allocated for vaccination drive* (2021) *Colombopage*. Available at: http://www.colombopage.com/archive_21A/ May10_1620667307CH.php (Accessed: 30 June 2021).

*Sri Lanka says state luxury SUV imports for MPs halted following outcry* (2021) *EconomyNext*. Available at: https:// economynext.com/sri-lanka-says-state-luxury-suv-importsfor-mps-halted-following-outcry-82413 (Accessed: 1 July 2021).

*Sri Lanka: Sri Lanka government grants more concessions to public affected by COVID-19 pandemic* (2020) *Colombo Page*. Available at: http://www.colombopage.com/archive_20A/ Mar31_1585667258CH.php (Accessed: 1 July 2021).

*Sri Lanka: State of the Economy 2020 | Institute of policy studies Sri Lanka* (2020). Available at: https://www.ips.lk/sri-lankastate-of-the-economy-2020-2/ (Accessed: 29 June 2021).

*Sri Lanka: The government decides to buy all the fish harvest* (2020) *Colombo Page*. Available at: http://www.colombopage.com/ archive_20B/Oct28_1603897849CH.php (Accessed: 1 July 2021).

*The Global Economic Outlook During the COVID-19 Pandemic: A Changed World* (2020) *World Bank*. Available at: https:// www.worldbank.org/en/news/feature/2020/06/08/theglobal-economic-outlook-during-the-covid-19-pandemic-achanged-world (Accessed: 28 June 2021).

*The Global Economic Prospects* (2021). Washington, DC: The World Bank Group. Available at: https:// openknowledge.worldbank.

org/bitstream/handle/10986/ 35647/9781464816659.pdf (Accessed: 28 June 2021).

*The government spent only 6% of the Itukama COVID-19 fund balance* (no date) *Publicfinance.lk*. Available at: https://publicfinance. lk/en/topics/ The-government-spent-only-6-of-the-ItukamaCOVID-19-fund-balance-1620900512 (Accessed: 1 July 2021).

Thomas, K. (2021) *What Happened To The Itukama Fund?* Available at: https://roar.media/english/life/current-affairs/whathappened-to-the-itukama-fund (Accessed: 1 July 2021).

Venugopal, R. (2015) 'Neoliberalism as concept', *Economy and Society*, 44(2), pp. 165–187. doi: 10.1080/03085147.2015.1013356.

Waliwitiya, R. (2021) *Sri Lanka fertilizer ban haphazard, modern tech, risk management the answer: researcher, EconomyNext*. Available at: https:// economynext.com/sri-lanka-fertilizerban-haphazard-modern-tech-risk-management-the-answerresearcher-81643 (Accessed: 25 July 2021).

Weerasekera, H. (2020) 'talkingeconomics - Building Back Better: Reviving Sri Lanka's Economy Beyond COVID-19', *Institute of Policy Studies*, 19 October. Available at: https://www. ips.lk/ talkingeconomics/2020/10/19/building-back-betterreviving-sri-lankas-economy-beyond-covid-19/ (Accessed: 29 June 2021).

*World Bank Supports Sri Lanka With $56 Million to Mitigate COVID-19 Impacts* (2020) *World Bank*. Available at: https:// www.worldbank.org/ en/news/press-release/2020/09/11/ world-bank-supports-sri-lanka-with-usd56-million-mitigatecovid-19-impacts (Accessed: 30 June 2021).

Yeyati, E. L. and Filippini, F. (2021) *Social and economic impact of COVID-19*. 158. Washington, D.C.: Brookings Institution. Available at: https://www.brookings.edu/wp-content/ uploads/2021/06/ Social-and-economic-impact-COVID.pdf.

# 5

# වර්ගවාදී වසංගත ආණ්ඩුකරණය: ශ්‍රී ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය තුළ මුස්ලිම් ප්‍රජාව

*සකිනා මොයිනුඩීන්*

## හැඳින්වීම

"වසංගත වලට හොබ්සියානු සංත්‍රාසයෙහි වෛද්‍යමය ප්‍රභේදය නිර්මාණය කිරීමේ හැකියාව පවතී; එනම් සියල්ලන් විසින් සියල්ලන්ට එරෙහිව දියත් කෙරෙන යුද්ධයක්." (Strong, 1990, p. 258) 'වසංගත මනෝභාවය' වශයෙන්ද හැඳින්විය හැකි මෙම මානසිකත්වය තුළින් තත් ආකාරයෙන් පවතින්නා වූ හෝ සිතින් මවාගන්නා ලද තර්ජනයක් මහජන පර්යායට ඇති බවට හැඟීමක් දෙනු ලබයි. කොවිඩ් වසංගත තත්වය තුළ ලංකාවේ මෙම තත්වය පැහැදිලිව දක්නට ලැබුණි. එහිදී රාජ්‍යයේ වර්ගිකතන්ත්‍ර[1] (ethnocratic) ආණ්ඩුකරණ පද්ධතිය (Balasundaram, 2016) විසින් සාධාරණීකරණය කළ නොහැකි අන්දමින් මෙරටේ මුස්ලිම් ජනයා නිරීක්ෂණයට, අපකීර්තියට හා වෙනස්කොට සැළකීම් වලට භාජනය කරන ලදී. වසංගත තත්වයක් තුළ මුල්බැස ගන්නා අතාර්කිකත්වය, භීතිය සහ සැකයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රෝගයට ගොදුරු වන්නන් මෙන්ම රෝගය පැතිරවීමට විශේෂයෙන් ප්‍රවණතාවක් ඇති බව සැක කරන කණ්ඩායම් ද අපකීර්තියට පත් කිරීම සිදුවේ. මග හැරීම, වෙන්කර තැබීම හා පරිභවයෙන් ආරම්භ වියහැකි මෙතුළින්, පුද්ගල භීතිය සමාජීය මට්ටමක සිදුවන

---

1 'වාර්ගිකතන්ත්‍රයක්' යනු වාර්ගිකත්වය මත පදනම්ව ආණ්ඩුකරණය සිදුකරන පද්ධතියකි. මෙහිදී මැතිවරණ, ප්‍රතිපත්ති සම්පාදනය සහ හදිසි තත්වයන්ට මුහුණ දීම වැනි සියළු ආකාර අවස්ථා වලදී වාර්ගිකත්වය මුල් වේ.

මන්තරකාර දඬයමක් බවට පරිවර්තනය විය හැකිය (ඉහත එම/Ibid, p. 253). ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය තුළ - එනම් ආශ්‍රිතයින් හඳුනා ගැනීමෙහි සිට කොවිඩ් ආසාදනය වීමෙන් මරණයට පත්වූ මුස්ලිම් දේහ ආදාහනය කිරීම දක්වා - මෙම අන්‍යකරණය ඉතා බහුල වශයෙන් දක්නට ලැබුණි. ඒ හරහා සෞඛ්‍ය අර්බුදය කළමණාකරණයෙහි ලා ආණ්ඩුවෙහි අසමත්කමෙන් මහජන අවධානය ඉවතට හැරවීමට හැකි වූවාක් මෙන්ම, පටු දේශපාලන වාසි තකා මුස්ලිම් ප්‍රජාවට විරුද්ධව සමාජයේ පැවති ආකල්පයන් වඩාත් තීව්‍ර කිරීමටද හැකිවිය. ඒ අනුව වසංගතය තුළින් ආණ්ඩුවේ වර්ගවාදී සහ ප්‍රජාතන්ත්‍ර-විරෝධී ආණ්ඩුකරණ මාදිලිය කිසිදු ප්‍රතිවිපාකයකින් තොරව ඉදිරියට පවත්වාගෙන අවශ්‍ය පසුබිම සකසා දුන් බව පෙනේ.

මෙම පරිච්ඡේදයෙන් අරමුණු කරන්නේ ආණ්ඩුවේ කොවිඩ් ප්‍රතිචාරය තුළ ගන්නා ලද යම් යම් ප්‍රතිපත්තිමය තීරණ හරහා රටේ වාර්ගික කණ්ඩායම් තවදුරටත් ධ්‍රැවීකරණය කිරීමත්, ඒ හරහා පවතින අසමානතා වැඩි වර්ධනය කිරීමත් කෙසේ සිදුවුනිද යන්න පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීමයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ ආයතනය වන Social Indicator විසින් සිදුකරන ලද සමීක්ෂණයකින් ලබාගත් දත්ත සහ ගුණාත්මක සාකච්ඡා කිහිපයක් මේ සඳහා පදනම් කරගන්නා ලදී.

## වසංගතය සහ මහජන මනස

වසංගත තත්වයේ මුල් කාලය තුළ අවස්ථා කිහිපයකදීම ජනාධිපතිවරයා සහ ඔහුගේ සහකරුවන් විසින් අර්බුදය කළමණාකරණය කරගැනීම පිළිබඳ තමාට ඇති විශ්වාසය සහ ශක්තිය සන්නිවේදනය කළේ එය යුද්ධයකට සමාන කරමිනි. රටේ ප්‍රධාන පෙළේ රූපවාහිනී නාලිකාවක සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වෙමින් යුධ හමුදාපති (සහ ජාතික කොවිඩ් මර්දන මෙහෙයුම් මධ්‍යස්ථානයේ අධිපති) ජනරාල් ශවේන්ද්‍ර සිල්වාද පැවසුවේ ත්‍රස්තවාදය පරාජය කළ ආකාරයටම වසංගතය මර්දනය කිරීමට ජනපති සහ මහජනතාව ත්‍රිවිධ හමුදාව කෙරෙහි විශ්වාසය තබා ඇති බවයි (*Full-Video of Army Commander speaks to Indeewari Amuwatte on battle against COVID-19 @HydePark,* 2020). කොවිඩ් මර්දන වැඩපිළිවෙල සඳහා නායකත්වය දීමට හමුදා නිලධාරීන් අනුයුක්ත කිරීම නිසා මෙම වෛරසය පැරදවිය යුතු සතුරෙක් බවට හැඟීමක් ජනිත විය. එතුළ ආසාදිතයින් ප්‍රමාණය අඩුකර ගැනීමේ ක්‍රමවේදය වශයෙන් විනය භාවිතා කෙරුණි. මෙම ක්‍රියාමාර්ගය අනුගමනය නොකළවුන්, එනම් කොවිඩ්-19 නීති රෙගුලාසි උල්ලංඝණය කළ සහ ආණ්ඩුව ප්‍රශ්න කළ අයවලුන් ප්‍රසිද්ධියේ නින්දාවට පමුණුවන ලදී (*Sri Lanka investigates troops over 'humiliation 'of Muslims,* 2021). මෙම සෞඛ්‍ය අර්බුදය ජාතික ආරක්ෂාව සම්බන්ධ

ප්‍රශ්නයක් ලෙස සමාජගත කිරීම බලයේ සිටින්නන් විසින් එම ප්‍රශ්නය අයුතු ලෙස භාවිතා කිරීමක් සේ දැක්විය හැකිය. සෞඛ්‍ය සේවයේ මඟ පෙන්වීම යටතේ සිවිල් ක්‍රියාදාමයක් දියත් කරනු වෙනුවට, කීකරුකම හා දේශප්‍රේමය පිළිබඳ ආඛ්‍යානයක් මත පදනම්ව කොවිඩ් අර්බුදය කළමණාකරණය කිරීමට උත්සහ දරනු දක්නට ලැබුණි. එහිදී කීකරුකම විනා කරුණු මත පදනම් වූ දැනුවත්භාවය හෝ, දේශප්‍රේමය විනා එකමුතුකම අවධාරණය නොකිරීම කැපී පෙනෙන කරුණකි.

වසංගත තත්වයන් තුළ සමාජ ඒකාබද්ධතාව සහ එකිනෙකා කෙරෙහි කරුණාව ඇත්තෙන්ම වැඩිවිය හැකි වුවත්, සමාජ විභේදන ඔඩදුවා යාම තුළින් යම් යම් කණ්ඩායම් බිල්ලට දීම වැනි හානිකර තත්වයන් ඇතිවීමේ ප්‍රවණතාවයන්ද නැත්තේ නොවේ. මෙම දෙවැනි ප්‍රවණතාව සාක්ෂාත්කරණය වූ තත්වයකදී ප්‍රජාව තුළ කැළඹීමක් ඇතිවිය හැකිය (Reicher and Stott, 2020). එවැනි අවස්ථාවකදී අධීක්ෂණය සහ බය ගැන්වීම තුළින් සිවිල් නිදහස කප්පාදු කිරීම, හදිසි තත්වයට යුහුසුළුව පිළිතුරු දීමේ මුවාවෙන් වගවීම සහ විනිවිදභාවය සම්බන්ධ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණයන් මගහැර යෑම, පැවැත්ම පිළිබඳ තර්ජනයක් එල්ලව ඇති අවස්ථාවක ශක්තිමත් නායකයෙක් පිටුපස එකතු වීමේ වැදගත්කම අවධාරණය කිරීම වැනි භාවිතයන් තුළින් ප්‍රජාතන්ත්‍ර-විරෝධී පාලනයක් සාධාරණීකරණය කිරීමට ශ්‍රී ලංකාවේ කොවිඩ් ප්‍රතිචාරය තුළ උත්සහ දරා ඇති බව පැහැදිලිය. එමඟින් සිදුව ඇත්තේ රෝගය ආසාදනය වන්නන් සම්බන්ධයෙන් කරුණාවෙන් කටයුතු කිරීම වෙනුවට ඉතා සැකයෙන් බැලීමය. මෙම භාවිතය රටේ පවතින කුරිරු වර්ගවාදය හා ඒ මත පදනම් වූ මැතිවරණ ගණනය කිරීම්ද වැඩි වර්ධනය කොට ඇත. මෙම භීතිය ආණ්ඩුව සහ ඔවුන්ට හිතවත් මාධ්‍ය ආයතන මඟින් යොදාගන්නේ මෙම වෙනස්කොට සැළකීම් ආයතනගත කිරීම සඳහාය. මෙහිදී බහුතරයකට තොරතුරු ප්‍රභවයක් වශයෙන් ක්‍රියා කරන මාධ්‍ය ආයතන විශේෂයෙන්ම මුස්ලිම් ප්‍රජාවගේ අයිතීන් කප්පාදු කිරීම සඳහා මෙවලමක් වශයෙන් භාවිතා වුනි.

කොවිඩ් ආසාදනය වීමෙන් මියගිය මුස්ලිම් ජාතිකයන්ගේ අවසාන කටයුතු කිරීමේදී චාරිත්‍රානුකූලව ඔවුන් භූමදානය කිරීමට එරෙහිව පැන නැඟි වර්ගවාදී ආඛ්‍යානය 'එක් රටක් - එක් නීතියක්' යන සටන් පාඨය නැවත කරළියට ගෙන ඒමට සමත් විය. මෙහිදී මුස්ලිම් ජාතිකයන් කරදරකාරයින් ලෙස සැළකීමේ සහ, ඒ මත පදනම්ව ප්‍රසිද්ධ නින්දාවන්ටත් වෙනස් කොට සැළකීම් වලටත් බඳුන් කිරීමේ භාවිතයක් පැන නැඟුනි. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය මෙම භාවිතයන් සුජාතකරණය කිරීමට යොදාගත් බවද පෙනෙන්නට තිබේ. 'වසංගතයට එරෙහි යුද්ධයේ' නොවැළැක්විය හැකි හානිය (collateral damage) බවට මුස්ලිම්වරුන්ගේ ආගම, හර පද්ධතිය සහ සංස්කෘතිය

පත්වන්නේ ඒ අනුවය. මෙම මුස්ලිම් විරෝධයට ජීවය ලැබුණු පූර්ව-වසංගත පසුබිමට කෙටියෙන් අවධානය යොමු කිරීම මෙහිදී ප්‍රයෝජනවත් වනු ඇත.

## පශ්චාත්-යුධ ශ්‍රී ලංකාවේ වර්ගවාදී-ආගම්වාදී ආණ්ඩුකරණය

2009 යුද්ධයේ අවසානයෙන් පසු ලංකා සමාජය තුළ ජයග්‍රාහී හැඟීමක් මෙන්ම (Kumarasinghe, 2016) සිංහල-බෞද්ධ අනන්‍යතාවය රැකගැනීම පිළිබඳ දැඩි අවශ්‍යතාවයක්ද ජනිත විය (*New party aims to safeguard Sinhala identity*, 2016). මුස්ලිම් ප්‍රජාව ආර්ථිකය තුළ ඒකාධිකාරයක් පවත්වාගෙන යන බවට වන මැසිවිල්ල (Kadirgamar, 2013) සහ ඔඩුදුවන ආර්ථික අභියෝග නිසා ජාතිවාදී දේශපාලනික බලවේග වලට නැතිව ගිය සිය ආකර්ෂණය යළි දිනාගැනීමටත්, ප්‍රචණ්ඩත්වයට යළි නැඹුරු වීමටත් අවස්ථාව උදා විය (Zuhair, 2016). දේශපාලනික වශයෙන් ගත්විට ජාතික හෙළ උරුමය වැනි දේශපාලන පක්ෂද, බොදු බල සේනා, සිංහල රාවය සහ රාවණ බලය වැනි අත්‍යන්ත වර්ගවාදී-ආගම්වාදී කණ්ඩායම්ද නැඟී එන්නේත්, කිසිදු වග වීමකින් තොරව ක්‍රියාත්මක වන්නේත් රාජ්‍යයේ අනුග්‍රහය හේතුවෙනි. ඒවා මඟින් ජාතිවාදය හා අනාරක්ෂිත භාවය පිළිබඳ බහුතරයේ හැඟීම් සුජාතකරණය කරන ලදී (*Sri Lanka: Preliminary findings of Country Visit to Sri Lanka by the Special Rapporteur on freedom of religion or belief,* 2019).

ආඩම්බර වියහැකි ආකාරයේ ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසයක් සහ ආගමික නිදහස තහවුරු කරන ශක්තිමත් නෛතික රාමුවක් තිබුණද, පශ්චාත්-යුධ ශ්‍රී ලංකා ඉතිහාසය තුළ වර්ගවාදය, වෙනස් අනන්‍යතාවයන් පිළිබඳ ඇති ප්‍රචණ්ඩකාරී භීතිය, වර්ගවාදී අපහාසයන් සහ ද්වේෂ සහගත භාෂණය වැනි බොහෝ හානිකර භාවිතයන් කරළියට පැමිණ ඇත. මේවා විවිධ අවස්ථා වලදී ප්‍රචණ්ඩකාරී ලෙස පුපුරා ගොස් තිබේ. 2015 යහපාලන ආණ්ඩුව විසින් මූලික අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට ප්‍රතිඥා දුන්නද, සුළුතර කණ්ඩායම් වලට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට හෝ ඊට අදාළ වරදකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ඔවුහු අසමත් වූහ. මෙම නිසා මෙකී වරදකාර පාර්ශ්වයන් කිසිදු දඬුවම් ලැබීමකින් තොරව නිදහසේ සිය කටයුතු කරගෙන ගිය අතර, එනිසා බහුතරය සහ සුළුතරය අතර ගැටුම් තවදුරටත් වර්ධනය වූ බව පැවසිය හැකිය (*President pardons Gnanasara Thero*, 2019; Mayberry, 2019).

මුස්ලිම්වරුන්ට එරෙහිව ප්‍රචණ්ඩකාරී ප්‍රතිචාර එල්ල වීමට බලපෑ හේතු අතර රටේ ආර්ථිකය ඔවුන් සියතට ගැනීම, හිතාමතාම සිය ජනගහණය වර්ධනය කිරීම මඟින් රටේ ජන අනුපාතය වෙනස් කිරීමේ සැලසුම් දියත්

කිරීම, සිංහල-බෞද්ධයාගේ ආහාර, ඇඳුම් පැළඳුම් සහ වෙනත් පරිභෝජන භාණ්ඩ වලට විෂ සහගත දෑ එකතු කිරීම මඟින් ජාතිය වඳ කිරීමට උත්සහ දැරීම මෙන්ම, මුස්ලිම් වෛද්‍යවරුන් සිංහල කාන්තාවන්ට වඳ සැත්කම් සිදුකිරීම යනාදී බොහෝ චෝදනා සහ ඒවායින් වැඩි කරන ලද සැකය හා සන්ත්‍රාසය විය. 2019 පාස්කු ප්‍රහාරය මෙම තත්වය තවත් තීව්‍ර කළ අතර, එය මුස්ලිම් ප්‍රජාව බහුතරයෙන් පමණක් නොව අනෙකුත් සුළුතර කණ්ඩායම් වලින් (සිංහල කතෝලිකයින් වැනි) හුදෙකලා කිරීමටද හේතු වුනි.

මෙම පසුබිම තුළ ‘සෞභාග්‍යයේ දැක්ම’ ප්‍රතිපත්ති ප්‍රකාශනය මත පදනම්ව රාජපක්ෂවරුන්ගේ කණ්ඩායම ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණ දෙකම ජයග්‍රහණය කළේ සිංහල-බෞද්ධ ජාතිවාදී දේශපාලනයක නියැලෙමිනි (Srinivasan, 2019; *Sri Lanka election: Rajapaksa brothers win ‘supermajority’*, 2020). මෙම මැතිවරණ ප්‍රතිඵලයෙන් ඉතාම ගැඹුරු ලෙස විභේදනය වූ සමාජයක් පිළිබඳ ඉඟි කළේ බහුතරයේ අති බහුතර කැමැත්තෙන් සහ සුළුතරයෙන් මුළුමනින්ම ප්‍රතික්ෂේප වූ ආණ්ඩුවක පත්වීම තුළිනි (Thiruvarangan, 2020). පාස්කු ප්‍රහාරය භාවිතා කරමින් පොදුජන පෙරමුණ සිදුකළේ ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙමින් එය තහවුරු කළ හැකි ශක්තිමත් නායකයකුගේ අවශ්‍යතාවය පිළිබඳ හැඟීමක් සමාජගත කිරීමයි (*Gotabaya named as SLPP’s presidential candidate*, 2019).

වසංගත තත්වය උත්සන්න වූ අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමටද, කිසිදු ආකාර ව්‍යවස්ථාදායක අධීක්ෂණයකට හෝ වගවීමකට යටත් නොකොට සෞඛ්‍ය අර්බුදය කළමණාකරණය කිරීම සඳහා කාර්ය සාධක බලකා සමූහයක් පත් කිරීමටද ජනපතිට පන්නරය ලැබෙන්නේ මෙවැනි පසුබිමකිනි. මෙම කාර්ය සාධක බලකා සමූහයට කොවිඩ් පාලනය කිරීමේ වගකීම, දරිද්‍රතාවය තුරන් කිරීම, ජීවනෝපාය දියුණුවට සහය දැක්වීම, ආර්ථික පුනර්ජනනය සහ පුරාවිද්‍යා උරුමයන් රැකගැනීම වැනි බොහෝ වගකීම් සහ බලයන් පවරා දී ඇත (*Sri Lankan Parliament dissolved; elections set for April, 2020; The appointment of the two presidential task forces,* 2020).

මැතිවරණ ජයග්‍රහණයෙන් පසු සිංහල-බෞද්ධ ආධිපත්‍යය ශක්තිමත් කිරීම ආශ්‍රිත සිය සැලසුම් ප්‍රකාශයට පත් කිරීමෙහිලා රාජපක්ෂවරු කිසිදු කාලයක් නාස්ති නොකළහ. ජනපති සහ අගමැති දෙදෙනාම දිව්රුම් දෙන ලද්දේ බෞද්ධ සිද්ධස්ථාන වලය. එමඟින් බෞද්ධ සංස්කෘතික උරුමයට ලැබෙන ප්‍රමුඛස්ථානය පැහැදිලිව සන්නිවේදනය කෙරුණි. එසේම බෞද්ධ භික්ෂූන්ගෙන් සැදුම්ලත් සංඝාභිශාසක මණ්ඩලයක් ජනපතිගේ ඇරයුමෙන් පත් කෙරෙන්නේ, සෑම මසකම තුන්වැනි සිකුරාදා ජනපති හමුවී ආණ්ඩුවේ

ප්‍රතිපත්ති පිළිබඳ උපදෙස් දීමටය (*Buddhist Advisory Council commends President for walking the talk*, 2020). 2020 වසරේ පළමු කාර්තුවේදී කොවිඩ් වසංගතය ලංකාවට එන විට පැවති තත්වය මෙවැන්නකි.

## මුස්ලිම් ප්‍රජාව සහ වසංගතය

වසංගතයේ මුල භාගයේ, එනම් වර්ෂ 2020 අප්‍රේල් මස ආණ්ඩුවට පක්ෂපාතී මාධ්‍ය නාලිකාවක විකාශනය වූ සම්මුඛ සාකච්ඡාවකදී ආණ්ඩුවේ ඇමතිවරු කිහිප දෙනෙක් සහ සාකච්ඡාව මෙහෙයවන්නා එකතුව සාවද්‍ය දත්ත සහ කතිකාවත් මත පදනම්ව මුස්ලිම් ප්‍රජාව පිළිබඳ අපහාසාත්මක ප්‍රකාශන කිහිපයක් සිදු කරන ලදී. ඒ හරහා ඒ වනවිටත් පැවති මුස්ලිම් විරෝධී ආකල්ප තවත් තීව්‍ර කළා පමණක් නොව, ඔවුන් සමාජයේ පැවැත්මට තර්ජනයක් වන බවට වූ පුහු භීතියට පදනමක්ද එකතු කරන ලදී (*Derana TV Chathura's double standards exposed: citizens enraged over racist slurs of Derana TV anchor,* 2020). මාධ්‍ය මඟින් වර්ගවාදී හැසිරීමට උඩගෙඩි දෙන අයුරු මෙහිදී කැපී පෙනුණි. මුස්ලිම් ප්‍රජාව කොරෝනා වෛරසයේ සුපිරි වාහකයන් (super spreaders) බවට වන ආඛ්‍යානය පළමුවෙන්ම සමාජයේ ස්ථාපනය කරන්නේ වසංගතයේ මුල් අවස්ථාවේ, එනම් වර්ෂ 2020 මාර්තු මාසයේ ලබාදුන් සම්මුඛ සාකච්ඡාවක් මඟින් හමුදාපතිවරයා විසිනි. ඔහු ප්‍රකාශ කර සිටියේ පිටරටින් පැමිණ ආසන්නතම පොලිස් ස්ථානයේ ලියාපදිංචි වීමකින් තොරව රැඳී සිටින්නන්ගෙන් බොහෝ දෙනා පුත්තලම ප්‍රදේශයේ පිරිස් බවයි. මෙහි දී ඔහු විසින් සිදු කරන ලද්දේ පුත්තලමේ බහුතරය මුස්ලිම් බවට වන පොදු දැනුම අවභාවිත කිරීමකි. ඔහුට අනුව මෙකී පුද්ගලයන්ගේ විනය මඳ භාවය හේතුවෙන් ඔවුන් තැන් තැන්හි සංචරණය කරන අතර, එනිසා වෛරසය ඇති අයගෙන් සමාජයට එය ආසාදනය වෙමින් තිබේ. එබැවින් පුත්තලමට දින නියමයකින් තොර ඇඳිරි නීතිය පැනවීමට සිදුව ඇති බවට ඔහු එම අවස්ථාවේදී ප්‍රකාශ කළේය (ඉහත එම). මෙවැනිම ආඛ්‍යාන කිහිපයක් මුස්ලිම් බහුතරයක් වෙසෙන මහනුවර අකුරණ සහ කළුතර අටලුගම සම්බන්ධයෙන්ද සමාජගත කරන ලදී (*Sri Lanka extends indefinite curfew to Kandy and Puttlam, Akurana under lockdown,* 2020).

වෛරසයේ බරපතලකම මුලින් අවතක්සේරු කිරීම නිසා පසුව එය කාර්යක්ෂමව කළමණාකරණය කරගැනීමට අසමත් වූ ආණ්ඩුව, මුස්ලිම් ප්‍රජාව භාවිතා කොට සිය අසමර්ථකම වසා ගැනීමට උත්සහ දැරූ බව පැහැදිලිය. දෛනික ආසාදිතයින් සංඛ්‍යාව වාර්තා කිරීමේදී මුස්ලිම් ප්‍රජාව බහුතරයක් වාසය කරන ප්‍රදේශ හා ගම්මාන ඉස්මතු කර දැක්වීමට පියවර ගන්නා ලද අතර, ඔවුන් නිරෝධායන නීති රෙගුලාසි උල්ලංඝණය කරමින්

වෛරසය පතුරුවන බව පෙන්වීම සඳහා ඔවුන් පිළිබඳ තොරතුරු ඉතා උනන්දුවෙන් වාර්තා කරන ලදී. වසංගතයේ දෙවන රැල්ලේදී අටලුගම ප්‍රදේශවාසියෙක් මුහුණ දුන් පහත අත්දැකීම ආශ්‍රයෙන් මේ පිළිබඳ වඩා පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය:

> පෞද්ගලික සායනයක් පවත්වාගෙන යන බණ්ඩාරගම වෛද්‍යවරයකුගේ වාර්තාවකට අනුවයි අපේ ප්‍රදේශය හුදෙකලා කළේ. ඔහු ළඟට බෙහෙත් ගන්න ආ බොහෝ දෙනාට උණ තත්වයක රෝග ලක්ෂණ තිබෙනු දැක ප්‍රදේශයට කොවිඩ් ආසාදනය විය හැකිව ඇති බවට ඔහු තීරණය කරලා. නමුත් මෙහි පැවති අමුතුම කාරණය නම් ප්‍රදේශයට පැමිණි හමුදා පිරිස් සමඟ මාධ්‍ය ආයතනද විශාල ප්‍රමාණයක් පැමිණීමයි. අපි හොඳටම තැති ගැන්මෙන් සිටියේ; සිදුවන දේ පිළිබඳ පැහැදිලි වැටහීමක් අපි කිසිවෙකුටත් තිබුණේ නැහැ. මිනිසුන්ව බලෙන්ම නිවෙස් වලින් එළියට ඇදගෙන ගියා; විරෝධය පෑම, ප්‍රශ්න කිරීම හෝ නිවාස ඇතුළට වී අගුලු ලා ගැනීම කළ අයට තර්ජනය කළා ඌරු මස් කවන බව කියමින්. PCR පරීක්ෂණ සඳහා සමහරු ස්වේච්ඡාවෙන් ගියා; තවත් සමහරු බලෙන් ඇදගෙන වාගේ ගියේ. 1080 ක් විතර දෙනා යාපනය, බණ්ඩාරවෙල , මඩකළපුව සහ බේරුවල ප්‍රදේශ වල නිරෝධායන මධ්‍යස්ථාන වලට ගෙන ගියා. අප 40-50 ක පමණ පිරිසක් එක බස් රථයක් තුළට පැටෙව්වා. ජනෙල් ඇරීමටවත් ඉඩක් දුන්නේ නැහැ. මෙසේ පැය තුනක් පමණ ගතකළ පසුයි නිරෝධායන මධ්‍යස්ථාන වලට ගමන ආරම්භ කළේ. මෙම සියලු දේ මාධ්‍ය ආයතන විසින් ඉතා උනන්දුවෙන් ආවරණය කළා. අපිට කොවිඩ් ආසාදනය වී ඇති බව පවසා මෙසේ ගෙන ගියත් අපි කිසිවෙකුට අපේ පරීක්ෂණ වල ප්‍රතිඵල ලබා දුන්නේ නැහැ. ඒ වගේම පරීක්ෂණ නොකළ සමහරුන්ටත් වෛරසය ආසාදනය වී ඇති බව පවසමිනුයි ගෙන ගියේ. නිරෝධායන දින 14 න් පසුව නැවත නිවසට පැමිණීමට මහත් පරිශ්‍රමයක් දරන්නට සිදුවූයේ ආපසු ඒමට ගමනාගමන පහසුකම් සලසා නොතිබූ නිසයි. අපේ ගමේ බොහෝ දෙනා දෛනික පඩියට වැඩ කරන්නන්. පෞද්ගලික වාහනයක් කුළියට ගැනීම සඳහා කළ මෙම වියදම දරාගැනීම ඔවුන්ට ඉතා අපහසු වුනා. මාස දෙක හමාරක් තනිකරම ගම හුදෙකලා කොටයි තිබුණේ. එය වටේ හමුදාව යොදා තිබුණා. දෙවරක් රුපියල් 5000 අපිට ලැබුණා. නමුත් අපට එවූ අත්‍යාවශ්‍ය භාණ්ඩ මල්ලේ තිබූ බොහෝ දේ කල් ඉකුත් වූ ඒවා.[2]

වාර්ගිකතන්ත්‍ර රාජ්‍යයන් වල (ethnocracies) රාජ්‍ය ව්‍යුහය පාලනය කරන්නේ අධිපති වාර්ගික කණ්ඩායම විසිනි. රාජ්‍ය ප්‍රතිපත්තිද ක්‍රියාත්මක වන්නේ අධිපති වාර්ගික කණ්ඩායමට වාසි සහගත හා ඇත්තෙන්ම අනෙකුත් වාර්ගික කණ්ඩායම් නොසළකා හැරෙන ආකාරයටය. කොවිඩ්-19 වසංගතය

---

2 අටලුගම බණ්ඩාරගම කුඩා පරිමාණ ව්‍යාපාරිකයෙක් සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාව (දුරස්ථ මාර්ගගත ක්‍රමය ඔස්සේ) 2021 ජූනි 18.

පාලනය කිරීමේදී බහුතරය පිනවීම සඳහා මුස්ලිම් විරෝධී ප්‍රචාරණ වලට රාජ්‍ය ආයතන විසින් ඍජුව හා වක්‍රව අනුග්‍රහ දැක්වීම තුළ මේ තත්වය පැහැදිලිව දැකගත හැකි විය. සමාජ මාධ්‍ය ජාලා වල සංසරණය වූ පහත දැක්වෙන කාටූන් තුළින් මේ බව මොනවට පැහැදිලි වේ.



*මූලාශ්‍රයː කාටූන් ශිල්පී ප්‍රදීප්, 2021*



*මූලාශ්‍රයː කාටූන් ශිල්පී ප්‍රදීප්, 2020*

වර්ෂ 2020 මාර්තු 27 නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් හරහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිවේදනය කළ කොවිඩ් ආසාදනය වී මියගිය අයගේ මළ සිරුරු බැහැර කිරීම පිළිබඳ ක්‍රමවේදය ඇත්තෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඒ පිළිබඳ උපදෙස් වලට අනුකූල එකකි. ඒ අනුව එමඟින් භූමදානය කිරීï වලට අවසර ලබා දී තිබුණත්, මුස්ලිම් ජාතිකයෙක් මියගිය පළමු අවස්ථාවේදීම ඔහුගේ පවුලේ දැඩි විරෝධය නොතකා ආදාහනය කරන ලදී. එදින සවස් වනවිට කොවිඩ් ආසාදනය වී මියයන අයගේ මළ සිරුරු ආදාහනය පමණක් කළ හැකි වන ආකාරයෙන් සෞඛ්‍ය උපදෙස් සංශෝධනය කෙරුණු අතර, අප්‍රේල් 11 වනදා මේ සම්බන්ධයෙන් අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තියක්ද හඳුන්වා දෙන ලදී. කිසිදු විද්‍යාත්මක සාක්ෂියක් නොමැතිව මෙවැනි තීරණයක් ගැනීම අතින් ගත් කළ ලංකාව ලෝකයේ වෙනස්ම රටකි.

ඉස්ලාමීය ඉගැන්වීම් වලට අනුව ආදාහනය, ගෞරවාන්විත භූමදානය පිළිබඳ නියමය උල්ලංඝණය කරයි. ඉහත දැක්වූ අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තිය මඟින් මුස්ලිම්වරුන්ට සිය ආගමට ඇති අයිතිය උල්ලංඝණය කළා පමණක් නොව, මුස්ලිම් ආගමික භාවිතයන් නිසා වෛරසය පැතිරීම වැඩිවන බවට මතයක්ද සමාජගත කරන ලදී. මෙම ප්‍රතිපත්තිය වෙනස් කරන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් වීම සමාජය තුළ මුස්ලිම් විරෝධය තවදුරටත් උග්‍ර කරන්නට සමත් විය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් අනුගමනය කළයුතු බවට හඬනැගූ විද්‍යාඥයින් සහ සෞඛ්‍ය වෘත්තිකයන් කොන් කිරීමටත්, රජයේ මතය දැරූ මාධ්‍ය වලින් බැහැර කිරීමටත් ලක්විය.

රජයේ ප්‍රධාන වසංගත විශේෂඥ වෛද්‍යවරයා ප්‍රමුඛ දේශපාලනඥයන් කිහිප දෙනෙකුම පැවසුවේ විශේෂඥ කමිටුවක් මඟින් නිර්ණය කර ඇති පරිදි කොවිඩ් ආසාදනය වී මියගිය අයගේ මළ සිරුරු භූමදානය කිරීම භූගත ජලයට බලපෑ හැකි බැවින් එතුළ රෝගය පැතිර යාමේ අවදානමක් ඇති බවයි. මෙකී කමිටුවෙහි කවුරුන් සේවය කළේද යන්න හෝ ඔවුන්ගේ සුදුසුකම් මොනවාද යන්න පැහැදිලි නැත. වඩාත් සැක කටයුතු කරුණ නම් මරණයකින් පසු PCR පරීක්ෂණ ප්‍රතිඵල ලද වහාම අවසන් කටයුතු කිරීමට කලබල කිරීමයි. එනිසා පවුල් වල සාමාජිකයන්ට ප්‍රතිඵල තහවුරු කිරීමේ පරීක්ෂණයක් ඉල්ලා සිටීමේ අවස්ථාව නැති විය. මෘත ශරීර ආදාහනයට කැමැත්ත පළ කරමින් ලිපි ලේඛන අත්සන් කිරීමට ඔවුන්ට බල කෙරුණු අතර, දේහය බැලීමට අවස්ථාවක් හෝ ලබා නොදෙන ලදී (*Coronavirus funerals: Sri Lanka's Muslims decry forced cremation,* 2020).

සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධිත විශේෂඥ අධිකරණ වෛද්‍ය චන්න පෙරේරා BBC සේවය සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවකදී පහත අදහස් දැක්වීය: "රජයට මුස්ලිම් ජනතාව සමඟ කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් කුඩා බියක් තිබෙනවා මේ වෛරසය යම් ආකාර නීති විරෝධී කටයුතු වලට යොදාගැනීමේ ප්‍රවණතාවයක් පිළිබඳව. යම් අයකු මෙවැනි මෘත ශරීරයක් ජීව අවියක් වශයෙන් භාවිතා කළ හැකියි." (*Small fear whether the dead bodies with the virus can be used as biological weapons,* 2020) රටේ නම් දැරූ සමහර විශ්ව විද්‍යාල ආචාර්යවරු පවා මෙම තීරණය සාධාරණීකරණය කළහ. නිදසුනක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය මෙත්තිකා විතානගේ දැක්වූයේ භූමදානය කරන සිරුරු වලින් කොවිඩ් වෛරසය භූගත ජලය හා මිශ්‍ර වියහැකි බවයි. මෙම කරුණු දැක්වීම් තුළ බරපතල වැරදි සහ ප්‍රතිවිරුද්ධතා පැවතිය ද, ආණ්ඩුව ගත් තීරණයට විද්‍යාත්මක පදනමක් ඇති බව පෙන්වීම සඳහා ඒවාට ඉහළ ප්‍රචාරයක් ලබාදෙන ලදී (*CCPSL says no solid evidence indicating burial of COVID-19 victims increases spread of virus,* 2021*; Sri Lanka can bury COVID-19 victims: SLMA,* 2021*; Marsoof,* 2020).

ඒ අනුව සිංහල සමාජය තුළ මෙන්ම මුස්ලිම් නොවන අනෙකුත් ජන කණ්ඩායම් අතරද මුස්ලිම් විරෝධය ඔඩුදුවා ගියේය. Social Indicator සමීක්ෂණය තුළින් අනාවරණය වූයේ සිංහල, දෙමළ සහ උඩරට දෙමළ කණ්ඩායම් ත්‍රිත්වයෙහිම බහුතරයක් මුස්ලිම් ජනයාගේ සංස්කෘතික හා ආගමික භාවිතයන් නිසා කොවිඩ්-19 වසංගතය පැතිරීමේ අවදානම වැඩිවන බව විශ්වාස කරන බවයි. මෙම විශ්වාසය සමඟ එකඟ නොවූ පිරිසෙන් වැඩිම කොටස මුස්ලිම් ප්‍රජාවය. එසේම 'වසංගත තත්වය තුළ ආණ්ඩුවේ උපදෙස් හා රෙගුලාසි සියළු ජන කණ්ඩායම් වලට එක හා සමානව ක්‍රියාත්මක වුනි'

යන ප්‍රකාශය සමග එකග නොවූ පිරිසෙන්ද වැඩිම කොටස මුස්ලිම් ප්‍රජාව වීම මේ අනුව පුදුමයට කරුණක් නොවේ ('SocioEconomic Index in the face of COVID-19', 2021).

ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය (*CCPSL says…,* 2021) සහ ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය (*Sri Lanka can bury…,* 2021) ප්‍රකාශ දෙකක් නිකුත් කරමින් දක්වා සිටියේ කොවිඩ් ආසාදනය වී මියගිය අයගේ මළ සිරුරු භූමදානය කිරීමෙන් මහජන සෞඛ්‍යයට තර්ජනයක් නොවන බවයි. ලෝක ප්‍රසිද්ධ වෛරස පිළිබඳ විශේෂඥයකු සහ හොංකොං විශ්ව විද්‍යාලයේ වයිරස අධ්‍යයනාංශයේ සේවය කරන, SARS වෛරසය සොයාගත් කණ්ඩායමේද මූලික විද්‍යාඥයකු වන මහාචාර්ය මලික් පීරිස්ට අනුව "කොවිඩ්-19 යනු ජලයෙන් බෝවන රෝගයක් නොවේ. එසේම එය මෘත දේහ ඔස්සේ බෝවන බවට සාක්ෂියක්ද මට තවම හමුව නැත. වෛරසයකට පැවතිය හැක්කේ ජීවී සෛලයක් තුළ පමණි. මෘත දේහයක් තුළ වෛරසයක රඳා පැවැත්මේ හැකියාව එන්න එන්නටම අඩු වේ. අනෙක් අතට මෘත දේහ ජලයේ භූමදානය කරන්නේ නැත. පොළොවෙන් අඩි හයක් ගැඹුරෙහි හොඳින් ඔතා තබන මෘත දේහයකින් භූගත ජලයට බලපෑමක් වේ යැයි සිතීම අපහසුය." (*World renowned virologist Prof. Malik Peiris refutes claims that burials transmit COVID-19,* 2020)

මෙම භූමදාන ප්‍රතිපත්තිය වැනි තීරණ වලට එරෙහිව විවිධ ව්‍යාපාර ක්‍රියාත්මක වූ නමුත් වසංගත තත්වය තුළ පැවති සංචරණ සීමා නිසා ඒවා ප්‍රකාශයට පත්කිරීමේ අභියෝග මතු විය. වසංගත තත්වයට මුවා වී ආණ්ඩුව විසින් මුස්ලිම් ප්‍රජාවට එරෙහි වෙනස්කොට සැළකීම් ආයතනගත කරමින් සිටි බව ඉතා පැහැදිලි වුවත්, මේ සම්බන්ධයෙන් හඬක් නැගූ ඉතාම ස්වල්පයක් වූ මුස්ලිම් දේශපාලනඥයින් හට යොමුවූයේ ඉතා අඩු අවධානයකි (Ranawana, 2020). කෙසේ වුවත් ජාත්‍යන්තරව මුස්ලිම් රටවල අවධානය මෙම ප්‍රශ්න වලට යොමු වූ බවද පැවසිය යුතුය. විශේෂයෙන්ම මෙම ප්‍රතිපත්ති තීරණ වලට අභියෝග කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමුකරන ලද පෙත්සම් විභාගයට ගැනීම ප්‍රතික්ෂේප කිරීම මුස්ලිම් ප්‍රජාව ජාත්‍යන්තරය වෙත තල්ලු කිරීමේ හැරවුම් ලක්ෂ්‍යය වූ බව කිව හැකිය. වර්ෂ 2020 අප්‍රේල් සහ 2021 ජූනි මාස වලදී ආණ්ඩුවට ලිපි යොමු කරමින් එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවන් කියා සිටියේ භූමදානයට ඉඩදෙන ලෙසත්, මුස්ලිම්වරුන්ගේ හැඟීම් නොසළකා හැරීම තුළින් පසුවට සංකීර්ණතා ඇතිවිය හැකි බවත්ය. 2021 පෙබරවාරි-මාර්තු කාලයේදී පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 46 වන සැසිවාරයේදීද මැද පෙරදිග රටවල් විසින් මෙම ප්‍රශ්නය මතු කරන ලදී. එහිදී ලංකාව පිළිබඳව ඉදිරිපත් වීමට නියමිතව තිබූ මානව හිමිකම් සම්බන්ධ යෝජනාවක් සඳහා මෙම

රටවල් වල සහ පාකිස්ථානයේ සහාය අවශ්‍යව තිබුණි (*Sri Lanka does away with forced cremations after PM Imran Khan reportedly raises issues,* 2021). අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තිය පසුව වෙනස් කිරීම පිටුපස තිබුණේ මෙම යථාර්ථය බව සිතිය හැකිය (Fonseka and Dissanayake, 2021). එහෙත් භූමදානය පිළිබඳව කලින් දැක්වූ කරුණු පිළිබඳව කිසිවකු ඉන්පසු කරදර නොවුණි. කෙසේ වුවත් අවසානයේ භූමදානයට ඉඩ දුන්නේද දුර බැහැර නැගෙනහිර පළාතේ ඔඩ්ඩමාවඩෙයි ගම්මානයේ බව සිහිතබා ගත යුතුය.

පෙරද දැක්වූ පරිදි වසංගත තත්වය තුළ මුස්ලිම් ප්‍රජාව මුහුණ දුන් ඉතා විධිමත් ආකාරයේ වෙනස් කොට සැළකීම් පිළිබඳ සිදුවීම් ප්‍රසිද්ධ හා සමාජ මාධ්‍ය වලට සීමා වූවක් නොව, ආයතනික මට්ටමින්ම ප්‍රතිපත්ති හරහාද දිග හැරුණු යථාර්ථයන් වේ. මෙමගින් ඔවුන්ගේ අයිතීන් උල්ලංඝණය වූවා පමණක් නොව, රටේ වාර්ගික සමගියටද විශාල හානියක් සිදුවුනි. සාවද්‍ය ප්‍රචාරණයන් නිසා ජන කණ්ඩායම් අතර විශ්වාසය තවදුරටත් පළුදු වීම හරහා සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදී හර පද්ධතියෙහි විශාල පසුබැසීමක් සිදු වී ඇති අතර, එනිසා හරයාත්මක ප්‍රජාතන්ත්‍රවාදයට දරුණු තර්ජනයක් එල්ලව තිබේ.

## නිගමනය

ආණ්ඩුවේ යුධ ආඛ්‍යානය සහ කොවිඩ්-19 රෙගුලාසි වල එකතුවෙන්, වෛරසයට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවයක් ඇත්තවුන් සමාජයට තර්ජනයක් ලෙසත්, වෛරසය ආසාදනය වූවන් අපරාධකරුවන් ලෙසත් හංවඩු ගසා ඇත. කොවිඩ් ප්‍රතිචාරය මෙහෙයවීම හමුදාවට භාර දීමත් සමඟ වින්දිතභාවය පිළිබඳ හැඟීම් වැඩි වර්ධනය වී තිබේ. එසේම එම වින්දිතයින් වාර්ගික-ජාතිකවාදී ව්‍යාපෘතිය තුළ බැහැර කළ හැකි කණ්ඩායමක් වශයෙන් සැළකීමද මෙතුළ සිදුව ඇත. 'එක් රටක් - එක් නීතියක්' පිළිබඳ භාෂාවට මුවා වී බහුතරයේ උවමනාවන් පමණක් නියෝජනය කරන ආකාරයේ ප්‍රතිපත්ති, රෙගුලාසි සහ ක්‍රියාවලීන් ඉදිරිපත් කිරීමට ආණ්ඩුවට හැකියාව ලැබී ඇතිවාක් මෙන්ම, ඒවා පිළිගැනීමට සුළුතර කණ්ඩායම් වලට සිදුව ඇත. මෙවැනි පසුබිමක ලංකාවේ කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ මුස්ලිම් ප්‍රජාව ඉලක්ක වූ අයුරු පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් අධ්‍යයනය කෙරුණි.

සිංහල සහ දෙමළ ප්‍රජාවන් මෙන්ම මුස්ලිම් ප්‍රජාවද වසංගතය සමනය කිරීමට යැයි කියමින් හඳුන්වා දුන් රෙගුලාසි වලින් පීඩාවට පත්විය. එසේ වුවත් වාර්ගිකතන්ත්‍ර රාජ්‍ය ව්‍යුහයක් තුළ එම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී මුස්ලිම් ප්‍රජාව විශේෂයෙන්ම දරුණු, අසාධාරණ සහ නින්දාසහගත ආකාරයේ සැළකීම් වලට භාජනය වූ බව පැවසිය යුතුය. එම නිසා ලංකාවේ

කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ මුස්ලිම් ප්‍රජාව ද්විත්ව වින්දිතභාවයට ලක්වූ බව පෙනේ. එහිදී වර්ගවාදී ගණනය කිරීම් මත පදනම්ව කොවිඩ් ප්‍රතිචාරය තීරණය කිරීම සිදුකරන ලද්දේ ඡන්ද දිනාගැනීමේ දක්ෂතාවය සහිත දේශපාලනඥයින් විසින් පමණක් නොව, ශාස්ත්‍රඥයින් සහ ඉහළ සිවිල් සේවයේද එකතුවෙනි.

අර්බුද සමයන්හි සමාජය තුළ එකමුතුකම වැඩිවන බවට වන මතයට පටහැනිව මෙම පරිච්ඡේදයෙන් පෙන්වා දී ඇත්තේ කොවිඩ් වසංගතයට ලංකා ආණ්ඩුව දක්වන ලද ප්‍රතිචාරයෙහි ස්වභාවය නිසා ඇත්තෙන්ම අන්තර් වාර්ගික එකමුතුකමට දැවැන්ත හානියක් සිදු වූ බවයි. සමාජය තුළ පැවති මුස්ලිම් විරෝධී චින්තනය වැඩි වර්ධනය කිරීම මඟින් බලයට පැමිණි රාජපක්ෂ ආණ්ඩුව, මුස්ලිම් ප්‍රජාව වෛරසය පැතිරවීම මඟින් සමාජයට තර්ජනයක් වියහැකි කණ්ඩායමක් බවට මතයක් පැතිරූ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාධරයින්ට ඍජුව හෝ වක්‍රව සහය පල කරන ලදී. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු කොහොමටත් පිරිහෙමින් තිබූ අන්තර් වාර්ගික සබඳතා මෙනිසා වඩාත් දරුණු අතට හැරුණි.

වඩා පුළුල්ව ගත්කළ මෙම පරිච්ඡේදයෙන් පෙන්වා දීමට උත්සහ කරන්නේ ඉතාම දැඩි ලෙස බහුතරවාදී ස්වභාවයක් දරන රාජ්‍ය පද්ධතියක දිග හැරෙන පසුගාමී ආණ්ඩුක්‍රම මාදිලි තුළ සුළුතර කණ්ඩායම් වලට හිමිවන අසමාන තත්වයයි. අතීතයෙන් පාඩම් ඉගෙන ගෙන බහුත්වවේදය සහ ප්‍රජාතන්ත්‍රවාදය සමාජයේ ස්ථාපනය කළ යුතු වුවද, අද වනවිට දැකිය හැකි වන්නේ ඊට සම්පූර්ණ ප්‍රතිවිරුද්ධ තත්වයකි. නීතිය මෙසේ අත්තනෝමතික සහ විශේෂීකරණය වන අන්දමින් භාවිතා කිරීම තුළත්, විධායකයේ බලය අත්‍යන්තයෙන් වැඩිවීම තුළත් ඇත්තෙන්ම සන්නිවේදනය වන්නේ සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී පදනම හායනය වීමේ අන්ත්‍රාවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ

Balasundaram, N. (2016) ‘Sri Lanka: An Ethnocratic State Preventing Positive Peace’, *Cosmopolitan Civil Societies: An Interdisciplinary Journal*, 8 (3), pp. 38-58.

*Buddhist Advisory Council commends President for walking the talk* (2020) *Presidential Secretariat.* Available at: https://www. presidentsoffice. gov.lk/index.php/2020/09/18/buddhistadvisory-council-commends-president-for-walking-the-talk/ (Accessed: 19 June 2021).

Cartoonist Pradeep (2020) Facebook. Available at: https:// www.

facebook.com/CartoonistPradeep/ photos/2808197036062999 (Accessed: 25 June 2021).

Cartoonist Pradeep (2021) Facebook. Available at: https:// www.facebook.com/CartoonistPradeep/ photos/2839047026311333 (Accessed: 25 June 2021).

*CCPSL says no solid evidence indicating burial of COVID-19 victims increased spread of virus* (2021) *Daily FT*. Available at: https://www.ft.lk/news/CCPSL-says-no-solid-evidence-indicating-burial-of-COVID-19-victims-increases-spread-ofvirus/56-710986 (Accessed: 21 June 2021).

*Coronavirus funerals: Sri Lanka's Muslims decry forced cremation*. (2020) *BBC*. Available at: https://www.bbc.com/news/ world-asia-53295551 (Accessed: 05 June 2021).

*Derana TV Chathura's double standards exposed: citizens enraged over racist slurs of Derana TV anchor* (2020) *Colombo Telegraph*. Available at: https:// www.colombotelegraph.com/index. php/derana-tv-chathuras-double-standards-exposed-citizensenraged-over-racist-slurs-of-derana-tv-anchor (Accessed: 20 June 2021).

Fonseka, B. and Dissanayake, U. (2021) 'Sri Lanka's Vistas of Prosperity and Splendour: A Critique of Promises Made and Present Trends', *Centre for Policy Alternatives*. Available at: https://www.cpalanka.org/wp-content/uploads/2021/07/ Sri-Lankas-Vistas-of-Prosperity-and-Splendour-A-Critiqueof-Promises-Made-and-Present-Trends.pdf (Accessed: 22 July 2021).

*Full-Video of Army Commander speaks to Indeewari Amuwatte on battle against COVID-19 @HydePark* (2020) *Ada Derana*. Available at: https:// www.youtube.com/watch?v=cJbQNnzoEx0 (Accessed: 20 June 2021).

*Gotabaya named as SLPP's presidential candidate* (2019) *Daily Mirror*. Available at: https://www.dailymirror.lk/top_ story/Gotabaya-named-as-SLPP%E2%80%99s-PresidentialCandidate/155-172682 (Accessed: 18 June 2021).

Kadirgamar, A. (2013) 'The Political Economy of Anti-Muslim Attacks', *Colombo Telegraph*, 03 March. Available at: https:// www.

colombotelegraph.com/index.php/the-politicaleconomy-of-anti-muslim-attacks/ (Accessed: 10 June 2021).

Kumarasinghe, U. (2016) 'The Genesis of Sinha le', *Sunday Observer*, 31 January. Available at: http://archives.sundayobserver.lk/2016/01/31/fea14.asp (Accessed: 10 June 2021).

Marsoof. A. (2020) 'Debunking The Claim Against Burial Of Covid-19 Victims: A Response To Professor Vithanage', *Colombo Telegraph*, 12. Available at: https://www. colombotelegraph.com/index.php/debunking-the-claimagainst-burial-of-covid-19-victims-a-response-to-professorvithanage/ (Accessed: 21 June 2021).

Mayberry. (2019) 'Suspicion stalks Sri Lanka's Muslim community after bombings', *Aljazeera*, 26 April. Available at: https:// www.aljazeera.com/news/2019/4/26/suspicion-stalks-srilankas-muslim-community-after-bombings (Accessed: 15 June 2021).

*New party aims to safeguard Sinhala identity* (2016) *Daily Mirror*. Available at: https://www.dailymirror.lk/102081/newparty-aims-to-safeguard-sinhala-identity (Accessed: 10 June 2021).

*President pardons Gnanasara Thero* (2019) *Daily FT*. Available at: https://www.ft.lk/front-page/President-pardonsGnanasara-Thero/44-678714 (Accessed: 15 June 2021).

Ranawana, A. (2020) 'Showing no compassion towards Muslim sentiments is shameful and dangerous', *Economynext*, 18 December. Available at: https://economynext.com/ showing-no-compassion-towards-muslim-sentiments-isshameful-and-dangerous-77047/ (Accessed: 18 July 2021).

Reicher, S. and Stott, C. (2020) 'On order and disorder during the COVID-19 pandemic', *British Journal of Social Psychology*, 59, pp. 694–702.

*Small fear whether the dead bodies with the virus can be used as biological weapons – Dr. Channa Perera tells BBC* (2020) *BBC*. Available at: Small fear whether the dead bodies with the virus can be used as biological weapons - Dr. Channa Perera tells BBC https://english.theleader.lk/news/690-small-fear-whetherthe-dead-bodies-with-the-virus-can-be-used-as-biologicalweapons-dr-channa-perera-tells-bbc

(Accessed: 05 June 2021).

'Socio-Economic Index in the face of COVID-19' (2021) *Centre for Policy Alternatives*, 30 June. Available at: https://www. cpalanka.org/ socio-economic-index-in-the-face-of-covid-19/ (Accessed: 30 June 2021).

*Sri Lanka can bury COVID-19 victims: SLMA* (2021) *Newsfirst*. Available at: https://www.newsfirst.lk/2021/01/03/srilanka-can-bury-covid-19-victims-slma/ (Accessed: 21 June 2021).

*Sri Lanka does away with forced cremations after PM Imran Khan reportedly raises issues* (2021) *The International News*. Available at: https://www. thenews.com.pk/latest/796072-sri-lankadoes-away-with-forced-cremations-after-pm-imran-speaksabout-minority-muslims (Accessed: 14 July 2021).

*Sri Lanka election: Rajapaksa brothers win 'super-majority'* (2020) *BBC*. Available at: https://www.bbc.com/news/worldasia-53688584 (Accessed: 18 June 2021).

*Sri Lanka extends indefinite curfew to Kandy and Puttlam, Akurana under lockdown* (2020) *Economynext*. Available at: https:// economynext.com/sri-lanka-extends-indefinite-curfewto-kandy-and-puttalam-akurana-under-lockdown-62832/ (Accessed: 20 June 2021).

*Sri Lanka investigates troops over 'humiliation 'of Muslims* (2021) *Aljazeera*. Available at: https://www.aljazeera.com/ news/2021/6/21/sri-lanka-investigates-troops-overhumiliation-of-muslims (Accessed: 21 July 2021).

*Sri Lanka: Preliminary findings of Country Visit to Sri Lanka by the Special Rapporteur on freedom of religion or belief* (2019) *United Nations Office of the High Commissioner*. Available at: https:// www.ohchr.org/ EN/NewsEvents/Pages/DisplayNews. aspx?NewsID=24918 (Accessed: 15 June 2021).

*Sri Lankan Parliament dissvolved; elections set for April* (2020) *Al Jazeera*. Available at: https://www.aljazeera.com/ news/2020/3/2/sri-lankan-parliament-dissolved-electionsset-for-april (Accessed: 20 June 2021).

Srinivasan, M. (2019) 'Gotabaya wins in presidential poll', *The Hindu*, 17

November. Available at: https://www.thehindu. com/news/international/gotabaya-rajapaksa-wins-srilankan-presidential-election-official-results/article29998767. ec (Accessed: 17 June 2021).

Strong, P. (1990) 'Epidemic psychology: a model', *Sociology of Health*, 12(3). pp. 249-259.

*The appointment of the two presidential task forces* (2020) *Centre for Policy Alternatives*. Available at: https://www.cpalanka.org/ the-appointment-of-the-two-presidential-task-forces/#_ftn1 (Accessed: 20 June 2021).

Thiruvarangan, M. (2020) 'Sri Lanka Elections: The SLPP's formidable majority doesn't bode well for pluralism', *The Wire*, 10 August. Available at: https://thewire.in/south-asia/ sri-lanka-podujana-peramuna-elections-rajapaksa-sinhalastamils (Accessed: 18 June 2021).

*World renowned virologist Prof.Malik Peiris refutes claims that burials transmit COVID-19 – Island* (2020) *Newswire*. Available at: https://www. newswire.lk/2020/12/15/world-renownedvirologist-prof-malik-peiris-refutes-claims-that-burialstransmit-covid-19-islan/ (Accessed: 21 June 2021).

Zuhair, A. (2016) 'Dynamics of Sinhala Buddhist Ethno nationalism in Post-War Sri Lanka', *Centre for Policy Alternatives*. Available at: https://www.cpalanka.org/wp-content/ uploads/2016/04/ Dynamics-of-Sinhala-Buddhist-EthnoNationalism-in-Post-War-Sri-Lanka.pdf (Accessed: 10 June 2021).

6

# නිදහස්-නොවන-අධ්‍යාපනයඃ වසංගත සන්දර්භයෙහි ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය-පුරවැසි සම්බන්ධතා

*හසිනි ලේකම්වසම්*

## හැඳින්වීම

කොවිඩ්-19 වසංගතය මානව සංහතිය මුහුණ දෙන වඩාත්ම බැරෑරුම් අභියෝග වලින් එකක් බවට පත්වෙමින් පවතී. ඊට ප්‍රතිචාර දැක්වීමේ පීඩනය ලොව පුරා ආණ්ඩු වලට සෞඛ්‍යමය, සංවිධානාත්මක, ආර්ථිකමය සහ සමාජමය යන සියළු ආකාර වලින් දැනෙන්නට පටන්ගෙන තිබේ. එහෙත් මෙම පීඩනයන් විවිධ රටවලට දැනෙන්නේ විවිධ ප්‍රමාණයන්ටය. එම වෙනස ප්‍රධාන වශයෙන්ම තීරණය වන්නේ ඔවුන් සතුව පවතින සම්පත්, විශේෂයෙන්ම ආර්ථික සම්පත් වල ප්‍රමාණය මත වේ. වෛරසයේ බලපෑම සියල්ලන්ට එක හා සමාන වුවත්, කවුරුන් ඊට වැඩිපුර නිරාවරණය වන්නේද යන කාරණයේදී, සමාජ-ආර්ථික කරුණු නිසා දියුණු වෙමින් පවතින ලෝකයේ රටවල් වැඩි අවදානමක පවතින බව හඳුනාගත හැකිය.

දරුණු ආර්ථික පීඩා වලින් බැට කමින් සිටි තුන්වන ලෝකයේ රටක් වශයෙන් ශ්‍රී ලංකාව මුල සිටම කොවිඩ්-19 වසංගතයේ සමාජ-ආර්ථික ප්‍රතිවිපාක වලට වැඩියෙන් නිරාවරණය වී තිබුණකි. ආර්ථිකයේ පටන් සියළුම අංශ වල මෙම බලපෑම පැහැදිලිව දැකගත හැකි වූ අතර, එහිදී අවිධිමත් ආර්ථිය කඩා වැටුනු අයුරු කැපී පෙනේ. සංචරණ සීමා නිසා සිය දෛනික ආදායම අහිමි වූ බොහෝ පිරිසක් සඳහා සහනාධාර ලබාදීමේ පැහැදිලි ක්‍රමවේදයක් විශේෂයෙන්ම 2020 අගෝස්තු මාසයේ මහ මැතිවරණයට පසු දක්නට නොවුනි. මෙම කඩාවැටෙන ගෘහස්ථ ආර්ථිකයන්ගේ බලපෑම

වෙනත් මාර්ගයන්ගෙන් ප්‍රකාශයට පත්වූ අයුරු හඳුනාගත හැකි විය. ඒ අතර කොවිඩ්-19 සෞඛ්‍ය රෙගුලාසි උල්ලංඝණය කරමින් ආදායම් මාර්ග සොයා සංචරණය කිරීම, ගෘහස්ථ හිංසනයේ වැඩිවීම සහ, මූලික පැවැත්ම සඳහා වන වියදමවත් දැරිය නොහැකි නිවෙස් වල අධ්‍යාපන කටයුතු කඩාකප්පල් වීම වැනි කාරණා අඩංගුය.

මෙම පසුබිම තුළ මගේ අවධානය යොමු වන්නේ වසංගතය නිසා සාපේක්ෂව අඩුවෙන් බලපෑමට ලක්වූ අධ්‍යාපන ක්ෂේත්‍රයටයි. බොහෝ අභියෝග මධ්‍යයේ වුවද වසංගත සමය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රය අනෙක් ඒවාට සාපේක්ෂව සිය කටයුතු දිගටම කරගෙන ගිය බව පැහැදිලි කරුණකි. මෙහිදී 'නිදහස් අධ්‍යාපනය' යන රාමුව තුළ සිට මා විභාග කිරීමට බලාපොරොත්තු වන්නේ ලංකාවේ රාජ්‍ය-පුරවැසි සම්බන්ධතාවය වසංගතය මඟින් බලපෑමට ලක් කළේ කෙසේද යන්නයි. මාර්ගගත ක්‍රමය තුළ අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගැනීමේ හැකියාව පෞද්ගලික ක්‍රය ශක්තිය මත තීරණය වන පසුබිමක, සමානාත්මතාවයට නිදහස් අධ්‍යාපනයේ ඇති කැපවීම තවදුරටත් එසේම පවත්වා ගත හැකිද යන්න මා මතු කරන මූලික ගැටළුවක් වේ. එහිදී පුරවැසියා සම්බන්ධ රාජ්‍ය වගකීමට කුමක් සිදුවන්නේද යන්න පිළිබඳ විමසීම මගේ අරමුණයි. මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශ වීමේදී ඇතිවන අසමානතා දුරලීමට රාජ්‍යය මැදිහත්වීමක් නොකරන තත්වයක් තුළ නිදහස් අධ්‍යාපනයේ ප්‍රජාතන්ත්‍රවාදී හරය කෙමෙන් වියැකී යන බවත්, එම නිසා එය තවදුරටත් නිදහස් අධ්‍යාපනය වීමට හැකියාවක්ද නැති බවත් මගේ තර්කය වේ.

මෙම තත්වයේ ඇති භයානකම ප්‍රවණතාව වන්නේ අපට ලැබීමට අධිකාරයක් ඇති දේ සහ, 'යහපත් ජීවිතය' වශයෙන් අප පෞද්ගලිකව තේරුම් ගන්නා ජීවිතය ළඟා කරගැනීමට අපට අත්‍යාවශ්‍ය වන දේට ප්‍රවේශය මුදල් මඟින් සම්බන්ධීකරණය වීමේ තත්වය සාමාන්‍යකරණය වීමය. මාර්ගගත අධ්‍යාපනය යනු මෙම වසංගත තත්වයට සුවිශේෂී වූ කාරණයක් නොව, අධ්‍යාපනයේ පෞද්ගලීකරණය යන වඩා පුළුල් යථාර්ථය තුළ අරුත් ගැන්වෙන කරුණක් බව අප සිහිතබා ගත යුතුය. මාර්ගගත අධ්‍යාපනයේ මෙන්ම පෞද්ගලීකරණයේද මූලික තර්කනය මුදල් මත පදනම් වේ. මෙම මාර්ගයේ දිගටම ගමන් කළහොත් වඩ වඩාත් පෞද්ගලීකරණය වූ අධ්‍යාපන මාදිලි වලට වැඩි පිළිගැනීමක් ලැබෙනු ඇත. එය දැනට ආරම්භ වී තිබෙන්නේ නිදහස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශය මූල්‍යකරණය වීම තුළිනි.

මෙම පරිච්ඡේදය ගොඩනැගීම සඳහා උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන්නකු වශයෙන් මගේ පෞද්ගලික අත්දැකීම් මෙන්ම, මෙම ගැටළු පිළිබඳ සාකච්ඡා කරන මණ්ඩප කිහිපයකට සහභාගී වීමෙන් මා නිරාවරණය වන ලද අදහස්ද යොදා ගන්නා ලදී. ඊට අමතරව විකල්ප

ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන Social Indicator මඟින් සිදුකරන ලද 'Socio-Economic Index in the Face of COVID-19' සමීක්ෂණයෙහි සොයාගැනීම් හා, මෙම ගැටළු සම්බන්ධයෙන් ක්‍රියාකාරී වන පුද්ගලයින්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පිරිස් සහ සිසුන්ගේ පවුල් වල අය හා සිදුකරන ලද ගුණාත්මක සාකච්ඡා කිහිපයක්ද යොදා ගැනුණි. පරිච්ඡේදය ගොඩනගා ඇත්තේ පළමුව ලාංකේය අධ්‍යාපනය හා වසංගතයට පෙර සිටම එහි සිදුවෙමින් පැවති වෙනස්කම් පිළිබඳ ආවර්ජනයක්ද, ඉන්පසුව වසංගත තත්වය තුළ අධ්‍යාපනය මුහුණ දුන් අභියෝග පිළිබඳ විස්තරයක්ද, අවසාන වශයෙන් මෙම ප්‍රවණතා මඟින් වඩා පුළුල්ව ගම්‍යමාන වන කරුණු පිළිබඳ සාකච්ඡාවක් හා නිගමන කිහිපයක්ද වශයෙනි.

## ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධ ඉතිහාසය

ශ්‍රී ලංකාවට නිදහස් අධ්‍යාපනය හඳුන්වා දෙන්නේ බොහෝ කොටම දෘෂ්ටිවාදීමය ව්‍යාපෘතියක් වශයෙනි. එමඟින් අරමුණු කරන ලද්දේ අධ්‍යාපනය සහ ඒ හරහා ලැබෙන ජීවන අවස්ථා වලට ප්‍රවේශය ලබාගැනීමේදී සමාජ-ආර්ථික වෙනස්කම් තුළින් පමුණුවන බාධා රාජ්‍යයේ මැදිහත් වීමෙන් අවම කිරීමයි. සමාජ අසමානතා අවම කිරීමේ සමානාත්මතාවාදී දෘෂ්ටිවාදයක් වශයෙන් එමඟින් අවාසි සහගත තත්වයක සිටි බොහෝ සමාජ කණ්ඩායම් වලට සමාජ සංචලතාවය සඳහා අවස්ථාව පාදා දෙන ලද්දේ නීතිය සහ වෛද්‍ය වෘත්තිය වැනි සමාජයේ පිළිගැනීමට ලක්වූ වෘත්තීන් වලට ප්‍රවේශය සලසා දීමෙනි (Jayasuriya, 1969, p. 170). එවක අධ්‍යාපන විධායක ඇමතිව සිටි සී.ඩබ්.ඩබ්. කන්නංගර මැතිඳුන්ගේ ප්‍රධානත්වයෙන් ඇරඹි මෙම ක්‍රමය, පශ්චාත් යටත්විජිත ලංකාවේ සමාජ මට්ටම්කරණයට වැඩියෙන්ම දායක වූ සාධකය මෙන්ම, අධ්‍යාපනය ඇත්තන්ගේ වරප්‍රසාදයක් බවට වන වැටහීම නැති කළ කාරණය වශයෙන්ද ඉතා වැදගත් වේ (Amarakeerthi, 2020). එහි ප්‍රජාතන්ත්‍රවාදී ජීව ගුණය මඟින් සමාජයේ ආන්තීකරණයට ලක්වූ කණ්ඩායම් බලගැන්වූ අතර, පුරවැසිභාවය භෞතිකව අර්ථ ගැන්වූ සාධකයක් බවට ඒ හරහා නිදහස් අධ්‍යපානය පත්වන ලදී. එහි මූලිකම අරමුණ වූයේ තමා ජීවත් වන පරිසරය පිළිබඳව පාරන්‍යායාත්මක සහ දේශපාලනික දැනුමක් මෙන්ම, විවේචනාත්මක විඥානයක්ද සිසුවා තුළ වර්ධනය කිරීමයි (Sivamohan, 2021).

එහෙත් නිදහස් අධ්‍යාපනයේ මෙම මුඛ්‍ය අරමුණ මෑත කාලීනව යම් ආකාර පීඩනයකට ලක්වෙමින් පවතී. දීර්ඝ කාලයක් තිස්සේ ඔඩු දුවමින් ඇති ආර්ථික අර්බුද නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව වැනි ආයතන වලින් ණය ලබාගැනීමට ශ්‍රී ලංකාවට සිදුවී ඇත. මෙවැනි ආකාරයේ ණය ලබාදෙන්නේ යම් යම් කොන්දේසි මත වන අතර,

එය අධ්‍යාපනයටද පොදු කාරණයකි. එම කොන්දේසි වලට අනුව නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් රාජ්‍යයට දරන්නට සිදුවන බරපැන අඩුකළ යුතුවාක් මෙන්ම, දිගු කාලීනව රාජ්‍ය අංශයෙහි ප්‍රමාණය හකුළුවා දැමීමද සිදුකළ යුතුය. එසේම වෙළඳපොළ ඉල්ලුමට සැපයුමක් වන ආකාරයේ උපාධිධාරීන් සම්පාදනයද මෙම කොන්දේසි අතර වේ (Punchi, 2001; Perera, 2021). මේ සියල්ල ආර්ථික වර්ධනයේ නාමයෙනි.

මෙම වෙනස්කම් තුළින් සන්නිවේදනය වන්නේ 'නව ලිබරල්වාදය' යි. නව ලිබරල්වාදය සමහරක් අවස්ථා වල ආර්ථික වර්ධනය අරමුණු කරගත් ප්‍රතිපත්ති පැකේජයක් ලෙසත්, තවත් අවස්ථා වල ආක්‍රමණශීලී ආඥාදායක ප්‍රාග්ධනයේ මෙවලමක් ලෙසත්, තවත් අවස්ථා වල ඇත්තන් විසින් නැත්තන් සූරාකෑම තුළින් ධනය රැස්කර ගන්නා ව්‍යාපෘතියක් ලෙසත් සහ, තවත් අවස්ථා වල ප්‍රතිව්‍යාප්තකරණයට, ප්‍රජාතන්ත්‍රකරණයට සහ සමාජ සුබසාධනයට ප්‍රතිරෝධය දක්වන සදාචාර විරෝධී දේශපාලන-ආර්ථික ව්‍යාපෘතියක් ලෙසත් හඳුන්වා දී තිබේ (Venugopal, 2015). මගේ වටහා ගැනීම නව ලිබරල්වාදයට එල්ලව ඇති වාමාංශික විවේචනය හා සමපාත වන්නකි; එනම්, එය ප්‍රාග්ධනයේ වැඩි වර්ධනය අරමුණු කරගත් චේතාන්විත, ඉතාම දේශපාලනික මෙන්ම (එනම් අසමානත්වය හා ඊට අදාළ බල සම්බන්ධතා මත පදනම් වූ), ඉතාම නිර්දේශපාලනික (එනම් වෙළඳපොළ අච්චුවට සමස්ත සමාජය සජාතීකරණය කිරීමට ප්‍රයත්න දරන) ව්‍යාපෘතියක්ය යන්නයි.

අධ්‍යාපනය තුළදී නව ලිබරල්වාදයෙන් අරමුණු කරන වෙනස අධ්‍යාපනයෙහි හරය හා ආයතනික ව්‍යුහය යන දෙකටම අදාළ වේ. හරයාත්මකව ගත්විට වෙළඳපොළ උවමනා එපාකම් මත පදනම්ව අධ්‍යාපනය වෙනස් කිරීම අ). අදාළ කුසලතා ලබාදීම (Perera, 2021) සහ ආ). වගකීම් සහගත, එනම් තමා ගැන තමාට බලාගත හැකි පුද්ගලයෙක් බිහිකිරීම තුළින් සිදුවේ. මෙම චින්තනය තුළ ආරක්ෂාව, සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි සමාජ අවශ්‍යතාවන් සපුරාලීමෙහි ලා රාජ්‍යයට තවදුරටත් වගකීමක් නොපවතින අතර, පුද්ගලයන්, ව්‍යාපාර, සංවිධාන, පාසල්, රෝහල් සහ දෙමව්පියන් වැනි ක්ෂුද්‍ර මට්ටමේ ඒකක මඟින් තම තමා පෞද්ගලිකව එම වගකීම දැරීමත්, එසේ දැරීමට ආශා කිරීමත් අපේක්ෂා කෙරේ (Davies and Bansel, 2007, p. 251). ආයතනික ව්‍යුහය ආශ්‍රයෙන් සැළකූ කළ නව ලිබරල්වාදයෙන් අරමුණු කරන්නේ රාජ්‍ය අධ්‍යාපනය සඳහා දරන පිරිවැය අඩු කිරීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කලින් පොදු සමාජ යහපත සඳහා අත්‍යාවශ්‍ය යැයි වටහාගෙන තිබූ මහජන අධ්‍යාපනය, වෙළඳපොළෙහි කොටසක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීම සිදුවේ (එම, p. 254).

ලංකාවේ තෘතීයික අධ්‍යාපනය දැනට දශක දෙකක් පමණ මුළුල්ලේ මෙවැනි විපරිවර්තන වලට මුහුණ දෙමින් සිටින බව සිහිතබා ගත යුතුය (Perera, 2021). වසංගතය නිසා සිදුවන ලද වෙනස්කම් අප තේරුම් ගත යුත්තේ මෙම පසුබිම සිත් දරාගෙනය. එහිදී මාර්ගගත අධ්‍යාපන ක්‍රමයට සිදුවූ මාරුව හුදෙකලා සිදුවීමක් නොව, මෙම වඩා පුළුල් පරිවර්තනයන්ට අදාළ සන්දර්භයේ සිදුවූවක් බව පෙනී යයි.

## කොවිඩ්-19 තත්වය යටතේ අධ්‍යාපනය

මතුපිටින් බැලූ විට අනෙක් ක්ෂේත්‍ර වලට සාපේක්ෂව අධ්‍යාපනය කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක්වූයේ අවම වශයෙන් බව සිතිය හැකිය. ඒ, නිවසේ සිට වැඩ කරන මාදිලියට අනුවර්තනය වීමට ඊට තිබූ සාපේක්ෂව වැඩි හැකියාව නිසාය. එසේ වුවත් මෙම ආකාරයේ සාර්ව මට්ටමේ ඇගයීම් වලදී සාමාන්‍යයෙන් සිදුවන්නාක් මෙන් මෙහිදීද ක්ෂුද්‍ර මට්ටමේ බොහෝ අපහසුතා මඟහැරී යාමේ ප්‍රවණතාවයක් පවතී. මෙම කොටස තුළ මා බලාපොරොත්තු වන්නේ අධ්‍යාපනය ලබාදෙන්නන් සහ ලබාගන්නන් යන දෙකොට්ඨාශය විසින් වසංගත තත්වය තුළ භාවිතා කරන ලද විවිධ ක්‍රම සහ, තෘණමූල මට්ටමේදී ඒවායෙහි බලපෑම මූලික වශයෙන් හඳුනා ගැනීමයි.

### *ක්‍රමෝපායන්*

වෛරසය පාලනය කිරීම සඳහා ලොව පුරා ගන්නා ලද පියවර අතර රටවල් අගුළු දැමීම් සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගන්නා වෙනත් ක්‍රම ප්‍රධාන විය. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ රටවල පාසල් හා විශ්ව විද්‍යාල වසා දැමුනු අතර, අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යෑම සඳහා මාර්ගගත ක්‍රම වලට යොමුවන ලදී (Toquero, 2020). මෙම හදිසි මාරුවෙහි ස්වභාවය නිසා එය ඇත්තෙන්ම හැඳින්වෙන්නේ ‘මාර්ගගත ඉගෙනුම’ ලෙස නොව ‘අර්බුද ඉගෙනුම’ ලෙසයි (Pace et al., 2020). මෙම මාර්ගගත ක්‍රම කොතරම් දුරට යොදාගත්තේද යන්න සන්දර්භයෙන් සන්දර්භයට වෙනස් වන කරුණකි. නිදසුනක් ලෙස OECD සංවිධානයෙන් වසංගත තත්වයට ලොව පුරා අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් දක්වන ලද ප්‍රතිචාර පිළිබඳ 2020 දී පල කරන ලද වාර්තාවකට අනුව ඔස්ට්‍රේලියාව වැනි රටවල් පූර්ණ පහසුකම් සහිතව කඩිනමින් මාර්ගගත ක්‍රම වලට යොමු වූවත්, ඊට සාපේක්ෂව අඩුවෙන් සංවර්ධනය වූ රටවල් වල යොදාගත් ක්‍රමෝපායන් වඩා අවිධිමත් විය. ආජන්ටිනාව හොඳ උදාහරණයකි; එම රටෙහි ගුරුවරු සිය සිසුන් අතර වඩාත්ම අනතුරට ලක්විය හැකි මට්ටමේ අය වෙනුවෙන් මාරුවෙන්

මාරුවට පාසලට පැමිණ ඉගැන්වීම් කටයුතු සිදුකිරීමත්, සමහර අවස්ථා වල ආහාර පානාදිය පවා ලබා දීමෙනුත් උපකාර කොට ඇති අතර, ඊට අමතරව අනෙක් සිසුන් වෙනුවෙන් මාර්ගගත ක්‍රම හරහාද ඉගැන්වීම් කටයුතු සිදුකර තිබේ. එම වාර්තාවේම දැක්වෙන පරිදි බෙල්ජියම සහ ඊශ්‍රායලය වැනි රටවල මාර්ගගත ක්‍රම වලට ප්‍රවේශය ලබාගැනීමට අපහසු සිසුන් සඳහා ජාතික රූපවාහිනී නාලිකා හරහා විෂය නිර්දේශ ආවරණය කිරීම සිදුකර ඇත (එම).

ලංකාවේද මෙවැනි ක්‍රමෝපායන් කිහිපයක සම්මිශ්‍රණයක් භාවිතා කෙරේ. එහිදී රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ මාර්ගගත ක්‍රමයට ඉගැන්වීමේ පහසුකම් වැඩියෙන්ම සලසා දී ඇත්තේ තෘතීයික මට්ටමේ බව කිව හැකිය. ආයතනික මට්ටමින් ස්ථාපනය කරන ලද මාර්ගගත පද්ධති හරහා අධ්‍යාපන කටයුතු දිගටම කරගෙන යාම එහිදී දක්නට හැකිවිය. ද්විතියික අධ්‍යාපනය මෙවැනි ආකාරයේ පහසුකම් සැලසීමට තරම් මධ්‍යගතකරණය කොට නොමැති නිසා බොහෝ පාසල් වලට සිදුව ඇත්තේ විකල්ප ක්‍රම සොයාගැනීමටය. කෙසේ වුවත් මෙම මට්ටම් දෙකටම පොදු ප්‍රවණතාවයක් වන්නේ අධ්‍යාපන කටයුතු වලට ප්‍රවේශය ලබාගැනීම සඳහා සිසුන්ට මෙන්ම ගුරුවරුන්ටද අවශ්‍ය කරන්නා වූ අන්තර්ජාල හා අනෙකුත් තාක්ෂණික පහසුකම් ඇති බවට පූර්ව උපකල්පනයක් කොට තිබීමයි. විශේෂයෙන්ම ද්විතියික මට්ටමේ ගුරුවරුන්ට මේ අරබයා ඇති අභියෝග වඩා අධික බව සිතිය හැක්කේ ආයතනික උපකාර ඔවුන්ට අවමයෙන් හිමිවීම නිසාය.

සම්පත් බෙදී යාම සම්බන්ධව දරුණු විෂමතා පවතින මෙවැනි පසුබිමක මෙම ක්‍රමෝපායන් වල සාර්ථකත්වය සැළකිය යුතු තරම් දුරට අඩු වූ බව ඒ අනුව පැහැදිලිය. නිදසුනක් ලෙස කලින් සඳහන් කළ සමීක්ෂණයට අනුව ජාතික නියැදිය තුළ පාසල් යන වයස් කාණ්ඩයේ 4% කගේ සහ තෘතීයික අධ්‍යාපනය ලබන වයස් කාණ්ඩයේ 0.9% කගේ අධ්‍යයන කටයුතු වසංගතයේ පළමු රැල්ල තරම් කලින් අවස්ථාවකදීම සම්පූර්ණයෙන් ඇණහිට තිබුණි (කරුණාකර ඇමුණුම් අංක 3 හි 45 සහ 46 වගු බලන්න).

විද්‍යුත් උපකරණ වලට ඇති ප්‍රවේශය පිළිබඳ සමීක්ෂණ දත්ත වලින් මේ පිළිබඳ වඩා පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය. නියැදියෙන් (එනම් කුටුම්බය තුළ ප්‍රාථමික, ද්විතියික හෝ තෘතීයික අධ්‍යාපනයේ නියැලෙන්නන් සහිත පවුල් වලින්) අඩකට වැඩි පිරිසක් මාර්ගගත අධ්‍යාපනයට ප්‍රමාණවත් තරම් විද්‍යුත් උපකරණ තමන්ට පවතින බව පැවසුවද, 31.5% ක ප්‍රමාණයක් එකී විද්‍යුත් උපකරණ පවුලේ අනෙක් අය සමඟ හවුලේ භාවිතා කිරීමට සිදුවන බවත්, 5.6% ක් එම විද්‍යුත් උපකරණ බාහිරින් ඉල්ලා ගැනීමට සිදුවූ බවත් පවසන ලදී. 2% ක් පැවසූයේ මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමට තමන්ට කිසිදු ප්‍රවේශයක් නොමැති බවයි (කරුණාකර ඇමුණුම් අංක 3 හි

49 වගුව බලන්න). මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමට අවශ්‍ය කරන්නා වූ අන්තර්ජාල සම්බන්ධතාවයන් සහ මූල්‍ය සම්පත් පිළිබඳවද මීට සමාන රටා පිළිබිඹු විය (කරුණාකර ඇමුණුම් අංක 3 හි 50 සහ 51 වගු බලන්න).

සමීක්ෂණයේ මූලික වාර්තාවට අනුව ('Socio-Economic Index in the face of COVID-19', 2021) මෙම කරුණු අරබයා ග්‍රාමීය සහ නාගරික අංශ දෙකේ පැහැදිලි වෙනසක් දැකගත හැකිය. විද්‍යුත් උපකරණ, අන්තර්ජාල සම්බන්ධතාවයන් සහ මූල්‍ය සම්පත් යන කරුණු සම්බන්ධයෙන් ගත්කළ සමස්තයක් වශයෙන් නාගරික ප්‍රතිචාරකයන්ට ග්‍රාමීය ප්‍රතිචාරකයන්ට වඩා හැකියාවක් ඇති බව පෙනුණි (p. 18). රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ ද්විතීයික සහ තෘතීයික තල වල අති බහුතරය ග්‍රාමීය සිසුන් වන නිසා මෙම දුෂ්කරතා ඔවුන්ට අදාළ වීමේ ප්‍රවණතාව සමීක්ෂණයෙන් පෙන්නුම් කරනවාටද වඩා අධික බව සිතිය හැකිය.

මෙහිදී වැදගත් වන්නේ සංඛ්‍යාත්මක අගයන් නොවන බවද සැළකිය යුතු කරුණකි. සමානාත්මතාවයට කැප වන බව පවසා ඇති අධ්‍යාපන පද්ධතියක් තුළින් ගම්‍ය වන්නේ සමාන ප්‍රවේශයයි. එම ප්‍රවේශය ලබාගැනීමේදී සම්පත් හිඟතාවය නිසා එක් අයකු හෝ මඟ හැරේ නම් සමානාත්මතාවයට කැප වී ඇති පද්ධතියේ වඩා පුළුල් සදාචාරාත්මක කැපවීම් උල්ලංඝණය වූ බව නිගමනය කිරීමට සිදුවේ.

මෙවැනි අතිශය අසමාන පසුබිමක් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා විවිධ ගුරු-සිසු කණ්ඩායම් විසින් විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරනු ලැබේ. ද්විතීයික අධ්‍යපාන පද්ධතිය තුළ සේවය කරන ගුරුවරුන් කිහිප දෙනෙකු සමඟ පැවැත්වූ කණ්ඩායම් සාකච්ඡාවකදී අනාවරණය වූයේ පාසල නාගරික එකක්ද නැතිද යන කරුණ මත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කොතරම් දුරට මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුකළ හැකිද යන්න තීරණය වන බවයි[1]. මෙම කරුණ සමීක්ෂණයේ සොයාගැනීම් සමඟද සමපාත වන්නේ ඉහතින් දක්වා ඇති පරිදි ග්‍රාමීය සහ නාගරික අංශ දෙක අතර පැහැදිලි වෙනසක් එහිදීද හෙළි වූ නිසාය (කරුණාකර ඇමුණුම් අංක 3 හි 49, 50 සහ 51 වගු බලන්න). මාර්ගගතව පැවැත්වෙන පන්ති වලට සහභාගී වන සිසුන් ප්‍රමාණය, ගුරුවරුන්ට එම පන්ති සඳහා ඇති ප්‍රවේශය කොතරම් පහසුද යන කාරණය මෙන්ම, ගුරු-දෙගුරු රැස්වීම් වැනි ද්විතියික කරුණු කොතරම් දුරට සිදුවනවාද යන ඒවා අරබයා මෙම වෙනස පැහැදිලිව දක්නට තිබුණි.

1 මාතර සහ කළුතර ගුරුවරුන් සමඟ කණ්ඩායම් සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 27.

ඉහත සාකච්ඡාවේදී ග්‍රාමීය පාසලක ගුරුවරියක් පැවසූයේ සිය පන්ති පැවැත්වීම සඳහා සෑම දිනකම පැය 6 ක් වැනි කාලයක් යාබද වැවක් ආසන්නයේ සිටගෙන සිටීමට තමාට සිදුවන බවයි. ඒ, මාර්ගගතව පන්තියක් පැවැත්වීමට අවශ්‍ය තරම් සංඥා ලැබෙන අවට පරිසරයේ එකම තැන එය වන බැවිනි. කුමන ක්‍රමයකින් හෝ විෂය නිර්දේශය සම්පූර්ණ කිරීමට ඔවුන් වෙත එල්ල වන පරිපාලනමය පීඩනය නිසා මෙවැනි තීරණ ගැනීමට ගුරුවරුන්ට සිදුවන බව පැවසුණි. එසේම ග්‍රාමීය සහ නාගරික දෙඅංශයේම පාසල් ගුරුවරු පැවසූයේ මෙම අභියෝග මධ්‍යයේම වෙසක් උත්සවය සඳහා මාර්ගගත සංස්කෘතික උළෙලවල් සංවිධානය කිරීමටද යම් පීඩනයක් එල්ල වූ බවයි. භක්ති ගීත ගායනය වැනි සජීවීව එකවිට සිදුවන ක්‍රියාකාරකම් මෙන්ම, සිසුන්ගේ නිවෙස් වල වෙසක් සැමරුම් ඡායාරූප ගෙන්වා ගැනීම වැනි එකවිට සිදුනොවන ක්‍රියාකාරකම්ද ඒ අතර විය.

කෙසේ වුවත් ප්‍රාථමික පාසලක් සහ උසස් පෙළ දක්වා පන්ති පැවැත්වෙන පාසලක විදුහල්පතිවරුන් දෙදෙනෙකු සමඟ පැවැත්වූ සාකච්ඡා දෙකකදී එවැනි පීඩනයක් පිළිබඳ තොරතුරු ලබාගැනීමට නොහැකි විය[2]. මාර්ගගත ක්‍රමයේ ඇති දුෂ්කරතා පිළිගන්නා අතරම ඔවුන් පැවසූයේ තමා ඍජුව වගවිය යුතු කලාපීය අධ්‍යාපන කාර්යාලයෙන් තමන් වෙත එවැනි පීඩනක් එල්ල නොවූ බවයි. ඒ වෙනුවට හැකි උපරිමයෙන් අධ්‍යාපන කටයුතු කරගෙන යන්නට උපදෙස් ලැබුණු බව ඔවුහු කියා සිටියහ. කෙසේ වුවත් මාර්ගගතව අධ්‍යාපන කටයුතු කරගෙන යෑම සඳහා ආයතනික ප්‍රතිපාදන නොලැබුණු බවද, පාසල් විසින් ස්වයංව එම කටයුතු කරගැනීම නිසා වැඩි හා අඩු පහසුකම් සහිත පාසල් අතර පවත්නා ධ්‍රැවලිය තවදුරටත් ශක්තිමත් වී ඇති බවද ඔවුන් පවසන ලදී. නිදසුනක් ලෙස මාර්ගගත අධ්‍යාපන කටයුතු වලට සම්බන්ධ වීම සඳහා අවශ්‍ය නව තාක්ෂණය සහිත ස්මාට් දුරකථනයක්වත් නොමැතිකම නිසා සමහර සිසුන්ට ඉගෙනුම් කටයුතු සම්පූර්ණයෙන්ම මඟහැරී ඇති බව ඔවුන් පෙන්වා දුනි. සුබසාධන රාජ්‍යය පිළිබඳ වඩා පුළුල් රාමුව තුළ සිට බලන කල මෙම සිදුවීම් වල අරුත පසුව විග්‍රහ කෙරෙනු ඇත.

පාසල් සිසුන්ගේ මවුවරුන් සමඟ සිදුකළ තවත් කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයකු පැවසූයේ මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය නැත්තවුන් සඳහා යම් යම් විකල්ප ක්‍රම යොදාගෙන ඇති බවය. ඒ අතර ළඟම නගරයෙහි කලින් එකඟ වූ ස්ථානයක අදාළ ප්‍රශ්න පත්‍ර හා වෙනත් ලේඛන ගුරුවරුන් විසින් තැබීමත්, සිසුන් ඒවායෙහි ඡායා පිටපත්

2 කුරුණෑගල සහ වලපනේ විදුහල්පතිවරුන් සමඟ කේවල සාකච්ඡා (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 05.

ලබාගැනීම මඟින් පාඩම් කටයුතු වල යෙදීමත් යන ක්‍රමය විය[3]. ආර්ථිකමය අතින් මෙය අනිවාර්යයෙන්ම මාර්ගගත ක්‍රමයට වඩා සහනදායී වුවත්, වසංගත තත්වය තුළ බලාත්මක වූ සංචරණ සීමා හා සමාජ දුරස්ථ වීම් රෙගුලාසි යටතේ මෙම ක්‍රමද එතරම් යොදාගත් බව සිතිය නොහැක. ගුරුවරුන් හා සිදුකළ ඉහත කණ්ඩායම් සාකච්ඡාව තුළින්ද හෙළි වූ පරිදි ඔවුන්ගේ සිසුන් අතර ඉතා දුර බැහැර ප්‍රදේශ වල වාසය කරන, කිසිදු අන්තර්ජාල සම්බන්ධතාවයක් නොමැති මෙන්ම, විශේෂයෙන්ම සංචරණ සීමා යටතේ ළඟම නගරයට පැමිණීම වුවත් ඉතා දුෂ්කර වන අය සිටී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙසේ දුරස්ථ ක්‍රම වලින් සිදුකරන අධ්‍යාපන කටයුතු ඔවුන්ට බොහෝ විට මඟහැරී යයි. එක් ගුරුවරයකුට අනුව එවැනි එක් අවස්ථාවක එසේ ලබාගැනීමට සලස්වා තිබූ පුහුණු මධ්‍ය වාර විභාගයක් එක් සිසුන් කණ්ඩායමකට සම්පූර්ණයෙන්ම මඟහැරී ගොස් තිබුණි.

තෘතීයික අධ්‍යාපනික ආයතනයක සේවය කරන්නකු වශයෙන් මගේ පෞද්ගලික අත්දැකීම් තුළින්ද මෙම තත්වය තවදුරටත් පැහැදිලි වේ. මාර්ගගතව පවත්වන්නා වූ දේශන වලට දිගටම සහභාගී වන සිසුන් ප්‍රමාණය පාඨමාලාවකට ලියාපදිංචි වන සිසුන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව දිගටම අඩුවක් පෙන්නුම් කරයි. එමෙන්ම ආයතනික මාර්ගගත පද්ධතියේ කටයුතු වලට සහභාගී වන ප්‍රමාණයට වැඩි සිසුන් ප්‍රමාණයක් WhatsApp වැනි අඩු වියදම් මාර්ග ඔස්සේ අධ්‍යාපනික කටයුතු වලට සම්බන්ධ වන්නේ ඊට වැයවන විද්‍යුත් දත්ත ප්‍රමාණය (data) සාපේක්ෂව අඩු නිසා බව සිතිය හැකිය. සමහරක් අවාසනාවන්ත අවස්ථා වලදී වාර අවසාන විභාගය සම්පූර්ණ කරගත නොහැකි වූ සිසුන් කිහිප දෙනෙකුද සිටි බව හෙළිවිය.

මෙම සිදුවීම් වලින් එල්ල කරන ලද බලපෑම කෙබඳුද? සමානාත්මතාවය මත පදනම් වූ හා, එම නිසා සමාන ප්‍රවේශය සහතික කිරීමට බැඳී සිටින නිදහස් අධ්‍යාපනය යන රාමුව තුළ ස්ථානගත වෙමින් ඊළඟ කොටස් තුළින් මා පිළිතුරු සොයන්නේ මෙම ගැටළුවටය.

## බලපෑම

වසංගතය මඟින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇතිකරන ලද මෙන්ම සමහර අවස්ථා වල වැඩි වර්ධනය කරන ලද අසමානතා ලංකාවට සුවිශේෂී වූවක් නොවන බව ඉහතින්ද දක්වා ඇත. නිදසුනක් ලෙස “පාකිස්ථානයේ සිසුන් බහුතරයකට මූල්‍යමය හා තාක්ෂණික අභියෝග නිසා මාර්ගගත

3 මොණරාගල පාසල් දරුවන් කිහිපයකගේ මවුවරුන් සමග කණ්ඩායම් සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මාර්තු 06.




මූලාශ්‍රයඃ බණ්ඩාර, 2021

අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල භුක්ති විඳීමට නොහැකිව තිබේ" (Adnan and Anwar, 2020, p. 45). ඇත්තෙන්ම සාර්ව මට්ටමේ ඉතා ප්‍රශංසනීය දර්ශක සහිත දියුණු වූ රටවල සිසුන්ට වුවත් මාර්ගගත අධ්‍යාපනයට සමාන ප්‍රවේශයන් ඇති බව සිතීම අසීරුය. උදාහරණයක් ලෙස ලී සහ ලලානිට අනුව (2020) එක්සත් ජනපදයේ 15 හැවිරිදි සිසුන් අතරින් 25% කට සිය අධ්‍යයන කටයුතු කරගෙන යෑම සඳහා පරිගණකයක් නොමැත. UNCTAD ආයතනයේ ප්‍රධානී ටෝබියන් ෆ්‍රෙඩ්රික්සන් පවසා ඇත්තේ මෙම කරුණු හේතුවෙන් වඩාත් පුළුල් වන ඩිජිටල් බෙදීම නිසා දැනටමත් ප්‍රවේශය අහිමි පිරිස් වඩාත් ආන්තීකරණය වියහැකි බවයි (*Coronavirus reveals need to bridge the digital divide*, 2020). දියුණු වෙමින් පවතින රටවල ඇති වඩාත් තීව්‍ර බෙදීම් මෙනිසා තවදුරටත් දරුණු වීමේ හැකියාව පවතී.

වසංගත තත්වය දැනටත් සිදුවෙමින් පවතින්නක් නිසා අධ්‍යාපනයට එහි ඇති බලපෑම සම්බන්ධ විධිමත් පර්යේෂණ ශ්‍රී ලංකාවේ සිදුකෙරී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. කෙසේ වුවත් හදිසියේ මාර්ගගත ක්‍රමයට සිදුකරන ලද මාරුව සම්බන්ධයෙන් රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ බොහෝ විවේචන එල්ලව ඇත්තේ එහි ප්‍රතිලාභීන් බහුතරය සාපේක්ෂව අඩු වරප්‍රසාද සහිත පසුබිම් වලින් එන බැවින්ය. ජයරත්න (2020) ට අනුව අන්තර්ජාල සහ වෙනත් පහසුකම් අඩුවෙන් පැවතීම නිසා සමහර අවස්ථා වල සිය ඇගයීම් කටයුතු යහළු මිත්‍රයන් ලවා සම්පූර්ණ කරවාගැනීමට පවා සිසුන් යොමුවී තිබේ. මෙවැනි තත්වයක් පවතිද්දීත් සාමාන්‍ය පරිදි වැඩ කටයුතු කරගෙන යාමට හා, සිදුවන ප්‍රමාදයන් හෝ මගහැරීම් තමාට වාර්තා කිරීමට ජනාධිපතිවරයා විසින් කාර්ය සාධක බලකායක් පත්කිරීම පිළිබඳ විවේචන එල්ලව ඇත. සමහර විචාරකයින් පවසා ඇත්තේ මෙම උපදෙස්

සඳහා භාවිතා කොට ඇති වචන තුළින් පද්ධතිමය අසමානතා පෞද්ගලික ශක්තීන් හෝ දුර්වලතා ලෙස සැළකීමක් සිදුව ඇති බවත්, ඒ අනුව උපදෙස් පිළිපැදීමට නොහැකි වීම පෞද්ගලික කැපවීමේ මඳ භාවය හඟවන්නක් බවට පත්ව ඇති බවත්ය (Ranasinghe, 2020). මෙමඟින් නව ලිබරල්වාදී චින්තනයේ ව්‍යාප්තිය පිළිබිඹු කරන බව අප මතක තබාගත යුතුය.

ඉහත දක්වා ඇති සමීක්ෂණ දත්ත වලට අනුව වසංගත තත්වය තුළ මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය කොතරම් ඇහිරී තිබුණිද යන්න පැහැදිලිය. ඊට අමතරව මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ කොතරම් දුරට සෑහීමට පත්වන්නේද යන ප්‍රශ්නයට ලැබුණු පිළිතුරු තුළද එහි සාර්ථකත්වය පිළිබඳව යමක් කියවේ. මේ සම්බන්ධ මතය ප්‍රතිචාරකයන් අතර හරි අඩකින් පමණ බෙදී තිබුණු අතර, එහිදී අඩකට මඳක් වැඩි ප්‍රමාණයක් තමන් ඒ පිළිබඳ සෑහීමට පත්වන බව පවසා තිබේ (කරුණාකර ඇමුණුම් අංක 3 හි 53 වගුව බලන්න). නියැදියෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ සෑහීමට පත් නොවීම තුළ බොහෝ යථාර්ථයන් ඇත. ඉන් එකක් නම් පවතින හා නව අසමානතා විෂයෙහි එහි භූමිකාවයි. තවෙකක් වන්නේ එවැනි සම්පත් හිඟතා වලින් තොර සන්දර්භයන් තුළ වුවද මාර්ගගත අධ්‍යාපනය නිසා සෞඛ්‍යයට අහිතකර බලපෑම් එල්ල වීමයි. පාසල් යන වයසේ ඉතා කුඩා දරුවන් සිටින මවක් සමඟ සිදුවූ පෞද්ගලික පිළිසඳරකදී දවස පුරා පරිගණකයේ එල්බගෙන සිටීම නිසා ඔවුන්ගේ ඇස්, උරහිස් සහ කොඳු නාරටියට ඇතිව තිබෙන බලපෑම පිළිබඳව සඳහන් වුණි[4]. පාසල් හා විශ්ව විද්‍යාල මට්ටමේ ගුරුවරුන් සමඟ කළ සාකච්ඡා[5] මෙන්ම, මගේ පෞද්ගලික අත්දැකීම් තුළින්ද පැහැදිලි වන්නේ ගුරුවරයාගේ පාර්ශ්වයෙන්ද මෙම ගැටළුව පවතින බවය.

තුන්වැනි යථාර්ථය දැනුම් සම්පාදන ක්‍රියාවලියට අදාළ එකකි. මාර්ගගත අධ්‍යාපනයේ සාධනීය ලක්ෂණ - විශේෂයෙන්ම පන්ති කාමරයේ ලබාදෙන අධ්‍යාපනය හා මිශ්‍ර කළවිට - බොහෝ පවතින බව සැබෑය (Dede, 2008). එහෙත් අධ්‍යාපනයේ සමාජමය හා අභිනිර්මාණවාදී භූමිකාව ආශ්‍රයෙහි ගත්කළ එහි බලපෑම යම්තාක් දුරකට ඍණාත්මක වේ. සමාජමය හා අභිනිර්මාණවාදී අධ්‍යාපනයෙන් අරමුණු කරන්නේ ශිෂ්‍යයා මූලික කොටගත්, සන්දර්භයට හා අන්තර්ගතයට සංවේදී දැනුම් නිර්මාණ ක්‍රියාවලියක යෙදීමය (Rovai, 2004; Liaw, 2001). ආබෝ සහ බෙන්බියුනන්-ෆික්ට අනුව (2006, p. 443) සාම්ප්‍රදායික පන්ති කාමරය තුළ පවතින, කාලය

4 පාසල් වියැති දරුවන්ගේ මවක් සමඟ පෞද්ගලික පිළිසඳර, 2021 ජූනි 12.

5 මාතර සහ කළුතර ගුරුවරුන් සමඟ කණ්ඩායම් සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 27; තෘතීයික අධ්‍යාපන ආයතනයක ගුරුවරුන් දෙදෙනෙකු සමඟ පෞද්ගලික පිළිසඳර, 2021 අප්‍රේල් 19.

සහ අවකාශය මඟින් හඳුන්වා දෙනු ලබන ඉතා සාධනීය සන්නිවේදන අවස්ථාවන් මාර්ගගත අධ්‍යාපනය තුළ බොහෝ විට දක්නට නැත. දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ මෙවැනි පරිසරයක් නිර්මාණය කිරීමේ හැකියාව පැවතුණද, එවැන්නකින් ප්‍රයෝජන ගැනීම සඳහා ගුරුවරයා සහ සියළුම සිසුන්ට නියමිත ආකාරයේ පහසුකම් පැවතීම සහ සමානව පැවතීම අත්‍යාවශ්‍ය වේ. සමාජයේ පවතින අසමානතා පිළිබඳ මාතෘකාව මෙතැනදී ඉතා වැදගත් වන්නේ එහෙයිනි.

වසංගත සමය තුළ අධ්‍යාපනයේ ස්වභාවය පිළිබඳ පැවැත්වුනු, මා සහභාගී වූ සාකච්ඡා විශාල ප්‍රමාණයක මෙම කරුණු වලට දැඩිව අවධානය යොමු කෙරුණි. එවැනි එක් සාකච්ඡාවක ප්‍රතිචාරකයකුට අනුව මාර්ගගත අධ්‍යාපනය නිසා නිවස තුළ මෙන්ම අසල්වැසියන් අතරද සම්බන්ධතා යම්තාක් දුරකට පළුදු වී ඇත. ඒ, අධ්‍යාපන කටයුතු වලට සම්බන්ධ වීම සඳහා සියළු දෙනාට ප්‍රමාණවත් තරමට විද්‍යුත් උපකරණ නොමැති වීම නිසාය. නිවස තුළ තත්වය ගත්විට, සහෝදර සහෝදරියන් සියළු දෙනාටම යම්තාක් දුරකට හෝ අධ්‍යාපනික කටයුතු වලට සහභාගී වීමට අවස්ථාව ලබාදීම සඳහා සියළුම දෙනාට යම් යම් කටයුතු මඟ හැරීමට සිදුවේ. අසල්වැසියන් අතර පවතින තත්වය සැළකූ විට, ස්මාට් දුරකථන වැනි උපකරණ වලට සාපේක්ෂව වැඩි ප්‍රවේශය සහිත අයවළුන් අන් අයගෙන් ඈත් වීමේ ප්‍රවණතාවක් දක්නට ඇත. ඒ, ඔවුන්ටද එම පහසුකම් පවත්වාගෙන යාමේ වත්කම ඇත්තේ අවමයෙන් නිසා සහ, බෙදාහදා ගැනීමට තරම් හැකියාවක් නැති බැවිනි[6].

තෘතීයික අධ්‍යාපනය තුළද මාර්ගගත අධ්‍යාපනයෙන් ඇති කරන ලද අසමානතා නිසා ඇති වූ බේදීම් හේතුවෙන් සැළකිය යුතු තරමේ ගැටුම් ජනනය වී ඇත. එක් පසෙකින් නියමිත වේලාවට උපාධි පිරිනමා සිසුන් (කඩා වැටෙන) ආර්ථිකයට නිදහස් කිරීමේ පීඩනය පවතී; අනෙක් පසින් මෙවැනි පීඩන වලට එරෙහි ප්‍රතිරෝධයක්ද ගොඩනැගෙමින් තිබේ. මෙහිදී ගතයුතු ස්ථාවරය පිළිබඳ ගුරුවරු ව්‍යාකූලත්වයට පත්ව සිටිති. අනේක විධ සම්පත් හිඟතාවයන් මධ්‍යයේ විභාග පැවැත්වීමම සදාචාරමය වශයෙන් ගත්කළ බරපතල ගැටළුවක් මතුකරන තත්වයක් එක් පසෙකින් තිබියදී, ඉක්මණින් උපාධිය ලබාගැනීමට සිසුන් වෙතින් ඉදිරිපත් වන සාධාරණ ඉල්ලීම අනෙක් පසින් උභතෝකෝටිකයක් මතුකර තිබේ.

මෙම සියළු වෙනස්කම් තුළින් ඉතා සියුම් ලෙස සිදුවන්නේ අප ජීවත් වන සමාජය සංවිධානය කර ඇති මූලධර්ම තීරණාත්මක ලෙස වෙනස් වීමයි. එමඟින් සමාජ සම්මුතියෙහි ස්වභාවය වෙනස් කරන බව අප සිහිතබා

6 පාසල් අධ්‍යාපනය පිළිබඳ ක්‍රියාකාරීන් සමඟ කණ්ඩායම් සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 අප්‍රේල් 07.

ගත යුතුය. එම නිසා ඊළඟ කොටසේදී මගේ බලාපොරොත්තුව වසංගත සමයේ රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළින් මෙම කරුණු වලට එල්ල කරන ලද බලපෑම වටහා ගැනීමයි.

## මේ සියල්ලෙන් ගම්‍ය වන්නේ කුමක්ද?

දේශපාලන ප්‍රජාවක් වශයෙන් අපේ දිශානතිය පිළිබඳ මෙම අත්දැකීම් තුළින් කුමක් ගම්‍ය වන්නේද? අපේ සමාජය සංවිධානය කොට ඇති පදනම් මූලධර්ම පිළිබඳ ඒවායින් කුමක් කියවේද? ගෝලීය අධි වසංගතයක් තුළ සාමාන්‍යකරණය වී ඇති හදිසි තත්වය හා ඒ ආශ්‍රිත හදිසි තීරණ ගැනීමේ පසුබිමක් තුළ එම මූලධර්ම කෙසේ විකාශනය වෙමින් පවතින්නේද? එම විකාශනය ශ්‍රී ලංකාව තුළ සමාජ සම්මුතියට එල්ල කර ඇති බලපෑම කෙබඳුද? මෙම ප්‍රශ්න පිළිබඳව කල්පනා කිරීමේදී වර්තමානයේ කරළියට පැමිණෙන දෘෂ්ඨිවාදීමය සහ මානසික රාමු සම්බන්ධව මතුවන පොදු තේමා දෙකක් තිබේ. මෙම තේමා දෙකම නව ලිබරල්වාදී පද්ධතිය යටතේ සාකච්ඡා කළහැකි බව මගේ මතයයි.

### *නව ලිබරල්වාදී තර්කනය*

මෙම ලිපිය සඳහා පාදක කරගත් සම්මුඛ සාකච්ඡා - විශේෂයෙන්ම ද්වීතියික අධ්‍යාපාන පද්ධතියට සම්බන්ධ ගුරුවරුන්, සිසුන් සහ විදුහල්පතිවරුන් සමඟ - වලින් හෙළි වූයේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියක් පැවතියදී වුවද වසංගත තත්වය තුළ අධ්‍යාපනයේ වගකීම පෞද්ගලිකව ශිෂ්‍යයා, ගුරුවරයා හෝ සමහර විට විදුහල්පතිවරයා විසින් දැරීමේ තත්වයක් උද්ගතව ඇති බවයි. එහි සැබෑ ඛේදවාජකය නම් මෙම තත්වය ඉතාම සාමාන්‍යකරණය වීම තුළ නිදහස් අධ්‍යාපනයට තමාට ඇති අයිතිය පිළිබඳ කතිකාව සම්පූර්ණයෙන්ම මඟහැරී ගොස් තිබීමය. එම අයිතිය සාක්ෂාත්කරණයෙහිලා සුබසාධන රාජ්‍යයෙහි වගකීම පිළිබඳ කිසිදු ප්‍රශ්නයක් මෙම චින්තනය තුළ නොනැඟේ.

මා හට සම්මුඛ සාකඡාවක් ලබාදුන් එක් විදුහල්පතිවරයකු තුළ මෙම ආකල්පය පැහැදිලිව දැකගත හැකිවිය. ඉතා අවංකව සිය රාජකාරිය කරන බව සක්සුදක් සේ පැහැදිලි වුවද, ඔහුගේ දැක්මට අනුව මාර්ගගත අධ්‍යාපනයෙහි ගුරුවරයකු යෙදෙන තරම ඇය/ඔහුගේ ව්‍යුහාත්මක සාධක වල නිරූපණයකට වඩා, පෞද්ගලික කැපවීමෙහි නිරූපණයකි. මෙතැන අනිවාර්යයෙන්ම පෞද්ගලික කැපවීම පිළිබඳ ගැටළුවක්ද යම්තාක් දුරකට ඇතත්, තත්වය සම්පූර්ණයෙන්ම ඊට ලඝු කළ නොහැක්කේ සිසුන් හා ගුරුවරුන් යන දෙපිරිසම මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමේදී ආර්ථික

සහ තාක්ෂණික ගැටළු වැනි ව්‍යුහාත්මක කරුණු වල බලපෑමට දැඩිව ලක්වන හෙයිනි. මෙහිදී සියළු බර පෞද්ගලිකව කරට ගෙන, 'පද්ධතියට බරක් නොවී' වගකීම් ඉටුකරන පිරිස ("මොකද ආණ්ඩුවටත් සල්ලි නැනෙ")[7] ප්‍රශංසාවට ලක්වන අතර, එතුළ නිදහස් අධ්‍යාපනය සම්බන්ධ ආයතනික වගකීම පිළිබඳ ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් නැත. එහිදී ඉගැන්වීම් කටයුතු කරගෙන යෑම සහ අදාළ කියවීම් ආදිය උඩුගත කිරීම සඳහා ආයතනිකව සපයනු ලබන පද්ධතියක නොපැවැත්ම ප්‍රශ්න නොකෙරේ; ඒ වෙනුවට ප්‍රශ්න කෙරෙන්නේ පුද්ගලිකව බරපැන නොදැරීම තුළින් විද්‍යාමාන වනවා යැයි කියවෙන උනන්දුව සහ කැපවීමෙහි මඳ භාවයයි.

මෙම විදුහල්පතිවරයා ඇත්තෙන්ම සිය කාර්ය මණ්ඩලයේ අදාළ වියදම් දැරීමට ශක්තියක් නොමැති සාමාජිකයන්ට මාර්ගගතව ඉගැන්වීම් කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ඩේටා පැකේජ සිය පෞද්ගලික මුදල් වලින් මිලට ගෙන දුන් අයෙකි. එමෙන්ම සිය දරුවන්ගේ මාර්ගගත අධ්‍යාපන කටයුතු සඳහා බරපැන දැරිය නොහැකි දෙමව්පියන්ටද ඉතා සද්භාවයෙන් ඔහු උපදෙස් දී තිබුණේ අනාගතය වෙනුවෙන් ඉතිරි කොට ඇති මුදල් හෝ වියදම් කොට අදාළ ස්මාට් දුරකථන වැනි සම්පත් ලබාගන්නා ලෙසයි. කැපවීම සහ අවංකභාවය අතින් ගත්විට ඉතාම ප්‍රශංසනීය වුවත්, මෙවැනි පියවර නිසා ඇත්තෙන්ම සිදුවන්නේ අයිතිවාසිකම් පිළිබඳ කතිකාවක් හෝ කරළියට පැමිණීමට ඇති අවස්ථාව ඇහිරීම බව අප පිළිගත යුතුය.

තෘතීයික අධ්‍යාපනය තුළ මේ පිළිබඳ ඇති විමසිලිමත් බව සාපේක්ෂව වැඩිය. දශක ගණනාවක් මුළුල්ලේ විශ්ව විද්‍යාල අවකාශය තුළ දිග හැරුණු අරගල හා ඒ ආශ්‍රිතව වර්ධනය වූ දේශපාලනික විඥානය මීට හේතුවක් විය හැකිය. සමාන ප්‍රවේශය පිළිබඳ සාකච්ඡා කොතරම් දුර්වලව වුවද සිදුවෙමින් පවතී; පීඨ මට්ටමින් සාමූහික තීරණ ගැනීමේ යාන්ත්‍රණ පැවතීමද එයට රැකුලක්ව තිබේ. එමෙන්ම ආයතනික වශයෙන් මාර්ගගත අධ්‍යාපන කටයුතු පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පද්ධති නිර්මාණය කොට තිබීම සහ, ඉගෙනුම් කටයුතු කුමනාකාරයෙන් සිදුවිය යුතුද යන තීරණය ගැනීමට ගුරුවරුන්ට නිදහස ලබාදීම තුළ ගුරුවරුන් කෙරෙහි එල්ල වන පීඩනය සහ සිසුන්ට දැරීමට වන බරපැන යන දෙකම අවම කොට තිබේ.

එහෙත් මෙහි අදහස සරසවිය තුළ සියල්ල ප්‍රශස්ත ආකාරයෙන් සිදුවන බව නම් නොවේ. කාර්යක්ෂමතා ආඛ්‍යානයට පරිපාලනයෙන් මෙන්ම, හැකි ඉක්මණින් උපාධිය ලබා ගැනීමට වෙහෙසන සිසුන් වෙතින්ද වැඩි පිළිගැනීමක් ලැබී ඇත. ඔඩුදුවන විරැකියාව පිළිබඳ යථාර්ථය මේ තර්කනය තුළ සැළකිල්ලට ගෙන ඇති බව සිතීම අපහසු වේ. විශේෂයෙන්ම වසංගත

7 වලපනේ විදුහල්පතිවරයකු සමඟ කේවල සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 05.

තත්වය තුළ පවතින රැකියාද අහිමි වීමේ තත්වයක්දී නව උපාධිධාරීන් සම්බන්ධයෙන් මෙම ආර්ථිකයට සැලසුමක් නොමැති බව නොකිවමනාය. එහෙත් විරැකියාව සම්බන්ධ සියළු වරද උසස් අධ්‍යාපනායතන පිට පටවා ඇත්තේ, ඊට හේතුව අදාළ කුසලතා සිසුන්ට ලබා දී නොමැති බවට වන චින්තනය සමාජගත කරමිනි. එම නිසා ආර්ථිකයේ පවතින ඉතා විශාල සිදුරෙන් අවධානය වෙනතක හරවමින්, හැකි සෑම අයුරින්ම සිසුන්ගේ කුසලතා දියුණු කරන්නට සරසවි ගුරුවරුන් කෙරෙහි පීඩනයක් එල්ල වෙමින් තිබේ.

### *නව ලිබරල් ආචාර ධර්ම සහ මානසිකත්වය*

අප ගන්නා තීරණ තුළ අයිතීන් පිළිබඳ සවිඥානිකත්වය මඳින් මඳ ඉවතට යන විට එම ප්‍රතිමානීය හිඩැස පුරවන්නට පැමිණෙන්නේ කාර්යක්ෂමතාවය පිළිබඳ චින්තනයකි. එවැනි චින්තනයක් නිසා අවාසියට ලක්විය හැක්කන් ඇතුළු සියළු දෙනාම සිය අයිතීන් අවධාරණය කිරීම හෝ අයිතීන් පිළිබඳ කතා කිරීමට හැකියාව ලබාදෙන දේශපාලනික-සදාචාරමය කැපවීම් වලට අවධානය දක්වනු වෙනුවට, 'වැඩ ඉවරයක් කරගැනීමේ' මානසිකත්වයකට අනුගත වෙමින් සිටිති. මෙයාකාර මානසිකත්වයක් සාමාන්‍යකරණය කරන නව ලිබරල්වාදී චින්තනය තුළ පුද්ගලවාදී තර්කනය ඉතා තදින් මතුවන නිසා පොදු අයිතීන් පිළිබඳ හැඟීමක් හෝ නැතිව යන තත්වයට පත් වෙමින් තිබේ.

මෙවැනි පසුබිමක් තුළය නිදහස් අධ්‍යාපනය සහ එහි අනාගත ගමන් මාර්ගය පිළිබඳව අප සළකා බැලිය යුත්තේ. තමාට හෝ තම පවුලේ අයට අධ්‍යාපනයට ඇති ප්‍රවේශය තහවුරු කිරීම තම පෞද්ගලික වගකීමක් ලෙස සැළකීමට පුරවැසියා පුරුදු වෙත්ම, නිදහස් අධ්‍යාපනය යන සංකල්පය ඉවතට තල්ලු වී ඒ වෙනුවට අධ්‍යාපනය යනු පෞද්ගලික ක්‍රය ශක්තිය මත තීරණය වන්නක් බවට වන වටහා ගැනීම සාමාන්‍යකරණය වේ. එමඟින් සිදුවන්නේ අධ්‍යාපනය කෙමෙන් වෙළඳ භාණ්ඩයක් සේ සැළකීමට පුරවැසියන් යොමු වීමයි. වසංගත සමය තුළ පෞද්ගලික මාදිලි වල අධ්‍යාපනයෙහි පැවැත්මට අවධානය යොමුකිරීම මේ සම්බන්ධයෙන් වැදගත් වේ. සමීක්ෂණයෙන් හෙළි වූ පරිදි කුටුම්බය තුළ පාසල් යන වයසේ දරුවන් සිටින ප්‍රතිචාරකයන්ගෙන් 79.7% ක් පැවසූයේ වසංගතය තුළ දිගටම පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වූ බවයි (කරුණාකර ඇමුණුම් අංක 3 හි 54 සහ 55 වගු බලන්න).

නිදහස් අධ්‍යාපනය අර්ධ වශයෙන් කඩා වැටීමට ලක් වෙමින් පවතින අවස්ථාවකදී වුවත් පෞද්ගලීකරණය වූ අධ්‍යාපන මාදිලි කිසිදු අපහසුතාවයකින් තොරව ඉදිරියට පැවතීම තුළ ඉහතින් දැක්වූ නව ලිබරල්වාදී තර්කනය සහ එතුළ අපේ ප්‍රමුඛතා පිළිබඳව යමක් කියවේ. අධ්‍යාපනය

තුළ සිදුවන්නා වූ වෙනස්කම් වලට මෙම මානසිකත්වය හේතුවක් වනවාක් මෙන්ම එහි ප්‍රතිඵලයක්ද වේ. ඉහතින් දැක්වූ විදුහල්පතිවරයාද පෞද්ගලික උපකාරක පන්ති පිළිබඳව ඉතා ප්‍රශංසා මුඛයෙන් කතා කළේය. ඔහුට අනුව ගුරුවරු සිය වගකීම් පිළිබඳව බරපතලව සිතා බැලීම තුළින් ඇති කළ හැකි වෙනසට හොඳ උදාහරණයකි පෞද්ගලික උපකාරක පන්ති. එම වෙනසට හේතුව ගුරුවරයාගේ කාර්ය සාධනය මත පදනම්ව ලැබෙන ප්‍රතිලාභ (මුදල් සහ/හෝ පිළිගැනීම) තීරණය වීමයි. මින් ඉගෙන ගත යුතු පාඩමක් ඇතත්, මෙවැනි තර්ක වලින් තවදුරටත් අධ්‍යාපනය මූල්‍යකරණය වීමට මඟ පාදන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් නිදහස් අධ්‍යාපනය සහ එහි දෘෂ්ටිවාදය සම්පූර්ණයෙන්ම වියැකී ගොස් අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් බවට පත්වීම සිදුවන බවද මතක තබාගත යුතුය.

මෙමඟින් වඩා පුළුල්ව පෙන්වා දීමට මා උත්සහ කරන්නේ පැතිර යන්නා වූ නව ලිබරල්වාදීමය තර්කනය තුළ දේශපාලන ප්‍රජාවක් වශයෙන් අපේ ප්‍රජාතන්ත්‍රවාදී කැපවීම් අමතක කර දැමීමට අපව යොමුකරන ආකාරයත්, එතුළ ආචාර ධර්ම යන්න වෙළඳපොළ මඟින් තීරණය කරන්නා වූ දෙයක් බවට පත්වීමත් පිළිබඳ යථාර්ථයයි. මෙම රාමුවෙහි සිට බැලූ කල පෞද්ගලික කැපවීම සහ වගකීම් ගැනීමේ හැකියාව යන ගුණාංග, අයිතීන් පිළිබඳ කතා කිරීමට වඩා සදාචාරාත්මක කාරණයක් වශයෙන් පෙනී යයි. එසේ අයිතීන් පිළිබඳ කතා කරන්නන් ඇත්තෙන්ම කුසීත බවට වැටහීමක්ද මෙම චින්තනය තුළ හඳුන්වා දී ඇත. මෙම නව චින්තනය කෙමෙන් මුල්බැස ගන්නා විකාශනාත්මක අවස්ථාවක් වන වර්තමානයෙහි නිදහස් අධ්‍යාපනය භාවිතා කරන්නේ එම විකාශනය හීන් නූලෙන් සිදුවන තුරු භාවිතා කළහැකි ප්‍රගතිශීලී ආඛ්‍යානයක් ලෙස පමණි.

## නිගමනය

මෙම පරිච්ඡේදය තුළ මගේ අරමුණ වූයේ කොවිඩ්-19 වසංගතය මඟින් රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධතාවය කෙරෙහි එල්ල කළ බලපෑම අධ්‍යාපනය ආශ්‍රයෙන් තේරුම් ගැනීමයි. එහිදී ආරම්භක ලක්ෂ්‍යය වශයෙන් මාර්ගගත අධ්‍යාපනයට හදිසියේ කරන ලද මාරු වීම යොදාගන්නා ලදී. මාර්ගගත අධ්‍යාපනයට ප්‍රවේශය ආයතනික මට්ටමින් සලසා නොදීම සහ එය පුද්ගලයාගේ පෞද්ගලික ක්‍රය ශක්තිය මත රඳා පැවැත්ම තුළ නිදහස් අධ්‍යාපනයට තවදුරටත් එම නාමය දිය හැකිදැයි යන ගැටළුව පැන නැගේ. නිදහස් අධ්‍යාපනයේ පදනම් වටිනාකමක් වන සමානාත්මතාවය එහිදී අමතක කොට දැමීමක් සිදුකර ඇති අතර, එම නිසා සමාජයේ පවතින අසමානතා, අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගැනීමේදී ප්‍රතිනිර්මාණය වී ඇති බව දැකිය හැකිය.

මෙම ප්‍රවණතා වල ගම්‍යයන් වසංගත තත්වයෙන් ඔබ්බට බලපාන අතරම, ඒවාට හේතු වසංගත තත්වයට පෙර සිටම පැවති ඒවා බව මතක තබාගැනීමද වැදගත්ය. අවම ආයතනික සම්බන්ධීකරණයක් සහිතව, වෙනත් විකල්පයක් නොමැති තත්වයක් ලෙස මාර්ගගත අධ්‍යාපන ක්‍රමය වැළඳ ගැනීම තුළ අධ්‍යාපනයට ඇති ප්‍රවේශය මූල්‍යකරණය වීමත්, එමඟින් දිගු කාලීනව අධ්‍යාපනය මූල්‍යකරණය වීමත් සිදුවේ. අධ්‍යාපනයට ඇති ප්‍රවේශය මූල්‍යකරණය වූ විට එය තවදුරටත් රාජ්‍ය ආයතන වල වගකීමක් නොව වෙළඳ භාණ්ඩයක් බවට පත්වීම වැළැක්විය නොහැක. එවිට වෙළඳපොළ තර්කනය අධිපති තැනක් ගන්නා අතර, විෂමතාවය ඔඩුදුවා යද්දී වුවත් අයිතීන් පිළිබඳ කිසිදු කතිකාවක් කිරීමට නොහැකි තත්වයක් උද්ගත වනු ඇත.

මෙම තත්වයට කිසිදු ප්‍රතිරෝධයක් නොවීම හා වගකීම පුද්ගලයාට කේවලව අනුයුක්ත වීමේ තත්වය සාමාන්‍යකරණය වීම තුළ නව ලිබරල් යුගයේ දේශපාලන මන්දෝත්සාහී භාවය මොනවට පිළිබිඹු වේ. 'ඉක්මණින් වැඩ ඉවරයක් කරගැනීමේ' කාර්යක්ෂමතා ආඛ්‍යානය මෙයට හොඳ අනුපූරකයකි. ඒ, එමඟින් නියමිත කලට උපාධිය ලබා ශ්‍රම බලකායට සම්බන්ධ විය හැකිය යන අර්ධ මිථ්‍යාව සාමාන්‍යකරණය කරන හෙයිනි. මෙම චින්තනය දැන් සාමාන්‍ය බුද්ධිය බවට පත්වී හමාරය.

මේ සිදුවන්නේ අධ්‍යාපනය තුළින්ද නව ලිබරල්වාදය සමාජයේ මුල්බැස ගැනීමකි. එහිදී අධ්‍යාපනය තවදුරටත් සමාජ සාධාරණත්වයේ හෝ අයිතිවාසිකම් වල නාමයෙන් ක්‍රියාත්මක වන්නක් නොව, කේවල ආර්ථික අරමුණු සාක්ෂාත්කරණය සඳහා ක්‍රියාත්මක වන වෙළඳ භාණ්ඩයක් බවට පත්වෙමින් තිබේ. වෙළඳපොළට අවශ්‍ය ආකාරයෙන් අධ්‍යාපනය අනුවර්තනය කරගැනීමේ මෙම ගමනේදී නිදහස් අධ්‍යාපනය යනු හුදු එම විකාශනය සැඟවීම සඳහා භාවිතා කරන ප්‍රගතිශීලී ආඛ්‍යානයක් පමණි.

## ආශ්‍රිත ග්‍රන්ථ


Adnan, M. and Anwar, K. (2020) 'Online Learning amid the COVID-19 Pandemic: Students' Perspectives', *Journal of Pedagogical Sociology and Psychology*, 2(1), pp. 45–51.

Amarakeerthi, L. (2020) 'Let's Make Our Education "More Open Than Usual"', *Colombo Telegraph*, 16 December. Available at: https://www.colombotelegraph.com/index.php/letsmake-our-education-more-open-than-usual/ (Accessed: 24 July 2021).

Arbaugh, J. B. and Benbunan-Fich, R. (2006) 'An Investigation of

Epistemological and Social Dimensions of Teaching in Online Learning Environments', *Academy of Management Learning & Education*, 5(4), pp. 435–447.

Bandara, S. (2021) *Facebook*. Available at: https://www.facebook. com/ArtOfSajith/photos/a.281558598710607/1858830217650096/?type=3 (Accessed: 24 July 2021).

*Coronavirus reveals need to bridge the digital divide* (2020) *UNCTAD*. Available at: https://unctad.org/news/coronavirus-revealsneed-bridge-digital-divide (Accessed: 24 July 2021).

Davies, B. and Bansel, P. (2007) 'Neoliberalism and education', *International Journal of Qualitative Studies in Education*, 20(3), pp. 247–259. doi: 10.1080/09518390701281751.

Dede, C. (2008) 'A Seismic Shift in Epistemology', *EDUCAUSE Review*, 43(3), pp. 80–81.

Jayaratne, H. (2020) 'Covid-19 Through The Perspectives Of Children & Youth', *Colombo Telegraph*, 3 July. Available at: https://www.colombotelegraph.com/index.php/covid-19- through-the-perspectives-of-children-youth/ (Accessed: 24 July 2021).

Jayasuriya, J. E. (1969) *Education in Ceylon before and after independence: 1939-1968*. 1st edition. Associated Educational Publishers.

Li, C. and Lalani, F. (2020) *The COVID-19 pandemic has changed education forever. This is how, World Economic Forum*. Available at: https://www.weforum.org/agenda/2020/04/ coronavirus-education-global-covid19-online-digitallearning/ (Accessed: 24 July 2021).

Liaw, S.-S. (2001) 'Designing the hypermedia-based learning environment', *International Journal of Instructional Media*, 28(1), pp. 43–56.

Pace, C., Pettit, S. and Barker, K. (2020) 'Best Practices in Middle Level Quaranteaching: Strategies, Tips and Resources Amidst COVID-19', *Becoming: Journal of the Georgia Association for Middle Level Education*, 31(1), pp. 2–13. doi: 10.20429/ becoming.2020.310102.

Perera, K. (2021) '"Marrying the Monster": World Bank Loans and English Language Projects in Sri Lankan Universities', *University of Colombo Review*, 2(1), pp. 42–60.

Ranasinghe, P. (2020) 'Zooming of Education', *Groundviews*, 21 June.

Available at: https://groundviews.org/2020/06/21/ zooming-of-education/ (Accessed: 24 July 2021).

Rovai, A. P. (2004) 'A constructivist approach to online college learning', *The Internet and Higher Education*, 7(2), pp. 79–93. doi: 10.1016/j.iheduc.2003.10.002.

Sivamohan, S. (2021) 'Kuppi Talk: setting the terms of the debate on education', 3 February. Available at: http://island.lk/kuppitalk/ (Accessed: 24 July 2021).

'Socio-Economic Index in the face of COVID-19' (2021) *Centre for Policy Alternatives*, 30 June. Available at: https://www. cpalanka.org/socio-economic-index-in-the-face-of-covid-19/ (Accessed: 30 June 2021).

Toquero, C. M. (2020) 'Challenges and Opportunities for Higher Education Amid the COVID-19 Pandemic: The Philippine Context', *Pedagogical Research*, 5(4). Available at: https:// eric.ed.gov/?id=EJ1263557 (Accessed: 24 July 2021).

Venugopal, R. (2015) 'Neoliberalism as concept', *Economy and Society*, 44(2), pp. 165–187. doi: 10.1080/03085147.2015.1013356.

# 7

# කබලෙන් ලිපට වැටීම: කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ සංක්‍රමණික ඇඟළුම් කම්හල් සේවකයින්ගේ ජීවිතය

***කෞෂිණී දම්මලගේ***

## හැඳින්වීම

වසරකට වැඩිකාලයක් පුරාවට ගෝලීය වසංගතයක් වශයෙන් ව්‍යාප්තිය වන කෝවිඩ් 19 සියලු ක්ෂේත්‍ර කෙරෙහි තර්ජනාත්මකව බලපෑවේය. ජාතික සහ ගෘහස්ථ ආර්ථිකයන් එහි දැඩි බලපෑමට ලක්ව ඇති අතර, සමහර අවස්ථා වල ඒවා කඩා වැටීමට ආසන්න තත්වයට පත්වී තිබේ. වෛරසය විකාශනය වෙමින් පාලනය කළ නොහැකි ලෙස පැතිර යනවිට ඊට ප්‍රතිචාරයක් ලෙස සංචරණ සීමා හා සමාජ දුරස්ථ භාවය රැකීමේ විධිවිධාන හඳුන්වා දී ඇත්තේ වෛරසය පැතිරීම පාලනය කිරීමෙහිලා ඒවායෙහි සාර්ථකත්වය දැනටමත් අවබෝධ වී ඇති නිසාය. එසේ වුවත් ජීවිත රැකගැනීමට සිදුව ඇත්තේ ජීවනෝපායන් අනතුරේ හෙළීම මඟිනි. වෙනත් අංශ වල මෙන්ම ඇඟළුම් ක්ෂේත්‍රය තුළද වියදම් අඩුකර ගැනීම සඳහා කර්මාන්ත ශාලා යොමුව ඇත්තේ, ආයෝජකයින් වියදම් කපාහැරීම හේතුවෙන් ඉල්ලුම සීඝ්‍රයෙන් පහත බැස ඇති බව හා එම නිසා පාඩුව අවම කරගත යුතු බවට හේතු දැක්වීම තුළිනි. එම පදනම මත වැටුප් අඩු කිරීම් සහ රැකියා අහිමි කිරීම් සිදුකිරීම තුළ ශ්‍රමිකයා අන් කවරදාටත් වඩා අනතුරුදායක තත්වයකට පත්වී තිබේ. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ කොවිඩ් වසංගත අත්දැකීම තුළ ප්‍රාග්ධනය සහ ශ්‍රමය අතර සම්බන්ධතාවය මෙන්ම, එහිලා රාජ්‍යයේ මැදිහත්කරණ භූමිකාව පිළිබඳ විමසා බැලීමට මා යොමු වන්නේ මෙවැනි පසුබිමක් තුළය.

අප දැනටමත් දන්නා පරිදි මෙන්ම පූර්ව මූලාශ්‍ර වලද දක්වා ඇති පරිදි නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් යනු සමාජයේ වෙසෙසින්ම ආන්තීකරණයට ලක්වූ කණ්ඩායමකි. මේ කෙරෙහි ඔවුන් පිළිබඳ ඇති සංස්කෘතික ආඛ්‍යාන සහ සමාජ ප්‍රතිමානයන් දැඩිව බලපා ඇති අතර, වසංගතය මඟින් තත්වය තවත් දරුණු අතට හරවනු ලැබ තිබේ. මෙම පරිච්ඡේදයේදී මාගේ අරමුණ වන්නේ 1) කොවිඩ් වසංගත තත්වය තුළ ඔවුන්ගේ ආර්ථික අත්දැකීම 2) කොවිඩ් වසංගතය නිසා ඔවුන්ගේ රැකියා සහ පෞද්ගලික ජීවිතය තුළ ඇති කරන ලද වෙනස්කම් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට මුහුණ පෑමට සිදුවූ අත්‍යන්ත දුෂ්කරතා 3) ඔවුන් පිළිබඳ සමාජයේ කලින් සිටම පැවති ආඛ්‍යාන නිසා වසංගත තත්වය තුළ ඔවුන් තවදුරටත් ආන්තීකරණය වූ අයුරු සහ 4) ශ්‍රමය අරබයා ප්‍රාග්ධනය සහ රජ්‍යයෙහි භූමිකාව යන ඒවා විමසා බැලීමයි. මගේ විශ්ලේෂණය ප්‍රාථමික සහ ද්විතියික ගුණාත්මක දත්ත මත පදනම් වේ.

## පසුබිම

1970 දශකයේ අග භාගයේදී ලංකාවට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් තැන් සිට නිදහස් වෙළඳ කලාප 'නව ලිබරල් අවකාශයන්' (Jayawardena, 2020) බවට පත්ව ඇත්තේ රැකියා අවස්ථා මඟින් ග්‍රාමීය කාන්තාව ආකර්ෂණය කරගැනීම තුළිනි. එතැන් පටන් අපනයන ආර්ථිකය මත පදනම්ව කාර්මීකරණයට සිදුකරන ලද දැවැන්ත විපරිවර්තනයෙහි කොඳු නාරටිය බවට මෙම කලාප පත්ව ඇත (Hancock, 2006, p. 1). හේවාමාන්නට අනුව (2020, p. 3) මෙම අවකාශයන් ඉතා චේතාන්විත ලෙස ස්ත්‍රීකරණය වීමෙහි දක්නට ලැබෙන්නේ පුරුෂාධිපති රාමුව තුළ කාන්තාව පිළිබඳ පවතින 'කඩිසර දෑතක් හිමි', 'කීකරු' හා 'පවුලේ ද්වීතීයික උපයන්නා' යන දැක්මය. ගුණතිලක (2019) පවසන්නේ මෙසේ ස්ත්‍රිය යටත් කරගැනීම හරහා ගෝලීය ප්‍රාග්ධනය ලාභ උපයාගන්නා බවයි.

එමෙන්ම නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු කාන්තාවන් ආර්ථික හා සමාජමය වශයෙන් ආන්තීකරණය වූ පසුබිම් වලින් සහ සාපේක්ෂව අඩු අධ්‍යාපන මට්ටම් වලින් පැමිණෙන්නන් වේ (Hewamanne, 2017). එම නිසා ගෝලීය නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉල්ලා සිටින්නා වූ ආකාරයේ 'ඵලදායී ශ්‍රමය' සැපයීමට සුවිශේෂයෙන්ම සුදුසු අය බවට ඔවුන් පත්ව ඇත (Jayawardena, 2020). පිටස්තර පළාත් වලින් පැමිණ වෙළඳ කලාපයේ සේවයේ යෙදෙන ඔවුන් කුලී නිවාස වල ලැගුම් ගන්නේ බොහෝ විට පෞද්ගලිකව එම විය පැහැදම් දරා ගනිමිනි. මෙම කුලී නිවාස වල බේදජනක තත්වය විශාල වශයෙන් අවධානයට ලක්ව ඇත (මේ

සම්බන්ධයෙන් අදහසක් ලබාගැනීම සඳහා Hewamanne, 2003, 2017, 2019, 2018; Jayawardena, 2017, 2020; Hancock, Middleton, and Moore, 2012 යන මූලාශ්‍ර භාවිතා කළ හැකිය).

මෙවැනි දුෂ්කරතා තුළින් නිර්මාණය වන 'කලාපයේ යුවතිය' ගේ අනන්‍යතාවය සූරා කෑමට ලක්වන, කෙලෙසුනු සහ එම නිසා සංස්කෘතිකමය වශයෙන් ප්‍රශ්නකාරී එකක් ලෙස සමාජගත වී ඇත. ඔවුන් පිළිබඳ ඒ අනුව සිතනු ලබන්නේ ගණිකා වෘත්තිය, ගබ්සාවන් සහ මූලිකව තමාගේම අසංවර බව නිසා ප්‍රශ්න ගණනාවකට මැදිවූ පිරිසක් යන ප්‍රවර්ගයන් ආශ්‍රිතවය. අසල්වාසීන් විසින් ඔවුන්ට 'ජුකී කෑලි' යන්නත්, වෙළඳ කලාපයට 'වේ* කලාපය' යන්නත් අන්වර්ථ නාම ලෙස යොදා ඇත (Hewamanne, 2003; Jayawardena, 2017; Attanpola, 2006; Hancock, 2006).

කර්මාන්ත ශාලාව තුළ ඔවුන්ගේ ජීවිතයද මෙතරම්ම කටුකය. අදාළ ඉලක්ක සම්පූර්ණ කරගැනීම සඳහා එල්ල වන පීඩනයෙන් ඔවුහු නිරන්තරයෙන් පීඩා විඳිති. එසේම අනිවාර්ය අතිකාල සේවා මුර, අධීක්ෂකයින්ගේ වාචික සහ ශාරීරික හිංසනයට බඳුන් වීම සහ මෙම කරුණු නිසා ඇතිවන මානසික ආතතිය ඔවුන්ගේ දෛනික යථාර්ථය වේ. එබැවින් කාර්මික පද්ධතිය තුළ බලරහිත, යටත්වාසී වින්දිතයන් බවට ඔවුන් පත්ව ඇත (Jayawardena, 2017; Hancock, 2006).

මෙම සාකච්ඡාවෙන් ගම්‍ය වන කරුණු දෙකකි: පළමුවැන්න, නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු කාන්තාවන් කලාපයේ සේවිකාවන් වීම නිසා සහ කාන්තාවන් වීම නිසා ද්විත්ව ආකාරයට අනතුරට ලක්වීමේ ප්‍රවණතාවයක් පවතින බවය. දෙවැන්න, සිය ගම් වල බලාත්මක ග්‍රාමීය සහ පවුල මූලික පුරුෂාධිපත්‍යයෙන් යම් දුරකට නිදහස් වීමට ඔවුන්ට හැකියාව ලැබී තිබුණත්, නව තත්වය තුළ කාර්මික පුරුෂාධිපත්‍යයේ සහ නිදහස් වෙළඳ කලාපයේ යටත්වාසී භාවයේ යදම් වලින් නැවත වාරයක් ඔවුන් බැඳ දමා තිබීමය. එම නිසා වෙනස් රාමුවක් තුළ වුවද ඔවුන්ගේ ආන්තීකරණය දිගින් දිගටම පවතින බව පෙනී යයි.

මෙම පරිච්ඡේදයේදී මගේ අරමුණ වන්නේ කොවිඩ්-19 වසංගත තත්වය තුළ ඇති කරන ලද නව හා වඩා තීව්‍ර වූ අනතුරුදායක තත්වයන් තුළ, මෙම කාන්තා ශ්‍රමිකයින් තවදුරටත් අනතුරට ලක්වූයේ කෙසේද යන්න විභාග කිරීමයි. ඒ හරහා මා උත්සාහ ගන්නේ කොවිඩ්-19 වසංගතය වැනි බාහිර උවදුරක් හමුවේ සමාජයේ පවතින ආන්තීකරණයන් තවදුරටත් තීව්‍ර වන්නේ කෙසේද යන්න සහ, එම අන්තයන්ගේ ජීවත් වන්නන්ට එමගින් බලපෑම් ඇති කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමටය.

## ආර්ථික ගැටළු සහ පැවැත්ම සඳහා අරගලය

වර්ෂ 2021 මාර්තු 20 වනදා දිවයිනටම බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීමත් සමඟ, නිදහස් වෙළඳ කලාප තුළ සිය නිවෙස් වලට යාගත නොහැකිව කුලී නිවාස වල සිරවූ සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ සංඛ්‍යාව 275,000 ක් පමණ වූ බවට තක්සේරු කොට ඇත (*UN(DER) PAID IN THE PANDEMIC: An estimate of what the garment industry owes its workers,* 2020, p. 28). ඔවුන්ගේ තත්වය සාකච්ඡා කිරීමේදී ආර්ථික කරුණු වලින් ආරම්භ කිරීම වඩා යෝග්‍ය වන්නේ අනෙක් බොහෝ ප්‍රශ්න වල මූලාරම්භයද එහි වන බැවිනි.




*වසංගත සන්දර්භයෙහි අඩු ගෙවීම්: ඇඟලුම් කර්මාන්තය විසින් ස්වකීය සේවකයන්ට ඇති ණය ප්‍රමාණය පිළිබඳ ඇස්තමේනතුවක් (2020, පිටුව 29).*

වසංගතය ආරම්භයේදීම වැටුප් කප්පාදු කිරීම්, අළුත් අවුරුදු හා වර්ෂ අවසාන සමුච්චිත දීමනා අහිමි වීම් මෙන්ම සමහර අවස්ථා වල රැකියා අහිමි වීම් වැනි තත්වයන් වලටද මුහුණ දීමටද සමහර ශ්‍රමිකයින්ට සිදුවිය (*Sri Lankan garment workers decry violations of labor rights - UCA News*, 2020; Hari Tv, 2020). මෙම කප්පාදු කිරීම් සිදුවන්නේ සාමාන්‍ය කාලයකදී වුවද ඔවුන්ගේ වැටුප අතිකාල දීමනාද ඇතුළුව රුපියල් 25,000 ක් පමණ වන පසුබිමක බව සිහිතබා ගත යුතුය (Hewamanne, 2021, p. 56). මේ පිළිබඳව මෑතදී එළි දක්වන ලද වාර්තාවකට අනුව 'COVID-19 Pandemic: A Pretext to Roll Back Sri Lankan Garment Workers' Rights' Report, 2020, p. 4) සමහර අවස්ථා වල ඇඟලුම් ශ්‍රමිකයන්ට ඔවුනගේ සාමාන්‍යය වැටුපෙන් දළ වශයෙන් 40% ක් පමණ අහිමි වී ගොස් ඇති බව පැහැදිලි වේ. මෙම තත්වය යටතේ වෘත්තීය සමිති, සේවාදායකයන් සහ

රජය අතර 2020 මැයි 5 වනදා ඇතිකර ගත් එකඟතාවක් මඟින් අරමුණු කළේ වසංගත තත්වය තුළ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීමය. ඊට අනුව රැකියා අහිමි කිරීම් සිදු නොකිරීම, සේවයට වාර්තා කරන සහ නොකරන සියල්ලන්ගේ වැටුප් වලින් 50% ක් වත් ඔවුන් වෙත ලබාදීම (හෝ ඩොලර් 75 ක අවම වේතනයක් ලබාදීමට කටයුතු කිරීම) සහ නිත්‍ය සේවකයන්ගේ සමාජ ආරක්ෂණ අරමුදල් වලට සිය දායකත්වය දිගටම දැක්වීම වැනි කරුණු සම්බන්ධයෙන් එකඟතා ඇතිකර ගෙන තිබුණි (*COVID-19 Pandemic: A Pretext to Roll Back Sri Lankan Garment Workers' Rights,* 2020; *UN(DER) PAID IN THE PANDEMIC: An estimate of what the garment industry owes its workers,* 2020). එසේ වුවත් කම්කරු දෙපාර්තමේන්තුවේ විමර්ෂණ වලට අනුව නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගෙන් 32% ක් තරම් පිරිසකට වසංගත සමය තුළ සිය වැටුපවත් ලැබී නොතිබුණ අතර, එසේ සිදුවූ අහිමි වීම් වල සමස්තය මාසිකව රුපියල් මිලියන 88 ක් වැනි අති දැවැන්ත මුදලකි. මෙම පාඩුව රජයේ කිසිදු සහන වැඩසටහනකින් නොපියවූ බවද මතක තබාගත යුතුය (ඉහත එම). ඉහත රූප සටහනේ දැක්වෙන්නේ 2020 පෙබරවාරි සහ මාර්තු මාස අතර කාලය තුළ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ වැටුප් පරතරයයි.

මේ සම්බන්ධ ක්‍රියාකාරියකු මෙම තත්වය යටතේ ශ්‍රමික ජීවිතයේ අත්දැකීම් පහත අන්දමට විස්තර කොට තිබුණි:

> ඇමතිතුමා කියූ නිසා රුපියල් 14,500 අවම වැටුප ලබා දුන්නත්, අළුත් අවුරුදු දීමනාව ඇතුළු සෙසු සියළු දීමනා කපා හැරියා. එම නිසා බොහෝ අයට සිය ණය තියා බෝඩිං ගාස්තු ගෙවා ගැනීමේ හැකියාවවත් තිබුණේ නැහැ. නිවෙස් වලට මුදල් යැවීමද බොහෝ දෙනා නතර කළා. සමහරුන්ට කියා තිබුණේ කණ්ඩායම් වශයෙන් සේවයට වාර්තා කරන ලෙසයි. නමුත් ඔවුන්ටත් ලබා දුන්නේ පළමු මාස දෙක තුළ අර්ධ වැටුපක් හා පසුව වැටුපෙන් කාලක්. අවසානයේ එයාලට අයින් කරන්න ඕන සේවකයන් අයින් කරලා දැම්මා. සමහර ශ්‍රමිකයන් වන්දි ඉල්ලා නඩු දමා ජය ගත්තත්, බොහෝ අය ඊට මැලි වූයේ කලාපයේ කිසිම තැනකින් අනාගතයේ තමන්ට වැඩ නොලැබේවිය යන බියෙන්.[1]

ප්‍රාග්ධන හිමියා මෙසේ වැටුප් කප්පාදු සහ රැකියා අහිමි කිරීම් ඔස්සේ සිය ලාභය දිගින් දිගටම වැඩිකර ගනිමින් සිටියදී (Hari Tv, 2020) රාජ්‍යය විසින්ද මෙම ආන්තික ප්‍රජාව සිය සුබසාධන යාන්ත්‍රණ වලින් බැහැර කොට තිබේ (Arunathilake, 2013). හදිසි අවස්ථා සහන දීමනාවක් ලෙස රජයෙන් ලබාදුන් රුපියල් 5000 දීමනාව නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ට

1 ක්‍රියාකාරියකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 28.

ලබාගත නොහැකි වීම තුළ මෙම තත්වය පැහැදිලිව දක්නට විය. ඊට හේතුව ලෙස දැක්වූයේ තමන් රැඳී සිටින ස්ථානයේ ස්ථිර පදිංචිය පෙන්වීමට ඔවුන්ට නොහැකි වීමය. මෙම ලිපිය ලිවීමේදී සම්මුඛ සාකච්ඡාවක් ලබාදුන් එක් ප්‍රතිචාරකයකුට අනුව "ගම් පළාතට ගිහින් එහෙ ලිපිනය පෙන්නලා රුපියල් 5000 ගන්න ඇඳිරි නීති පාස්පොතක් ලබාදුන්නේ නැහැ මට. කන්නවත් සල්ලි තිබුණෙ නෑ අන්තිමේ."[2]




මූලාශ්‍රයඃ ආටිගල (2020)

ඒ අනුව වසංගත තත්වය තුළ මෙම ශ්‍රමිකයින්ගේ ආර්ථික තත්වය සම්බන්ධයෙන් රාජ්‍යය හෝ ප්‍රාග්ධන හිමිකරුවන් සංවේදී නොවූ බව පැහැදිලිය. එසේම ශ්‍රමිකයින් හා පුරවැසියන් ලෙස ඔවුන්ගේ අයිතීන් පිළිබඳව කිසිදු වගකීමක් නොගත් බවද පෙනී යයි. මේ නිසා ශ්‍රමිකයින්ගේ පෞද්ගලික ආර්ථික තත්වය තව තවත් සීඝ්‍රයෙන් නරක අතට හැරෙන්නට වූ අතර, එම නිසා ඔවුන් සිය ජීවිතය තුළ ආදායම මත පදනම්ව කලින් භුක්ති විඳි යම් හෝ තීරණ ගැනීමේ බලයක් තිබුණා නම් එයද නැතිව ගියේය (Hewamanne, 2021). ඒ අනුව කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ පවතින ආර්ථික ආන්තීකරණය තවදුරටත් තියුණු වූ බව කිව හැකිය.

2 බියගම නිදහස් වෙළඳ කලාපයේ ශ්‍රමිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 31.

## කොවිඩ්-19 යටතේ ජීවන තත්වයේ පහළ බැසීම

කොවිඩ්-19 වසංගතයේ බලපෑම විවිධ කණ්ඩායම් වලට විවිධ අයුරින් දැනුනු බව දැන් වනවිට හොඳින් පැහැදිලි කරුණකි. මේ සම්බන්ධයෙන් හොඳම උදාහරණයක් වන්නේ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයාය. වසංගතයට පෙර සිටම අත්විඳින ලද්දා වූ බහුවිධ ආන්තීකරණයන් නිසා මෙවැනි අර්බුද තත්වයක් තුළ වඩාත් අවධානමට ලක්විය හැකි සහ වින්දිත මට්ටමකට ඔවුන් ඇද වැටුණි. එහිදී ශ්‍රමිකයන් මෙන්ම පුරවැසියන් ලෙසත් අයිතිවාසිකම් උල්ලංඝණය වීම් ගණනාවකට ඔවුන් මුහුණ පාන්නේ ඒ අනුවය. මෙම කොටසේදී මගේ අරමුණ මෙසේ අයිතීන් උල්ලංඝණය වීම හරහා ශ්‍රමිකයන් ලෙස හා පුද්ගලයන් ලෙස ඔවුන්ගේ ජීවන තත්වයේ සිදුවූ පහත බැසීම හඳුනා ගැනීමයි.

### *සේවා ස්ථානයේ තත්වය*

කොවිඩ් පළමු රැල්ලේ සිට දෙවන රැල්ල වන විට නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ ජීවන තත්වයෙහි දරුණු පසුබැස්මක් සිදුවූයේ බොහෝ කොටම පෞද්ගලික ආර්ථිකයේ කඩාවැටීම නිසාය. වර්ෂ 2020 ඔක්තෝබර් මාසයේ ‘බ්‍රැන්ඩික්ස් පොකුර’ අරබයා උද්ගත වූ තත්වය හේතුවෙන් මේ තත්වය තවත් නරක අතට හැරුණි. පහත උපුටා දක්වා ඇත්තේ එම ආයතනයෙහි සේවය කළ අයෙක් ලබාදුන් විස්තරයක් වේ:

> මම දැනට මාතර කුඹුරුගමුව රෝහලේ කොරෝනා රෝගය සඳහා ප්‍රතිකාර ගන්නවා. අපේ ආයතනයේ වැඩ කළ 200 ක් පමණ පිරිස මේ අවස්ථාවේ මෙසේ ප්‍රතිකාර ලබා ගන්නවා. මුලින්ම ආයතනයේ 600 ක් පමණ දෙනාට වෛරසය වැළඳී ඇති බව තහවුරු වූ අවස්ථාවේ අපට කීවේ ඉලක්ක සම්පූර්ණ කරගැනීම සඳහා දිගටම වැඩ කරගෙන යන ලෙසයි. ඒ වෙලාවේ යමක් කළා නම් මේක නවත්තගන්න තිබුණා. අපට මුලින්ම කීවේ ආයතනයට ඇවිත් පරීක්ෂා කරගන්නා ලෙසයි. එහිදී තමයි මට රෝගය ආසාදනය වී ඇති බව හෙළි වුනේ. ඒත් සමගම මගේ පවුලේ අයට නිරෝධායනය වන ලෙස දන්වා ඔවුන්ට අවශ්‍ය ආහාර පානාදිය ආයතනයෙන් ලබාදුන්නා. ඔවුන්ගේ PCR පරීක්ෂණ හෙට කිරීමට නියමිතයි. අපේ පරීක්ෂණ ප්‍රතිඵල එනවිට අපි Victoria’s Secret වෙළඳ නාමයේ ඇඟළුම් වගයක් මසමින් හිටියේ. කතාවක් තියෙනවා ඊට අවශ්‍ය ද්‍රව්‍ය ගෙනාවේ ඉන්දියාවෙන් කියලා. එහි ඇත්ත නැත්ත මම දන්නේ නැහැ. (*Garment workers on the frontline of the pandemic outbreak in Sri Lanka,* 2020)




මූලාශ්‍රයඃ ආටිගල (2020)

වෛරසය වැළඳී තිබියදී දීර්ඝ වැඩ පැය ගණනක් සේවය කිරීමට සිදුවීම කොතරම් අපහසු හා කළමණාකාරීත්වය පාර්ශවයෙන් කොතරම් අමානුෂිකදැයි යන්න අමුතුවෙන් සඳහන් කිරීම අවශ්‍ය නොවේ. සමහර අවස්ථා වල දිගටම වැඩ කළ හැකි අයට එසේ කළ නොහැකි අයගේද ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා කිසිදු අමතර ගෙවීමකින් තොරව වැඩිපුර වැඩ කිරීමට සිදුවූ බවද වාර්තා වුනි.[3]

මෙයාකාරයෙන් දැඩි ලෙස සූරාකෑමෙන් පසුවත්, වෛරසය නොවැළඳුනු අයව එන්නත්කරණය කිරීමට හෝ කර්මාන්තශාලාව තුළ දීර්ඝ සේවා මුර සම්පූර්ණ කරන්නන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව තහවුරු කිරීමට කිසිදු වැඩ පිළිවෙළක් අනුගමනය කොට නොතිබීම නින්දා සහගතය (Hari Tv, 2020; Ruwanpura, Gunawardena, and Padmasiri, 2021). හේවාමාන්න (2021 p. 65) සඳහන් කොට ඇත්තේ බ්‍රැන්ඩික්ස් පොකුරෙන් බාහිර සමාජයට එල්ල කළ තර්ජනය නොවන්නට මෙම භාවිතයන් දිගින් දිටම පැවතෙන්නට හොඳටම ඉඩ තිබූ බවයි.

## *පෞද්ගලික ජීවිතය*

සමාජ සහ ප්‍රසිද්ධ මාධ්‍ය වල පලවූ බොහෝ ප්‍රවෘත්ති වලින්, නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ට රට අගුළු ලා තිබූ කාල සීමාව තුළ ජීවිතය කොතරම් අභියෝගාත්මක වුණිද යන්න පැහැදිලි විය. සිය කුලී නිවාස තුළ

3 නිදහස් වෙළඳ කලාපයක ශ්‍රමිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 28.

ඔවුන් පත්වූ අනාරක්ෂිත තත්වය ඒ අතර වැදගත් වේ. ප්‍රමාණවත් තරම් ආහාර පානාදිය නොතිබීම, සහකරුවන්ගේ ශාරීරික අඩන්තේට්ටම් සහ හිංසනයට ලක්වීම සහ නිවෙස් හිමියන්ගෙන් අනවශ්‍ය ලිංගික අවධානය ලැබීම වැනි ගැටළු මේ අතර විය. මීට අමතරව තිබූ මූලිකම ප්‍රශ්නයක් වූයේ මෙවැනි කුලී නිවාස වල කාමරයක තුන් හතර දෙනෙකු එක්ව වාසය කිරීම වෛරසය පැතිරීමට සුවිශේෂයෙන් තුඩදුන් කාරණයක් වීමයි (Perera and Fenando, 2020). බියගම නිදහස් වෙළඳ කලාපයේ සේවක අයිතීන් පිළිබඳ ක්‍රියාකාරියෙක්ට අනුව තත්වය පහත පරිදි විය:

> පොසිටිව් වෙන අයට වැඩට එන්න එපා කියනවා. ඔවුන් දවස් 14 ක් නිවසේ නිරෝධායනය විය යුතුයි. නාන කාමරය පාවිච්චි කිරීමට ගියාම බෝඩිං අයිතිකරුවන් බලන්නේ හරියට යකෙක් දිහා බලනවා වගේ. ඔවුන්ට කන්න දෙයක් තිබුණේ නෑ. අඩු තරමේ විටමින් සී පෙත්තක් තරම්වත් තිබුණෙ නැහැ බොහෝ අයට. PHI ලා ආවෙවත් නෑ. ටික කාලයක් ගියාම සමහර බෝඩිං අයිතිකරුවන් නේවාසිකයින්ට පිට වෙන්න කියා තිබුණා, මොකද බොහෝ දෙනා එකම තැන නිරෝධායනය වන විට වැසිකිළි එහෙම හිර වෙන්නටත් කරන්ට් බිල් වැඩි වෙන්නටත් පටන්ගත් නිසා. ඒ වගේම සමහර අයට දින 30 ක් පමණ දක්වා නිරෝධායනය වෙන්නට සිදුවුනා. ඊට හේතුව එක් නිරෝධානයක් ඉවර වෙද්දි එතැනම තවත් අයෙක් පොසිටිව් වීම. ඇත්තෙන්ම සමහර අවස්ථා වල දිගින් දිගටම නිරෝධායනයේ හිටපු අයත් උන්නා.[4]

සංචරණ සීමා සහ අඩුවන ආදායම නිසා බොහෝ ශ්‍රමිකයින්ට දැඩි ආහාර අර්බුදයක්ද පැවතුණි. බොහෝ දෙනා දිනකට එක් වේලකින් පමණක් සෑහීමට පත්ව සිට ඇති අතර, කහට තේකකින් සහ ගස් වලින් වැටෙන පලතුරු අනුභව කරමින් ජීවිතය ගැටගසා ගත් අය පිළිබඳ පුවත්ද අසන්නට ලැබුණි. කඩයකින් බඩු මිළදී ගත්තේ නම් ඒ ණයටය. සන්ධ්‍යාවේ 6 ට ඇඳිරි නීතිය බලාත්මක කරන ලද බොහෝ දිනවල පස්වරු 2 තරම් වනතෙක් වැඩ කරන්නට සිදුවූ බොහෝ දෙනෙක් වූ අතර, එම නිසා ඇඳිරි නීතියට පෙර නිවසට යාගන්නට තරම් ඔවුන්ට කාලය ප්‍රමාණවත් නොවුණු බව පැවසේ (ඉහත එම; Wijesinghe, 2020).

මෙම සියළු අත්දැකීම් වලින් කියවෙන්නා වූ සූරාකෑම පිළිබඳ ආඛ්‍යානයෙන් පැහැදිලි වන්නේ රාජ්‍යයේද ආශිර්වාදය සහිතව සිදුවන ප්‍රාග්ධනය රැස් කිරීමේ පීඩාකාරී ක්‍රියාවලිය තුළ ශ්‍රමිකයා කොතරම් ආන්තීකරණය වන්නේද යන්නය. නිරෝධායනය වෙමින් සිටි හෝ වසංගත තත්වය තුළත් දිගටම රැකියාවෙහි නියුතු වූ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ තත්වය සොයාබැලීමට කරදර නොවීමෙන් හා, කර්මාන්ත ශාලා

4 ක්‍රියාකාරියකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 28.

වල අමු අමුවේ සිදුවූ කොවිඩ් රෙගුලාසි උල්ලංඝණය කිරීම් නොදැක්කා සේ සිටීමෙන්, මෙම ප්‍රාග්ධන රැස් කිරීමේ ක්‍රියාවලියට රාජ්‍යය කුමන පරිමාණයකින් සම්බන්ධ වන්නේද යන්න පැහැදිලි වේ. එතුළ එම ප්‍රාග්ධන සම්පාදන ක්‍රියාවලියට පණ පොවන ශ්‍රමිකයාගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ ගරුත්වය යන සියල්ල නොසළකා හැර ඇත.




මූලාශ්‍රයඃ බණ්ඩාර (2021ඉ)

***සමාජ දූර්මත***

නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් වෛරසය පැතිරවීමට විශේෂ ප්‍රවණතාවයක් සහිත බව වන වටහා ගැනීම පිටුපස පෙර දක්වන ලද කිලිටි භාවය සහ අසංවර බව පිළිබඳ ආඛ්‍යානය පවතී (Preston and Firth, 2020, as cited in Hewamanne, 2021). බ්‍රැන්ඩික්ස් පොකුර ආශ්‍රිතව මෙම තත්වය සුවිශේෂයෙන් දක්නට ලැබුණු අතර, ඊට සමකාලීනව හට ගැනුණු පෑලියගෙ ාඩ මත්ස්‍ය වෙළඳපොළ ආශ්‍රිත පොකුරට මෙම ඉරණම අත්නොවීම සැළකිය යුත්තකි. සමාජ හා ප්‍රසිද්ධ මාධ්‍ය වලින් පෑලියගොඩ පොකුරට ලබා නොදුන් ප්‍රචාරයක් බ්‍රැන්ඩික්ස් පොකුරට ලබාදීම මඟින් වෛරසයේ නව ප්‍රභවය ලෙස ඔවුන් උලුප්පා දක්වන ලදී. පුරුෂාධිපති පද්ධතියක් තුළ සදාචාර සම්පන්න භාවය පිළිබඳ පනවා ඇති නියමයන්ට පිටතින් ජීවත් වන කාන්තාව විවිධාකාරයේ හානීන්ට නිරාවරණය වියහැකි බවට වන මතය තුළ මෙම ආඛ්‍යාන අරුත් ගනී. එම කතිකා මඟින් ඇති කරන ලද පීඩනය පිළිබඳව ක්‍රියාකාරීනියක් මෙසේ විස්තර කළාය:

> මෙම කාන්තාවන් බොහෝ දෙනෙක්ට සිය ගම්බිම් බලා යැමට නොහැකි වුනා. ඊට හේතුව ඔවුන්ගේ අසල්වැසියන් 119 අමතා ඔවුන් පැමිණි බව වාර්තා කිරීම. මා දන්නා එක් අවස්ථාවක එක් කාන්තා ශ්‍රමිකයෙක් පොළොන්නරුවටම ගිහින් දුම්රිය වේදිකාව ළඟට පැමිණ සිටි අම්මා මොහොතකට දැකගෙන අනෙක් අතට කොළඹට පැමිණියා. ගාමන්ට් ළමයි

වෛරසය ගමට ගෙන ඒවි යැයි ගම්වාසීන් තුළ තිබූ භීතිය නිසයි ඇයට ගෙදර යාමට නොහැකි වූයේ. ඒ අවස්ථාවේ ඔවුන්ට උදා වුනේ වැඩට යන්නත්, බෝඩිමේ ඉන්නත්, ඒ වගේම ගෙදර යන්නත් බැරි තත්වයක්.[5]

රාජ්‍යය මෙන්ම සමාජයද සංක්‍රමණික ශ්‍රමිකයා සළකන්නේ නගරයේ ජීවත් වන පිටස්තරයකු ලෙසය. එම නිසා එම අවකාශයෙහි ඔවුන්ගේ පැවැත්ම පොදුජන විඥානය තුළ එතරම් මුල්බැස ගෙන නොමැති අතර, ඔවුන්ගේ අයිතීන් දරුණු ලෙස උල්ලංඝණය වීම පිළිබඳ විවේචනයක් නොපැවතීමට එයද එක් හේතුවක් වී ඇත. එමෙන්ම රාජ්‍යයේ පරිපාලන ව්‍යුහය තුළත් ඔවුන්ගේ පැවැත්ම අදෘශ්‍යමාන වී තිබේ. මන්ද ඔවුන් නිල වශයෙන් පදිංචිව සිටිය යුතු ස්ථානයේ ඔවුන් භෞතිකව නොමැති වීමත්, භෞතිකව වාසය කරන ස්ථානයේ නිල වශයෙන් පදිංචිව නොසිටීමත් නිසාය. අත්තන්පොලට (2006) අනුව මෙම 'අස්ථානික භාවය' හේතුවෙන් කරදරේ නොවැටී සිටීමට ප්‍රමාණවත් මානසිකත්වයක් ශ්‍රමිකයා තුළ වර්ධනය වී ඇත. මෙම මානසිකත්වය අභ්‍යන්තරීකරණය වූ විට සූරාකෑම සාමාන්‍යකරණය වේ; සාමාන්‍යකරණය වූ විට එය බාහිර ලෝකයට මෙන්ම ඔවුන්ටත් අදෘෂ්‍යමාන වේ; එවිට එම පද්ධතිය හා එහි ව්‍යුහයන් පිළිබඳව ප්‍රශ්න නැගීමේ හැකියාව නැතිව යයි.

ස්ත්‍රීත්වය, ආර්ථික පසුබිම මෙන්ම රැකියාව නිසාද ඔවුහු බහුවිධ ආන්තීකරණයන්ට ලක්වෙති. එම නිසා තත්වය නිවැරදි කිරීම සඳහා ක්‍රියාත්මක වීමට ඇති ඉඩ තවදුරටත් ඇහිරෙන අතර (Jordal, Öhman, and Wijewardene, 2020), අනතුරට ලක්විය හැකි භාවය ඊට සාපේක්ෂව ඉහළ යයි. බියගම නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු ප්‍රතිචාරකයකු වසංගත සමය තුළ මුහුණ දුන් පහත අත්දැකීමෙන් මෙම තත්වය පැහැදිලි වේ. ඇයට අනුව නැවත සිය නිවස බලා යාම සඳහා ඇඳිරි නීති සංචරණ අවසරපතක් ලබාගැනීමට ගියවිට අදාළ පොලිස් නිලධාරියා හඟවා ඇත්තේ එදින රාජකාරී අවසන් වූ විට ඇයව පෞද්ගලිකවම රැගෙන යන්නම් කියාය[6]. මෙහි වෙනත් අරමුණක් තිබූ බව ඉතා පැහැදිලි වේ. තවත් අවස්ථාවකදී කිසිදු ගරුත්වයකින් තොරව බස් රථ වලට පටවාගෙන මෙම ශ්‍රමිකයන් සිය දිස්ත්‍රික්කයන් බලා ගෙනගොස් තිබුණි. එහිදීද අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට ඔවුන් ඇරලවා තිබුණා මිස එතැනින් එහාට නිවෙස් බලා යන ආකාරයක් සම්පාදනය කොට දී තිබුණේ නැත. රට පුරා ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන අවස්ථාවක දින ගණනාවක් සිය තාවකාලික නවාතැන් වල කුසගින්නේ පසුවූ මෙම පිරිස ගෙදර යාමට මාර්ගයක් සැලසීමකින් තොරව

5 ක්‍රියාකාරියකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 28.

6 බියගම නිදහස් වෙළඳ කලාපයේ ශ්‍රමිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 31.

නගරයන් මැද හුදෙකලා කොට යාම නිසා පා ගමනින් නිවස දක්වා යාමට සිදුවූ අතර, සමහරුන්ට සිය නිවසට යාමට දින දෙකක් තරම් කාලයක් ගතවූ අවස්ථා තිබුණි[7].

මෙම තත්වය තුළ විද්‍යාමාන වන 'හඬක් නොමැති බව' යනු ආයතනගත වී ඇති යථාර්ථයකි. නිදසුනක් ලෙස කිසිදු දැනුම් දීමක් නොමැතිව හමුදාව විසින් මෙම ශ්‍රමිකයින් නිරෝධායන මධ්‍යස්ථාන වලට කුදලාගෙන යාම දැක්විය හැකිය. මෙවැනි සමහර අවස්ථා වලදී කොවිඩ් නොමැති බවට වෛද්‍යමය සාක්ෂි පවතිද්දී පවා බලෙන්ම මෙසේ නිරෝධායනය සඳහා යොමුකර තිබුණේ පැහැදිලි කිරීමට කිසිදු අවස්ථාවක් ලබා නොදීය (De Silva, 2020). රාජ්‍යය ව්‍යුහය මඟින්ද මෙම ශ්‍රමිකයින් ගෞරවයක් සහිතව සැලකීමට තරම් නොවන බව තීරණය කර ඇති බවය මින් පෙනී යන්නේ.

නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ හඬක් නොමැති බව විශේෂයෙන්ම වසංගත තත්වය තුළදී අයිතිවාසිකම් උල්ලංඝණය වීම් ගණනාවකට තුඩු දී ඇත. ඉහත දැක්වූ පරිදි මේ පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් පැවැත්ම තුළ සිදුව ඇත්තේ එම තත්වය සාමාන්‍යකරණය වීමත්, ඒ හරහා අදෘෂ්‍යමාන වීමත්ය. වසංගතයෙන් මතු කරන ලද අමතර අභියෝග පිළිබඳ යථාර්ථය තුළ මෙම ආන්තීකරණය වඩාත් දරුණුව ඇත්තේ ඔවුන්ගේ සමාජ-ආර්ථික ආරක්ෂාව එන්න එන්නටම පිරිහෙමින් පවතින හෙයිනි. එහෙත් ශ්‍රම බලකායක් වශයෙන් අද වන විට ඛණ්ඩනය වී ඇති නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් අතර එම නිසා මේ තත්වයට ප්‍රතිරෝධය දැක්වීමට අවශ්‍ය හැකියාව වර්ධනය වී නැත. මෙසේ ශ්‍රමය ඛණ්ඩනය කිරීම ප්‍රාග්ධනය එක්රැස් කිරීම සඳහා උපකාරී වන බව නොකිවමනාය. ස්වකීය අයිතීන් භුක්ති විඳීමෙහිලා ඔවුන්ට එම තත්වය බලපෑම් කරන ආකාරය ඊළඟ කොටසින් විමසා බලන්නෙමි.

## රාජ්‍යය, ප්‍රාග්ධනය සහ ශ්‍රමය

වසංගතයේදී නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයා මුහුණ දුන් තත්වය තුළ ශ්‍රමය අරබයා රාජ්‍යය සහ ප්‍රාග්ධනයෙහි ක්‍රියාකාරීත්වය යම්තාක් දුරකට හෝ හඳුනාගත හැකි වේ. එහිදී ශ්‍රමිකයා මුහුණ දුන් අමිහිරි අත්දැකීම් වලින් රාජ්‍යය හා ප්‍රාග්ධනය ඉවත බලාගත් බව දැන් වනවිට පැහැදිලිය. නමුත් එතරම් පැහැදිලි නොවන යථාර්ථයක් වන්නේ මෙම ඉවත බැලීම තුළ ශ්‍රමිකයා අත්‍යන්ත ලෙස සූරාකෑමට අවශ්‍ය තත්වය නිර්මාණය වූයේ කෙසේද යන්නයි.

---

7 රාජ්‍ය නොවන සංවිධානයක සාමාජිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 20.




මූලාශ්‍රයː බණ්ඩාර (2021ඉ)

මුලින්ම ප්‍රාග්ධනයට අදාළ කරුණු සළකා බලමු. මෙහිදී ප්‍රාග්ධනය නියෝජනය වන්නේ කර්මාන්ත ශාලා හිමියන් සහ එහි කළමණාකාරීත්වයෙනි. වසංගතය නිසා නිදහස් වෙළඳ කලාප තුළ සිරවූ ශ්‍රමිකයන්ට වෛරසය පතුරුවන්නන් ලෙස සමාජයේ තිබූ තත්වය හේතුවෙන් සිය කුලී නිවාස වලින් පිටතට යාගත නොහැකි වීමේ අසරණකමින් මෙම ප්‍රාග්ධන හිමිකරුවෝ ප්‍රයෝජන ගත්හ. එහිදී නිෂ්පාදන වියදම් අඩු කිරීම තුළින් ලාභය වැඩිකර ගැනීම අරමුණු කරන ලදී. එය මූලිකවම සිදුකරන ලද්දේ ශ්‍රමිකයන්ට සිය නවාතැන් වල සිට කර්මාන්ත ශාලාවට යාම් ඊමේ පහසුකම් කළමණාකාරීත්වය විසින් සපයා, දෛනික වැඩ පැය ගණන දීර්ඝ කිරීම තුළිනි. ඉන්පසු නිත්‍ය සේවකයන්ගේ සමාජ ආරක්ෂණ පිරිවැය අඩු කරන ලද්දේ ඇඟළුම් නිෂ්පාදන වලට ඇති ඉල්ලුම පහත යාමේ පදනම මතය. තෙවැනි ක්‍රමයක් වූයේ වෛරසය ආසාදනය වූවන්ගේ වැඩද ආසාදනය නොවූ අය ලවා කිසිදු අතිකාල දීමනා හෝ අමතර ගෙවීම් ලබාදීමකින් තොරව කරවා ගැනීමයි[8]. කෙසේ නමුත්, මෙසේ ඉතා පීඩාකාරී තත්වයන් යටතේ ශ්‍රමිකයන්ගෙන් වැඩ ගැනීමට තරම් ඇඟළුම් නිෂ්පාදන වලට ඉල්ලුමක් තිබුණා විය යුතුය. ඇත්තෙන්ම ලංකාවේ ඇඟළුම් කර්මාන්තයට මෙම වකවානුව තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය මුහුණු හා අත් වැසුම් වැනි නිෂ්පාදන ලබාදීම සඳහා දැවැන්ත ඇණවුම් ලැබුණු බවට තොරතුරු තිබේ (*Sri Lanka's apparel industry attracts over 500 mln USD orders for PPE,* 2020). එසේම බදු සහනයේ ප්‍රතිලාභද ශ්‍රමිකයාගේ මට්ටමට ළඟා වී නොතිබීම විශේෂයෙන්ම මෙවැනි අර්බුද අවස්ථාවක කණගාටුදායකය (Hari Tv, 2020).

8 රාජ්‍ය නොවන සංවිධානයක සාමාජිකයකු සමග සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 20.

මෙහිදී ශ්‍රමිකයා ලබන සැළකුම් තුළ ඔවුන්ගේ මානව වටිනාකම සහ ගරුත්වය හෑල්ලුවට ලක්වන අයුරු පැහැදිලිව පෙනී යයි. අදාළ අවම වේතනය ඔවුන්ට ගෙවා දැමීම ප්‍රමාණවත් සේ පෙනී යන්නේ මෙවැනි චින්තනයක් තුළය. මානවයා වෙළඳ භාණ්ඩයක තත්වයට ලඝු වී ප්‍රාග්ධනයේ රැස්කිරීම සහ ව්‍යාප්තිය වෙනුවෙන් යෙදවෙන්නේ ඒ අනුවය. මෙම තත්වය රාජ්‍යයේද වාසියට හේතු වන අයුරු ඊළඟට මගේ අවධානයට යොමු වේ.

හැන්කොක් (2006) පෙන්වා දී ඇති පරිදි අසාධ්‍ය තත්වයේ පසුවන රටේ ආර්ථිකයට කාන්තා ශ්‍රමය ප්‍රධාන ආදායම් මාර්ගයකි. එම ශ්‍රමය වඩ වඩාත් සූරාකෑම මඟින් ප්‍රාග්ධන හිමිකරුවන්ගේ ලාභයද වැඩිවේ. ප්‍රාග්ධන හිමිකරුවන් ගෙවන්නා වූ බදු මුදල් මත යැපෙන රාජ්‍යයටද එම නිසා එකී සූරාකෑම වාසිදායකය. හාවි (2007) සහ බොදියු (1998) විසින්ද මීට සමාන අදහස් දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ ආදායම් මර්ග සොයමින් සිටින සහ සීඝ්‍රයෙන් නව ලිබරල්කරණය වන රාජ්‍යයට මෙවැනි අවිධිමත් ශ්‍රම බලකායක පැවැත්ම සහ එහි අත්‍යන්ත සූරාකෑම වැදගත් වන බවයි. එම නිසා ඒ ශ්‍රමය නියාමනය කිරීමේ ක්‍රියාවලියට රාජ්‍යය සම්බන්ධ වන අතර, එය සිදුවන්නේ එක්කෝ නොදැක්කා සේ සිටීමෙනි; නැතිනම් ඊට ක්‍රියාශීලීව දායක වීමෙනි.

මෙම නොදැක්කා සේ සිටීමේ භාවිතය සම්බන්ධයෙන් ලංකා රාජ්‍යය - මෙන්ම බොහෝ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් - ප්‍රසිද්ධියක් උසුලයි. රටේ සමස්ත ශ්‍රම බලකායට එක සේ අදාළ වියයුතු කම්කරු නීතියක් පවතිද්දීත් නිදහස් වෙළඳ කලාප තුළ එම නීතිය ප්‍රායෝගිකව බල නොපැවැත්වීම ඊට හොඳ නිදසුනකි. සාධාරණීකරණය කළ නොහැකි තරම් දීර්ඝ වැඩමුර, ප්‍රමාණවත් නොවන විවේක කාලය සහ අනාරක්ෂිත සේවා ස්ථාන තත්වයන් මෙම ගැටළුවෙහි සමහරක් පැතිමාන පමණක් වේ. රාජ්‍යයේ නිලධාරීන්, කර්මාන්ත ශාලා හිමිකරුවන් මෙන්ම ශ්‍රමිකයන් පෞද්ගලිකවද මෙම තත්වය සාමාන්‍ය එකක් ලෙස පිළිගෙන ඇත (Skanthakumar, 2017). වසංගත තත්වය තුළ රාජ්‍යයේ මෙම භූමිකාව ප්‍රකට වූයේ ඇඳිරි නීති සංචරණ බලපත්‍ර ලබාදීම ප්‍රතික්ෂේප කිරීම, ඇඳිරි නීති තත්වයක් තුළ නිවසට යාමට ප්‍රතිපාදන සැලසීමකින් තොරව නගරවල් මධ්‍යයේ හුදෙකලා කොට දමා යාම, සහ රජයේ සහනාධාර ක්‍රම වලට සුදුසුකම් ලබා නොදීම වැනි අවස්ථා තුළිනි. ප්‍රාග්ධනය සහ රාජ්‍යය යන ද්විත්වය සම්බන්ධයෙන්ම දැකගත හැකි තත්වයක් වන්නේ ශ්‍රමිකයා දරුණු ලෙස සූරාකෑමට ලක්කොට එම ලාභ ලබාගැනීමට භාවිතා කරන ශරීරය ඉවත දැමීමකි (Hewamanne, 2021). එම නිසා රාජ්‍යය සහ ප්‍රාග්ධනයෙහි අන්තර් රඟා පැවැත්ම නිදහස් වෙළඳ කලාප තුළ ශ්‍රමය දිගින් දිගටම සූරාකෑමට ලක්වීම කෙරෙහි ඍජුව දායක වී ඇත.

## නිගමනය

මෙම පරිච්ඡේදය තුළ මගේ අරමුණ වූයේ කොවිඩ්-19 වසංගතය මඟින් නිදහස් වෙළඳ කලාප වල ශ්‍රමිකයින්ගේ ජීවිත බලපෑමට ලක්කළ අයුරු හඳුනා ගැනීමයි. එහිදී ඔවුන්ගේ පවතින ආන්තික තත්වය වැඩි වර්ධනය කිරීමටත්, ඔවුන් තවදුරටත් සූරාකෑමට ලක් කිරීමටත් රජයේ වසංගත ප්‍රතිචාරය හේතු වූ අයුරු විමසුමට භාජනය කළෙමි.

සාමාන්‍ය තත්වයන් යටතේ වුවද නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් පන්තිය, ස්ත්‍රී-පුරුෂ භාවය සහ වෙනත් සමාජ-සංස්කෘතික සාධක වල එකතුව නිසා දරුණු ලෙස ආන්තීකරණය වූ පිරිසකි. කොවිඩ්-19 වසංගතය මඟින් එය තවත් දරුණු අතට හරවන ලදී. වසංගතයේ එක් එක් රැල්ලත් සමඟ මෙම ශ්‍රමිකයින්ගේ පෞද්ගලික ආර්ථිකය වඩ වඩාත් පිරිහීමට ලක්වූ අතර, ඊට අනුව ජීවන රටාවේද දැඩි පසුබෑස්මක් දක්නට විය. එම තත්වය තුළ ඔවුන් මුහුණ දෙන සූරාකෑම වඩ වඩාත් දරුණු වුවත්, ඒත් සමඟම එය වඩ වඩාත් සාමාන්‍යකරණය වීම හා ඒ තුළින් අදෘෂ්‍යමාන වීම සිදුවිය.

නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් පිළිබඳ සමාජයේ කලින් සිටම පැවති දුර්මතද වසංගත තත්වය තුළදී වඩාත් තීව්‍ර වන්නට විය. ඒ අනුව ඔවුන් සිය රැකියා සහ ජීවන ක්‍රමය නිසා වෛරසය පැතිරවීමට සාපේක්ෂව වැඩිපුර ඉඩක් ඇත්තවුන් බවට වන මතයක් සමාජගත වුනි. අදාළ ශ්‍රමිකයින්ද දැන් වන විට මෙවැනි ආකල්ප වලට හොඳින් හුරු වී සිටිති. නව ලිබරල්වාදයේ බණ්ඩනය කරන සුළු බලපෑම මෙම තත්වය වැඩිදුරටත් උත්සන්න කොට ඇත්තේ එදිනෙදාට ජීවිතය පවත්වාගෙන යෑම පිළිබඳ මානසිකත්වයක් ජනිත කරමිනි. එම නිසා සංවිධිත ප්‍රතිරෝධය පිළිබඳ හැඟීමක් හෝ ඔවුන් තුළ වර්ධනය නොවන බව පැවසීම වරදක් නොවේ.

මෙම තත්වයට රාජ්‍යය සහ ප්‍රාග්ධනය යන දෙකම වගකිව යුතුය. නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයා පාරිභෝජන භාණ්ඩයක තත්වයට ලඝු කිරීමත්, අවම වේතනය ගෙවා දැමීමෙන් පහසුවෙන් කළමණාකරණය කළ හැකි බවට සිතීමත් නිසා ඔවුන්ගේ මානව වටිනාකම සහ ගරුත්වය සම්පූර්ණයෙන්ම නැතිකර දමා තිබේ. එමඟින් සිදුව ඇත්තේ ශ්‍රමිකයා උපයා දෙන ලාභය සහ ඊට අදාළ ශ්‍රමය අතිශය අසාධාරණ ලෙස භාවිතා කොට, එම ලාභය උත්පාදනය සඳහා යොදාගන්නා ශරීරය අමතක කොට දැමීමයි. රාජ්‍යයට මෙම ශ්‍රමය යනු ආදායම් උපයන මාර්ගයකි; ප්‍රාග්ධනයට එය තවදුරටත් රැස් කිරීම සහ ව්‍යාප්ත වීමට අවශ්‍ය කරන්නා වූ මෙවලමකි. එම නිසා එම ද්විත්වයටම ශ්‍රමිකයා සූරාකෑමට හේතු ඇතිවාක් මෙන්ම, එම සූරාකෑම දිගටම හා වඩාත් නිර්දය ලෙස පවත්වාගෙන යාමට වසංගත තත්වය තුළින් ඉඩ හසර පාදා දී ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

Artigala, A. (2020) *Facebook*. Available at: https://www.facebook.com/permalink.php?story_fbid=4562515707099223&id=580456651971835 (Accessed: 24 July 2021).

Arunatilake, N. (2013) 'Precarious Work in Sri Lanka', *American Behavioral Scientist*, 57(4), pp. 488–506. doi: 10.1177/0002764212466246.

Attanapola, C. T. (2006) 'Were they ever "in place"? Sense of place and self-identities among migrant female export-processing zone workers in Sri lanka', *Norsk Geografisk Tidsskrift - Norwegian Journal of Geography*, 60(3), pp. 217–226. doi: 10.1080/00291950600891778.

Bandara, S. (2021a) *Facebook*. Available at: https://www.facebook.com/ArtOfSajith/photos/a.281558598710607/1829869590546159/?type=3 (Accessed: 24 July 2021).

Bandara, S. (2021b) *Facebook*. Available at: https://www.facebook.com/ArtOfSajith/photos/a.281558598710607/1839013799631738/?type=3 (Accessed: 24 July 2021).

Bandara, S. (2021c) *Facebook*. Available at: https://www.facebook.com/ArtOfSajith/photos/a.281558598710607/1873961409470310/?type=3 (Accessed: 24 July 2021).

Bourdieu, P. (1998) *Acts of Resistance: Against the New Myths of Our Time*. Translated by R. Nice. Cambridge: Polity Press.

*COVID-19 Pandemic: A Pretext to Roll Back Sri Lankan Garment Workers' Rights* (2020) AFL-CIO, Clean Clothes Campaign, Labour Behind the Label, Workers United, Maquila Solidarity Network, War on Want and USAS. Available at: https://cleanclothes.org/file-repository/sri_lanka_brief_ march_2021.pdf.

De Silva, M. (2020) 'Situation Of Garment Factory Workers In Katunayake – Covid-19', *Colombo Telegraph*, 14 October. Available at: https://www.colombotelegraph.com/index. php/situation-of-garment-factory-workers-in-katunayakecovid-19/ (Accessed: 24 July 2021).

*Garment workers on the frontline of the pandemic outbreak in Sri Lanka* (2020) WARONWANT. Available at: https://waronwant. org/news-analysis/garment-workers-frontline-pandemicoutbreak-sri-lanka

(Accessed 20 June 2021).

Gunatilaka, H. (2019) 'Gender Inequality at Work: A Literature Review', *International Journal of Research and Innovation in Social Science (IJRISS)*, 3(IX). Available at: https:// www.rsisinternational.org/virtual-library/papers/genderinequality-at-work-a-literature-review/ (Accessed: 24 July 2021).

Hancock, P. (2006) 'Women, work and empowerment: A portrait of women workers in two of Sri Lanka's Export Processing Zones', *Norsk Geografisk Tidsskrift - Norwegian Journal of Geography*, 60(3), pp. 227–239. doi: 10.1080/00291950600891836.

Hancock, P., Carastathis, G., Georgiou, J., Oliveira, M. (2016) 'Female workers in textile and garment sectors in Sri Lankan Export Processing Zones (EPZs): gender dimensions and working conditions', *Sri Lanka Journal of Social Sciences*, 38(1), pp. 63–77. doi: 10.4038/sljss.v38i1.7386.

Hancock, P., Middleton, S. and Moore, J. (2012) 'Gender, globalisation and empowerment: a study of women who work in Sri Lanka's Export Processing Zones', *Work Organisation, Labour & Globalisation*, 6(1), pp. 131–146. doi: 10.13169/workorgalaboglob.6.1.0131.

Hari Tv (2020) සමහරු කොස් ඇට කාලා වතුර බිව්වාග කාන්තාවන්ව විවිධ දේවල් වලට භාවිතා කලා - හෙළිදරව්ව [Hari Tv]. Available at: https://www.youtube.com/watch?v=ekkeroK92FM (Accessed: 24 July 2021).

Harvey, D. (2007) *A Brief History of Neoliberalism*. Oxford: Oxford University Press.

Hewamanne, S. (2003) 'Performing "Dis-respectability": New Tastes, Cultural Practices, and Identity Performances by Sri Lanka's Free Trade Zone Garment-Factory Workers', *Cultural Dynamics*, 15(1), pp. 71–101. doi: 10.1177/a033109.

Hewamanne, S. (2017) 'Toward Meaningful Health and Safety Measures: Stigma and the Devaluation of Garment Work in Sri Lanka's Global Factories', in Prentice, R. and De Neve, G. (eds) *Unmaking the Global Sweatshop*. Philadelphia: University of

Pennsylvania Press, pp. 226– 250. Available at: https://www.degruyter.com/document/ doi/10.9783/9780812294316-010/html (Accessed: 24 July 2021).

Hewamanne, S. (2018) 'Sewing their way up the social ladder? Paths to social mobility and empowerment among Sri Lanka's global factory workers', *Third World Quarterly*, 39(11), pp. 2173–2187. doi: 10.1080/01436597.2018.1458302.

Hewamanne, S. (2019) 'Crafting social change: former global factory workers negotiating new identities in Sri Lanka's villages', *Identities*, 26(2), pp. 165–183. doi: 10.1080/1070289X.2017.1380942.

Hewamanne, S. (2020) 'From global workers to local entrepreneurs: Sri Lanka's former global factory workers in rural Sri Lanka', *Third World Quarterly*, 41(3), pp. 547–564. doi: 10.1080/01436597.2019.1675504.

Hewamanne, S. (2021) 'Pandemic, Lockdown and Modern Slavery among Sri Lanka's Global Assembly Line Workers', *Journal of International Women's Studies*, 22(1), pp. 54–69.

Jayawardena, D. (2018) 'Patriarchy and (Un)Doing Factory of Women's Collective Identity in Sri Lanka's Localised Global Apparel Industry: The Glass Ceiling Revisited', in Mahtab, N. et al. (eds) *Handbook of Research on Women's Issues and Rights in the Developing World*. IGI Global, pp. 19–36. doi: 10.4018/978-1-5225-3018-3.ch002.

Jayawardena, D. (2020) 'Other's Place or Othering Space Reframing the Performativity of the Neoliberalized Space(s) of Factory Women in a Free Trade Zone in Sri Lanka', *Gender in Management: An International Journal*, 35(5), pp. 405–421.

Jordal, M., Öhman, A. and Wijewardene, K. (2020) 'Respectability and rights. Sexual and reproductive health and rights of Sri Lankan women formerly involved in prostitution', *Contemporary South Asia*, 28(1), pp. 28–42. doi: 10.1080/09584935.2019.1667301.

*Liberation Movement on Facebook Watch* (2021). Available at: https:// www.facebook.com/LiberationMovementLka/videos/noteven-13-of-the-working-class-has-been-given-the-

covid-19- vaccine-as-yet-on-o/323307655890361/ (Accessed: 24 July 2021).

Perera, W. and Fernando, K. (2020) Sri Lankan free trade zone employees told to keep working as infections rise, *World Socialist Web Site*. Available at: https://www.wsws.org/en/articles/2020/10/17/coro-o17.html (Accessed: 24 July 2021).

Ruwanpura, K. N. (2012) *Ethical codes: reality and rhetoric-a study of Sri Lanka's apparel sector. University of Southampton*. Available at: https://core.ac.uk/download/pdf/8747298.pdf (Accessed: 24 July 2021).

Ruwanpura, K. N., Gunawardana, S. and Padmasiri, B. (2021) 'Vaccine Inequality and the Cost to Garment Sector Workers', *Groundviews*, 22 May. Available at: https://groundviews.org/2021/05/22/vaccine-inequality-and-the-cost-to-garmentsector-workers/ (Accessed: 24 July 2021).

Skanthakumar, B. (2017) *Living for the day': Contract Workers in Sri Lanka's Free Trade Zones*. Katunayake: Dabindu Collective.

*Sri Lankan garment workers decry violations of labor rights - UCA News* (2020) *ucanews.com*. Available at: https://www.ucanews.com/news/sri-lankan-garment-workers-decry-violations-oflabor-rights/89988 (Accessed: 24 July 2021).

*Sri Lanka's apparel industry attracts over 500 mln USD orders for PPE* (2020) *Xinhua News*. Available at: http://www.xinhuanet.com/english/2020-05/22/c_139079934.htm (Accessed: 24 July 2021).

*UN(DER) PAID IN THE PANDEMIC: An estimate of what the garment industry owes its workers* (2020) Clean Clothes Campaign. Available at: https://cleanclothes.org/file-repository/underpaid-in-the-pandemic.pdf.

Wijesinghe, R. (2020) 'Sri Lankan garment workers face difficulties during and after COVID-19 curfew', *Praja*, 3 June. Available at: http://praja.lk/english/sri-lankan-garment-workers-facedifficulties-during-and-after-covid-19-curfew/ (Accessed: 24 July 2021).

8

# දුෂ්කර සමයක සමාජ සම්බන්ධතාඃ කොවිඩ්-19 වසංගත තත්වය තුළ රාජ්‍ය සේවා ලබාගැනීමේදී සමාජ සම්බන්ධතා ජාල වල භූමිකාව පිළිබඳ අධ්‍යයනයක්

*ශෂික් සිල්වා*

## හැඳින්වීම

ලොව වෙනත් රටවල මෙන්ම ලංකාවේද කොවිඩ්-19 වසංගත තත්වය නිසා පුරවැසියා සාමාන්‍යයෙන්ට වඩා බොහෝ වැඩියෙන් රාජ්‍යය මත රඳා පැවතීමේ තත්වයක් දැකිය හැකි විය. උත්සව සඳහා බලපත්‍ර ලබාග ැනීම, විවිධ ව්‍යාපාර කටයුතු වල යෙදීම, සංචරණය, එන්නත්කරණය, වියළි සලාක ලබාගැනීම වැනි බොහෝ කරුණු අරබයා මෙම රඳා පැවැත්මේ ස්වභාවය විද්‍යාමාන වන ලදී. මෙවැනි අවස්ථාවක සමානාත්මතාවය පිළිබඳ මූලධර්මයට ගරු කිරීම සඳහා රාජ්‍යයට අන් කවරදාටත් වඩා වගකීමක් පැවතියද, කොවිඩ්-19 වසංගත තත්වය තුළ රාජ්‍ය සේවා ලබාගැනීමේදී සිදුවූ විවිධාකාරයේ විශේෂ සැළකිළි සහ වෙනස්කොට සැළකීම් පිළිබඳ සාකච්ඡා බොහෝ ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ජාතික මට්ටමින් ඇති වී තිබේ.

මෑතදී කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ එවැනි සිදුවීමකදී එක්තරා නගර සභාවක නගරාධිපතිගේ බලකිරීම මත ඔහුගෙන් තුණ්ඩුවක් ලබාගෙන පැමිණි පිරිස පමණක් එන්නත්කරණය කිරීමට සෞඛ්‍ය නිලධාරීන්ට සිදුවිය (*Moratuwa Mayor arrested for disrupting the duties of health workers,* 2021). තවත් එවැනි සිදුවීමකදී බස්නාහිර පළාතේ පිරිසක් සංචරණ සීමා මධ්‍යයේ ගාල්ලට ගමන් කොට තිබුණේ ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ දෙවැනි මාත්‍රාව ලබාගැනීම සඳහාය. මෙය සිදුවන්නේ දෙවැනි මාත්‍රාව ලබාදීමේ ක්‍රියාවලිය නිල වශයෙන් ආරම්භ වීමට පෙර සහ පළමු මාත්‍රාව සඳහා වුවත් අවැසි එන්නත් වල හිඟයක් තිබූ අවස්ථාවක වීම වැදගත් කරුණකි

(*Report finds 425 from Western Province got Covishield jab in Galle,* 2021). සංචරණ සීමා මධ්‍යයේ උත්සව පැවැත්වීම මෙන්ම සමහර පුද්ගලයන් නිරෝධායන ක්‍රියාවලිය මගහැර යෑම වැනි සිදුවීම්ද බොහෝ වාර්තා විය. සංචරණ සීමා මැද කොළඹ තරු පන්තියේ හෝටලයක උපන්දින සාදයක් පවත්වා හසුවූ පිරිසකගේ නිරෝධායනය ඉතා ලිහිල් නීති යටතේ සිදුකිරීම මීට තවත් එක් හොඳ උදාහරණයකි (*Chandimal's birthday party: Seven arrested and granted bail,* 2021).

මෙම අවස්ථා මඟින් පැහැදිලි වන්නේ රාජ්‍ය සේවා ලබාගැනීමට සමහර පුද්ගලයින්ට අනෙක් අයට සාපේක්ෂව වැඩි හැකියාවක් පැවතීමේ යථාර්ථයයි. එමඟින් සාමාන්‍ය පුරවැසියාට එවැනි සේවා වලට සමාන ප්‍රවිෂ්ඨයක් ලබාගැනීමට ඇති අයිතිය උල්ලංඝණය වේ. එවැනි අවස්ථා වලදී සාමාන්‍ය පුරවැසියන් සිදුකරනු ලබන්නේ ස්වකීය සමාජ සම්බන්ධතා ජාලා හරහා මෙම සේවාවන්ට ප්‍රවිෂ්ඨය ලබාගැනීමටත්, සමහර අවස්ථාවන්හි දී ඒවා අවභාවිතා කිරීමටත් යොමු වීමයි. මෙම පරිච්ඡේදය තුළින් මා උත්සාහ ගනු ලබන්නේ කොවිඩ් වසංගත පසුබිම තුළ මෙම තත්වය දිගහැරුණු අන්දම විමසුමට ලක් කිරීමටයි. එහිදී කරුණු හතරකට මගේ අවධානය යොමු වේ: 1) කොවිඩ්-19 ට එරෙහි සටනේදී දේශපාලනික සහ දේශපාලනික නොවන ක්‍රියාධරයින්ගේ භූමිකාව; 2) කොවිඩ්-19 වසංගත තත්වය තුළදී දේශපාලන අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධතා ජාලය සමාජ සම්බන්ධතා ජාලයක් ලෙස රාජ්‍ය සේවාවන්ට ප්‍රවිෂ්ඨය ලබාදුන් අයුරු; 3) මෙම අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධතා ජාලා නිසා පවතින අසමානතා තවදුරටත් පැවතීම සහ නව අසමානතා ඇතිවීම; සහ 4) කොවිඩ්-19 වසංගත තත්වයට අදාළ රාජ්‍ය සේවා වලට ප්‍රවිෂ්ඨය ලබා දීමෙහිලා මැදිහත්කරුවන්ගේ භූමිකාව.

බස්නාහිර පළාතේ කොළඹ සහ කළුතර යන දිස්ත්‍රික්ක දෙක තුළ සිදුකරන ලද ගුණාත්මක සම්මුඛ සාකච්ඡා සමූහයක් සහ නිරීක්ෂණ මත පදනම්ව මාගේ විශ්ලේෂණය ගොඩනගා ඇත. මෙම තොරතුරු වලට අමතරව ද්විතියික මූලාශ්‍ර වලින් සහ Social Indicator ආයතනයෙන් මෙහෙයවන ලද Socio-Economic Index in the Face of COVID-19 සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු මේ සඳහා භාවිතා කරන ලදී. න්‍යායාත්මකව, සමාජ සම්බන්ධතා ජාලා පිළිබඳව අදහස් දක්වා ඇති ශාස්ත්‍රඥයින් තිදෙනෙක්, එනම් රොබර්ට් පට්නම් (Robert Putnam), ජේම්ස් ස්කොට් (James. C. Scott) සහ පියරෙ බොදියු (Pierre Bourdieu) මෙන්ම, දේශපාලන සමාජය පිළිබඳ අදහස් දැක්වූ පාර්තා චැටර්ජීවද (Partha Chatterjee) යොදාගෙන තිබේ. අවසාන වශයෙන් මගේ තර්කය වන්නේ වසංගත තත්වය තුළ විධිමත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සහ ක්‍රියාවලීන් යම් ආකාර තාවකාලික අත්හිටුවීමකට ලක්වූ බවත්, ඒ වෙනුවට අවිධිමත් හා ආයතනික රාමුවෙන් පරිබාහිර වූ ක්‍රියාමාර්ගයන් හරහා පුරවැසියා බොහෝ දුරට රාජ්‍යය හා සම්බන්ධ වූ බවත්ය.

## කොවිඩ්-19 ට එරෙහි සටනේදී දේශපාලනික සහ දේශපාලනික නොවන ක්‍රියාධරයින්ගේ භූමිකාව

2021 පළමු කාර්තුවේදී Social Indicator ආයතනය විසින් සිදුකරන ලද පෙර දැක්වූ සමීක්ෂණයෙහි ප්‍රතිඵල වලින් කියවුනේ කොවිඩ්-19 ට එරෙහි සටන අරබයා මහජන ප්‍රසාදය පාර්ලිමේන්තු නියෝජිතයන් කෙරෙහි සාපේක්ෂව අඩු වශයෙන් පැවති බවයි. ඒ හා සැසඳූ කල ග්‍රාම නිලධාරී, සෞඛ්‍ය අංශය, පොලීසිය හා ත්‍රිවිධ හමුදාව කෙරෙහි මහජන ප්‍රසාදය ඉහළින් තිබුණි (කරුණාකර ඇමුණුම් අංක 3 හි 5-10 වගු බලන්න). කොවිඩ්-19 හා සම්බන්ධ ක්‍රියාවලිය තුළ රුපියල් 5000 දීමනාව සඳහා පිරිස් හඳුනා ගැනීම, නිවෙස් වල නිරෝධායනය වන්නන් හට වියළි සලාක බෙදාදීම, ඇඳිරි නීති කාල සීමාව තුළ රජයේ රෝහල් වලින් ඖෂධ නිවසටම ගෙන්වා ගැනීම පිළිබඳ තොරතුරු මහජනතාවට ලබාදීම, සමීපතමයෙකුගේ අභාවයකදී මහජන සෞඛ්‍ය පරීක්ෂක සමඟ සම්බන්ධීකරණය කිරීම වැනි බොහෝ වගකීම් ග්‍රාම නිලධාරී හට පැවරී තිබුණි. ආරක්ෂක අංශ වලටද සංචරණ සීමා බලාත්මක කිරීම හා නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම වැනි වගකීම් විය. විශේෂයෙන්ම වසංගතයේ තුන්වන රැල්ල වනවිට එන්නත්කරණය පිළිබඳ වගකීමෙන් සැළකිය යුතු කොටසක්ද ආරක්ෂක අංශ වෙත පවරා දී තිබුණි. එසේම කොවිඩ් මර්දන ක්‍රියාවලිය තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂකට ඉතා වැදගත් ස්ථානයක් ලැබුණේ නිරෝධායන නීති ක්‍රියාත්මකකරණය මෙන්ම තවත් බොහෝ වගකීම්ද එකී නිළධාරීන්ට පැවරී තිබුණු නිසාය.

කෙසේ වුවත් ග්‍රාම නිලධාරීවරුන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විවිධ පීඩන නිසා සිය වගකීම් ඉටුකිරීම ප්‍රතික්ෂේප කළ අවස්ථාද නැත්තේ නොවේ. නිදසුනක් ලෙස 2020 සහ 2021 වසර වල අවස්ථා දෙකකදී රුපියල් 5000 දීමනාව පිළිබඳව ග්‍රාම නිලධාරීවරු ගැටළු මතු කළහ. 2020 දී ඔවුන් පැවසුවේ දේශපාලන පීඩනය නිසා 5000 දීමනාව බෙදා හැරීමට කටයුතු කරන බවත්, වසංගතයේ ආරම්භක අවස්ථාව නිසා එවැනි දීමනාවක අවශ්‍යතාවයක් නොමැති බවත්ය (*Grama Niladharis call off boycott of Rs 5,000 allowance distribution duties, 2020; Distribution of Rs 5,000: Grama Niladharis to withdraw,* 2020). 2021 දී ගැටළුව වූයේ දීමනාව බෙදාහැරීමට යාම තුළින් නිලධාරීන් අනාරක්ෂිත තත්වයකට පත්වන බවත්, අළුත් අවුරුද්දට පෙර සියළු දීමනා බෙදා අවසන් කරාවි යැයි අපේක්ෂා කිරීම යථාර්ථවාදී නොවන බවත්ය (*Grama Niladharis refuse to distribute Rs. 5,000,* 2021). එසේම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සිය වගකීම් වලින් ඉවත් වන බවට එක් අවස්ථාවක නිවේදනය කළේ ඔවුන්ගේ කටයුතු වලට නීතිමය ආවරණයක් ලබා නොදීම සහ ඔවුන් මහජනතාවට හිරිහැරයක් බවට සෞඛ්‍ය ඇමතිවරිය විසින් ප්‍රකාශයක් නිකුත් කිරීම යන හේතු නිසාවෙනි (*PHIs step away from COVID-19 control duties,* 2020).

ඉහත දැක්වූ සමීක්ෂණ දත්ත වලට අනුවද තහවුරු වන්නේ රටේ කොවිඩ් ප්‍රතිචාරය තුළ දේශපාලනඥයින්ට වඩා අනෙකුත් ක්‍රියාධරයින් මහජන ප්‍රසාදය දිනා ඇති බවයි. ඉහත සඳහන් කළ උදාහරණ සැළකූ විටද පෙනී යන්නේ දේශපාලනඥයින් සහ අනෙකුත් ක්‍රියාධරයින් අතර යම් යම් නොමනාපකම් පැවති බවය. එහෙත් ජනප්‍රියත්වය නම් කරුණ සම්බන්ධයෙන් තත්ත්වය කෙසේ වෙතත් කොවිඩ් ක්‍රියාවලිය තුළ දේශපාලනඥයින්ට වඩා වැඩි බලයක් හිමිව තිබූ බව පැහැදිලිය.

කොවිඩ් ප්‍රතිචාරය තුළ දේශපාලන මැදිහත්වීම් සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවයට තිබූ ගැටළුවට අමතරව තවත් කණස්සල්ලක් බවට පත්වූයේ එතුළ ආරක්ෂක අංශ විසින් කරන ලද මැදිහත්වීමයි. නිදසුනක් ලෙස රජයේ සෞඛ්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට දන්වා තිබුණේ එන්නත්කරණ වැඩපිළිවෙළ තුළ ආරක්ෂක අංශ වල මැදිහත්වීම පිළිබඳ තමන් නොසතුටු බවත්, මහජනතාව තුළද එනිසා යම් ව්‍යාකූලත්වයක් ජනනය වී ඇති බවත්ය (*GMOA complains of military interference in vaccination drive: Army refutes allegation,* 2021).

## වසංගත තත්වය තුළදී දේශපාලන අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධතා ජාලයෙහි භූමිකාව

### *ලංකාවේ දේශපාලන අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධතා වල ඉතිහාසය*

අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධතා වසංගත තත්වය තුළ ක්‍රියාත්මක වූ ආකාරය වටහා ගැනීමට පෙර ඉන් කියවෙන්නේ කුමක්දැයි අවබෝධ කරගැනීම ප්‍රයෝජනවත් වේ. වැඩවසම් යුගය තුළ මෙම සම්බන්ධතා සරල සහ පැහැදිලි, ඉඩම් හිමි ප්‍රභූන් සහ එම ඉඩම් මත ජීවත් වූ ප්‍රවේණිදාස ගොවීන් අතර දිගහැරුණු අන්තර් ක්‍රියාවන් වලින් සමන්විත විය. එම අසමාන බල සම්බන්ධතා තුළ ඉහළින්, එනම් අනුග්‍රාහකයාගේ ස්ථානයේ සිටි ප්‍රභූන් පහළින්, එනම් සේවාදායක ස්ථානයේ සිටි ප්‍රවේණිදාස ගොවීන් හට ආරක්ෂාව ලබාදීම මඟින් සිය බලය දියත් කළ අතර, ඒ වෙනුවෙන් ප්‍රභූවරයා විසින් නීර්ණය කරන ආකාරයේ යම් යම් සේවා ඉෂ්ඨ කිරීම සේවාදායකයාගෙන් අපේක්ෂා කෙරුණි (Scott, 1972; Hettige, 1984).

කෙසේ වුවත් ප්‍රජාතන්ත්‍රවාදයේ ආගමනයෙන් පසු මෙම සම්බන්ධතා වඩාත් සංකීර්ණ ස්වරූපයක් ගන්නා බව පෙනෙන්නට තිබේ. මෙහිදී ප්‍රමාණයෙන් වැඩි සේවාදායකයන් පිරිසක් රැකබලා ගැනීමේ පීඩනය අනුග්‍රාහකයින් මත පැටවෙන නිසා සේවාදායකයන්ගේ බලය සාපේක්ෂව වර්ධනය වන අයුරු හඳුනාගත හැකිය. මෙම සියළු උවමනා එපාකම් බලාග

ැනීම සඳහා සිය පෞද්ගලික ධනය ප්‍රමාණවත් නොවීම යන කරුණ මත රාජ්‍යයේ සම්පත් ප්‍රයෝජනයට ගැනීමට අනුග්‍රාහකයින් යොමුවන අයුරු ඒ අනුව දක්නට ලැබේ (Kitschelt and Wilkinson, 2005). 'අනුග්‍රාහක ප්‍රජාතන්ත්‍රවාදය' (patronage democracy) කරළියට එන්නේ ඒ අනුවය. එය සිය සේවාදායකයින්ගේ ඡන්දය සඳහා හිලව්වට ඔවුන්ට රාජ්‍යයේ සම්පත් සඳහා ප්‍රවේශය අනුග්‍රාහකයින් විසින් ලබාදීමේ ක්‍රමවේදයකි.

මෙම සම්බන්ධතාවය තුළ රාජ්‍යයේ සුබසාධන සේවා පවා ඡන්ද දායකයින්ගේ සේවාදායක අවශ්‍යතා සඳහා යෙදවෙන අතර, එම නිසා රාජ්‍යය සුබසාධනයේ සහ ත්‍යාගශීලීත්වයේ පරම පිළිබිඹුව ලෙස දකින්නට පුරවැසියා හුරු විය (Uyangoda, 2010, p. 61; also see Weerawardana, 1951). එම නිසා පුරවැසියා සහ සුබසාධනය සම්බන්ධ කරන්නා වූ වැදගත් පුරුකක් වශයෙන් දේශපාලනඥයින් නැතිවම බැරි තත්වයට පත්වනු දැකගත හැකිය (Gunasekara, 1992; Uyangoda, 2010; Peiris, 2021). වසංගත තත්වය තුළ සමාජ සම්බන්ධතා සහ සම්බන්ධතා ජාලා තේරුම්ගත යුත්තේ මෙම රාමුව තුළ සිට වේ.

### *අනුග්‍රාහක ජාලා සහ වසංගත තත්වය තුළ රාජ්‍ය සේවා වලට පහසු ප්‍රවේශය*

මීට පෙර සඳහන් කළ පරිදි රාජ්‍ය සුභසාධන යෝජනා ක්‍රමයට ප්‍රවේශ වීමේ කාර්යක්ෂම පුරුක වශයෙන් දේශපාලනඥයින් ප්‍රයෝජනවත් වී ඇත. වසංගතය තත්වය තුළ ද ප්‍රදේශවාසීන් විසින් කොවිඩ් -19 ආශ්‍රිත රාජ්‍ය සේවාවන් ලබා ගැනීමට ස්ථාපිත වූ අනුග්‍රහක ජාලයන් වඩාත් ඵලදායී මාධ්‍යයක් ලෙස භාවිතා කරන ලද අවස්ථා කිහිපයක් තිබුණි. බොහෝ අවස්ථාවන්හි දී, පුද්ගලික හදිසි අවස්ථා වලදී පළාත් සීමා හරහා ගමන් කිරීමට අදාළ අවසර පත්‍ර ලබා ගැනීම හෝ සිල්ලර බඩු විකිණීමට හෝ වෙනත් පෞද්ගලික ව්‍යාපාර කරගෙන යාම සඳහා ව්‍යාපාරිකයින්ට අදාළ බලපත්‍ර ලබා ගැනීම ආදී අරමුණු උදෙසා රාජ්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීම මිනිසුන්ගේ ජීවිතවලට ඉතා වැදගත් විය.

වසංගත තත්වය තුළදීද බොහෝ අවස්ථා වල දැකගත හැකි වූයේ මෙම අනුග්‍රාහක සම්බන්ධතා ජාලා භාවිතයෙන් බිම් මට්ටමේ ප්‍රජා කණ්ඩායම් බොහෝ ප්‍රමාණයක් කොවිඩ්-19 ට අදාළ රාජ්‍ය සේවා වලට ප්‍රවිෂ්ඨය ලබාගත් අයුරුයි. මෙම අධ්‍යනය සඳහා මා විසින් ප්‍රවේශ වූ ප්‍රතිචාරකයින් කිහිප දෙනෙකුගේ අත්දැකීම් මෙහිදී තත්වය වටහා ගැනීම සඳහා ඉවහල් වනු ඇත. එක් අයෙක් සිය ප්‍රදේශයේ සුළු ව්‍යාපාරයක් හිමිකරුවෙකි. එහි විකුණනු ලබන්නේ වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය වන විෂබීජ නාශක අත් සේදුම් දියර, මුහුණු වැසුම් හා වෙනත් එවැනි දේය. වසංගතයේ

පළමු රැල්ල තුළ නිරෝධායන ඇඳිරි නීතිය පැනවූ අවස්ථාවේ සිය ව්‍යාපාර ස්ථානයේ සේවය කළ සියළු දෙනා ඔවුන්ගේ ගම් බිම් වලට පිටත් කර හැරීමට ඔහුට හැකිවූයේ ප්‍රදේශයේ දේශපාලනඥයාගේ සහයෙනි. ඔවුන් දෙදෙනා අතර කිට්ටු සම්බන්ධයක් ඇති බවත්, පෙර අවස්ථාවන්හි දී ඔහුගේ දේශපාලන කටයුතු වලට තමා සහය වී ඇති බවත් මෙම ප්‍රතිචාරකයා පැවසුවේය[1]. තරුණ විධායක නිලධාරියකු වන මාගේ දෙවන ප්‍රතිචාරකයා කිසිදු දේශපාලන ජාලයකට සම්බන්ධ නොවූවෙකි. නිරෝධායන ඇඳිරි නීතිය පැනවූ අවස්ථාවේ සිය නිවසේ අළුත්වැඩියාවක නිරත වෙමින් සිටි පෙදරේරුවකු නිවසට යැවීමට ඔහුට නොහැකි විය[2]. තවත් ප්‍රතිචාරකයකුගේ අත්දැකීම පළමුවැන්නාගේ අත්දැකීමට සමානය. පුරපතිගේ නිර්දේශය මත තුන්වන රැල්ලේ නිරෝධායන ඇඳිරි නීති සමය තුළ ආහාර විකිණීමේ බලපත්‍රයක් ලබාගැනීමට ඔහුට හැකිවිය[3]. මෙය ඇත්තෙන්ම බොහෝ අයට අවශ්‍යතාවය තිබූ, එහෙත් වැඩි දෙනෙකුට අවසර නොලැබුණු කරුණක් බව මතක් කළ යුතුය.

මෙම අත්දැකීම් වලින් පෙන්නුම් කෙරෙනුයේ අනුග්‍රාහක ජාලයක් තුළ සිටින්නකුට වසංගත සමයේ රාජ්‍ය සේවා වලට කොතරම් පහසු ප්‍රවිෂ්ඨයක් තිබුණාද යන්නත්, එසේ නොවූ අයට එම කරුණ කොතරම් අපහසු වූවාද යන්නත්ය. කොවිඩ්-19 රෙගුලාසි රිසි පරිදි වෙනස් කරගැනීමටත් මෙම ජාලා හරහා සේවාදායකයින්ට අවස්ථාව ලබාදෙන ලදී. පාර්තා චැටර්ජී (Partha Chatterjee) (2004) දක්වා ඇත්තේ මෙවැනි භාවිතයන් මගින් පවතින ආයතන පද්ධතියට පරිබාහිරින් රාජ්‍යයට ප්‍රවිෂ්ඨය ලබාගන්නා ‘දේශපාලනික සමාජයක්’ (political society) බිහිව ඇති බවයි. චැටර්ජීට (Chatterjee) අනුව පුද්ගලයන් එසේ කරන්නේ එක්කෝ ඔවුන්ට විකල්පයක් නොමැති නිසාය; එසේත් නැතිනම් එම ක්‍රමය වඩා ඵලදායී වන බැවිනි.

කෙසේ වුවත් වසංගතය තුළ පැවති අඩු සම්පත් ප්‍රමාණය සහ අධික ඉල්ලුම නිසා මෙම සම්බන්ධතා ජාලා වෙනදා තරම්ම ප්‍රයෝජනවත් නොවූ බවද පැවසිය යුතුය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඊට පෙර අවස්ථාවන්හි දී මෙවැනි ජාලාවන්ට සම්බන්ධිතව සිටීමෙන් ප්‍රයෝජන ලද්දා වූ නමුදු මෙම අවස්ථාවේ දී එවැනි ජාලයක සිටියදී පවා සමහර තැනැත්තන්ට එවැනි වාසි ලබාගැනීමට නොහැකි වීම පිළිබඳ මැසිවිලි තිබුණු බවද පෙනේ. නිදසුනක්

1 කේවල සම්මුඛ සාකච්ඡාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 02.

2 කේවල සම්මුඛ සාකච්ඡාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 02.

3 කේවල සම්මුඛ සාකච්ඡාව, කොළොන්නාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 04.

ලෙස නගර සභාවක කම්කරුවකු වශයෙන් සේවය කරන ප්‍රතිචාරකයකු පැවසුවේ නගර සභාවේ සේවකයින් සඳහා එවූ ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ දෙවැනි මාත්‍රාව නගරාධිපතිගේ ඥාතීන්ට ලබාදුන් බවත්, තමා ඒ පිළිබඳව ඉතා නොසතුටෙන් පසුවන බවත්ය[4]. මෙම පුද්ගලයින්ව සභාවේ සේවයට බඳවා ගන්නේද අනුග්‍රාහක ජාලා තුළිනි. එසේ වුවත් වසංගත තත්වය තුළ පැවති සීමාකම් නිසා පෙර පරිදි අනුග්‍රාහක ප්‍රතිලාභ බෙදා දීමට එම ජාලා වලට තවදුරටත් නොහැකිව ඇත. මේ අන්දමින් වර්ධනය වූ හිඟතාවයන් සමාජීයීය සමානාත්මතාවයට බලපාන අයුරු ඊළඟ කොටස තුළින් විග්‍රහ කිරීමට බලාපොරොත්තු වෙමි.

### *අනුග්‍රාහක ජාලා සහ අසමානත්වය*

අනුග්‍රාහක ජාලා තුළින් රාජ්‍ය සේවා වලට ප්‍රවිෂ්ඨය ලබාගැනීමේ භාවිතය නිසා සමහර තැනැත්තන්ට අනෙක් අයට වඩා වැඩි වාසි හිමිවීමේ තත්වයක් උදා වී ඇත. එම නිසා සමාජය තුළ කලින් පැවතියාටත් වඩා අසමානතා වසංගත තත්වය තුළ කරළියට පැමිණ තිබේ. නිදසුනක් ලෙස රුපියල් 5000 දීමනාව සමහර අවස්ථා වල නිසි ක්‍රියාදාමයට පිටින් ලබාගත් අවස්ථා වාර්තා වී ඇත. එහිදී දීමනාව ලැබීමට අදාළ සුදුසුකම් සම්පූර්ණ නොකරන අයවළුන්ගේ පසුබිම පිළිබඳ කිසිදු විමසීමකින් තොරව එය ලබාදීමත්, එකී දීමනාව ලැබීමට සුදුසුකම් සහිත, එහෙත් කිසිදු අනුග්‍රාහක ජාලයක කොටසක් නොවන පිරිසකට දීමනාව ලබාගැනීමේදී බොහෝ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුවීමත් පිළිබඳව තොරතුරු තිබේ. පහත ප්‍රතිචාරකයින්ගේ අත්දැකීම් මීට නිදසුන්ය.

මින් එක් ප්‍රතිචාරකයකු ප්‍රාදේශීය අනුග්‍රාහක ජාලයට සම්බන්ධතා සහිත විශ්‍රාම ලත් රජයේ සේවකයෙකි. ඔහු එක් දේශපාලන පක්ෂයක කටයුතු සඳහා නිතරම වෙහෙස මහන්සි වනු බොහෝ දෙනා දැක ඇති අයෙක් වේ. ඔහුගේ නිවස තුළ ඔහු සහ ඔහුගේ බිරිඳගෙන් සැදුම්ලත් පවුල මෙන්ම, ඔහුගේ පුතු සහ බිරිඳගෙන් සැදුම්ලත් අනු පවුලද වාසය කරනු ලබයි. සිය අනුග්‍රාහක ජාලය තුළින් මෙම පවුල් දෙක සඳහාම රුපියල් 5000 බැගින් ලබාගැනීමට ඔහු සමත් විය[5]. පෞද්ගලික අංශයේ සේවය කරන තවත් ප්‍රතිචාරකයකුගේ අත්දැකීම මීට වෙනස්ය. සිය නිවස තුළද පෙර පරිදිම පවුල් දෙකක් ජීවත් වන අයෙක් වුවද, කිසිදු අනුග්‍රාහක ජාලයකට සම්බන්ධව නොසිටීම හේතුවෙන් 5000 දීමනාව පවුල් දෙක සඳහා වෙන

---

4 කේවල සම්මුඛ සාකච්ඡාව, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 17.

5 කේවල සම්මුඛ සාකච්ඡාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 04.

වෙනම ලබාගැනීමට ඔහුට නොහැකි විය. පසුව ප්‍රාදේශීය සභා සාමාජිකයකු හා සබඳතා තිබූ සිය මිත්‍රයකුගේ මාර්ගයෙන් මෙම කාර්යය කරගත හැකි වූ බව ඔහු කියා සිටියේය[6]. විශේෂයෙන්ම මෙම දෙවැනි උදාහරණය තුළින් පැහැදිලි වන්නේ මෙවැනි සේවා ලබාගැනීමේදී විධිමත් ක්‍රියාවලියට වඩා අවිධිමත් මාර්ග වඩාත් ඵලදායී වී ඇති බවයි.

තවත් උදාහරණයකදී ප්‍රජා සමෘද්ධි සමිතියේ ලේකම් වශයෙන් කටයුතු කරන සහ ප්‍රදේශයේ දේශපාලනඥයාගේ සොහොයුරිය වන ප්‍රතිචාරිකාවක් 5000 දීමනාව බෙදාදීමේ කාර්යයෙහි තමා මූලිකත්වය ගත් බව දක්වා සිටියාය. ඒ අනුව ප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන් හඳුනා ගන්නා ලෙසට ග්‍රාම නිලධාරී සහ සමෘද්ධි නිලධාරීන්ට තමා උපදෙස් දුන් බවත්, එසේ වුවත් එම ක්‍රියාවලියෙහි අපක්ෂපාතීත්වය සම්බන්ධයෙන් නොසතුටට පත් පිරිස් සිටි බවත් ඇය පැවසුවාය[7]. මෙහිදී යම් ආකාර විශේෂ සැළකිළි හා ඒ මත පදනම්ව කොවිඩ් සම්බන්ධ රාජ්‍ය සේවාවන්ට විශේෂීකරණය වූ ප්‍රවේශයක් සමහරුන්ට හිමි වූ බව අනුමාන කළ හැකිය.

2021 අප්‍රේල් මාසයේදී රත්මලාන ප්‍රදේශයෙන් වාර්තා වූ සිදුවීමකට අනුව රජයේ දීමනාවක් බෙදා හැරීමේදී කලින් සකසන ලද ලැයිස්තුවක් මත පදනම්ව තුණ්ඩු ක්‍රමයට එය සිදුකිරීමට නියමිතව තිබුණත්, අවසානයේ පෞද්ගලික දැන හැඳුනුම්කම් මත එය සිදුවූ හෙයින් බොහෝ පිරිසකට පැය ගණනාවක් පෝලිම් වල රැඳී සිටීමට සිදුවිය (*The 5000 that heated up Ratmalana,* 2021). අඩු ආදායම්ලාභී පවුල් වලට සහන බෙදාහැරීමේදී සිදුවන අක්‍රමිකතා පිළිබඳව Transparency International ආයතනයද සැළකිල්ල පල කොට තිබුණි. එම ආයතනයට අනුව එක් අවස්ථාවකදී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු විසින් සිය ප්‍රචාරණ කටයුතු සඳහා මෙවලමක් වශයෙන් මෙම සහන දීමනා යොදාගෙන තිබුණේ කවුරුන් සඳහා ඒවා ලැබිය යුතුද යන්න පිළිබඳව ප්‍රධාන තීරකයා බවට තමා පත්කර ගැනීමෙනි (*ENSURING COVID-19 RELIEF REACHES SRI LANKA'S PEOPLE,* 2020). මෙම සිදුවීම් වලින් ගම්‍යමාන වන ප්‍රධානම කරුණ නම් මෙවැනි අනුග්‍රාහක ජාලා වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් යම් යම් අවස්ථා වල අසාධාරණ සහ අසමානුපාතික ආකාරයෙන් පද්ධතිය හා සම්බන්ධ වීමට සමහරුන්ට අවස්ථාව ලබාදෙන බවයි. එහිදී එවැනි ජාලා වලට සම්බන්ධයක් නොමැති අයවළුන්ට එකී සේවා ලබාගැනීමේ අවස්ථාව බොහෝ විට නොලැබෙන බව පැහැදිලිය.

6 කේවල සම්මුඛ සාකච්ඡාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 05.

7 කේවල සම්මුඛ සාකච්ඡාව, බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කළුතර දිස්ත්‍රික්කය, 2021 ජූනි 05.

සමාජ ප්‍රාග්ධනය පිළිබඳ බෝදියුගේ (Bourdieu's) අදහස් පැහැදිලි කරමින් ඇස්ක්විත් (Asquith) (2009) දක්වන්නේ එකී ප්‍රාග්ධනය "පුද්ගලයාගේ හා පවුලේ භෞතික, සංස්කෘතික සහ සංකේතාත්මක තත්වය, ප්‍රජාව තුළ පවුලේ තත්වය, ආර්ථික තත්වය සහ සංස්කෘතික කටයුතු වල යෙදීම වැනි සාධක මගින් හැඩගස්වන බවයි. එම නිසා පුද්ගලයකු සතු සමාජ ප්‍රාග්ධනයෙහි තරම තීරණය වන්නේ ඔහු/ඇයගේ සමාජ සම්බන්ධතා ජාලය මෙන්ම, එම ජාලයෙහි සිටින්නන්ගේ සංස්කෘතික සහ ආර්ථික ප්‍රාග්ධනය මගිනි." (පිටුව 32) එම නිසා සමාජ ප්‍රාග්ධනය යන අදහස තුළ අසමානත්වය සහ බහිෂ්කරණය හෙවත් බැහැර කිරීම නෛසර්ගයෙන්ම අඩංගු වේ. සමාජ ප්‍රාග්ධනය මූලික කොටගෙන ක්‍රියාත්මක වන තත්වයන් තුළද එබැවින් මෙම ලක්ෂණ අනිවාර්යයෙන්ම අඩංගු වේ. චැටර්ජී (Chatterjee) දක්වා ඇති පරිදි සමාජයේ සාපේක්ෂව බලය අඩු ස්ථාන වල සිටින්නන්ට මෙවැනි සම්බන්ධතා ජාල වලින් සාමාන්‍යයෙන් නොලැබෙන අන්දමේ වාසි හිමිවන බව සත්‍යයක් වුවත්, පුරවැසියාට භුක්ති විඳීමට අයිතියක්/අධිකාරියක් ඇති දෙයට 'වාසි' යන පදය අනුයුක්ත කිරීම තුළින්ම මෙවැනි අනුග්‍රාහක ජාලා රාජ්‍යයේ සහන ව්‍යාපෘති වලට ඇතුල් වීමෙන් සිදුකරන හානිය පිළිබිඹු කරන බවද පිළිගත යුතුය.

## *වසංගත තත්වය තුළ රාජ්‍ය සේවා වලට ප්‍රවිෂ්ඨය ලබා දීමෙහිලා මැදිහත්කරුවන්ගේ වැදගත්කම*

මෙම සන්දර්භය තුළ 'මැදිහත්කරුවකු' වශයෙන් හැඳින්වෙන්නේ කොවිඩ්-19 වසංගත තත්වයට අදාළ රාජ්‍ය සේවා ලබා ගැනීමේදී සහ ඒ අරබයා හඳුන්වා දෙන ලද නීති රෙගුලාසි මඟහැර යෑමේ අවශ්‍යතා වලදී පොදු මහජනතාවට රාජ්‍යය සම්බන්ධීකරණය කොට දෙන්නා වූ පුද්ගලයෙකි. දේශපාලනික අනුග්‍රාහක ජාලයට අමතරව මෙවැනි මැදිහත්කරුවන් සෞඛ්‍ය සේවය, පොලීසිය සහ හමුදාව මෙන්ම, සිවිල් සේවය වටා පැන නැඟී ඇති සම්බන්ධතා ජාල වලද හමුවේ. මෙම කොටසින් අරමුණු කරන්නේ මෙම විවිධාකාරයේ මැදිහත්කරුවන්ගේ භූමිකාව විස්තර කිරීමය.

## *දේශපාලනික අනුග්‍රාහක ජාලයේ මැදිහත්කරුවන්*

කොවිඩ්-19 අධි වසංගතය හමුවේ දේශපාලනික අනුග්‍රාහක ජාලයේ මැදිහත්කරුවන්ට විශේෂ වැදගත්කමක් හිමිව තිබේ. ඔවුහු සිය දේශපාලනික අනුග්‍රාහක ජාලයට අමතරව ගමේ වෙනත් සමාජ සම්බන්ධතා ජාලයන් වලද ක්‍රියාකාරී මැදිහත්කරුවන් වෙති. එම නිසා සමහර අවස්ථා වල මෙම ජාලා

වල වපසරියෙන් පිටත ඇති පෞද්ගලික ස්වරූපයේ උපකාරයන්ද ඔවුන් විසින් සිදුකරන අවස්ථා ඇත.

නිදසුනක් ලෙස කලින් ප්‍රාදේශීය සභාවේ සාමාජිකයකුව සිටි සහ වර්තමානයේ ගොවි නියාමකවරයකු වශයෙන් සේවය කරන එක් ප්‍රතිචාරකයෙකු ප්‍රදේශයේ එන්නත්කරණ වැසටහනට තමා දැක්වූ දායකත්වය විස්තර කළේය. එහිදී ඔහු පැවසූයේ තමා බොහෝ ප්‍රජා මූල සංවිධානයන්හිද සාමාජිකයකු බවත්, ශ්‍රමදාන සහ ලේ දන්දීමේ වැඩසටහන් වැනි බොහෝ ස්වේච්ඡා කටයුතු වලට දායකත්වය දක්වා ඇති බවත්ය. වර්තමාන ප්‍රාදේශීය දේශපාලනඥයකුගේ සහායකයකු වශයෙන් තරුණ කණ්ඩායමක් හා එක්ව ප්‍රදේශයේ එන්නත්කරණ වැසටහන මෙහෙයවීමේ වගකීම අදාළ දේශපාලනඥයා විසින් තමාට භාරදුන් බවද ඔහු පැවසීය. ඒ අනුව එන්නත්කරණ මධ්‍යස්ථානය තුළ ප්‍රමාණවත් පරිදි ආසන පැනවීම, විෂබීජහරණ ක්‍රියාවලිය නිවැරදි පරිදි සිදුකිරීම, වතුර බෝතල් සහ ආහාර පානාදිය සැපයීම වැනි කාර්යයන් ඔස්සේ එම වගකීම ඉටුකළ බවද දැක්වීය. එන්නත්කරණය පිළිබඳ පණිවුඩය දේශපාලනික අනුග්‍රාහක ජාලයේ සිටි-නොසිටි සියල්ලන් වෙත යොමු කළ බවද ඔහු විශේෂයෙන් කියා සිටියේය[8]. මෙහි සඳහන් එන්නත්කරණ වැඩසටහන සඳහා තෝරාගෙන තිබුණේ බෞද්ධ පන්සලක් වීමද විශේෂත්වයකි. මෙමඟින් සන්නිවේදනය කරන දෘෂ්ඨිවාදය සහ පසුගිය ජනාධිපතිවරණය සඳහා තරඟ කළ එක්තරා ප්‍රධාන පෙළේ පක්ෂයක දෘෂ්ඨිවාදය එකක් වීම අහඹුවක් නොවිය හැකිය. එම නිසා මෙම ස්ථානය තෝරා ගැනීමෙන් යට කී පක්ෂයේ ඡන්ද පදනම දැනුවත්ව හෝ නොදැනුවත්ව ශක්තිමත් කිරීමක් සිදුවූ බව තර්ක කළහැකි වේ.

මීට සමානව යමින් ප්‍රාදේශීය සභා මැතිවරණයට අතීතයේ තරඟ කළ හා වර්තමානයේ සමෘද්ධි නිලධාරියකු වශයෙන් සේවය කරන ප්‍රතිචාරකයකු පැවසුවේ රුපියල් 5000 දීමනාව සිය ප්‍රදේශය තුළ බෙදාදීමේ වගකීම ඔහුට භාර වූ බවයි. එහිදී ඔහු ඔහුගේ දේශපාලනික ජීවිතයේ ඇතිකර ගත් සබඳතා භාවිතා කරමින් එම දේශපාලනික සම්බන්ධතා ජාලය තුළ සිටි හා නොසිටි සියල්ලන්ට සාධාරණ ලෙස දීමනාව බෙදාදීමට කටයුතු කළ බව පැවසීය[9].

ඉහත සිදුවීම් දෙකෙන්ම පැහැදිලි වන්නේ ඍජුව හා වක්‍රව ප්‍රජාව තුළ දේශපාලනික අනුග්‍රාහකත්ව ජාලයන් සහ සමාජ සම්බන්ධතා ජාලයන් ශක්තිමත් කිරීමෙහි ලා මැදිහත්කරුවන් ක්‍රියාත්මක වන බවයි.

8 කේවල සම්මුඛ සාකච්ඡාව, කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 08.

9 කේවල සම්මුඛ සාකච්ඡාව, කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 16.

ප්‍රාදේශීය තලයේ සිය සම්බන්ධතා ඔවුන්ට මේ සඳහා මහත් සේ උපකාරී වන බව පෙනේ. අනුග්‍රාහක ජාලයන් හැමවිටම උත්සුක වන්නේ වැඩිම කාර්යක්ෂමතාවයකින් යුතුව තෘණ මූල මට්ටම කරා ළඟා වීමටය. එම නිසා මෙම ජාලයන් සඳහා භාවිතා කරන බිම් මට්ටමේ සම්බන්ධතාවයන් විවිධ වැඩ සටහන් සංවිධානයේදී සහ ක්‍රියාත්මකකරණයේදී දේශපාලනඥයින්ට ඉතා උපකාරී වීම පුදුමයට කරුණක් නොවේ.

වසංගත තත්වය තුළ මෙම අනුග්‍රාහක සම්බන්ධතා වඩාත් ශක්තිමත්ව ප්‍රජාවන්හි මුල්බැස ගෙන ඇත. ඒ, කොවිඩ්-19 ට අදාළ සේවා වෙත සිය සේවාදායකයින්ට වඩා කාර්යක්ෂම ප්‍රවේශයක් ලබාදීම තුළිනි. මෙහි සාර්ථකත්වය කෙසේ වුවත්, ඒවා මගින් විෂමතා දිගටම පවත්වාගෙන යාම සහ සමහර අවස්ථා වල අළුතින් නිර්මාණය කිරීම සිදුකළ බව පිළිගත යුතුය.

***සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මැදිහත්කරුවන්***

කොවිඩ් අර්බුදය සෞඛ්‍යය සම්බන්ධ එකක් බැවින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන්නන්ට එතුළ වැඩි අවධානයක් යොමුවිය. මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය නිලධාරීන්ගේ දායකත්වය අගය කිරීම සඳහා 2020 දී 'සුව විරුවෝ' වැඩසටහන දියත් කරන ලද අතර, එය මහත් අවධානයට යොමුවන ලදී. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවයේ නියැලෙන්නන්ට ප්‍රසිද්ධ හෝටල් වල විශේෂ නිවාඩු පැකේජ වැනි පහසුකම්ද ලබාදුන්නේ ඔවුන්ගේ සේවය අගය කිරීමක් වශයෙනි (*Cinnamon Hotels & Resorts offers a holiday package for "Suwa-Sewa Wiruwo"*, 2020). එමෙන්ම අනෙක් ක්ෂේත්‍ර වලට සාපේක්ෂව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන්නන්ගේ වෘත්තීය අයිතීන් වල දියුණුවක්ද මේ කාලය තුළ දකින්නට ලැබුණි.

වඩාත්ම සිත් ඇදගන්නා සුළු කරුණ නම් ප්‍රජා මූල මට්ටමේ සමහර සෞඛ්‍ය නිලධාරීන්ගේ භූමිකාවෙහි වැදගත්කම වසංගත තත්වය නිසාම පුරවැසියන්ට තේරුම් යෑමට පටන් ගැනීමයි. එක් ප්‍රතිචාරකයකු පැවසූයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට ප්‍රදේශවාසීන් එතෙක් භාවිතා කළ නම 'කුණු මහත්තයා' යන්න වන බව සහ එහෙත් වසංගත තත්වය තුළදී ඔහුගේ භූමිකාවේ වැදගත්කම බොහෝ අයට ඒත්තු ගොස් ඇති බවය. ඒ අනුව සෞඛ්‍ය සේවයේ පුද්ගලයින් සිය සමාජ සම්බන්ධතා ජාලය තුළ සිටීම නිසා බෝදියු (Bourdeiu) දැක්වූ ආකාරයේ සමාජ ප්‍රාග්ධනයක් පුද්ගලයින්ට හිමි වූ බව සිතිය හැකිය. එම සන්දර්භය තුළ එවැනි ප්‍රාග්ධනයක් තිබීම රාජ්‍ය සේවා වලට වඩා පහසු ප්‍රවිෂ්ඨයක් ලබාගැනීමට උපකාර වූ බවටද සැක නැත. කාර්යක්ෂමව එම සේවා ලබාගැනීම සඳහා අදාළ නීති රෙගුලාසි යම් ආකාරයකින් 'නැමූ' බවද පැහැදිලි කරුණකි.

දේශපාලනික මැදිහත්කරුවන් සහ සෞඛ්‍ය සේවා මැදිහත්කරුවන් අතර ඇති වෙනස වටහා ගැනීමද මෙහිදී වැදගත් වනු ඇත. සෞඛ්‍ය අර්බුදයකදී සෞඛ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම සාමාන්‍ය කාරණයක් වුවත්, රාජ්‍ය සේවා වලට ඔවුන්ගේ ප්‍රවිෂ්ඨය ඉතා සීමා සහිත වේ. ප්‍රතිචාරකයින් බොහෝ දෙනෙක්ද දැක්වූ පරිදි ඔවුන් සෞඛ්‍ය නිලධාරීන්ගෙන් විශේෂිත උපකාර අපේක්ෂා කළේ ළඟම ඥාතියකුගේ මරණයක් වැනි අවස්ථාවක PCR පරීක්ෂණයක් කරවා ගැනීම වැනි කටයුතු සඳහා පමණි. නිදසුනක් ලෙස පහත උධෘතය සළකා බලන්න:

> කොවිඩ් තුන්වැනි රැල්ලේදී මගේ මාමා මියගියා. රජයේ රෝහලකට ඇතුළත් කිරීමෙන් ටික වේලාවකට පසුවයි ඔහු මියගියේ. මරණ පරීක්ෂණයක් සිදුකිරීම අවශ්‍ය බව රෝහල් කාර්ය මණ්ඩලය මට දැනුම් දුන්නා. ඒ සඳහා අපට සමීපම පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරියෙක් කැඳවා ගන්නා ලෙසද උපදෙස් ලැබුණා. නමුත් පෞද්ගලිකව හඳුනන පොලිස් නිලධාරියෙක්ට කතා කළ පසුවත් කෙනෙක් කතා කරගැනීමට හැකි වුනේ නැහැ. ඒ අවස්ථාවේ මම අපේ නගරාධිපතිතුමා හමුවීමට ගියේ කාරණය ඉක්මන් කරගැනීමටයි. ඔහුත් ඔහු යටතේ වැඩ කරන්නෙක් පොලිස් ස්ථානයට යැව්වත් කෙනෙක් ලබාගැනීමට ඔහුටත් හැකිවුනේ නැහැ. මගේ අවසාන විකල්පය වුනේ මා හඳුනන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හමුවීමයි. එම මන්ත්‍රීවරයාගේ ඥාති සොහොයුරා මා ඉතා ළඟින් හඳුනනවා. ඔමෙන්ම එක් මැතිවරණයක් සඳහා මා දන්නා හඳුනන අයගේ ඡන්ද ඔහුට ලබාදීම සඳහාද මා සහය වුනත්, ඇත්තටම ඔහුගේ පක්ෂය මා පෞද්ගලිකව සහය දක්වන පක්ෂයක් නොවෙයි. ඔහුට කතා කිරීමෙන් පසුවයි මට අවසානයේ පොලිස් නිලධාරියෙක් ලබාගැනීමට හැකිවුනේ. එහෙත් මරණ පරීක්ෂණය අවසානයේ දේහය නිදහස් කරගැනීමට PCR පරීක්ෂණයක් සිදුකළ යුතු බවත්, ඊට දින දෙකක් පමණ ගතවිය හැකි බවත් පැවසුවා. ඒ සඳහා මා හඳුනන හෙදියකගේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරියකුගේ උදව් ලබාගෙන ඊට අඩු කාලයකින් කරගත්තා. මරණයෙන් හත්වන දින වනවිට කිරීමට සැලසුම් කර තිබූ දානයට වඩම්මවා ගැනීමට හිමිනමක් සිටියේ නැ. මොකද ගමේ පන්සලේ හිමිනම පවතින තත්වය යටතේ වැඩීම ප්‍රතික්ෂේප කළ නිසා. නමුත් මගේ අසල්වාසියෙක් වන දේශපාලන පක්ෂ ආසන සංවිධායකයෙකුගේ උදව්වෙන් මෙම කාර්යයද කරගැනීමට හැකි වුනා.[10]

මෙම අත්දැකීම මඟින් වසංගත තත්වය තුළ ක්‍රියාත්මක වූ විවිධ අනුග්‍රාහක ජාලා වල ස්වභාවය හොඳින් පැහැදිලි කරයි. එහිදී සෞඛ්‍ය සේවා නිලධාරීන්ටද අනුග්‍රාහක ජාලා වල ඉතා වැදගත් ස්ථානයක් හිමිවන අයුරු කැපී පෙනේ.

---

10 කේවල සම්මුඛ සාකච්ඡාව, කොළොන්නාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 04.

තවත් ප්‍රතිචාරකයින් දෙදෙනෙක්ද මීට සමාන අත්දැකීම් විස්තර කළහ. ඉන් එක් අයෙකුගේ පියා වසංගතයේ දෙවැනි රැල්ල සමයේ නිවසේදී මියැදීමට පත්ව රෝහලට ගෙනයනු ලැබ තිබේ. එහිදී PCR පරීක්ෂණය වඩා ඉක්මන් කරගැනීම සඳහා සිය ඥාතියෙක් වන ගිලන් රථ රියැදුරෙකුගේ උදව් පතා ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එකී පරීක්ෂණය පැවැත්වීමෙන් තොරවම සියළු ලිපි ලේඛණද සම්පූර්ණ කොට දේහය නිදහස් කරගැනීමේ හැකියාව ලැබී ඇත.[11] දෙවැනි උදාහරණයේදී පෞද්ගලික අංශයේ අලෙවි නිලධාරියකු වන ප්‍රතිචාරකට ඔහුගේ සේවාදායකයකු වන හෙදියක් හරහා ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ පළමු මාත්‍රාව ලබාගැනීමට හැකිව තිබේ. එම එන්නත් කාණ්ඩය කොවිඩ් මර්දන වැයමේ ඉදිරිපෙළ කාර්ය මණ්ඩලයට වෙන්කළ එකක් වීම මෙහි විශේෂත්වයයි.[12]

මෙම උදාහරණ වලින් පැහැදිලි වන්නේ දේශපාලනික අනුග්‍රාහක ජාල මෙන්ම සෞඛ්‍ය සේවා පදනම් කරගත් අනුග්‍රාහක ජාලද වසංගත තත්වය තුළ ඉතා වැදගත්ව ඇති බවයි. මෙහිදී සෞඛ්‍ය සේවා පදනම් කරගත් අනුග්‍රාහක ජාලාවන් තුළින් චැටර්ජී (Chatterjee) සඳහන් කළ ආකාරයේ අවිධිමත් දේශපාලන සමාජය මෙන්ම, විධිමත් ආයතනික පද්ධතිය මුල්කරගත් සිවිල් සමාජයද නිරූපණය වූ අයුරු හඳුනාගත හැකිය. මෙවැනි සමාජ සම්බන්ධතා ජාලා වලින් ලැබෙන පිළිගැනීම සැළකූ විට එතැන ඇත්තේ සිරස් සහ අන්‍යොන්‍ය වශයෙන් වාසි සහගත තත්වයක් බව පැවසිය හැකි වේ (Putnam, 1993, as cited inGelderblom, 2018, p. 4). බොදියු (Bourdeiu) දැක්වූ ආකාරයේ සමාජ ප්‍රාග්ධනයක් බවට පසුව පත්වන්නේ මෙවැනි සම්බන්ධතාය.

## *සෞඛ්‍ය සේවා අනුග්‍රාහක සම්බන්ධතා ජාල තුළට දේශපාලනික අනුග්‍රාහක සම්බන්ධතා ජාල පැමිණීම*

වසංගත තත්වය තුළ සෞඛ්‍ය සේවයේ අනුග්‍රාහක ජාලය වඩාත් විද්‍යාමාන තත්වයට පත් වෙද්දී සාම්ප්‍රදායික දේශපාලන අනුග්‍රාහක ජාලයද සිය සුපුරුදු ධූරාවලිය තුළ ක්‍රියාත්මක වුණි. ජාතික මෙන්ම ප්‍රාදේශීය මට්ටමින්ද කොවිඩ් මර්දන කමිටු වැනි ව්‍යුහ තුළ දේශපාලන නායකත්වය කැපී පෙනුණි. පහත ඡායාරූප වලද දැක්වෙන පරිදි සිය ප්‍රදේශ වලට එන්නත්කරණ වැඩ සටහන් ගෙන ඒම පිළිබඳ අධිකාරය දැරුවේ සහ ඒ සම්බන්ධයෙන් කැපී පෙනුනේ දේශපාලනඥයින්ය.

---

11 කේවල සම්මුඛ සාකච්ඡාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 14.

12 කේවල සම්මුඛ සාකච්ඡාව, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය, 2021 ජූනි 14.




*ඡායාරූපය 1: එන්නත් කිරීමේ වැඩසටහන ගාල්ල දිස්ත්‍රික්කයේ මඩවලමුල්ලට ගෙන ඒම වෙනුවෙන් වැවිලි අමාත්‍ය රමේෂ් පතිරණට සහ ගාල්ල නගර සභාවේ නගරාධිපති ප්‍රියන්ත සහබන්දුට ප්‍රදේශවාසීන් ස්තුති කරති.*




*ඡායාරූපය 2: කොවිඩ්-19 එන්නත් කිරීමේ වැඩසටහන හිරියාල, කුරුණෑගල දිස්ත්‍රික්කය වෙත ගෙන ඒම වෙනුවෙන් ජනාධිපති, අගමැති සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දුට ප්‍රදේශවාසීන් ස්තුති කරති.*




*ඡායාරූපය 3: 2018 පළාත් පාලන මැතිවරණයේ අපේක්ෂකයකු වූ රංගන සුමිත් කුමාර්, ස්වකීය ප්‍රදේශයට කොවිඩ්-19 එන්නත් කිරීමේ වැඩසටහන ගෙන ඒම සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍ය රෝහිත ගුණවර්ධනට ස්තුති කරමින් කළුතර දිස්ත්‍රික්කයේ වෙලපුර ප්‍රදේශයෙහි බැනරයක් ප්‍රදර්ශනය කර තිබීම.*

වසංගතයේ පළමු භාගය තුළ සීමිත එන්නත් ප්‍රමාණයක් පැවතීම සහ ඒවා ප්‍රමුඛතා පදනමක් මත ලබාදීම නිසා එන්නත් ඉක්මණින් ලබාගැනීම සඳහා අනුග්‍රාහක ජාල වැදගත් වන ලදී. නගර සභා සේවකයකු වූ එක් ප්‍රතිචාරකයකුට අනුව එන්නත්කරණය සිදුවූ ශාලාවේ දොරටු දෙකක් විය. ඉන් ප්‍රධාන දොරටුව අසල දීර්ඝ පෝලිමක් පැවත ඇති අතර, දෙවන දොරටුව තුළින් නගර සභා සේවකයින් සමඟ පෞද්ගලික දැන හැඳුනුම්කම් ඇත්තවුන් ඉක්මණින් එන්නත ලබාගෙන පිටව ගොස් තිබේ[13].

